# 2020 ජනවාරි මස 07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්රි |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ර්.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.40 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී .**

( 01 )

**01.01** **2019.12.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර් තාව හා 2019.12.10/18 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර් තා සම්මත කිරිම**

2019.12.03 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර් තාව පිළිගත යුතු බවට ගරු නගර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර් මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, 64 වෙනි පිටුවේ හයවෙනි පේළියේ ඡන්ද හය ලක්ෂ ගණනක් එතුමාට කියන එක හංසයාට කියා සංශෝධනය විය යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සංශෝධන ඇතුළත් කරන්න. තවත් සංශෝධනයක් තිබෙනවා. 2019.12.03 දින මාසික සභා රැස්වීම් වාර් තාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ පැමිණිම සටහන් කිරිමේදි සභා වාර් තාවේ යතුරු ලියන කටයුතු සිදු කිරිමේදි ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ නම ඇතුළත් කර නැත. 2019.12.03 දින එම වාර් තාවට එම නම ඇතුළත් කර සංශෝධනය කිරිමට අවසර ඉල්ලා සිටිනවා.2019.12.10 දින පැවති විශේෂ සභා වාර් තාවත් (අවැය සම්මත කිරිමේ ) , 2019.12..18 දින පැවති විශේෂ සභා වාර් තාවත් ඉදිරියට සංශෝධන කිරිමට යටත්ව මෙම සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා.

- 2019.12.10 දින පැවති විශේෂ සභා වාර්තාවත් (අවැය සම්මත කිරිමේ ) , 2019.12..18 දින පැවති විශේෂ සභා වාර්තාවත් ඉදිරියට සංශෝධන කිරිමට යටත්ව සංශෝධනය කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

**( 02)** **සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන**

**( 03)** **ලැබි ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කරිම**

**03.01** **2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර් ධනය කිරිමේ සංස්ථා පනතේ 4 ( ආ) අ වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරිම සම්බන්ධව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරිමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර් ධනය කිරිමේ සංස්ථා පනතේ 4 ( ආ) අ වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරිම . උක්ත කරුණ සම්බන්ධයෙන් එවකට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් 2019 නොවැම්බර් මස ඔබ වෙත යොමුකරන ලිපිය හා බැදේ. එම ලිපිය මඟින් දන්වා ඇති පරිදි දකුණු පළාත තුල පිහිටි සියළු ඇළ මාර්ගයන් සඳහා වන රක්ෂිතයන් ඉහත පනත යටතේ ප්‍රකාශයට පත් කිරිම පිණිස අදාළ පළාත් පාලන ආයතනයන්හි එකඟතාවය ලබා ගත යුතුවේ. එබැවින් ඔබ බල ප්‍රදේශය තුළ පිහිටි ස්වාභාවික හා ජලය බැස යාමේ අරමුණෙන් නිර්මාණය කර ඇති සියළු ප්‍රධාන ඇළ මාර් ග , අතුරු ඇළ මාර් ග හා පෝෂිත ඇළ මාර්ගයන්හි මතුපිට පළලට අනුරූපි වන සේ රක්ෂිත ප්‍රදේශයන් වෙන් කරමින් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරිම සඳහා වන ඔබගේ එකඟතාවය මෙම සංස්ථාව වෙත ද පිටපතක් සහිතව නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර මේ සඳහා ඔබ මහනගර සභාවෙන් ලැබෙන සහයෝගය අගය කොට සලකන බව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ සංස්ථාවේ සාමාන්‍යාධිකාරිතුමා විසින් ඉල්ලිමක් කර සිටිනවා. ඒ අනුව යෝජිත ප්‍රකාශයට පත් කිරිමට මේ වගේ උපලේඛණයක් අපට ඉදිරිපත් කර තිබෙනවා.ඇළෙහි මතුපිට පළල 1.0-1.2 දක්වා. මෙය දි තිබෙනවාද ? මෙයට එකඟතාවය තිබෙනවාද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, හොඳ යෝජනාවකි මෙය. මේ වන විට ඇළ ඉවුරු විවිධ දේවල් සඳහා භාවිතා කරනවා. ඇළ රක්ෂිතය සුද්ද කරන්න අවශ්‍ය වුනාම අඩුම ගණනේ යන්ත්‍රයක් ගෙන යාමට අවශ්‍ය වෙනවා. මේ වන විට විවිධ පුද්ගලයන් විසින් එම ඇළ මාර් ග අවහිර කර තිබෙනවා. මෙය ඉතා ඉක්මනින් අපේ නගර සිමාවේ තිබෙන ඇළ රක්ෂිත පිළිබඳ ඉතා ඉක්මනින් දන්වා යවන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය එවා තිබෙන්නේ මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් එවා තිබෙන්නේ. මෙය ඔබතුමාට තියන්න කියා නිත්‍යානුකුලව පණතෙන්ම දිලා තිබෙනවා. මේ කටයුත්ත තිබෙනවා. ගැටළු තිබෙන්නේ මෙය අපට අදාල වෙන එකක් ද? බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ අපට අයිති එකක් නෙමේ. මහ නගර සභාව වලට තමයි ඇත්තටම මෙය තිබෙන්නේ. නමුත් මෙය කරන්න ඕන දෙයක්. මේ පිළිබඳව හොඳට අධ්‍යනය කරලා එවත් නිවැරදි කරන ලෙස අප ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා එකඟ වෙනවා ගරු උප සභාපතිතුමාගේ අදහස් වලට . විශේෂයෙන්ම මට මෙය බලපනවා. මොකද පෝරඹ තිබෙනවා පහත් බිම්. මෙහි දමා තිබෙනවා සංශෝධන සහිත කියා. අපේ පෝරඹ ප්‍රදේශය ගත්විට පහත් බිම් ප්‍රදේශයක්. මෙය ජලයට යටවෙනවා. මේ පහත් බිම් ප්‍රදේශයේ ඇළ ඉවුර අපේ ගම් වාසින් විසින් අල්ලාගෙන සිටින්නේ. රක්ෂිතයේ ඇළ අයිනත් සමඟ. දැන් මේවා කඩන්න බිඳින්න බැහැනේ. දැන් මේවා හදලා තිබෙන්නේ. ගොඩ කරලා අල්ලා ගෙන

තිබෙන්නේ. තාප්ප ඉදිකරලා තිබෙන්නේ. මහජනතාවට අපහසුතාවයක් නොවන විදියට සංශෝධනය කර යවන්න පුළුවන් නම් ගරු සභාපතිතුමි, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු විසින් අධික්ෂණය කර බලා සංශෝධනය කර යවන්න. මොකද මෙය පොරඹ ප්‍රදේශයට විතරක් නෙමේ. පහත් බිම් ප්‍රදේශ ගොඩක් තිබෙනවා. ඒ සංශෝධන සහිතව. මෙහි දි තිබෙනවා මීටර් ගණන් වලින් .අඩි ගණන බැලුවොත් අඩි 3යි අහල් 3ක් වගේ තිබෙන්නේ. සමහරක් තැන්වල මෙය සංශෝධනයට ගත්විට අපහසුතාවයට පත්වෙනවා.මෙය සංශෝධනය නොකොළොත් එහෙම. මෙය නැවත නිත්‍යානුකූලව කරන් ගියොත් එහෙම අපහසුතාවයට පත් වෙනවා. මේ ගැන අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මා මෙය පැහැදිලි කරන්නම්.ඉඩම් ගොඩකිරිමේ සංස්ථාවේ 4වන වගන්තියේ කියන්නේ මෙන්න මෙවගේ කාරණයක්. යම් තැනැත්තකු ( 1 ) වන උප වගන්තියේ විධිවිධාන කඩ කරන බවට සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා වෙත දන්වනු ලබන අවස්ථාවක නිති විරෝධි ක්‍රියාකාරකම් කරගෙන යාමෙන් ඒ තැනැත්තා වළක්වාලීම සඳහා සියලු නිසි පියවර ඔහු විසින් ගත යුතු අතර , නිති විරෝධි ක්‍රියාකාරකම් කරගෙන යනු ලබන්නේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා තිබෙන්නේ කවර පොලිස් ස්ථානයක බල ප්‍රදේශයක් තුළ ද ඒ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාගේ සහාය අවශ්‍ය අවස්ථාවන්හි දි සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විසින් ලබාගත හැකි ය. ( 1 ) වන උප වගන්තියේ විධිවිධාන කඩකරමින් නිති විරෝධි ක්‍රියාකාරකම් කරගෙන යාමෙන් ඒ තැනැත්තා ඔහුගේ අනුයෝජිකයන් හෝ සේවකයන් හෝ වළක්වාලිම සඳහා අවශ්‍ය සියලු සහාය ප්‍රධාන විධායක නිලධාරයාට හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ ලබාදිම ඒ පොලිස් නිලධාරයාගේ කාර්යය වන්නේය. මේ යටතේ තමයි මේ ප්‍රමාණය දි තිබෙන්නේ. ඒ අනුව බැලුවොත් එහෙම මීටර් 1 සිට මීටර් 2 දක්වා තිබෙන පාරක ඇළක දෙපැත්තෙන් පාරක මීටරයක් තියන්න කියා. අඩි 3ක් තියන්න කියා. සාධාරණයි . නැතිනම් අපට සුද්ද කරන්න යන්න විදියක් නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, තල්ගස්ගොඩ, කෙරමිනිය , පෝරඹ , පනියන්දුව , කියන ප්‍රදේශ වල . මා මේ පෙන්වන්නම්. මේ තිබෙන්නේ ඇළේ සිට අඩියක්වත් නැහැ. මෙම ගොඩනැගිල්ල ඉදිකර පාරකුත් හදා විදුලියත් දි තිබෙනවා. මෙය සුදුවැල්ල ප්‍රදේශයේ තිබෙන්නේ. වතුර බැස යන ඇළ මාර්ගයකි. හරියටම ඇළ කණ්ඩියේ හදා තිබෙන්නේ. කිසිම නිත්‍යානුකූල තත්ත්වයක් නැහැ. වෙළ මැදින් විදුලි කණු කිහිපයක් දමා තමයි විදුලිය ලබාගෙන තිබෙන්නේ. ජනමාධ්‍යයටත් මේවා පෙනෙන්නේ නැහැ. මේවා සුදුවැල්ල පාරේ සිට ටිකක් ඇතුළතට යන්න ඕන. මෙහි ඡායාරූප පෙනෙනවා ඇති. තව ඡායරූප තිබෙනවා. මෙය හොඳ යෝජනාවකි. මෙයට පිළියම් යොදන්න ඕන. නැතිනම් අනාගතයේ අපේ දරුවන්ට කොහේටවත් යන්න බැරි වෙනවා. මොකද මෙම ඇළෙන් තමයි හල්වතුර ඇළට යන්න බැහැ. සුදුවැල්ල ඇළ දිගේ ගිහින් තමයි හල්වතුරට ඇළට යන්නේ. මේ හේතුනිසා ඇළට යන්නත් බැහැ. පාලමක් ගසා තිබෙන්නේ. ඇළ මාර්ගයෙනුත් මෙහා පාලමක් ගසා තිබෙන්නේ.ඔරුවක්වත් යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. මේවාට විරුද්ධව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. මෙය ඇත්තටම හොඳ යෝජනාවකි. මේ පුද්ගලයා පාත්ති කපා කුරුඳු දමා තිබෙන්නේ. වෙළේ අක්කර 4ක් විතර පාත්ති කපා කුරුඳු දමා තිබෙන්නේ. ඇළ උඩින් පාලමක් ගසා තිබෙන්නේ.මෙය දන්වා යැව්වාම අපට පුළුවන් කතා කරන්න. මෙයට ඉතා ඉක්මනින් කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය කිසි ගැටළුවක් නැහැ. නමුත් මට තිබෙන ප්‍රායෝගික ගැටළුව නම් ඇළ වෙනස් වෙලාද කියන එක. තිබෙන ඇළ වෙනස් වෙලාද කියා.ඉස්සෙල්ලා ඇළ හරිද කියා බලා තමයි මීටරය මීටරය දෙපැත්තට තැබිය යුත්තේ. ඇළ නියම තත්ත්වයට ගෙන ආ යුතුයි. පළමුව ඇළ සිතියම් කළ යුතුයි මෙන්න මෙකයි ඇළ කියා. මාගේ යෝජනාව පළමුව ඇළ සිතියම් කර ඉන්පසු ඒ අනුව අනික් තත්ත්වය සිදු කරන ලෙසයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මෙය ඇත්තටම අපේ ප්‍රදේශයේ ඇළවල් වල කණ්ඩි කැපුවොත් ඇරෙන්න කඳු පාමුලවල් නැති නිසා සෝදා පාළුවට ලක්නොවන නිසා මෙය ඇත්තටම සංශෝධනය කළ යුතු යෝජනාවකි. නැතිනම් වෙන්නේ ගරු උප සභාපතිතුමා පෙන්නා දුන් පරිදි සිදු වන්නේ ඇළ නියරෙම කණු ගසා සංර්ධන කටයුතු සිදු කරයි. එතකොට එහි නරක නාමය පැමිණෙන්නේ ගරු සභාවට , ඔබතුමා ඇතුළු සියළු ගරු මන්ත්‍රීවරුන්ට මේ කුණු නාමය පැමිණෙයි. මේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. ක්‍රියාත්මක කිරිමට අපි සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ සහායෝගය ලබා දිය යුතු යෝජනාවකි. මොකද මෙහි සාධාරණව තිබෙනවා. මොකද මෙහි ඇළේ පළල අනුව ඒ රක්ෂිතයට තිබිය ප්‍රමාණය තීරණය කර තිබෙන්නේ. මෙහි බැලුවොත් ඇළ මීටර් 1.2 දක්වා කියන්නේ සාමාන්‍යයෙන් ගතහොත් අඩි 4ක් පළල ඇළකට තියන්න කියන්නේ අඩි 3 අඟල් 39ක ප්‍රමාණයකි. එය තිබිය යුතුයි. නැතිනම් අපට ඇළ සුද්ද කරන්න ඉඩ ප්‍රමාණය නැති වෙනවා. බොහොම පොඩි ප්‍රමාණයක් තබන්න කියා තියෙන්නේ. මා හිතන්නේ වත්මන් තත්ත්වය බලා තමයි මෙය දමා තිබෙන්නේ. ඔබතුමා බලන්න මීට කලින් තිබෙන කෘෂි කාර්මික චක්‍රලේඛණය. මේ වගේ තිබෙනවා දෙගුණයක්. චක්‍රලේඛ පරික්ෂා කර බලන්න. මීට වඩා දෙගුණයක් තිබෙනවා. මා හිතන්නේ ජනතාව මේ ඇළත් සමඟ පරිහරනය කරනවා යම් යම් ඉඩම්. එතකොට ඒවා කඩා ඉවත් කරන්න ගියාම රජයට ප්‍රශ්න ගැටළු නිසා මෙය අඩු කරලා දි තිබෙන්නේ. පරණ එකේ මීටවඩා වැඩිපුර දි තිබෙනවා. ඇළේ රක්ෂිතය. මෙය අඩුකර දි තිබෙන්නේ. මා හිතන්නේ මෙය ක්‍රියාත්මක කළ යුතු දෙයකි. මෙයට ගරු මන්ත්‍රීවරුන් සහායෝගය දිය යුතු දෙයකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ප්‍රකාශ කළ පරිදි මෙහි ඇළ කැපිය යුතු තැන නිර්නය කළ යුතුයි. මොකද මා ඇස්දෙකෙන් දුටු දෙයක් තමයි . ඇළ හරද්දි අපේ ජීවත්වන මහජනතාවට පහසුවන පරිදි රක්ෂිතය පැත්තෙන් කපනවා. කපා ගොඩ දමන්නේ ඇළේ තිබෙන පස්ටික රක්ෂිතය පැත්තට. එහෙමයි එය රක්ෂිතය අඩු වෙලා තිබෙන්නේ. මෙය සාමාන්‍යයෙන් බලපාන්නේ මීටර් 1.2 තිබෙන පොඩි ඒවාට තමයි. මෙය සාමානයෙන් හල්වතුර ඇළ ගත්තොත් එහෙම අඩි 14ක් පමණ තිබෙනවා. එතකොට රක්ෂිතයේ මේ පැත්තේ පස් අයින් කරන විට මේ පැත්තට දැමිය නොහැකි වෙනවා. එය අල්ලාගෙන තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හල්වතුරේ ඇළ අඩි 24කි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

පනියනේ රණසූරිය පාරේ තිබෙන එක එච්චර පළල නැහැ. මෙහි විශේෂයෙන් වැදගත් වන්නේ මෙය පළල් වනවිට තමයි වැදගත් වෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපිනේ ඔය ඇළ මාර්ග කපනු ලැබුවේ . ඒ කපන විට අඩි 24 පළලෙන් තමයි ගියේ. ඒ පළල දිගටම යනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

රෝන්මඩ පිරිලා කඩන් වැටිලා තිබෙන්නේ.මෙය සංශෝධන සහිතව හරි බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ යෝජනාව හොඳ එකක්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පොඩි ඉල්ලීමක් තිබෙනවා කරන්න. මෙහි විය යුතු දේ නිත්‍යානුකූල විය යුතු දේ. භෞතික අපි අම්බලන්ගොඩ බැලුවත් භෞතිකව පාරක් ලෙස පාවිච්චි කරන අවස්ථා තිබෙනවා. දැන් අපි කතා කරපු හල්වතුර ගත්තාත් වම් පැත්ත ඉවුර පාර. දකුණු පැත්ත ඉවුරත් පාර. එතකොට මේවා සංවර්ධනය කිරීමේදී පාර අත්‍ය වශ්‍යයි. එතකොට මේ ආරක්ෂා කිරීම නොවේද විය යුත්තේ. අපට එහෙම බලපෑම් කරන්න බැහැ. ඉල්ලීමක් කළ හැකියි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පාරක් තිබෙනවා නම් කිසිම ගැටළුවක් වෙන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මෙහි ඉඩම් ගොඩකිරීමේ ප්‍රධානියාට කිසිම ගැටළුවක් නැහැ. එයා නිතිය ක්‍රියාත්මක කරන්න කියාවි. දැන් භෞතිකව හල් වතුරේ දෙපැත්තෙම පාරවල් දෙක තිබෙනවා. වාහන යනවා. නිහඬස්ව තිබුණට අරයට නිත්‍යානුකූලව බලයක් එනවා නේ. ඒ පාර වුණත් අයින් කරන්න

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පාරක් අයින් කරන්නේ නැහැ. පාරක් වශයෙන් තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඇළ රක්ෂිතය වෙන එකක්. පාර වෙන එකක්. අපි පාර කිවුවාට වැඩක් නැහැ . ඇළ රක්ෂිතයේ අඩි 20ක් තිබ්බාම කොහේද පාර තිබෙන්නේ. නැහැ ඇළ රක්ෂිතය ඉල්ලන්නේ පාරට නෙමේ. ඇළ රක්ෂිතය එන්නේ ඇළේ සංවර්ධනයට. ඇළ පළල් වෙන්න පුළුවන්. දැන් උදාහරණයකට දැන් අපි කතා කළ හල්වතුර ඇළ බාත් එක නිසා නෙමේ අඩි 24ට ගිහින් තිබෙන්නේ. අඩි 30 තිබෙන්නේ උසාවි තින්දුව නිසා. හල්වතුර සංවර්ධනය කරන්න ඕන නිසා උසාවි තින්දුවක් දුන්නා අඩි 30 වෙනකම් පළල් කරන්න කියා. හෙට අඩි 40ට උසාවි තින්දුවක් දුන්නොත් අඩි 40ට පළල් වෙනවා. අන්න එකයි ඇළ රක්ෂිතය. එකට අපි යටත්. එක වෙනම කතාවක්. හැබැයි මේ ආයතනයට මේ බලය දෙනවා කියන්නේ. මා මෙය කියන්නේ තර්කයකට නෙමේ. මේ ඉල්ලීම අපි ගරු සභාපතිතුමනි කරන්න පුළුවන් නම් එය කළ යුතුයි. මොකද අපි දැනුවත් නම් ඉදිරියේදි ජනතාව

දැනුවත් කරන්න අපි මෙම ඉල්ලීම කර තිබෙනවා කියා. පුද්ගලිකව පාර අයිනේ තිබෙන එකට මා එකඟයි. හැබැයි පොදු මාර්ග. දැන් ඔය මාර්ග සති පාරම යනවා. එහෙම බැලුවත්. දැන් ඔය කියන පාරවල් සියල්ලම යනවා. එතකොට විශාල ගට්ටනයක් ඕක ඇතුළේ. ඒ ජනතාවගේ පාරවල් අයිතිය කොහොමද? ටානියා එකට යන්නේ කොහොමද? ජනතාව උඩින් යන්නද? ඒ අය යන්න එපැයි.වාහන අඩි පාරෙන් යන්න බැහැනේ. ඇළ රක්ෂිතයේ මායිමේ ඒ අය දැන්වැල් ගසා මායම් ගැසුවොත් . අද ධිවර සංස්ථාව ගසා තිබෙනවා පාරවල් වසා පිටුපසින්. එවාගේ ගැසුවොත්. අපට ඕක කරන්න බැහැ. එතකොට අපේ ජනතාවට විශාල පිඩනයක් වෙනවා. එමනිසා අපි මේ බලය දිමේදි මෙම ඉල්ලිමත් මෙයට සම්බන්ධ කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම ඉල්ලිමට අපි එකඟයි කියා යවනවා. ඒ සඳහා මාර්ග

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විපක්ෂයක් විදියට අපේ අදහස ඉදිරිපත් කළ යුතුව වෙනවා. නගරයක පාරවල් , ඇළ මාර්ග ඒ සැලසුම් තිබෙන ආකාරයට සකස් විය යුතුයි. දැනට කවුරු හරි විෂමාචාර විදියට ගොඩ නගා තිබෙනවා නම් හරියට ඒ නිතිය නවත්නේ නැතිව එම නිතිය හරියට ගනිවි කියා අප හිතනවා. අපි අනුමැතියක් දෙන එක විතරයි කරන්නේ. එම නිසා අනාගත පරම්පරාවට දායද කරන මේ නගරය නිවැරදිව සකස් කර භාරදීම අපේ වගකීමක් හැටියට නගර  සභාවේ සාමාජිකයන් හැටියට මා විශ්වාස කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි එහෙනම් මෙය මේ විදියටම අනුමත කර යවන්න. ගරු නගර සභා මන්ත්‍රිතුමියට මා මේ පාර ආව නිසා කියා සිටිනවා සුදුපාට සාරියක් ඇඳගෙන එනලෙස ඔබතුමියට අපි දන්වනවා. නැතිනම් සභාවට එන්නේ නැතිව ඉන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය   කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම විරෝධය පළ කරන්න තමයි කළු ඇඳගෙන ආවේ. පසුගිය සිකුරාදා ගරු සභාපතිතුමා මුණ ගැසෙන්න හිටියා . මෙතැන ලොකු සිදුවිමක් සිද්ධ වුණා. ලේකම්තුමියත් හිටියා. ඒ ගැන මා කිහිප වරක් පැමිණියා මේ සිද්ධිය පිළිබඳ කියන්න. හම්බ වුණේ නැහැ. එයට විරෝධය පළ කරලා තමයි මා අද කළු ඇඳගෙන ආවේ. මා ඔබතුමාට පසුව විස්තර කියන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ . සියළුම ගරු මන්ත්‍රිවරු සුදු ඇඳුමෙන් සැරසිලා එනවා නම් වඩා හොඳයි. අපි මිට ඉහත සුදු ඇඳුමෙන් සැරසිලා ටී ෂර්ට් වගේ එවාගෙන් සැරසිලා එන්න එපා කියා තිබෙනවා. එමනිසා සභාවට ඒ ගෞරුත්වය හැසිරෙන ආකාරයෙන් සැරසිලා එන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**තීරණය -**

2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර් ධනය කිරිමේ සංස්ථා පනතේ 4 ( ආ) අ වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරිම සම්බන්ධව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය  කිරිමේ සංස්ථාවේ

ඉල්ලීමට එකඟතාවය පළ කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.02 අම්බලන්ගොඩ රාජ්‍ය නිලධාරින් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම යන මැයෙන් නගර සභාවේ ගණකාධිකාරිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 ( XXVIII)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 1-3 උපජේදය ප්‍රකාරව ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට මා හට හිමිකමක් පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගණකාධිකාරිවරිය විසින් ඉල්ලීමක් කර තිබෙනවා. මෙන්න මේ විදියට තිබෙනවා. මේ චක්‍ර ලේඛණයේ මෙන්න මේ විදියට තිබෙන්නේ.නියෝජ්‍ය සාමාන්‍යධිකාරි මට්ටමේ තනතුරු දරන රාජ්ය නිලධරයන්ට සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.1.3.1 වාහන සහ ඒ සඳහා ඉන්ධන ප්‍රතිපාදනය කිරිමට හැකියාවක් ඇත්තනම් පමණක් , සේවයේ අවශ්‍යතාව මත කාර්යාලය හා නිවස ආසන්න ස්ථාන අතර ගමන් කිරිම සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි පහත සඳහන් අයට ලබා දිමට හැකිය. මෙහිදි ගමන් ස්ථාන දෙක අතර උපරිම දුර ප්‍රමාණය කිලෝමීටර් 50 නොඉක්ම විය යුතුය. එවැනි වාහනයක් රාත්‍රී කාලයෝ දි නවතා තැබිය යුතු ස්ථානය ආයතන ප්‍රධානියා විසින් නියම කළ යුතුය.

(1) කැබිනට් අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය කොමසාරිස්, නියෝජ්‍ය පාලක, සහකාර අධ්‍යක්ෂක , සහකාර කොමසාරිස්, සහකාර පාලක වැනි හා ඒ හා සමාන තනතුරු දරන , කිසියම් දිප ව්‍යාප්ත සේවයක I,II,I ශ්‍රේණිවලට අයත් හෝ ඊට සමාන වෙනත් සේවාවල නිලධරයන්,

(II) පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලවල , පළාත් අමාත්‍යාංශවල හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය මට්ටමේ සහකාර මට්ටමේ තනතුරු දරන දිප ව්‍යාප්ත සේවයක I,II,I ශ්‍රේණිවලෙට අයත් හෝ ඊට සමාන වෙනත් සේවාවල නිලධරයන්

එම දිමනාව මෙන්න මේ ප්‍රමාණය කියා ඉල්ලන්න. එය සභාවෙන් අනුමත කර දෙන්නම්. දැන් ඔබතුමියගේ වැටුපට අමතරව දිමනාවක් ගෙවීමට එකඟතාවය තිබෙනවා. අපි නගර සභාවේ තිබෙන වාහනයකින් ප්‍රවාහන පහසුකම් ලබා දීමට එකඟතාවය ලබා දෙනවා.

**තීරණය -**

2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 ( XXVIII)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ 1-3 උපජේදය ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාවේ ගණකාධිකාරිතුමිය විසින් කරන ලද ඉල්ලීමට අනුව ( රාජ්‍ය නිලධාරින් සඳහා) ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා සභාව සතු වාහනයකින් ප්‍රවාහන පහසුකම් ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.03 අම්බලන්ගොඩ නගර සභාවේ පවතින ගිණුම් අංක 035100116296205 දරණ ගිණුමේ ඇති රු .24850/= ක මුදල අවලංගු කර පොදු ගිණුමකට මාරු කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ පවතින ගිණුම් අංක 035100116296205 දරණ ගිණුම අත්හැර දමන ලද දේපලක් ලෙස සලකා එහි ශේෂය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ගැනීමට නියමිතව ඇති බව දන්වා එවා ඇත. ඒ අනුව 03.03 යටතේ අප ඉල්ලීමක් කරනවා. එහි ශේෂය තිබෙනවා රු.24850/= ක මුදලක්. එම ගිණුම අවලංගු කර පොදු ගිණුමට මුදල් ලබා ගැනිමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභාවේ පවතින ගිණුම් අංක 035100116296205 දරණ ගිණුමේ ඇති රු .24850/= ක මුදල අවලංගු කර පොදු ගිණුමකට මාරු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.04 මාදම්පා මෝදර ගැටළුව විසඳිම යන මැයෙන් රත්ගම ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රී එන්. ගාමිණි ද සිල්වා මහතා විසින් නීති සම්පාදන හා මානව හිමිකම් රාජ්‍ය අමාත්‍යා වෙත යොමුකරන ලද ලිපියේ පිටපතක් සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ ලිපිය ලියා තිබෙන්නේ නිති සම්පාදන හා මානව හිමිකම් රාජ්‍ය අමාත්‍යතුමාට . නමුත් මෙය අම්බලන්ගොඩටත් වැදගත් වන නිසා මේ ලිපිය සභාවට ඉදිරිපත් කරන්න තීරණය කළා. මාදම්පා මෝදර ගැටළුව විසඳිම සම්බන්ධවයි. රත්ගම , අම්බලන්ගොඩ, කරන්දෙණිය, බලපිටිය යන මැතිවරණ කොට්ඨාශ හතරක අයත් ග්‍රාම නිළධාරි වසම් විස්සකට ( 20) වැඩි සංඛ්‍යාවක් ගංවතුර උවදුර ඇතිවේ. එම ප්‍රදේශයේ ජනතාව සෑම වසරකම දැඩි අපහසුතාවයකට පත් වන මාදම්පා ගඟේ ජල ගැලීම් තත්ත්වය වර්ෂය 1968 දි පමණ මාදම්පා මුව දොර වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඉදිකරන ලද අසාර්ථක ව්‍යාපෘතියක ප්‍රතිඵලයකි. එනම් මාදම්පා කලපුව කරදිය ගැලීම නතර කිරිම සඳහා කලපුවේ ස්වාභාවික මුවදොර වෙනස් කොට වෙරළ තීරයේ ගල් බැම් දෙකක් යොදා පැරණි මෝය වසා සොරොව්වක් ඉදිකර නව මෝය කටක් ඉදි කිරිම නිසා මෙම උවදුර නිර්මාණය වී ඇත. මෙයට ප්‍රධාන හෝතුව කලපුවේ වතුර මට්ටම ඉහල යන අවස්ථාවල පැරණි මෝයේ වැලි ඉවත් වී මෝයට මීටර් 100ට වැඩි ප්‍රමාණයක් පුළුල් වීමට තිබු අවස්ථාව අහිමි කර කළුගල් බන්ට් දෙකක් යොදා මෝය වෙනස් කර කුඩා කර ඇති අතර , එම කුඩා ප්‍රමාණයටද මුහුදු රළ දැඩි වන අවස්ථාවලදි එම ගල් බැම් වල ගල් පෙරලී මෝයකට සම්පුර්ණයෙන් ගොඩවීමේ තර්ජනයට ලක් විමයි. මෙම මෝය ගල් පෙරලී ගොඩවීමේ තර්ජනය වර්ෂ 1970 දී පමණ ආරම්භ වු අතර එදා සිට වසර පනහකට ( 50) ආසන්න කාලයක් තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් මෙම මෝයේ ගල් ඉවත් කිරිම විසි තිස් වතාවකට වඩා වාර ගණනක් සිදු කර ඇති නමුත් ප්‍රශ්නයට විසඳුම් ලැබි නැත. එයට ප්‍රධාන හේතුව නම් මෙම ගල් වැටි දෙක මුහුදු රළ බිඳෙන ස්ථානයේ ඉදිකර තිබිම නිසා මුහුදු වෙරළ වැඩි වන අවස්ථාවේ මෙම ගල් වැටි තුළ ගල් පෙරලීම තුලින් මෝය කට ගොඩවීමයි. මෙම ගැටළුවට විසඳුම් ලැබීමට ප්‍රමාදයට හේතු වී ඇත්තේ මධ්‍යම රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් කරන

ලද මෙම ව්‍යාපෘතිය පළාත් සභා පිහිටු වීමෙන් පසු එකී ව්‍යාපෘතිය පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම ගැටළුව විසඳීමට උත්සාහයක් නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාදම්පා කලපුවේ ගැටළු රාශියක් මතුවිය.

01) කලපුව අවට ගම්මාන විශාල ප්‍රමාණයක් වාර්ෂිකව ගංවතුර තත්ත්වයකට මුහුණ දිම.

02) වර්ෂ සියයකට වැඩි කලක් ධීවරයා සිය තොටුපල වශයෙන් භාවිතා කළ මාදම්පා කලපුව විනාශ වීම.

03) විදේශ වෙළඳපොලට පවා සැපයූ ඉස්සන් අස්වැන්න මෙන්ම කකුළුවන්, කලපු මසුන් වර්ග රැසක් කලපු රැකියාව කළ ධීවරයාට මෙන්ම රටේ ජනතාවට මත්ස්‍ය සම්පත අහිමි වීම.

04) කලපුවේ ජලය නිසි ලෙස බැස නොයෑම නිසා ජලය දූෂණය විම නිසා ධිවරයින්ගේ මෙන්ම පිහිනුම් ක්‍රිඩාවේ පුහුණුවිම් කල ළමියන්ගේ මෙන්ම කලපුවේ නෑම කරන අයගේ සමේ රෝග ඇතිවීම ඇතුළු තවත් ගැටළු රැසක් ඇතිවීම.

<u>විසඳුම් හා යෝජනා.</u>

01) මාදම්පා මුවදොරේ ගල් බැමි දෙකේ දකුණු බැම්ම දැනට තිබෙන ස්ථානයෙන් ඉවත් කර මීටර් 50ක් පමණ ( රළ බිදෙන ස්ථානයෙන් දියබට ) දැම්ම.

02) මුවදොර ( මෝය කට ) මීටර් 100ක් පමණ පළල් කිරිම.

03) මුදදොර ඇති සොරොව්ව ඉවත් කර කලපුවේ ලේනදූව හා කුඹල් දූව යා කර ඉදිකිරිම හෝ ගොඩහේන තොටුපල හා මහ අම්බලන්ගොඩ දූව තොටුපල යා කොට ඉදිකිරිම.

04) මෝය කට ප්‍රදේශයේ සිට දුම්රිය පාලම දක්වා ඇති නොගැඹුරු ප්‍රදේශවල ගල් තබා ඉවත් කර මෝය කට ගැඹුරු කිරිම.

<u>අපේක්ෂිත ප්‍රතිලාභ -</u>

01) ඉහත දී මැතිවරණ කොට්ඨාශ වලට අයත් ග්‍රාම නිළධාරි වසම් 20 ( විස්සකට ) අධික සංඛ්‍යාවකට වාර්ෂිකව ඇති වන ගංවතුර තත්ත්වය අවම කර ගැනීමට හැකිවිම.

02) කලපුව අවට ගම්මාන රැසක ධිවර ජනතාවට ධීවර කර්මාන්තය පහසුවෙන් කර ගත හැකි තොටුපලවල් කිපයක්ම නිර්මාණය වීම.

03) කලපුවේ ඉස්සන් , කකුළුවන් හා කලපු මසුන්ගේ වැඩි වර්ධනයක් ඇති වීම.

04) දැනට තිබෙන සොරොව්ව ඉහත කි ප්‍රදේශවල ඉදි කිරිමෙන් කුඩා වැව් දෙකක් නිර්මාණය වීම තුළ එම ප්‍රදේශවල කුඹුරු විශාල ප්‍රමාණයකට කරදිය මිශ්‍ර10නැති ජලය සැපයීමට හැකි විම.

05) පානීය ජලය ලබා ගැනීමේ ව්‍යාපෘති ඇති කිරිමේ හැකියාව.

06) කලපුව හරහා ගමන් කිරීමේ කෙටි මාර්ග පද්ධතියක් ඇති කිරිමේ හැකියාව.

මෙම කරුණු පිළිබඳව වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා මාදම්පා මෝය නිරීක්ෂණය කිරිම සඳහා කලපුවේ ජල මට්ටම අඩු අවස්ථාවක මෝයකටආසන්නයට අදාල රාජ්‍ය නිලධාරින් හා ( වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ආදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල නිලධාරීන් හා අදාල ප්‍රදේශයේ දේශපාලන නායකයින් දෙසැම්බර් , ජනවාරි මාසවල මෙම මෝය පරික්ෂා කිරිමට සුදුසු

කාලය වේ.  මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමුකර කඩිනම් පියවරක් ගන්නා ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටින ලෙස එන් . ගාමිණී ද සිල්වා ඌරවත්ත කොට්ඨාශ මන්ත්‍රී විසින් ඉල්ලීමක් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එම මහත්මාට අපි ස්තුති වන්ත වෙන්න ඕන. අපි දන්නවා අපේ අම්බලන්ගොඩ ජනතාව ගංවතුර උවදුර ඇති වුණාම ලක්වන්නේ කොයි ආකාරයටද කියා. මා හිතන විදියට ඒ මහත්මා කිවූ පරිදි ඔබතුමාට මීට කලින් අම්බලන්ගොඩ නගර සභාවේ විශේෂයෙන්ම තුඩුවමුල්ලේ , ප්‍රදේශවල ජීවත්වන ජනතාව ඔවුන්ගේ දුක් ගැනවිල්ල කියලා ඒ විය යුතු දේ කියා ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කළා. ගරු සහෝදර මන්ත්‍රීවරුණි, මෙය ඇත්තටම කළ යුතු දෙයකි. අපේ නගර සභාව මඟින් ක්‍රියාත්මක වෙලා කළ යුතු දෙයක්. එය රත්ගම ආසනයටත් එය බලපාන නිසා තමයි එතුමා එතුමාගේ අදහස් හා යෝජනා ඔබතුමාට ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ගැන අපි ලොකු අධ්‍යනයක් කර ඉතා ඉක්මනින් මෙය කළ යුතුයි. දැන් ගංවතුර නැති නිසා ඔබතුමා ඇතුව අපි සියළු ගරු මන්ත්‍රීවරුන්ට කිසි කරදරයක් නැතිව ඉන්න පුළුවන් වෙයි. නැවත ගංවතුර ගැලුවාම අපි දන්නවා අපේ අහිංසක ජනතාව කොයි වාගේ කරදර වලට මුහුණ පානවාද කියා. එමනිසා අපේ යුතුකම හා වගකීම අපි ඉෂ්ඨ කළ යුතු වෙනවා. මුහුදු ප්‍රදේශ හැර මහ අම්බලන්ගොඩ, පනියන්දුව, පෝරඹ, කෙරමිණිය , පොල්වත්ත , තල්ගස්ගොඩ ආදි අනික් සැම ප්‍රදේශයකටම බලපානවා. මා මාදම්පා ගඟ ආශ්‍රිත කර්මාන්ත වල නියැලෙන එම පිරිස සමඟ සාකච්ඡා කළාම එතුමාලාගේ තිබෙන යෝජනාවක් තමයි මෝය කටේ තිබුණ පාලම කඩන අවස්ථාවේ එම පාලමේ තිබුණ කැළි දරුවන් පිහිණුම් ක්‍රිඩාවේ නියැලෙන ස්ථානයේ වැටි තිබෙනවා. එතකොට සුනාමි ව්‍යාසන අවස්ථාවේ වාහන කිහිපයක් ඔය ස්ථානයේ ගසා ගෙන යනවා මා මාගේ ඇස්දෙකෙන් දුටුවා. මා එම අවස්ථාවේ සිටි නිසා දුටුවා කොච්චර ජනතාවක් එම ගඟ දිගේ ගසාගෙන යනවාද කියා. ඒ වගේම බඩු භාණ්ඩ කොච්චර ප්‍රමාණයක් ගසාගෙන යනවාද කියා සියැසින් දුටු කාන්තාවක් වශයෙන් එම අවස්ථාව මට ශෝකජනක අවස්ථාවක් ලෙස මැවි පෙනෙනවා. එමනිසා මෙම ගඟේ සුනාමි නිසා තැන්පත් වූ අපද්‍රව්‍ය හා භාණ්ඩ විශාල ප්‍රමාණයක් තිබෙනවා.මෙය පිරිසිදු කරන විට විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැමිණියාම කරන්නේ උඩ තිබෙන ගල්ටික විතරක් අයින් කරනවා. ඊට කලින් ඔබතුමා මැදිහත් වෙන්න අපේ පිහිණුම් තටාකය තිබෙන ස්ථානය සුද්ද කිරීමට. එහි ගල් තිබෙනවා. මොකද ඔතැන කිමිදිච්ච අය සිටිනවා. මෙහි පාලම උඩ සිට පැනපු අය ඉන්නවා. මාගේ හිතවත් සහෝදරයෝ ඉන්නවා. ඒ අය මට කියනවා අපි ඉස්සර මෙතැන උඩ සිට පැනලා තිබෙනවා. එච්චර හොඳට තිබුණ ස්ථානයක් තමයි අද ගල් ඇවිල්ලා පාලමේ කැලි, අපද්‍රව්‍ය ආදියත් එක්රැස්වෙලා අනාරක්ෂිත ස්ථානයක් බවට පත්වෙලා තිබෙනවා. මා එමනිසා ගරු සභාපතිතුමා ඇතුළු මාගේ සියළු සහෝදර ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ අප මෙයට මැදිහත් විය යුතුයි. ඇත්තෙන්ම ගරු රත්ගම ආසනයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මොහාන් මහතා පැමිණෙනවා කියා එම ස්ථානය නිරීක්ෂණය කිරීමට. මට පෞද්ගලික කාරණයක නියැළුණ නිසා මට එම ස්ථානයට යාමට නොහැකි වුණා. නමුත් ඔබතුමා දැනුවත් වෙලා ඇති. ආවාද නැද්ද කියන එක මා දන්නේ නැහැ. නමුත් අපි ක්‍රිඩා කමිටුවේදී කතා කළාම ඒ අය එනවා පැමිණ අස්කර තිබෙන බව පවසා එහෙමම යනවා. ඇත්තෙන්ම මෙය කාගේ වත් බුදලයක් නෙමේ. මෙය මහජනතාවගේ දෙයක්. එමනිසා මහජනතාවගේ මුදල් යොදවන විට යම් කිසි දෙයකට අපිව දැනුවත් කරලා එම කාර්ය නිසි විදියට කිරීමට ඔබතුමා මැදිහත් විය යුතුයි. අපි අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් මහජන නියෝජිතයන් විදියට අපි පත්වෙලා යම්කිසි සේවයක් කරනවා නම් එම සේවය නියමාකාරයට සාධාරණ ආකාරයට කිරීම අපේ යුතුකම විය යුතුයි. එමනිසා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ මෙය කරන විට එම කාර්ය කරන විට අපව දැනුවත් කරලා ඔබතුමා අපව සමඟත් ගිහින් නියම අයුරින් නිරීක්ෂණය කර

එම කාර්ය කරන්න එකතු වෙන්න කියන අතරම එම ගාමිණී මහතාටත් මේ සම්බන්ධව සභාව දැනුවත් කිරීම පිළිබඳ ස්තුතිය පළ කරනවා . එම කාර්ය සාර්ථක වොවායි ප්‍රර්ථනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපි නගර සභාවෙන් ඉදිරිපත් නොවුවත් එම ගරු මන්ත්‍රී ගාමිණී මහතා විසින් ඉදිරිපත් කර ඇත්තේ හොඳ යෝජනාවකි. මේ ව්‍යාපෘතිය සම්බන්ධව මට ගැඹුරු අවබෝධයක් නැතත් මේ ගැන අධ්‍යනය කර කරනු ලැබූ හොඳ යෝජනාවකි . මොකද 1968 ගංමෝය පටුකර දැම්ම නිසා කියනවා.

- පෙරවරු 10.20ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

1968 ගංමෝය පටුකර දැම්මා කියන එක මා දැන සිටියේ නැහැ.නමුත් බැලු බැල්මට මට එය අවබෝධ වෙලා තිබුණා. ඊට අමතරව මෝය කටට ගල්වැටිමත් සිදු වෙලා තියෙනවා. මේ ප්‍රශ්නය ඇතිවීමට මුලික වශයෙන්ම බල පෑ ඇති බව මට අවබෝධවෙලා තිබෙනවා. මේ සමස්ත කුඹුරු යායම පුරන් වෙලා තිබෙන්නේ මේ ප්‍රශ්නය නිසා. එතකොට මේ කරිච්ච එන නිසා මේ මහ වටිනා වෙල් යායක් වටිනා සම්පතක් අපට අහිමි වෙලා තිබෙනවා. එහෙමනම් මේ යෝජනා කළ තිබෙන යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් හැටියට මා දකිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම රත්ගම ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රිතුමාට ස්තුති කර සිටිනවා මේ යෝජනාව ගෙන එම පිළිබඳව . ගරු සභාපතිතුමාටත් ස්තුතිය පුද කරනවා මෙතුමා සභාවට යොමුකරන ලද ලිපිය සභාවට දැම්ම සම්බන්ධව. මේ මෝදර ගඟ නිසා ඇතිවන ගංවතුර උවදුර දුරු කර ගැනිම වැදගත්. මා දන්නවා අපේ කාන්තාවන් වන ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා මහත්මිය, ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය ගංවතුර උවදුරෙන් පිඩාවට පත් වූවන් වෙනුවෙනු කටයුතු කලා. එවැනි විපත් වලදි කාන්තාවන් වශයෙන් පිහිට වුණා. අනිත් එක අපි යොමු කරන්න ඕන දෙයක් . මෙය එතුමා යොමු කරන්න ඇත්තේ රත්ගම ප්‍රදේශයේ ගරු මොහාන් ද සිල්වා මහතා සිටිනවා රාජ්‍ය අමාත්‍ය ධුරයක් දරමින් සිටිනවා. එතුමා මෙය ගරු අමාත්‍යතුමාට කියා මෙය කරගැනීමේ දැඩි උත්සාහයක් තිබෙන්නේ. මෙය හොඳ දෙයක් . මෙතුමාට ස්තුති කළ යුතුයි. අපි අම්බලන්ගොඩ නගර සභාවේ සියළුම ගරු මන්ත්‍රිවරුන් කැමති වෙයි මෙම යෝජනාවට. මෙම යෝජනාව යවන්න මෙය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියා. මෙය කොළයකට පමණක් සීමා නොකර මෙය ඉතා ඉක්මනින් කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ රත්ගම ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රී ගාමිණී මහතා විසින් ගරු රාජ්‍ය අමාත්‍ය මොහාන් සිල්වා මහතාට යොමු කරන ලද ලිපියේ පිටපතක් තමයි මේ සභාවට යොමු කර තිබෙන්නේ. ඒ සම්බන්ධව අපි දිගින් දිගටම සාකච්ඡා නොකළත් මේ සම්බන්ධව අපට වඩා වැදගත් වන්නේ ඉංජිනේරු මතය. ඒ ලිපියේ අන්තර්ගතයත් ඉංජිනේරු මතයත් අතර තමයි එය තීරණය කරන්න වෙන්නේ. නමුත් මා දන්නා කාරණා දෙකක් තිබෙනවා. මේ සම්බන්ධව දන්නා කාරණා 2ක් ඉදිරිපත් කිරිමට තිබෙනවා. ඒ සමඟම මේ කාරනා දෙක ඉදිරිපත් කිරිම වඩා වැදගත්. මේ අවස්ථාවක් නොවන නිසා මේ දුක්විඳින මහ අම්බලන්ගොඩ , දූව, පොල්වත්ත , ආදි ඒ ගංවතුරට හසුවන ජනතාව වෙනුවෙන් බරපතලම ප්‍රශ්නය අප දැක්කේ මේ මෝය කටේ දමා තිබෙන දොරවල්

අට. එම දොරවල් අටම පොළොවේ. දොරවල් අටම උස්සන්න බැහැ. භාගයට උස්සන ලද දොරවල් දෙකක් ද හතරක් ද තිබෙනවා. තව තුනක් තිබෙනවා උස්සන්නම බැරි. මෙයට ප්‍රධානම හේතුව වී ඇත්තේ මේවා තිබුණේ තඹ හෝ පිත්තල වලිනි. දැන් තිබෙන්නේ යකඩ. එතකොට කාලයක් තිස්සේ මේවා තිබෙන කොට මේවා මලකඩ බැඳෙනවා. කිසි කෙනෙකුට මේවා අරින්න බැහැ. මෙය කරුණාකරලා මෙය ලියා යවන්න වාරිමාර්ග ඉංජිනේරුතුමාට. දෙවැනි කරුණ තමයි මේහි නොලියුවුණු දෙයක් තමයි ඌරවත්ත පාලම හදන විට එම පාලමට කොන්ක්‍රීට් කුළුණු දැමීමට සිදු වුණේ වතුර බැස්ම හරහා. එමනිසා තමයි වතුර බැස්සම පටු වී තිබෙන්නේ. එයට ප්‍රායෝගිකව ගැටළු පැමිණියා. ඔය පාලමට ඉඩම් අත්පත් කර ගැනීමේදි ප්‍රායෝගික ගැටළු පැමිණියා. එම ගැටළු නිසා තමයි ඔය පාලමේ ඔය කුළුණු ඔය විදියට දමනු ලැබුවේ. ඒ කුළුණු අතර පරතරය අරක්කු පාලමේ කුළුණු අතර පරතරයට වඩා අඩුයි. එමනිසා තමයි වතුර බැස්සම එකපාරට බසින්නේ නැති ගතියක් තිබෙන්නේ. ඉතිං මේවා විශාල ප්‍රායෝගික ගැටළු . ඉංජිනේරු මතත් සමඟ. අපට වාද කරන්න බැහැ.මෙම කරුණු දෙක අඩුනිසා මා මෙය ඉදිරිපත් කළේ. එකත් එකතු කරනවා නම් වඩා හොඳයි කියා මා විශ්වාස කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු රත්ගම ප්‍රාදේශිය සභා මන්ත්‍රී ගාමිණී මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ මාදම්පා මෝදර ගැටළුව පිළිබඳ නගර සභාවක් විදියට අප සතුටු වෙනවා . මා දකින විශේෂම දෙය තමයි අප පෝරඹ ප්‍රදේශයේ පහත් බිම් රැසක් තිබෙනවා. පොඩි වර්ෂාවකටත් යටවෙනවා. විශේෂයෙන් මුහුදෙන් හමන සුළං හරහා අඩු වැඩි වීම් හරහා උදම් හරහා මෝය කට හරහා තිබෙන මුහුදු සීමාවේ ගල්වැටිලා වැලි හිරවෙලා තිබෙන්නේ. අර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කිවු පරිදි. එයට විසඳුම් දිය යුතුයි. එතැන භාරා ගල්ටික උඩින් තැබිය යුතුයි. ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය කිවු පරිදි ගල්ටික උඩින් අයින් කරන්න. ඒ වගේම තමයි රෝන්මඩ. රෝන්මඩ අයින් කර ගල්ටික අයින් කළාම ඔය ප්‍රශ්නය ටිකක් විසඳෙනවා. ඇළවල් හරහා තිබෙන රොන්මඩ ඉවත් කළාම. මෙයට විසඳුමක් දෙන්න නගර සභාවක් විදියට නගර සභාව ඇතුළු දේශපාලන බල අධිකාරියට ක්‍රියාත්මක වෙන්න කියා අපි නගර සභාවක් විදියට යොමුවන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාදම්පා මෝදර ගැටළුව සම්බන්ධව ගාමිණී මහතා විසින් එවන ලද ලිපිය එතුමා මෙම ප්‍රදේශයට අයත් නොවුණත් රත්ගම ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් හැටියට එය ඉටු කරලා මහජනතාවගේ ප්‍රධාන වශයෙන් බලපාන ගැටළුවට විසඳුම් සෙවීමට ඔබතුමා අපවෙත ඉදිරිපත් කිරිම සම්බන්ධව ඇත්ත වශයෙන්ම ස්තුති වන්ත විය යුතුයි. මොකද හැම ගංවතුරක් වේලාවෙම මෙය තමයි මුල්වන කාරණය. ඔබතුමා මැදිහත්වෙලා ඒ ගංවතුරෙන් උවදුරට පත්වුණු සියළු දෙනාට ඔබතුමා මැදිහත් වෙලා ඒ සියළු දෙනාට ඉටු කර දෙනවා. මෙය පෙර කාලයේ සිටම තිබෙන ප්‍රශ්නයකි. මා හිතන්නේ දැන් මෙය අවබෝධ කරගෙන තිබෙනවා. දැන් මොහු මේ සම්බන්ධව හොඳ දැනුමක් තිබෙන කෙනෙකි. ප්‍රායෝගිකව. මොකද ඒ ප්‍රදේශවල ජීවත්වෙලා , ඒ වගේම ධීවර කර්මාන්තය සම්බන්ධවත් , ගඟ සම්බන්ධවත් , ප්‍රදේශයේ ජීවත්වන වැසියෙක් හැටියට අධ්‍යනයකින් යුතුව කර තිබෙනවා. අපි බලන්න ඕන දැන් මෙය කොහොමද ක්‍රියාත්මක කරන්නේ දැන්. ඔය කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. මෝය කටේ ඉවත් කරන්නේ ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියත් හිටියා. උඩ තිබෙන ගල් විතරයි. බැකෝ එකේ ඒ දිග ප්‍රමාණයට තමයි ඔය ගල්ටික අයින් කරන්නේ ඒ ජනතාව සතුටු වෙන්න. නමුත් ඊට වඩා ගැඹුරු දෙයක් මෙහි

තිබෙනවා.ඒ ගල් ඉවත් කිරීම , පළල් කිරීම හා මෝය කට වෙනස් කිරීම. ප්‍රායෝගිකව කෙරෙන්න ඕන දේවල්. නමුත් මෙයට විශාල වශයෙන් මුදල් වැයවෙනවා. අනිත් එක තමයි වතුර බැස්සේ ක්‍රමවේදය. දැන් සුනාමි අවස්ථාවේ තනිකර රේල් පිල්ලක් එහි යට තිබෙනවා. තව වාහන හරි මොනවා හරිත් තිබෙනවා මෙහි යට. ඒවා ගොඩ ගත්තේ නැහැ. තවම එවා තිබෙනවා. මමත් ඔබතුමාත් ඒ කාලයේ බලන්න ගියා. නමුත් මේවා ගොඩ ගැසීමට අපහසු නිසා ඒවා එහෙමම තිබෙනවා. ඇවිත් රොඩු හිරවෙලා ඇවිත් එක එක දේවල් හිරවෙච්ච නිසා තමයි ඔය ගැටළු. විවර වී ඇති ටිකෙන් තමයි ඔය වතුර ටික යන්නේ. එමනිසා ඔබතුමාට යම් කාර්ය භාර්යයක් කරන්න පුළුවන් නිසා තමයි ඔබතුමාට එය කරන්න පුළුවන් වෙන්නේ. එමනිසා ඔබතුමා ගරු විෂයභාර අමාත්‍යතුමා හේ මුණ ගැසි මෙය විශේෂ කටයුත්තක් සේ සලකා මෙය ඉටු කරන්න. ඒ කාර්ය ඉංජිනේරු මහතුන්ගේ උපදෙස් පරිදි ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඔය කියන්න වගේ පලාදූව, මහ අම්බලන්ගොඩ , පනියන්දූව , පෝරඹ ආදි විශාල ප්‍රදේශ ගණනාවක් යටවෙනවා. එම යටවීම තුළ විශේෂයෙන්ම හානි දායක වෙන්නේ නගර සභාව සොයාගෙන තමයි එන්නේ. අපේ කොට්ඨාශයේ. නගර සභාව නොකොළොත් එහෙම බනිනවා. ඔබතුමා ඒ යුතුකම හා කාර්ය භාර්ය හරියට ඉටු කළා. ඒ වගේම මේ කාර්යත් ඉටු කරන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මෙය ගැඹුරු කාර්යයක් . මෙය අධ්‍යානය කරලා මෙයත් ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

ඇත්තටම මේ කාරණය සම්බන්ධව මා සමඟ පැය දෙකක් විතර කතා කළා. කතා කරලා එතුමාගේ තිබෙන අවබෝධය නිසා තමයි කිවුවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කරන ලද අසාර්ථක දෙයක් බව. නමුත් 1968 මෙය ඉදිකරන විට එම ගල්ටික හැම වසරකටම වරක් පෙරළෙනෙවා. හැම වසරකටම වරක් වාරිමාර්ගයෙන් මෙය මුදල් වෙන්කර ආයිත් ගල් උඩට දමනවා. ආයේ ඊළඟ වාරකන් කාලේ ගල් නැවත වැටෙනවා. නැවත අයිත් උඩට දමනවා. මෙය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැන් සිටින ඉංජිනේරු මහතුන්ට හා නිලධාරින්ට මෙය ඉතා වාසිදායක දෙයක් බවට පත්වෙලා තිබෙනවා. මේ ගල් උඩට දැම්මයි පහතට දැම්මේ කොන්ත්‍රාත්තුව. එමනිසා මෙයට නියම පිළිතුර ලැබෙන්නේ නැහැ කියන අදහසින් තමයි ගාමිණි මහතා ඇත්ත වශයෙන්ම සිටින්නේ.එමනිසා එතුමා කියපු දෙය තමයි කලින් වතුර පාර බැසපු තැනින් තමයි මේ ගල්බැම්ම දමා තිබෙන්නේ. එතකොට තිබුණ වතුර බසින ප්‍රමාණය සම්පූර්ණම වසා තමයි තිබෙන්නේ. වෙනදා බෝට්ටු ඔතනට අරන් තිබෙනවා. ඉතිං එතුමාගේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවකි. මේ මෝය කට ඉවත් කර එතුමා යෝජනා කරන්නේ දැන් මේ කියන ඇළ වල්වල මෝයකට දැම්මානම් කරදිය මුසුවීම නැතිවෙනවා. මේ දෙය ඒ විදියට කරන්න කියා. තවම ක්‍රියාත්මක වෙන්නේ නැති මෝය කටවල් තිබෙනවා. හල්වතුර ඇළේ, පනියන්දූව ඇළේ, යාල දූවේ තිබෙනවා. ඒ විදියට මෙය ගොඩනගා ගෙන ඇවිත් තිබෙනවා වගාව සඳහා . කල් යාමේදී එම ව්‍යාපෘතිය අතහැර දමා තිබෙනවා. කරදිය මුසුවීම එය ගණන් ගන්නේ නැතිව තිබිලා තියෙනවා. ඇත්ත වශයෙන්ම ඔහු කියන දෙයක් තමයි වෙනදා කකුළුවෝ සංඛ්‍යාවක් අපේ වෙළඳපොළට ගෙනාවාද? දැන් කුකුළුවෙක් අසුවෙන්නේ නැහැ කියා. මාදම්පා මෝය කටේ. එමනිසා මෙයට මේ කටයුත්ත කරනවා නම් යෝග්‍යයයි කියා යෝජනා කළේ . එමනිසා තමයි එතුමාගේ යෝජනාව දැම්මේ. අළුත් දේවල් අපට හිතන්න අළුත් දේවල් අපට කල්පනා කරන්න යොමු කර තිබෙන්නේ. මට කටින් කිවු සමහර දේවල් කියන් බැහැ. මේ මාදම්පා ගඟ කියන එක සමහර නිලධාරින්ගේ ජීවන වෘත්තියක් වෙලා තිබෙනවා. ඉස්සෝ එහෙම නෙමේ. ඉංජිනේරු මහත්වරුන්ගේ වෘත්තියක් බවට පත්වෙලා තිබෙනවා. වසරක් වෙනකන් බලාගෙන ඉන්නවා මේ අය. දැන් මේ ගල්ටික මෙතැනට වැටෙනවා. මෙක දැන් අයින් කරන්න ඕන. හැමදාම එය සිද්ධ වෙනවා. හැම ආණ්ඩුව මොන පක්ෂය ආවත් මෙතැන ගල් වැටුණාම ගංවතුර එනවිට කොහොම හරි මුදල් සොයා දී අපි එම වැඩය කරන්න

කියනවා. නමුත් මෙක නෙමේ හැමදාම මේ තත්ත්වය වෙනස් කරන එක තමයි එතුමා අසන්නේ. එමනිසා අපි කල්පනා කරන්න ඕන නියම පිළිතුරක් මෙතැනට ගන්න එක. නියම පිළිතුර තිබෙන්නේ මෙතැන සිටින අසල්වාසින් , ධිවරයෝ ඒ සියළු දෙනාගේ දැක්ම මත තමයි අපි මෙතැන හදන්න ඕන. දැනට එතුමා කිවු දෙයක් තමයි මේ වතුර බැසපු තැන දැන් හෝටලයක් ඉදිකරගෙන යනවා. එහා පැත්තේ . අර ලයිට් හවුස් වගේ හෝටලය ඉදිකරගෙන යන්නේ හෝටලය ඉදිකරපු තැන. එය නියමානුකුලව ඇති කරනවා නම් අපිට ලොකු ප්‍රශ්නයකට මුහුණ පාන්න වෙනවා. අපි සියළු දෙනා එකතුවෙලා ඒ කාලයේ සිට දැන් වසර 50ක් විතර ස්භාවධර්මයට විරුද්ධව කටයුතු කිරිම නිසා තමයි දැන් එහි ප්‍රතිඵල විදියට මේ අත්විදින්නේ. එමනිසා මෙය අපි සාකච්ඡා විය යුතුයි. සාකච්ඡා කර ඇත්ත ජනතාවටත් දැනුම් දිලා මෙය නිලධාරින්ටත් දැනුම් දිලා නියම විදියට වැඩ කරන්න කියන හැඟිමෙන් තමයි මා මෙය ඉදිරිපත් කළේ. මෙහි වැඩිම ප්‍රතිලාභ තිබෙන්නේ රත්ගම ආසනයට වඩා අම්බලන්ගොඩ ආසනයටයි තිබෙන්නේ. මෙහි කරදරයේ තිබෙන්නේ අපට . එම කරදරයෙන් අපි මිදෙන්න ඕන. දැන් අපේ තල්ගස්ගොඩ ප්‍රදේශය ගත්තාත් කරදිය මිශ්‍ර වෙච්ච ජලය තිබෙන්නේ. ඉතිං එවා ජලය බවට පත්කිරිමේ යම්කිසි වැඩ කොටසක් අපි ඉෂ්ඨ කරන්න ඕන. ඒ අනුව අපි සියළු ගරු මන්ත්‍රිවරුන් දැනගෙන මේ අනුව ඉදිරියට කටයුතු කරන ලෙස යෝජනා කරනවා.

**තීරණය -**

මාදම්පා මෝදර ගැටළුව විසඳිම යන මැයෙන් රත්ගම ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රි එන්. ගාමිණි ද සිල්වා මහතා විසින් නීති සම්පාදන හා මානව හිමිකම් රාජ්‍ය අමාත්‍ය වෙත යොමුකරන ලද පිටපත් ලිපිය ගරු සභාවේ දැන ගැනිම පිනිස ඉදිරිපත් කරන ලදි.

**03.05 මානිම්මුල්ල නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතිය යන මැයෙන් පනියන්දුව ප්‍රජා මණ්ඩලය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී ( රු. 100000/= ක මුදලක් ඉල්ලිම් කිරිම )**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මානිම්මුල්ල නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතියේ වැඩ කරගෙන යන බවත් මේ දක්වා සැහෙන මුදලක් වැය කොට ඇත. කාලගුණික හේතුන් මත වැඩ කරගෙන යාමේදි මුදල් අතින් ඉතා අසිරුතාවයට පත්ව ඇති බැවින් අප සමිතියේ ගිණුමෙන් රු.100000/= ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. එම මුදල කොන්ත්‍රාතුවේ ගෙවීමට ඇති මුදලින් ( අයවිය යුතු මුදලින්රු. 550,000/=) වැඩ අවසන් කිරිමෙන් පසු ගෙවීමට ඇති මුදලින් සමිතියට ලැබිය යුතු 5% මුදල ( රු 27500/=) හා අප සමිතියෙන් මේ සඳහා ලබා දුන් ඉහත රු. 100000/= මුදල අඩු කරගෙන ඉතිරි මුදල් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**තීරණය -**

පනියන්දුව ප්‍රජා මණ්ඩලය විසින් මානිම්මුල්ල නිවාස යෝජනා ක්‍රමයේ කාණු පද්ධතිය ඉදිකරගෙන යාමේදි මුදල් අතින් අසිරුතාවයට පත්ව ඇති බව දන්වා ඇති අතර එම සමිතියේ ගිණුමේ ඇති මුදලින් රු. 100,000/= ක මුදලක් ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා

විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය   කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගාමිණී මහතා විසින් එවන ලද ලිපියේ පිටපතක් ලබා දෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දෙන්නම්.ඒකෙ පිටපතක් දෙන්න.

**03.06 අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයට මිලදීගත් කාපට් එක පිරිසිදු කිරීම සඳහා භූවර් එකක් ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය සඳහා භූවර් එකක් ලබාගැනීම නොවැම්බර් මස ක්‍රීඩා කමිටුවේදී යෝජනා වූ පරිදි 2019 දෙසැම්බර් සභාවේදී සම්මත වූ පරිදි අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයට මිලදීගත් කාපට් එක පිරිසිදු කිරීම සඳහා භූවර් එකක් ලබාගැනීමට තීරණය විය. එම උපකරණය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය:-**

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයට මිලදීගත් කාපට් එක පිරිසිදු කිරීම සඳහා භූවර් එකක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති ලිපිය අනුව  එය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව අනුව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.07** ප්‍රසිද්ධ ධර්ම දේශනාවක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීමක් නොමිලයේ ප්‍රසිද්ධ දැන්වීම් පුවරුවේ එලකිරීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ , කළුවඩුමුල්ල, සුමනදාස මාවත, අංක 137/1 ලිපිනයේ පදිංචි බී.ජී.හේමවතී මහත්මිය විසින්  එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බී.ජී.හේමවතී , අංක 137/1, සුමනදාස මාවත, කළුවඩුමුල්ල,අම්බලන්ගොඩ. බී.ජී.හේමවතී වන මම ප්‍රසිද්ධ ධර්ම දේශනාවක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීමක් ප්‍රසිද්ධ දැන්වීම් පුවරුවේ එලකරවා ගැනීම සඳහා ඔබතුමාගේ කාරුණික අවසරය ලබාගැනීමට අවශ්‍යාව ඇත.ඒ නිසා මේ සඳහා අවසරය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.නොමිලයේ ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය   කතා කරමින්</u>

එය ලබා දෙන්න. ධර්ම දේශණාවක් නිසා එය නොමිලේ ලබා දෙන්න.

**තීරණය**

ප්‍රසිද්ධ ධර්ම දේශනාවක් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීමක් නොමිලයේ ප්‍රසිද්ධ දැන්වීම් පුවරුවේ එලකිරීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ , කළුවඩුමුල්ල, සුමනදාස මාවත, අංක 137/1 ලිපිනයේ පදිංචි බී.ජී.හේමවතී මහත්මිය විසින් එවා ඇති ලිපිය අනුව ඒ සඳහා අවසර ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව අනුව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.08** අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති "සපිරි ගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 අනුව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රජාකමිටු රැස්වීම් පවත්වා ලබාගත් යෝජනා ඇතුළත් ලේඛණය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සපිරි ගමක් ප්‍රජා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 .මේකෙ මේ විදියට යෝජනා තියෙනවා. එවන ලද යෝජනා අතර එම යෝජනාවලින් සමහර ඒව වෙනස් කරල යවන්න සිද්ධ වුණා. ඒ අනුව අපට එවල තියෙන යෝජනා තමයි මහඅම්බලන්ගොඩ පිට්ටනිය ඉදිරිපසින් ඇති කාණුවේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම. සර්විස් සෙන්ටර් එක ජලය බැසයාම සඳහා අඩි 75 ක් පමණ. දෙවැනි කරුණ විජේවික්‍රම නිවාස යෝජනා ක්‍රමය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හා සපත්තු කාණුව දැමීම .

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , එතකොට අපිට අඩුයිනේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේ මහජනතාව යෝජනා කරපු ඒව තමයි. පළවෙනි එකට ලක්ෂ දාහතරයි.දෙවැනි එකට ලක්ෂ හයයි. ඊලඟට හිරේවත්ත.හිරේවත්ත ආපු එකේ අපි සංශෝධනය කරල තියෙනව මේ විදියට. හිරේවත්ත ගම්මානයට කරවල විකිණීම සඳහා ජංගම රථයක් ලබාදීම.මං ඒක අයින් කරන්න කියල ඉල්ලීමක් කළා. මොකද ජංගම රථයක් තිබ්බොත් පාරෙ විකුණන්න ගිහිල්ල හරි ප්‍රශ්නයක් වෙනවා අපිට. ඊලඟට නම්බිමුල්ල හරස්පාරේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම ලක්ෂ පහයි. පල්ලියගොඩ අග්‍රා මහත්මියගේ නිවස අසල ප්‍රතිසංස්කරණය කිරීම ලක්ෂ පහයි. නම්බිමුල්ල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම. ඒ සඳහා හිරේවත්ත මේ විදියට වෙනස් කරල යවල තියෙනවා. නම්බිමුල්ල හරස් පාරේ මීටර් 80 ක් කොන්ක්‍රීට් කිරීම සඳහා අප එකඟයි.ඒ නිසා හිරේවත්ත පුස්තකාලය අසල ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම ලක්ෂ පහයි. පුස්තකාලය,පෙරපාසල් ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම ලක්ෂ දහයක් ලෙස සංශෝධනය කරල තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි මං ඔය සංශෝධනවලට විරුද්ධ නැහැ.ඒත් අර අග්‍රා මහත්මියගෙ නිවස අසල පාර හදල දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අපි හදල දෙනවා ඒ පාර.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ යෝජනා ගැන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ජනහමු පැවැත්වුවා. මන් දන්නෙ නැහැ අපේ මන්ත්‍රිවරුන්ද ගරු සභාපතිතුමාද කවුද මං දන්නෙ නැහැ ඒවට සහභාගී වෙන්න එපා කියල රාවයක් ගියා. මම නම් සහභාගි වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සියළුම මන්ත්‍රිවරුන්ට රැස්වීම් තියෙන වෙලාවල් ඔක්කොම මං යවල තියෙන්නෙ. සහභාගී වෙන්න කියල තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගම්පෙරළිය වැඩසටහන් කරනකොට මහජන නියෝජිතයො වශයෙන් අපි දැනුවත් නොවුණු නිසා මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරන රැස්වීම්වලට සහභාගී වීම අවශ්‍ය නැහැයි කියල අදහසක් ගියා. මම නම් ගියා .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි හරි. ඒ ගිහිපු ටික මට ආපහු ඇවිත් තියෙනවා . ඒකෙ මගෙ අනුමැතිය සහිතව එනකොට මං ඒක දීල තියෙන්නෙ යම් යම් වෙනස්කම් සහිතව.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවපු සපිරි ගමක් වැඩසටහනේ ලිපිය සම්බන්ධව මාර්ග කිහිපයක්

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉන්න මං මේ ලැයිස්තුව කියනකන්.ඊලඟට කරිත්තකන්ද යෝජනා කරල තියෙනව හල්වතුර කුලරත්න හරස් පාර ඉදිකරන බම්පර් දෙකක් ඉදිකිරීම කියල මීටර් 500 ක් ලක්ෂ විස්සම දාල තියෙනවා. ඒක වෙනස් කළා මේ විදියට. කරිත්තකන්ද ග්‍රාමසේවා කොට්ඨාසය සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකිරීමට ලක්ෂ 20 වෙන්කරල තියෙනවා. අපේ ගරු මන්ත්‍රිතුමාගෙත් එකඟත්වය පරිදි. ඊලඟට හෙප්පුමුල්ල ආර්.ඊ ද සිල්වා මාවත ප්‍රතිසංස්කරණය කිරීම ලක්ෂ 20 ම වෙන්කරල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ආර්.ඊ ද සිල්වා මාවත ප්‍රාදේශීය ලේකම් කාරියාලයෙන් මැන්නෙ ඊයෙ ඇවිල්ල. ඒ අය දැන් පන්සලේ උඩ ඉඳල පල්ලෙහාට පටබැඳිමුල්ලට අයිතියි කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි අපි ඒක කරන්නම් .ගැටලුවක් නැහැ.ඊලඟට විලේගොඩ අකුර අධ්‍යාපන ආයතනය මාවත කොන්ක්‍රීට් කිරීම ලක්ෂ 05 යි. ගෞරි මහත්මියගේ නිවස අසල දක්වා එස්.ජේ. සිල්වා මාවත අවසාන කොටස කොන්ක්‍රීට් කිරීම ලක්ෂ 05 යි. හිරිගල්දූව මාර්ගයේ අවසාන කොටස කොන්ක්‍රීට් කිරීම ලක්ෂ 05 යි. හින්ඇළ පළමුවන මාර්ගයේ තාර දමා සර්විස් කිරීම ලක්ෂ 05 යි. ඒක ඒ විදියටම අනුමත කරල තියෙනවා. පනියන්දූවෙ යෝජනා ඇවිල්ල තියෙන්නෙ මේවයි. තොටුපොල පාරේ

මට්ටම උස්සා තාර දැමීම. පනියන්දුව වටරවුම් පාර ලකෂ 05 යි. පනියන්දුව පාරේ ජිම්සන් මහතාගේ නිවස අසල වම සපත්තු කාණුව දකුණ පැති කාණුව සකස් කිරීම ලක්ෂ 05 යි. එඬේරමුල්ල පාරේ යශෝමා ජයබිම මහත්මියගේ නිවස අසල සිට මීටර් 125 ක් කාණුව සකස් කිරීම ලක්ෂ 05 යි. රූපා අයිරාංගනී මහත්මියගේ නිවස අසල කාණුව සකස් කිරීම ලක්ෂ 05 යි. පනියන්දුව මෙන්න මේ විදියට වෙනස්කරල තියෙනවා.එඬේරමුල්ල මානාන පාර යාකරන පාලම සංවර්ධනය කිරීම ලක්ෂ 05 යි. මහ පන්සල පාරේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම ලක්ෂ 05 යි. පනියන්දුව පාරේ වම් පස දකුණු පස පැති කාණුව ඉදිකිරීම ලක්ෂ 10 යි.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මානාන පාරේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. එතන ලොකු ඇළක් තියෙනවා.ඇළ වැහීගෙන යනවා. ප්‍රදේශයේ ජනතාව යටවෙනවා.ඔබතුමා ඒකට පොඩ්ඩක් මැදිහත්වෙලා බලලා අධීක්ෂණය කරල නීත්‍යානුකූලව කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රදේශයේ ජනතාවගෙන් පරිදි තමයි පාර හැදුවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

පාර හදනකොට පොඩ්ඩක් එතන ගිහිල්ල බලන්න.ඇළක් නැති තරමට මේවවෙලා තියෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙනම් අපි ඒක සුද්ද කරමු. කළුවඩුමුල්ල මාර්ගසති පාර කොන්ක්‍රීට් කිරීම සංවර්ධනය කිරීම. පැතිබැම්ම සහ පීරිස් වෙද මාවත ආරම්භයේ සිට කොන්ක්‍රීට් කිරීම ලක්ෂ 20 ම වෙන්කරල තියෙනවා. කෙරමිණිය පොකුණ පාරේ ආරම්භක ස්ථානයේ යූ කාණුව මීටර් 150 ක් පමණ ලක්ෂ 07 යි. පින්නදූව සුනාමි නිවාස මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම අවසාන කොටස ලක්ෂ 07 යි. පින්නදූව පටුමගේ හතරවන මාර්ගයේ ඇති සැපයුම් විදුලි කණු මැදින් පාර අයිනට වන පැති කාණුව ගොඩනැගීම ලක්ෂ 06 යි. වෙන්කරල තියෙනව ඒ වදියට. පෝරඹ මංසන්ධියේ සිට සුගත බිම්බාරාමය පාර අවසානය දක්වා තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම. පන්සල පාර ඉදිරිපිට සිට අවසානය දක්වා ඉදිකිරීම ලක්ෂ 15 යි. පන්සල අසල සිට තොටුපොල දක්වා ඇති දකුණු පස කාණුව ස්ලැබ් දමා සංවර්ධනය කිරීම ලක්ෂ පහයි. ඒ විදියටම ඇතුල් කරල තියෙනවා. වෙනස් කළේ නැහැ.ඊලඟට තල්ගස්ගොඩ සුදුවැල්ල පාරේ බේකරිය අසල සිට එක් පැත්තකට පැති කාණුව සකස් කිරීම ලක්ෂ 15 යි. නිව්යෝර්ක් ගම්මානයට යන ප්‍රවේශ මාර්ගය සකස් කිරීම ලක්ෂ 05 යි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඕක වැරදියි. නිව්යෝර්ක් ගම්මානයට ලක්ෂ 10 යි.සුදුවැල්ල පාරට ලක්ෂ 10 යි දාන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි .ඒක ඒ විදියට හදන්නම්.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

කාණුව ලක්ෂ 05 න් හදන්න බැහැ ගරු සභාපතිතුමා. සුදුවැල්ල පාරෙ කාණු සෑදීම ලක්ෂ 10 යි. ඒවගේම නිව්යෝර්ක් ගම්මානයට ලක්ෂ 10 යි .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

හරි.මං ඒක සංශෝධනය කරන්නම්. මම අර නිව්යෝර්ක් ගම්මානයට යන පාරට ඊට වැඩිය යයි කියල හිතල තමයි මම වෙන්කළේ ලක්ෂ 15 ක්.

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා අපි ලක්ෂ 05 ක් සුදුවැල්ල පාරට දැම්මොත් එහෙම ඒ කාණුවත් භාගෙට නවත්වන්න වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඒකෙ කීයද ඇස්තමේන්තුව.

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මට මතක හැටියට නමයයි ගානක් .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අර පාර ලක්ෂ 15 න් ඉවර කරන්න බැරිද?

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

බෑ.ඉවර කරන්න බැහැ. ඒ නිසා ඒකට 10යි. අදියර දෙකකින් තමයි කරන්න වෙන්නෙ ගරු සභාපතිතුමා. ඒ නිසා සුදුවැල්ල පාරෙත් කරන්න ඕන . මොකද

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

බෝක්කුවක් හදන්න තියෙනවනෙ ඒකෙ.

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ඔව්.බෝක්කුව හදන්න කොහොමත් ලක්ෂ 15 න් බැහැ. ඒ නිසා ලක්ෂ දහය දහය දාන්න ගරු සභාපතිතුමා. මං දැම්මෙ එහෙමයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මං වෙනස් කළේ බෝක්කුවක් හදන්න තියෙන නිසා. ඊලඟට ඕකන්ද පුස්තකාලය අසල විහාරගොඩ මාර්ගය සම්බන්ධ වන මාර්ගය දෙපස පාර සකසා ගල් අතුරා තාර දැමීම ලක්ෂ 20 යි. ඔන්න ඔය ටික තමයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

පොල්වත්තෙ කොටයාසෙ නැද්ද? ගරු සභාපතිතුමා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත කොට්ඨාසෙ තියෙනවා. නැද්ද කියවුණේ. පොල්වත්ත නුගේතුඩුව පළමුවන මර්සි මහත්මාගේ නිවස අසලින් ජගත් විජේනායක මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම ලක්ෂ 05 යි. නුගේතුඩුව පාරේ දයානන්ද මහතාගේ නිවස අසල සිට රන්ජන් මහතාගේ නිවස අසල දක්වා මාර්ගය පස් පුරවා කොන්ක්‍රීට් කිරීම ලක්ෂ 07 යි. මේ මිනිස්සුන්ගෙ නම් වෙනුවට වරිපනම් අංක යොදන්න පුරුදු වෙන්න මන්ත්‍රීවරුන්. නැත්නම් මේක හරිම අර්බුදයක්. පාරෙ වරිපනම් අංක හරි පාරෙ නමක් ඇතිනෙ. ඒ නම යොදන්න.ඊලඟට බුද්ධදත්ත මාවත ගලප්පත්ති මහතාගේ නිවස අසල සිට වාස් ගුණවර්ධන මහතාගේ නිවස අසල දක්වා සපත්තු කාණුව සැකසීම ඊට යාබද දයාවතී මහත්මියගේ නිවස අසල ඇළ දක්වා කාණු සකස් කිරීමට ලක්ෂ 08 යි.ඒ විදියට වෙන්කරල තියෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

පනියන්දූව පාරේ දෙපැත්තෙ කාණුවට ලක්ෂ 10 මදියි ගරු සභාපතිතුමා. ඒකට ලක්ෂ 15 ක් දාන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නෑ ඒකෙ ඉතුරු ගාන අපි දෙන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

ඒවගේම ගරු සභාපතිතුමා අපි හෙට වැඩක් පටන් ගන්නවා. විපුල මහතාගේ නිවස අසලින් කාණුව තියෙන්නෙ ඒක හෙට පටන් ගන්නවා

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

හරි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

අංක 01 ඕකන්ද පුස්තකාලයට ඇතුලු ඒ විහාරගොඩ පාරෙ මං හිතන්නෙ කරන කොටසට ලක්ෂ 20 න් ඒ කියපු කොටස කරාට දැන් අර ඔබතුමාට එදා කමිටුව වෙලාවෙත් කිව්වා බැමි කිහිපයක් බඳින්න තියෙනව කියල.ඒක අපේ ගානෙ හරි කරල දෙන්න කියල කියනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඕකන්දෙ බැම් බැඳීම කියන එක පුරුදුවෙලා තියෙන්නෙ.ඒ නිසා මන්ත්‍රීතුමා යෝජනා කරන්නම එපා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

නෑ නෑ. මෙක අත්‍යාවශයයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

බැම්මක් බැන්දොත් එක් පුද්ගලයෙකුගෙ විතරයි ප්‍රශ්නෙ තියෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

මේ කියන දේ අහගන්නකො පොඩ්ඩක් ඉස්සරවෙලා.මේකයි ගරු සභාපතිතුමා පාර හැදුවට වැඩක් නැහැ මල්ලිකාලගෙ ගේ ඉස්සරහ බැම්ම බදින්නෙ නැතුව පාර හැදුවට වැඩක් නැහැනෙ. වතුර පාර කඩාගෙන යනවා. ඊලඟට ෂාන් ඔබතුමා අර ඔප්පුව දුන්නෙ . ෂාන් මහත්තයට දීපු එකේ එතන ඉස්සරහා කාණුව බඳින්න ඕන අනිවාර්යෙන්ම. මොකද ඒක කඩාගෙන ගිහිල්ල තියෙන්නෙ. ඉතින් ඒ වගේ ඒව නගර සභාවෙන් කරන්නෙ නැත්නම් අපරාදෙ පාර හැදීමට විශාල මුදලක් වැය කරනවනෙ . මෙහා පැත්තෙ පතුලක් දාන්න තියෙනවා.ඔබතුමා බැඳපු කාණුවල පතුල් ගිහිල්ල දැන් තියෙන්නෙ. එක්ස්පයර්ඩ් වෙලානෙ තියෙන්නෙ.ඒනිසා ඒවත් දාන්න. ඒක ඉල්ලීමක් කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අර ලක්ෂ 20 ඇතුලෙ ඇස්තමේන්තු කරගන්න ඒක.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ඒක තමයි මං මේ කියන්න යන්නේ. දැන් ඇස්තමේන්තු කරන්න ඇවිල්ල තියෙනවා. මේගොල්ලො ඕක බලල ලක්ෂ 20 ටම ඇස්තමේන්තු කරාවි. නමුත් අවශ්‍ය දේවල් මම හිටියෙත් නැහැ බලාගෙන ගිහිල්ල කට්ටයගෙන් අහල කරගෙන ගිහිල්ල තියෙනව රැකියාව . අපි විශේෂයෙන් කියනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැඩක් කරනවනම් අපේ තාක්ෂණික නිලධාරී මහත්මා සම්බන්ධ කරන්න. නැත්නම් මම කරන්න දෙන්නෙත් නැහැ. මොකද හේතුව කලින් බැඳපු කරපු පාරවල් ඔක්කොම අවුල්. දැනට ප්‍රයෝජනයක් නැහැ. නැත්නම් ඉතින් අපිටත් හිරගෙවල්වල ඉන්න වෙනව මේව කතාකරන්න ගියාම.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා අපි මාස 03 ක් ඇතුළත මේක ඉවර කරන්න ඕන. ඒක නිසා මේක මේ විදියට යවන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ඔන්න ඕක තමයි අසාර්ථකම වැඩේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මං කියන දේ අහගෙන ඉන්න. කලින් අපි මේ විදියටම කළා. ඒ සියලුම සල්ලි නගර සභාවට ගෙන්නගෙන නගර සභාවෙන් තමයි ඉවර කළේ. දැනට මුළු රටේම මේක ප්‍රතිපත්තියක් නිසා ඒ ප්‍රතිපත්තිය වෙනස් කරන්න මට මාස 03 ක් දෙන්න. අපි කරගන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ඒක ප්‍රශ්නයක් නැහැ.ඒකෙන් කළාට කමක් නැහැ. තාක්ෂණ නිලධාරීන් අධීක්ෂණයට දාන්න පුළුවන්නෙ. වරදක් තියෙනවනම් පෙන්නල දෙන්න පුළුවන්නෙ. දැන් බලන්න පොල්වත්තපුර පාර හදල තියෙනවා.කාණුව තියෙන්නෙ කොහෙද කියල බලන්න ඔබතුමා. මිනිස්සු බනින බැනිලි. කවුරු කරත් හරියට වැඩේ නොකළොත් ඔබතුමාටත් බැනුම් අහන්න වෙනවා. අපිටත් බැනුම් අහන්න වෙනවා. මම නම් හැබැයි මෙහෙමයි කියන්නෙ. හරියට වැඩේ කරන්න.මොකද මේකෙ නමත් හොඳයි. මේකෙ මාතෘකාව සපිරි ගමක්ද මොකක්ද තියෙන්නෙ. සුපිරි ගමක්ද? සපිරි ගමක්. ඉතින් මේකෙ වැඩ ටික හරියට කරන්න.ඔබතුමා මැදිහත් වෙන්න. වැරදි තියෙනවනම් නිවැරදි කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ඒක දැන් අනිවාර්යයෙන්ම බලනවා.අපි යටතෙනෙ තියෙන්නෙ

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඔය පොල්වත්තපුර කියන එක බැලුවෙ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒක ගම්පෙරළිය යටතෙ කරපු වැඩක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

මොන පෙරළිය යටතෙ කරත් මහජනතාවෙ මුදල්නෙ මේ වැය කරන්නෙ.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ගරු රාහුල මන්ත්‍රීතුමා කිව්ව දේට මං එකඟ වෙනවා. මොකද හේතුව ගරු සභාපතිතුමා අපේ නිලධාරීන් නැතුව මේව ඇස්තමේන්තු හදන්න දෙන්න එපා. අපට ප්‍රශ්න ඇතිකරගන්න බැහැ නිලධාරීන් එක්ක.ඒ නිසා කරුනාකරල ඔබතුමා ඉල්ලීමක් කරන්න අදම ගරු සභාවෙ යෝජනා වුණා කියල මෙම කර්මාන්ත කරනකොට අපේ තාක්ෂණසේවා නිලධාරීන්ගෙ අධීක්ෂණය යටතේ කරන්න කියල. මොකද නැත්නම් ගැටලුවක් වෙනව ගරු සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි සපිරි ගමක් ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020. මධ්‍යම රජයෙන් ලක්ෂ 20 ක් දාල තියෙනවා. ප්‍රජා මණ්ඩල හරහා මේ යෝජනා ගත්තෙ. මං දැකපු ප්‍රායෝගික ගැටලු කිහිපයක් තියෙනවා. මං ඒක කියන්න කලින් මං මේකට උත්තරයක් දෙන්නම්. මගේ සහෝදර මන්ත්‍රීතුමා ගරු රාහුල මන්ත්‍රීතුමා කියපු දෙයක් ගැන. ගම්පෙරළියේ වැඩසටහන් පහත් තත්ත්වෙට දාල පොඩ්ඩක් කතාකළා. මං අවංකවම කියන්නම් ලොකු වැඩ කොටසක් කළා ගම්පෙරළියෙන්. යහපාලන ආණ්ඩුවෙන්. ඒවා මාධ්‍යයෙන් හරියට ප්‍රචාරණය වුණේ නැහැ. අවංකවම කියනවනම් මං කරපු වැඩ ටික මම ලඟ ඉඳන් මහන්සි වුණා ඇතිතටම.අච්චෙ පිච්චීගෙන. ලක්ෂ 60 ක 70 ක වගේ වැඩ කෙරුණා මගේ ගමේ. මා මුදල් ගෙන ගරු සංවිධායකතුමා හා මා එකතුවෙලා .හොඳ කොන්ත්‍රාත්කරුවන් අල්ලගෙන සුපිරියටම වැඩ කළා මං මගේ ගමේ.ගමට අවශ්‍ය විදියට.පාරක් බලන්න.කාණුවක් බලන්න. නියමෙට කරල ඇති ප්‍රාදේශීය සභාවෙ තාක්ෂණ නිලධාරීහු සම්බන්ධ වෙලා. මට ඒ ගැන කළකිරීමක් තියෙනවා ඔබ කියන විදියට ගම්පෙරළිය හැමතැනම එහෙම සිද්ධ වුණේ නැහැ මන්ත්‍රීතුමනි.මං දැක්ක දෙයක් තියෙනවා.ප්‍රායෝගික ගැටලු. විශේෂයෙන් අපේ නගර සභාවේ තාක්ෂණ නිලධාරී කෙනෙක් සම්බන්ධවීම ගැන අනිවාර්යය කළ යුතුයි.ඒක ගොඩක් වැදගත්. තව එකක් තියෙනවා අපේ මේ ගම්පෙරළියේ වැඩසටහනේ කාණු පද්ධතිවලට සල්ලි ගොඩක් ගියා. ඒ කියන්නෙ සමිතිවලට කිසි ප්‍රශ්නයක් නැහැ. සමිතිවලට 5% ගාන හම්බවෙනවා. මේක ප්‍රායෝගික ගැටලුව තියෙන්නෙ කොන්ත්‍රාත් කරන අයට.තාමත් මං හිතන්නෙ කෝටිගානක සල්ලි එනව දෙවන අදියර කරපු සල්ලි. ඇත්තටම ඒ මිනිස්සු අසරණ වෙලා තියෙන්නෙ . දැන් මේ ලක්ෂ 20 ක් ඇවිල් තියෙන්නෙ ලක්ෂ 20 වැඩ කරනකොට සමහරවිට කොන්ත්‍රාත්කරුවො හොයාගන්න බැරි ප්‍රශ්නෙකුත් ඒවි. කාණු පද්ධති ගියා. තව එකක් දාපු මිළ ගණන්. ඒ මිළ ගණන් දාල තියෙන්නෙ අවුරුදු ගානක රේට් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.පරණ මිළ ගණන්. සමහර වෙලාවට ප්‍රාදේශීය ලේකතුමිය සමග මම සෘජුව සම්බන්ධ වුණා කොන්ත්‍රාත් කරද්දි. සමිති

සම්බන්ධ වෙද්දිත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සම්බන්ධ වුණු සමිතිවලට විතරයි දුන්නෙ. ඒවයි ගිවිසුම් ගහල නැත්තම් තමයි ප්‍රාජා මණ්ඩල හරහා කමිටුවලට දුන්නෙ.විශේෂයෙන් ගොඩක් කාණු පද්ධති ගියා. ලාභය හින්දා පාරවල් කරනවා.කාණු පද්ධති ගියා ගොඩක්. දැනුත් මේ ප්‍රජා මණ්ඩල හරහා ගත්ත යෝජනායි සංවර්ධන යෝජනාවලට කාණු පද්ධති තියෙනවා.තව එකක් කාණු පද්ධති කිරීමේදී තාප්ප තියෙනවනෙ ලොකු ප්‍රශ්නයක් වුනානෙ.අපේ කෙනෙක් නැතිවුණානෙ. මානිමුල්ලෙ. මගේ මතයක් කියන්නෙ කාණු පද්ධති වැඩිය ගැඹුරට හාරන්න බැහැ.මොකද දිගටම තියෙන්නෙ තාප්ප. තාක්ෂණ නිලධාරීතුමන්ල එතනට ගිහිල්ල සම්බන්ධ වෙලා ප්‍රාදේශීය ලේකම් එකේ තාක්ෂණ නිලධාරීන් විතරක් නෙමෙ අපේ කෙනෙක් සම්බන්ධ වෙලා වැඩිය ගැඹුරු කරන්නෙ නැතිව ඒ තාප්ප ගැලවෙන්නෙ නැතිව ඒ උස මට්ටම අඩි 18 ටම හාරන්න ඕන නැහැ. ගැඹුර අඩුකරල ඒ ගැන අවධානය යොමුකරන්න කියල ඉල්ලමින් තව එකක් මේ ගම්පෙරළිය වැඩසටහන පහත් තත්ත්වෙට දාන්න එපා. ඒ වගේ හැම එකක්ම එහෙම සිද්ධ වුණේ නැහැ. තව එකක් සමහර ඒවට ඇස්තමේන්තු හදද්දි ලක්ෂ 10 එකට ඔබතුමා දාල තිබුණා වලව්වත්ත පාරෙ යෝජනාවක්.ඒ ගැන සතුටු වෙනවා. මං කලින් අපේ මාර්ගය සභාවට අත්පත් කළා. යෝජනාවක් දැම්මා . ලක්ෂ 10 ක් මීටර් 50 ක් වගේ තියෙන්නෙ ගරු සභාපතිතුමා එතන. මං ඒ පාර මැන්නා තාක්ෂණසේවා නිලධාරීන් එක්ක. සමහර තැන්වල කාණු බඳින්න බැහැ. ලක්ෂ 10 ක් තියෙන්නෙ මීටර් 50 ක් කියන්නෙ පළලත් අඩි 12 ක් විතර තියෙනවා. හරියට ඒ මුදල්වල උපරිම වටිනාකම ලැබෙන පරිදි කටයුතු කරන්න කියල මං ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඕකන්ද විහාරගොඩ පුස්තකාලෙ ළඟින් තියෙන පාරෙ ඇත්තටම ඔබතුමාගෙ කතාවත් පිළිගන්නවා . ගරු රාහුල මන්ත්‍රීතුමාගෙ කතාවත් පිළිගන්නවා . මොකද ප්‍රදේශයේ මන්ත්‍රී හැටියට. මට හිතෙනවා කෙසේවෙතත් පුද්ගලික එකක් වුණත් කරන්න දෙයක් නැහැ අපි ඒ වැඩේ පැති බැම් බඳින්නේ නැතිව කාණුව බැන්දොත් පාර හදන එකේ නියම ප්‍රයෝජනේ අපිට හම්බවෙන්නෙ නැහැ. යටින් ඌරු මීයො හාරල ආයෙ පාර කඩාගෙන වැටෙන්නත් පුළුවන්. ඒ නිසා අපි අධීක්ෂණය කරලා ඒ පැති බැම් ටිකත් අපි නගර සභාවෙ වියදමෙන් හරි කරල දෙන්න කියල මං ඉල්ලා සිටිනවා.නැත්නම් ලක්ෂ 20 න් කරන වැඩේ නියම ප්‍රතිඵලේ අපට ලැබෙන්නෙ නැහැ. මං යෝජනා කරනවා ඒක කරමු කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඕකන්ද ග්‍රාමයේ මේ විහාරගොඩ මාවත වෙනුවෙන් මුදල් වෙන්කරගෙන තිබුණා.අපිට ඒක කරගන්න බැරිවුණා. මම ඔබතුමාට කියනවා ලක්ෂ 11 ක් අපේ ඉල්ලීම මත පැති බැම්වලට වෙන්කරල තියෙනවා. ඒ ලක්ෂ 11 ත් ඒකට යටකරල පැති බැම් ටිකත් හදන්න. එතකොට තමයි මේක සාර්ථක පාරක් වෙන්නේ. නැත්නම් දැන් මෙතුම කිව්ව වගේ මේක හදල වැඩක් නැහැ පැති බැම් හදන්නෙ නැතිව. මං හිතන්නෙ ඒකෙ ඇස්තමේන්තු තාක්ෂණ නිලධාරීතුමා හදල ඇති. ඇත්තටම අපි සතුටු වෙනවා දැන් පටබැදිමුල්ලෙ ධීවරයින්ගේ දැල් මැසීම සඳහා යෝජනා කළේ මෙතුමිය ධීවර ශාලාවක් හදල දෙන්න කියල මං හිතන්නෙ ඒකට ගරු මනුෂ නානායක්කාර මැතිතුමා ලක්ෂ 20 ක් වෙන්කරල දුන්නා. නමුත් නිර්නාමික දුරකථන ඇමතුම්වලින් ඉඩමෙ අවුලක් තියෙනව අනංමනං කියල ලොකු බාධාවක් වුනා. ගරු නගර සභා මන්ත්‍රී පේෂලා කුමාරි මහත්මිය දැඩි මහන්සියක් ගත්තා මේක හදන්න. නමුත් ඒකත් හදාගන්න බැරිවුණා. අපි සතුටු වෙනවා ඔබතුමා ඒකත් දාල ඒකත් හදන එක ගැන. කොහොමහරි අපි නගර සභාවෙ මොන රජයෙන් කළත් අපිට අත්‍යාවශ්‍ය දේවල් කරන්නෙ. ඒ රජයෙන් කළත් මේ රජයෙන් කළත් අපි හැමෝම මෙතුම කිව්ව වගේ අපේ තාක්ෂණසේවා නිලධාරීන්ට ලොකු වගකීමක් තියෙනවා ප්‍රාදේශීය ලේකම්

කාර්යාලයෙන් කවුරු කළත් මේ නගර සභා සීමාව තුළ හැදෙන දේවල්.ඔබතුමා සම්පූර්ණ ශක්තිය දෙන්න මෙතුමලට ඒවා අධ්‍යානය කරන්න අධීක්ෂණය කරන්න. මොන කොන්ත්‍රාත්කරු කළත් ගෙවීම් කරන්න එපා හරියට කරන්නෙ නැත්නම්. මොකද අපේ සල්ලි. අපේ මේ සපිරි ගමක් කියල දෙන්නෙත් මහජනතාවගෙ මුදල්. ගම්පෙරළිය කියල දුන්නෙත් මහජනතාවගෙ මුදල්. මේව හරියට සුරකින විදියට වැඩකරන්න ඕන. ඒ යෝජනාවත් මම කරනවා. ඒ වගේම අනිවාර්යයෙන්ම ඕකන්ද පැතිබැම්ම වැඩේ නම් කරන්න ඕන ඔබතුමා කිව්ව වගේ. මේ ගමන්ම ඔබතුමාට තව එකක් කියන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කතාවම මීට අවුරුදු 10 කට විතර කලින් ගරු රහුල මන්ත්‍රීතුමත් කිව්වා. බැම්ම බැන්දෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඒ ප්‍රදේශෙ කඩා වැටෙනවනෙ ගරු සභාපතිතුමා.ඒකයි වෙලා තියෙන්නෙ.නගර සභාවෙ ප්‍රජාශාලාවට දැන් ඔබතුමාල වතුර දීල තියෙනවා.බට ලයින් එක දීල නැහැ.සප්ලයි එකේ මීටරේ විතරක් දීල. පාර කඩල පාරෙ යන්න බැහැ. ගමට ගිය ගමන් කියනව බලන්න මිස් මේකෙ ග්‍රාම නිලධාරීගෙ තැනටවත් වැසිකිළියටවත් වතුර පද්ධතියෙ බට දාල නැහැ කියල. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒක අත්‍යාවශ්‍ය දෙයක්. ග්‍රාම නිලධාරී,සමෘද්ධි නිලධාරී ඕක්කොම ඉන්නෙ ඒකෙ. නිල සෙවණ කළේ නැහැනෙ. ප්‍රජාශාලාවෙනෙ ඉන්නෙ.දැන් ඉතින් ඒ අයට ඒ පහසුකම් අවශ්‍ය බට ටික සලස්වා දෙන්න කියල කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ ගරු රාහුල මන්ත්‍රීතුමා ඒක කරනව කියල කිව්වනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මට සල්ලි නැහැ.තියෙනවනම් මං කරනවනෙ.මම ධනපතියෙක් නම් මේ සභාවට කිසිම දෙයක් කරන්නෙ නැහැ ලංකාවට සියලුම දේ කරනවා.මට එහෙම සල්ලි නැහැනෙ. මං එහෙම උපයන්නෙත් නැහැ. මං දානපතියෙක් නම් ඕකන්දෙ, කළුවඩුමුල්ලෙ කිසිම පාරක් මේ සභාවට දාන්නෙ නැහැ.මං ඒ පාරවල් ටික හදල දානව දඩබඩ ගාල. මට එහෙම නැහැනෙ.ඒ නිසා මං කියන්නෙ බට ටික දාල ඒ වැඩ ටික කරන්න. ගරු සභාපතිතුමා ඒක අත්‍යාවශ්‍යම දෙයක්. වතුර දුන්නට වැඩක් නැහැ.වැඩේ කෙරෙන්නෙ නැහැනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි කළුවඩුමුල්ල ප්‍රජා මණ්ඩලයට රැස්වෙද්දි ගරු ධම්මික මන්ත්‍රීතුමාට සහභාගී වෙන්න බැරිවෙලා නියෝජිතයෙක් එවල තිබ්බෙ. මමත් යනකොට ප්‍රමාද වෙලා.කොහොමහරි ඒ ගෙනාපු යෝජනාවට මම එකඟ වුණත් නමුත් ඒ පාරෙ එක ගැටලුවක් තියෙනවා. එක තැනක පොඩි ගැටලු සහගත තැනක් තියෙනවා ගයාන් මහත්තයගෙ ගේ ළඟ. අපි මේ මුදල් වියදම් කරනවා ගැටලු සහිත පාරකට. ඒකෙදි ගරු සභාපතිතුමා දෙන විසඳුම මොකක්ද? මුදල් වියදම් කිරීම පිළිබඳව මට කොහෙත්ම ගැටලුවක් නැහැ. මම ගරු ධම්මික මන්ත්‍රීතුමාගෙ යෝජනාවට එකග වුණා. අපි මේ මුදල් යොදවනකොට මාර්ගය නිරවුල් කරන්නම ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අත්පත් කරනව අඩි 20 ට සල්ලි බැදල තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඒ ගැන අදහසක් ප්‍රකාශ කරන්න ඒන. දැන් ඔය පාර ඔය ප්‍රශ්නෙ හින්ද හැදෙන්නෙ නැතිව අවුරුදු ගානක් තියෙනවා. හැමදාම පාරෙ කට්ටිය බනිනව නගර සභාවට පාර හදන්නෙ නැහැයි කියල. අවසානයේ කොහොමහරි පාරෙ කට්ටියත් ස්ථාවරේකට ඇවිල්ල මේ විදියටහරි පාර හදල දෙන්න කියල කිව්වා. මේක නොකරොත් මේ ලක්ෂ 20 ත් ඔය පාර හදන්නෙ නැතිව යනවා. දැනට ඔය ටික අපි ඔහොම කරල අර දෙවැනි අදියරේදි ඔය අත්පත් කරන එක අත්පත් කරගන්න. සුළු කොටසක්නෙ. නැත්නම් ඕක මෙතෙන්ට ඇදල දා ගත්තොත් පාර හැදෙන්නෙ නැහැ ආපහු.අර මිනිස්සු නඩු යනවා. මිනිස්සු ළඟත් ලියකියවිලි තියෙනවා.අවුරුදු ගානක් එහෙමෙහෙ වෙවී තියෙයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා මේක හිටපු ගරු සභාපති ජී.එම්.එස් ද  සිල්වා මහතාගෙ කාලෙදි අත්පත්කර ගැනීමේ නියෝග ගහල රුපියල් හැත්තැපන්දාහක් දැනටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බැඳලා වැඩ කරගෙන යනවා. ඒ අතරතුරදි තමයි මිනිස්සු එකතුවෙලා අපිට අඩි 10 කින් මේ පාර සම්බන්ධ කරන්න ඉඩ දුන්නේ. දැන් ඒක 10 න් ඒ මහත්තය ඒකට එකඟ නැත්නම් අඩි 20 ක් යාවි හැමෝ'ගෙන්ම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා  කතා කරමින්</u>**

මම කියන්නෙ ඒක. එහෙම කරන්න . හැබැයි මේ වැඩේ නවත්වන්න එපා මේ කෑල්ල නිසා. නැත්නම් පාර කඩාගෙන ගිහිල්ල දැන් ඉස්සරහ පාරත් පාවිච්චි කරන්න බැරි තත්ත්වෙට ඇවිල්ල තියෙන්නෙ. ඒ කියන්නෙ පාරෙන් වැඩක් නැති වෙනවා ඔය ටික කළේ නැත්නම්.ඒ කියන්නෙ වාහනයක් යන්න බැරි වෙනවා. ඒ නිසා මං කියන්නෙ ප්‍රදේශයේ අයත් කැමතිනෙ පාර පාවිච්චි කරන අයත් ඔය ගානට හරි හදල දෙන්න නැත්නම් අපට පාර නැතිවෙනව කියලනෙ කියන්නෙ. ඒ නිසා ගරු සරත් මන්ත්‍රීතුමා අපි මේක මේ විදියටම හදමු. හැබැයි දෙවැනි අදියරේදි ඒ පිළිවෙල ගෙනියමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  එස්.එම් සරත් චන්ද්‍ර මහතා  කතා කරමින්</u>**

අනියම් වශයෙන් හරි බලපෑමක් ආවොත් ප්‍රදේශවාසීන්ගෙන්  මේකට නීතියක් තියෙන්න ඕන.

**<u>ගරු නගර මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා  කතා කරමින්</u>**

නීතිය කියන්නෙ ගරු මන්ත්‍රීතුමා ඒ අයත් එක්ක මං පුද්ගලිකව ගෙවල්වලට ගිහිල්ල ඒ අය ළඟත් තියෙනව යම්කිසි ලියකියවිලි ගොඩක්. මං කියන්නෙ මේ වැඩේ නවත්වන්න එපා කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,  මං හිතන්නෙ සපිරි ගමක් ග්‍රාමීය සංවර්ධන 2020 වැඩසටහන යටතේ එක ගම් ප්‍රදේශයකට ලක්ෂ 20 බැගින් පොදුජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව බලයට ඇවිල්ලා ගම්

නගාසිටුවීම සඳහා වන පළවෙනි වැඩසටහන. මේ වැඩසටහන අපි රජයක් අගය කළ යුතු අවස්ථාවක් මේක. මේ ආණ්ඩුව යටතේ අතිගරු ජනාධිපතිවරයා යටතේ නගරෙක ගහකට එන පළවෙනි වැඩසටහන. එතකොට මේ වැඩසටහන සාර්ථක කරගැනීම අපි සියලුම මන්ත්‍රීවරුන්ගේ යුතුකම සහ වගකීම වෙනවා. එයිනුත් මෙම වැඩසටහන සඳහා මුදල් ප්‍රතිපාදන එවල තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමිය හෝ තුමා හරහා. ඉතින් ඒක නිසා අපි අම්බලන්ගොඩ නගර සභාව විදියට මේකට අපට දියහැකි සහයෝගය දියයුතු වෙනවා. නමුත් ගරු සභාපතිතුමනි අපි දැක්කා මේ දැන් ගරු සභාවෙ විවිධ මත එලවුණා. පහුගිය කාල වකවානු තුළ මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වෙච්ච කර්මාන්ත සම්බන්ධයෙන් මන්ත්‍රීවරු පවා මේකෙ විවිධ මත දරනු ලැබුවා. හැබැයි කවුරු කොහොම මේ වැඩකටයුතු කළත් මොන ආයතන මගින් මේ කටයුතු සිද්ධ කළත් මොන නිලධාරීන් යටතේ අධීක්ෂණය කළත් අවසානයේ වගකීම එන්නේ අම්බලන්ගොඩ නගර සභාව විදියට අපට. මන්ත්‍රීවරු විදියට අපට. මේ ජනතාව මැසිවිලි නගන්නේ අපට. ඒක නිසා මෙහි වගකීමේ ප්‍රධාන කොටස්කාරයො වෙන්නෙ අම්බලන්ගොඩ නගර සභාවේ නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා. ඉතින් ඒක නිසා මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වය පිළිබඳව අපට බරපතල වගකීමක් තියෙනවා ගරු සභාපතිතුමනි. සමිති හා සමාගම් මගින් මේව යෝජනා කරල මන්ත්‍රීවරුන්ගේ අනුමැතිය ඇතිව අද දිනයේ අපි ප්‍රාදේශීය ලේකම්තුමියට මේව සඳහා අනුමැතියට යැව්වත් මේ සියලු කාරණා සිද්ධවෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමියගේ අනුමැතිය යටතේ. අම්බලන්ගොඩ නගර සභාවේ මේ සඳහා කිසිදු අනුමැතියක් ලැබෙන්නේ නැහැ. කිසිඳු නිලධාරින්ගේ අධික්ෂණයක් මේ සඳහා ලබා ගන්නේ නැහැ. කිසිඳු මුදල් ගෙවිමක් සඳහා නගර සභාවේ අනුමැතියක් නැහැ. හැබැයි අපි නියෝජනය කරන අපේ ආණ්ඩුවකින් පැමිණි මුදල්. එමනිසා මේ මුදල් සම්බන්ධව අම්බලන්ගොඩ නගර සභාව විදියට පාලක පක්ෂය විදියට හෝ විපක්ෂය විදියට හෝ මේ පිළිබඳ බරපතල වගකිමක් තිබෙනවා. එමනිසා මා පළමුකොටම ඉල්ලා සිටිනවා. ඔබතුමා ඉල්ලිමක් කරන්න. අම්බලන්ගොඩ නගර සභා කලාපය තුළ තිබෙන ප්‍රජා කමිටු හරහා මේ මුදල් කොන්ත්‍රාත්තු අත්සන් කරන්න තීරණය කරන්න කියා. අඩුම වශයෙන් අපට ඒ සමිති හරහා සම්බන්ධතාවයක් තිබෙනවා මේවාගේ ක්‍රියාදමයන් නිසියාකාරව සිද්ධ වෙනවා කියා. මේ අපි ගරු මන්ත්‍රිවරු හැමදෙනාම මගින් මගට කතා කළේ නියම ක්‍රියාදාමයන් සිදු නොවන නිසා. එතකොට අවසාන වශයෙන් අපේ නගර සභාවේ තාක්ෂණ නිලධාරින් තමයි දන්නේ භෞතිකව තිබෙන ගැටළු. මොකද ප්‍රාදේශිය කාර්යාලයේ නිලධාරින් දන්නේ නැහැ ඒ සම්බන්ධව තිබෙන භෞතික ගැටළු. මේ පාර මෙතැනින් දැම්මාම මේ ප්‍රශ්නය වෙනවා කියන එක දන්නේ අපේ තාක්ෂණසේවා නිලධාරින්. විශේෂයෙන්ම. එම නිසා මෙය බරපතල ප්‍රශ්නයකි. එමනිසා මා කරුණාකර ඉල්ලා සිටිනවා අපේ තාක්ෂණ නිලධාරින්ගේ අධික්ෂණය යටතේ මේ වැඩ කටයුත්ත කරන්න නිර්දේශ කරන්න. මෙය රජයෙන් හරි ඉල්ලිම කරන්න. මොකද මෙය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට මෙය මග හරින්න පුළුවන්. එකට විවිධ කාරණා ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමා ගරු සභාපතිතුමා වශයෙන් සම්බන්ධිකරණ රැස්වීම් වලට සහභාගි වෙනවා. දිස්ත්‍රික් ලේකම් සහභාගි වෙනවා. ඒ වගේම අපේ දිස්ත්‍රික් නායකතුමන්ලා සම්බන්ධ වෙනවා. පාලන අධිකාරිය. මේ අය හරහා මේ වරද නිවැරදි කරන තුරු හෝ මේ කාරණා ටිකවත් නිවැරදි කරන්න. කරුණාකරලා ඒ අවශ්‍ය සහාය ලබා දෙන්න. මොකද ගරු මන්ත්‍රිවරු වශයෙන් මෙයට අපි වගකිව යුතු නිසා. වගකිව යුතු වන්නන් නිසා මා මේ ඉල්ලිම කරන්නේ. රජය යටතේ අපට මේ ලබා දි තිබෙන ප්‍රතිපාදනය පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළුම ග්‍රාමසේවක වසම් සඳහාම ලබා දි තිබෙනවා ලක්ෂ 260 ක මුදලක්. ඒ මුදල අම්බලන්ගොඩ නගර සභාවේ ග්‍රාමිය තත්ත්වය දියුණු කිරිම සඳහා ග්‍රාමිය කාණු ඒ විවිධ යෝජනා පැමිණ තිබෙනවා. කර්මාන්තශාලා ආදි සියල්ල සඳහා තමයි මේ මුදල් වෙන්කර දි තිබෙන්නේ. රජයක් විසින් ඒ ප්‍රතිපාදන දෙන විට අපි අභය කිරිමක් කළ යුතු වෙනවා. එමනිසා ගරු මන්ත්‍රිවරු වශයෙන් අපි පවතින රජයක පොදුජන එක්සත් පෙරමුණට අතිගරු ජනාධිපති ගෝඨාභය

රාජපක්ෂ මැතිතුමාට , ගරු අග්‍රමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට අපගේ ප්‍රණාමය මේ අවස්ථාවේ පුද කරන්න කැමතියි අපේ නගර සභාවට මේ මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම සම්බන්ධව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපිටත් යමක් කියන්න තිබෙනවා. ඉඩෝරයට පොද වැස්සක් වැටෙන්නාක් මෙන් සපිරි ගමක් යටතේ ප්‍රබෝධමත් ගරු මන්ත්‍රීවරුන්ට ගමට වැඩක් කරන්න අවස්ථාව සැලසිලා. එනමුත් අම්බලන්ගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය කියන නම ගැන අප කිසිසෙත්ම සැහීමකට පත් වන්නේ නැහැ. එහි නායිකාව එය මෙහෙයවන නිලධාරිණිය සම්පූර්ණයෙන්ම ජන මතයට පිටුපාන කෙනෙක් හැටියටයි මා දකින්නේ. මට මතකයි පසුගිය අවධියේ ජල ගැල්ම පැමිණි අවස්ථාවේ අර මහ වැසි කොඩය පැමිණි මෙහොතේ අපේ අසරණයෝ අසරණ වෙලා කන්න බොන්න දෙයක් නැතිව සිටිද්දි ඇය ඇගේ අණපණත් නිති පොත් පෙරළමින් සුවසේ කල් යැව්වා. අපේ නියෝජ්‍ය සභාපතිවරයා කාර්යාලයට ගිහින් රණ්ඩු වෙලා තමයි මේ පුංචි ප්‍රතිපාදනය වෙන්කර ගත්තේ. ඇය ඇත්ත වශයෙන්ම ඒ කත මා හිතන්නේ පරිපාලනයට සුදුසු නැහැ. අපේ බෞද්ධ කලා පුරවරයේ. ඒ වගේම ඇය මහජන නියෝජිතයන්ට ගරු කරන්න දන්නේ නැහැ. උදච්චකමින් මුහුණ පුළුටු කරගෙන මහජන නියෝජිතයන් දැක්කාට දත පෙන්වා හිනාවෙලා විනිත බවක් දක්වන්නට ඇය දන්නේ නැහැ. ඇය එතරම් අශිලාචාරයි. එමනිසා මා මේ වැදගත් ගරු ගම්භිර සභාවේ කියනවා. එවැනි කතුන් මේ අම්බලන්ගොඩට අතිගරු ජනාධිපති ගෝඨාභය චින්තනයට ගැලපෙන්නේ නැහැ. මේ අවස්ථාවේ අපි පවසනවා අපේ සෘජු නිලධාරින්ගේ අධික්ෂණය යටතේ සිදු කරන්න. විෂය පථයට අදාලවයි කතා කරන්නේ. මේ අධික්ෂණය කරන ප්‍රධාන නිලධාරිතුමිය ගැනයි මේ කතා කරන්නේ. එයට ඔබතුමලාගේ පිළිතුරු කතාවේදි උත්තර දෙන්න. මගේ මතය එය. එමනිසා මා කියනවා අපේ සෘජු අධික්ෂණය යටත් අපේ නිලධාරින්ට අවකාශ සලස්වන්න මෙම යෝජනා පසු විපරම් කිරීමට. නොඑසේ නම් නිවැරදි යෝජනාවක් මල්ඵල ගන්වන්නට නොහැකි බවයි අපේ මතය. ඒ අවස්ථාවේ මේ සපිරි ගමක් යටතේ ප්‍රජා පාදක භෞතික සම්පත් නැංවීම පමණක් නොවේ මේ රජය ලිංගික අල්ලස් වලට රැකියා දිපු අලගියතැන් නිමා කරලා සියළුම පුරවැසියන්ට සහනශිලි ලෙස රැකියා ලබා දෙන වැඩපිළිවළක් ඉදිරිපත් කරලා. අපේ අහිංසකයින්ට සැනසෙන්නට කාලය උදාවෙලා. මෙම සපිරි ගමක් වැඩ පිළිවල යටතේ එම වැඩසටහන සාර්ථක කර ගැනීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඒ අවිනිත හැසිරීම් වලින් තොරව අපේ නිලධාරින්ට බලය පවරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් රජයේ ප්‍රධාන නිලධාරියෙකුට ඒ කතා කරපු විලාෂය පිළිබඳව මාගේ පුද්ගලිකවත් එක්සත් ජාතික පක්ෂයේ බලවත් අප්‍රසාදය හා අසතුට මුලින්ම ප්‍රකාශ කරනවා. මොකද මේ ගරු නගර සභාවේ රජයේ නිලධාරියෙකුට හෝ වේවා රජයේ නිලධාරියෙකුට දෝෂාරෝපණය ලක් කිරීමට පෙර හෝ යම් අදහසක් පලකිරීමට හෝ එම රජයේ නිලධාරින්ගේ ආත්ම ගෞරුත්වය , ගරුත්වය , එම නිලධාරින්ගේ තනතුරේ ගරුත්වය පිළිබඳ දැඩි අවබෝධයකින් , දැඩි අවධානයකින් මේ ගරු සභාවේ කතා කළ යුතු යන හැඟීම මා යෝජනා කරනවා. ඒ එක්කම තම තමන්ගේ උගත්කම තම තමන්ගේ ඉගෙනීම මත තමයි ඒ අයගේ අදහස් පල වෙන්නේ. ඒ පිළිබඳ මට කිසිඳු ගැටළුවක් නැහැ. සත්තුන්ගේ නම් සහ වෙනත් අපහාස නාම යොදාගෙන විවිධ දේශපාලන පක්ෂ වලටත් , විවිධ පුද්ගලයන්ටත් අවලාද කිරීම ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම සහ ඔවුන්ගේ හැසිරීම යයි මාගේ හැඟීම. එමනිසා මාත් රජයේ විශ්‍රාමික නිළධාරියෙක්. අපි කිසිසේත් රජයේ නිලධාරින් අපහාස අවලාද නගන්නේ නැහැ. රජයේ නිලධාරියෙක් යම් වරදක්

කළානම් ඔහුට ඔහුට විරුද්ධව ගත යුතු විනායානුකූල ක්‍රියාමාර්ග රජයේ අණපණත් වල තිබෙනවා. එවා මහජන නියෝජිතයන්ට වෙනස් කරන්න ආයතනවත් ගරු පාර්ලිමේන්තුවත් , ගරු පළාත් සභාවත් තිබෙනවා. ඒවා මේ සභාවල අපට එසේ නොකර අපට කරන්න ඉඩක් නැහැ. එමනිසා ගරු මන්ත්‍රිවරුන් දැනගෙන තිබිය යුතුයි තමන්ගේ සීමාවන්. එමනිසා මාගේ දැඩි විරෝධය අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය පිළිබඳව මේ ගරු මන්ත්‍රිවරයා කරන ලද ප්‍රකාශය පිළිබඳ මාගේ දැඩි අකමැත්ත රජයේ නිලධාරියෙක් විදියටත් , විශ්‍රාමික නිලධාරියෙකු විදියටත් අප්‍රසාදය මහජන නියෝජිතයෙක් විදියටත් , දේශපාලන පක්ෂයක් නියෝජනය කරන නියෝජිතයෙකු ලෙසත් මාගේ දැඩි අප්‍රසාදය මා පළකරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, පොදුජන එක්සත් පෙරමුණේ ගරු නගර සභා මන්ත්‍රිතුමාගේ කතා විලාශය කතාව ඇත්තෙන්ම අපේ ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දවගේ මහතා කිවු පරිදි අපි කැමති නැහැ කාන්තාවකට හෝ රජයේ සේවකයෙකු සම්බන්ධව යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් එම ප්‍රශ්නය විසඳන ක්‍රමයක් තිබෙනවා. කතා කරන විලාශයක් තිබෙනවා. මෙය නිකම් ගව මඩුවක තත්ත්වයකට අද නගර සභාව පත්වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි , ඔබතුමා මීට වඩා වගකීමක් ගත යුතුයි. ඒ වගේම ගරු ලේකම්තුමියගේත් වගකීමකි. දැන් මේ අවස්ථාවේ එතුමා ගරු ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කරන ලද විලාශය, කතාව පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු වන්ත්‍රිවරුන් ලෙස අප තුන්දෙනාත් , විපක්ෂය ලෙස ගරු එක්සත් ජාතික පක්ෂයේ සියළු ගරු මන්ත්‍රිවරුත් , ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගරු මන්ත්‍රිවරුත් මා හිතන විදියට මේ අවස්ථාවේ ඡන්දයක් විමසා මේ ගරු මන්ත්‍රිවරයාට විරෝධයක් දැක්වීම හොඳ බව. අනිත් එක මෙතුමා ගැන වචනයක් මටත් කියන්න තිබෙනවා. එම සිද්ධිය වෙන අවස්ථාවේ ඔබතුමා හිටියේ නැහැ. එතුමාගේ සැබෑ ස්වරූපය දැන් ඔබ සැම ඉදිරියේ ප්‍රදර්ශනය වුණා. ඇත්තෙන්ම මා අද කළු ඇඳගෙන පැමිණියේ එතුමා කළ ප්‍රකාශය ගැන විරෝධය පළ කිරිමට. මේ වගේ පුද්ගලයන් ඇත්තටම දඩුවම් දිලා මේ සභා වලින් ප්‍රතික්ෂේප කළ යුතුයි. ඉදිරියේ දි මෙවැනි පුද්ගලයින් මුළු ශ්‍රී ලංකාවටම වන අවනම්බුවකි. එදා අප නගර සභාවේ සේවය කරන සේවක සේවිකාවන් සඳහා පොත් ලබා දීමේ කාර්ය මේ ශාලාවේ සිද්ධ වුණා. ඒ මොහොතේ ගරු ලේකම්තුමිය . ගණකාධිකාරිතුමිය , අභ්‍යාන්තර විගණන නිලධාරිතුමිය ඇතුළු සියළු සේවක සේවිකා හැමදෙනාම ඒ අවස්ථාවේ එහි සිටියා. ඔබතුමා එදා පොල්වත්තේ පොත් බෙදා දි අවසන් වෙලා ගරු මන්ත්‍රිවරු කිහිප දෙනෙකු සමඟ ගරු අධ්‍යාපන අමාත්‍යාතුමා මුණ ගැසිමට කොළඹ ගියා.ත එදා මටත් ඔබතුමලා සමඟ යන්න බැරි වුණා. මොකද මා මහ අම්බලන්ගොඩ පිංකමක් සඳහා සහභාගි වි සිටිය නිසා. මා නගර සභාවට පැමිණියා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය මුණ ගැසි එම උත්සවයේ පොඩි විස්තරයක් දැන ගැනීමට. අත්ත වශයෙන්ම අපේ එම නිලධාරින් හා සේවකයින් ඉතා අපහසුතාවයකට පත් වුණා මේ ගරු මන්ත්‍රිවරයා කෙරමිණිය ප්‍රදේශයේ ජනතාවක් මෙම රැස්වීම් ශාලාවට ගෙන එනු ලැබුවා. එතුමා එම අවස්ථාවේ නටපු නාඩගමක් වශයෙන් තමයි මා දුටුවේ. මොකද නිලධාරින්ට කරන්න දෙයක් නැහැ. සෝමවති එන්න කියනවා. තව ළමුන් තුන් හතර දෙනෙක් කැඳවනවා. ඔවුන්ට පොත් ලබා දෙනවා. ඔහුට ඕන විදියට තමයි මේ වැඩ කටයුතු සිදු කෙරුණේ. මා ඒ අවස්ථාවේ චමින්ද මහතා කිවුවා ඔබතුමාලා තමයි මේවාට කවදාහරි අධිහාර වෙන්නේ. එමනිසා මේවා නිවැරදිව කරන්න කියා. ගරු මන්ත්‍රිතුමා වශයෙන් එතුමාට වගකීමක් තිබෙනවා. එතුමා ඒවාට සම්බන්ධ වුණාට කමක් නැහැ. නමුත් පිටින් පැමිණි අයට ඒ ලේඛණ සඳහා ඕන විදියට ක්‍රියාත්මක වෙන්න ඉඩ දෙන්න එපා කියා. මා ගරු මන්ත්‍රිතුමාටත් කිවුවා මේ පාසැල් ළමුන්ට පොඩි කාලේම හොරකම පුරුදු කරන්න එපා කියා. එය අපේ වගකීමක්. අපි පාසැල් දරුවන්ට අදාර්ශමත් විය යුතුයි. එහෙම කියලා එම ප්‍රශ්නය එතැනින් නිම වුනාට එතුමා එම පොත් එම දරුවන්ට ලබා දුන්නා. ගරු සභාපතිතුමනි, ප්රජා සංවර්ධන

නිලධාරිතුමියගෙන් හා ලෙකම්තුමියගෙන් අසා දැනගන්න. එහිදි පොත් පාර්සල් 50ක් පමණ ලබා දුන්නා. එතුමා ආක්‍රමණය කරලා ඔබතුමා නැති නිසා සභාපති පදවිය. මා දුටුවේ එවැනි තත්ත්වයක්. මොකද ඊට පසුදින ඔබතුමා පැමිණි පසු ම පොත් ලබා දුන්නාම් එය ඉතා සාර්ථක වැඩ පිළිවලක් වෙනවා. ඔබතුමා කිසිම දිනක ඔබතුමාගේ පුද්ගලික අරමුණු අනුව එම අභ්‍යාස පොත් ලබාදීමට කටයුතු කළේ නැහැ. එතැනදි එම පොත් ලබා දුන් පසු මා ගරු ලේකම්තුමියගේ දැක්ක පොඩි අඩුපාඩුවක් තිබුණා. මා මෙතැනට පැමිණියේ ගරු ලේකම්තුමියටත් නිලධාරින් සියළු දෙනාටත් මේ පිංකම පිළිබඳව ආරාධනයක් කරන්න. ඒ එන අතරට මේ මන්ත්‍රීතුමා මේ ප්‍රදේශයට එම කට්ටියත් සමඟ මේය ආක්‍රමණය කරා. ආක්‍රමණය කර ගරු ලේකම්තුමියට අභියෝග කළා මෙන්න මේ කට්ටියට මේ පොත් දෙන්න. මේ පොත් පාර්සල් 5ත් දෙන්න කියා. මා එම අවස්ථාවේ කියා සිටියා . මේ අවස්ථාවේ කරන්නේ අපේ සේවක සේවිකා මහත්මීන් සඳහා පොත් ලබා දිමයි සිදු කරනු ලබන්නේ. ඔබතුමා මොකක්ද මේ පිට අය මෙතැනට දමා ගෙන කරන්නේ. එමනිසා පිට අය ඇතුල් කරන්න එපා. මාගේ ඔයාගේ ප්‍රශ්නයක් තිබෙනවා නම් එය කතා කරගෙන යන්න. අතනදි එම පොත් පාර්සල් 50 හෝ 75 ලබා ගත්තානම් මෙතැනදි එම පොත් පාර්සල් 5 හය මෙතැනදි ලබා දිමට කටයුතු කිරිම මා ගරු ලේකම්තුමියගෙන් දැක්ක අඩුපාඩුවකි. මොකද ලේකම්තුමියත් දේශපාලන අධිකාරියට ඒ අවස්ථාවේ භය වෙන්නැති. මා හිතන්නේ නැහැ ගරු ලේකම්තුමිය ශක්තිමත්ව වැඩ කටයුතු කරන කාන්තාවක් වශයෙන් එහෙම අධිකාරිවලට දේශපාලන බලයට යටවෙන්න අවශ්‍ය නැහැ. අපි රාජකාරිය හරියට කරනවා නම් ඒවාට යටවෙලා කටයුතු කරන්න එපා . ගරු ප්‍රදේශීය ලේකම්තුමියට නරක වචනයක් කියා කතා කළා වගේ මට ප්‍රකාශ කළා කටුකන බැල්ලි බැහැපන් එළියට කියා. ඒ වගේ ජාරා විදියට තමන්ගේ සහෝදර ගරු මන්ත්‍රීවරියෙකුට කතා කළේ.මා මෙතුමා ගැන කලින් සභාවේ හිටිය නිසා එතුමා ගැන ලොකු ප්‍රසාදයකින් හිටිය මන්ත්‍රීවරියක් . මහජන නියෝජිතවරියක්. මෙතැන සභාවේ පොත් ලබා දිම කඩාකප්පල් වෙන නිසා මා කොච්චර අවේශශිලි වුවත් මා එතුමාට එම කියපු වචනයම අනිත් පැත්තට කිව්වා. බල්ලා කට වහපන් කිවුවා. කියපු දෙය කියන්න මා බයවෙන්නේ නැහැ.එහෙම කියා මා පුටුවේ වාඩි වුණා. ලේකම්තුමිය එම පොත් පාර්සල් 6 ලබා දුන්නා. මොටර්රථයක් ගෙනවිත් එම පොත් පාර්සල් පැටවුවා. පොදුජන එක්සත් පෙරමුණේ ගරු මන්ත්‍රීවරු වුණත් මේ ගරු සභාවේ මේවැනි ක්‍රියාකාරකම් වලට විරුද්ධ නොවුණහොත් අපි හැල්ලු වෙනවා. මොකද ඔබතුමා දන්නවා. මාගේ අඩුපාඩු ඇති. මා ගැන මා වර්ණනා කරන්නේ නැහැ. මට උපාධියක් නැහැ. නමුත් මට සමාජය පිළිබඳ උපාධියක් තිබෙනවා. මොකද මා අධ්‍යාපනය අතින් ඉහළ තලයක කෙනෙක් නෙමේ. පන්තිය වශයෙන් ගත්තාත් මා සාමාන්‍ය පන්තියක කාන්තාවක්. මා ඔබතුමාට කියන්නේ මේ වගේ තත්ත්වයකට අප පත් කරන්න නම් ඔබගේ පක්ෂයේ මා මෙය අතිගරු ජනාධිපතිතුමාටත් , ගරු අගමැතිතුමාටත් , ගරු පළාත් පාලන අමාත්‍යතුමාටත් , ගරු ආණ්ඩුකාරතුමාටත් මා දැනුම් දෙනවා. මෙවැනි පුද්ගලයින් පොදුජන පෙරමුණටත් , හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ ගරු මන්ත්‍රීවරයෙකු ලෙසත් මෙතුමාගේ මේ ක්‍රියා කලාපය හෙලා දකිනවා. මේ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව මා දැඩි අවධානයෙන් සිටින බව ප්‍රකාශ කරමින් මේ සඳහා විරෝධය මාගේ සියළු ගරු සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපි කතා කරන්නේ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතාණෙනි , අපි ඔබතුමා සලකන්නේ සහෝදර මන්ත්‍රීවරයෙක් වශයෙනි. මා ගියවරත් මෙය පැවසුවා. ඔබතුමා මේ ළඟදි සිට ඔබතුමාට ලෙඩක්ද දන්නේත් නැහැ. මොනවා හරි දෙයක් වෙනවා ඔබතුමාට . ඔබතුමා සභාවට පැමිණියාම සභාවේ කතා කරන්නේ සභාවේ ඉන්න විදියට නෙමේ. අපි ඔක්කොම ගරු මන්ත්‍රීවරු ගරුත්වයක් ඇතිව මෙතැනට එන්නේ. මා හිතන්නේ නැහැ ගංජා , රා , අරක්කු , කුඩු විකුණා

මෙතැනට පැමිණි අය. ඔක්කොම ගෞරවනිය කට්ටිය මෙතැන සිටින්නේ. මුළු මන්ත්‍රී මණ්ඩලයම හැම තිස්සේම වැදගත් දේ කතා කරන වැදගත් විදියට ජීවත්වන කාටත් ඇඟිල්ල දික්කර කතා කරන්න බැරි මන්ත්‍රී මණ්ඩලයක් තමයි ඔබතුමා යටතේ පත්වෙලා තිබෙන්නේ. අපි ඒ ගැන ආඩම්බර වෙන්නේනේ . මෙතැන කවුරුත් නැහැ ඒ වගේ අය. දැන් ගරු ප්‍රාදේශිය ලේකම්තුමිය කියන්නේ දක්ෂ කාන්තාවක්. එතුමිය එම තනතුරට පැමිණිමට තරඟ කර විභාග ලියා කොතරම් වෙහෙස වෙලා හැකියාවක් ඇති කාන්තාවකි. අවතක්සේරුවට කතා කරන් එපා.ප්‍රාදේශිය ලේකම්තුමිය නිතියට අනුව කතා කරන කාන්තාවකි. මා හොඳටම දන්නවා. අපි ගිහින් මොනවාහරි කතා කළත් නිතියට පටහැනිව ගරු මන්ත්‍රීතුමිය කටයුතු කරන්න බැහැ. එහෙම ඉල්ලීම් කරන්නත් එපා කියනවා. අපි එයට හිස නමා එතුමියට ගරු කරන්න ඕන. මේ රටේ නිතියට ගරු කරන්නේ නැති අය සිටින නිසා තමයි මේ රටේ මේ හැම දෙයක්ම සිදු වන්නේ. නිතියට ගරු කරලා මේ සියළු කටයුතු කරනවා නම් මේ රට දියුණු දියුණු වෙමින් කියා හැමදාම කියන්නේ නැහැ. දියුණු වූ රටක් වෙනවා. ඇත්තටම ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතාණෙනි ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියට ඒවගේ බැණ වැදුනා කියන්නේ මේ සමාජයේ කාන්තාවන් හෙලා දැකිමයි. 54% ක කාන්තාවන් පිරිසක් ඡන්දය පාවිච්චි කර තිබෙනවා. කාන්තාවන් නිගාවට පත් කරන්න එපා. මේ රටේ බහුතර කාන්තාවන් ඡන්දය පාවිච්චි කරලා තමයි ගෝඨාභය රාජපක්ෂ මහතා පත් කර ගනු ලැබුවේ. එතුමාට නිගාවක් ඔබතුමා කරන්නේ. ඔබතුමා එම පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක්. ඔබතුමා එතුමාට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට ආදරයක් තිබෙනවා නම් මේ රජය පිරිහෙන්න වැඩ කරන්න එපා. මේවා පිරහෙන ඒවා. මොකද මේ කාන්තාවෝ හැම තැනම සිටින්නේ. සේවකයෝ වුණත් මේවා දැක්කාම අපේ මාධ්‍ය වුණත් මේවා දැක්කාම බලනවා මොකක්ද මේ වෙන්නේ කියා. මා එකයි කිවුවේ මෙතුමාට ලෙඩක් හැදිගෙන එනවා. මිට පස්සේ වත් මේ සභාවල මේ වගේ දේවල් කරන්න එපා. විශේෂයෙන් කාන්තාවන්ට ඇඟිල්ල දික් කරලා කුණුහරුපෙන් කතා කරන්න එපා. අපි සම්පූර්ණ විරුද්ධ වෙනවා කාන්තාවන් සියළු දෙනාම. බහිනවා මේ සමාජයේ පාරට එහෙම කළොත්. කළානම් වැරදියි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා රිති ප්‍රශ්නයක් ගෙන එනවා. හිදිස්සියේ රාජ්‍ය නිලධාරියෙක් හෝ යම් නිලධාරියෙක් වැරදි වැඩක් කළහොත් අසාධාරණයක් කළහොත් ඒ ගැන කතා කිරිමට ගරු මන්ත්‍රීවරයෙකුට මේ සභාවේ අවසර නැද්ද?

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය  කතා කරමින්</u>

මා එය පිළිගන්නවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. කතා කරන්න අයිතිය තිබෙනවා නමුත් මා දකින්නේ අපේ ගරු මන්ත්‍රීතුමා මිට වැඩියේ වැදගත් විදියට කතා කළානම් හොඳයි.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය  කතා කරමින්</u>

මා කියන්නේ මෙකයි. ඔබතුමාට වරදක් වුණානම් ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් ප්‍රාදේශිය ලේකම්තුමිය කියා ගරුත්වයක් දි කතා කිරිම වඩා වැදගත් වෙනවා. එතුමියත් නිගාවට පත්කරලා ගරු මන්ත්‍රීතුමියත් නිගාවට පත් කරලා ජනතාව නිගාවට පත් කරලා කතා කරන්න එපා ගරු මන්ත්‍රීතුමියණනි. මා නැවතත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා සහෝදර මන්ත්‍රීවරයෙක් විදියට අම්බලන්ගොඩ නගරය පුරවරය ලස්සන කරන්න පැමිණි අප හැමදෙනාගෙම කිර්තිය රකින්න. ගරු

සභාපතිතුමාගේ නම්බුව රකින්න. අපි මුළු මන්ත්‍රී මණ්ඩලයේම නම්බුව රකින්න ඔබතුමා මේ විදියට කතා කරන්න එපා කියා නැවතත් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මී ළඟ සභාවේ මේ වගේ දේවල් වෙන්න දෙන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සියළු ගරු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි කතා කරන දෙය ගැනද කතා කරන්නේ. අද අපේ න්‍යාය පත්‍රය බලන්න. පිටු 8ක් තිබෙනවා. තවම මුල් පිටුව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි අපි මේ සභාවේ නගර සභාවට පත්වෙලා තිබෙන්නේ කවුරු හෝ නිලධාරියෙකු හෝ සේවකයෙකු හෝ යම්කිසි වැරද්දක් කර තිබෙනවා නම් එය කතා කිරිමේ අයිතිය අපට තිබෙනවා. අපි දන්නවා ප්‍රාදේශිය රැස්වීම් වලට ගියාම යම්කිසි වැරදි කරනවා නම් අපි කතා කරනවා. නිලධාරි හෝ කවුරු හරි වැරද්දක් කළානම් අපි කතා කරනවා. එවකට ගරු ප්‍රධාන අමාත්‍ය වරයා සිටියා . එවකට අපට අවස්ථාව ලබා දෙනවා. රාජ්‍ය නිලධාරින් වැරද්දක් කළානම් එය කතා කිරිමේ අයිතිය අපට තිබෙනවා. එක කාටවත් නැහැ කියන්න බැහැ. වචන හුවමාරු කිරිමේ ප්‍රශ්නයක් ඇති. එකට ඒ ගරු මන්ත්‍රීවරයා දැන ගත යුතුයි. අපිට තිබෙන අයිතිය මෙතැන කාටවත් නැති කරන්න බැහැ. මා ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරයෙකුට කතා කිරිමේ තිබෙන ඒ අයිතිය නැති කරන්න එපා. ඒ අයිතිය ලබා දීමට කටයුතු කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා එය පිළිගන්නවා. ඒ අයිතිය තිබෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒ එතුමා කතා කරන ශෛලාය . මා එතුමා සමඟ එකඟ වෙන්නේ නැහැ. දිගින් දිගටම මෙය ගරු සභාවේ කතා කිරිම ගැන වගකිම ඔබතුමාට තිබෙනවා . ඔබතුමා මෙය පැහැදිලි කර හෝ දෙන්න. එය ඉල්ලා සිටිනවා. පාලක පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් විදියට මේ පහර එල්ල කරන විට අපිට බලාගෙන ඉන්න බැහැ. එමනිසා ගරු සභාපතිතුමාගේ වගකිම එය. එය ඉටු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මා සිංහල පිළිතුරක් දෙනවා

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ ගරු මන්ත්‍රීතුමා කතා කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙය කතා කිරිම පිළිබඳව නෙමේ ප්‍රශ්නය. ගෞරවාන්විතව කතා කළ යුතුයි. මොන රජයක් පිහිටවුවත් දේශපාලන අධිකාරිය කවුරු වුවත් ප්‍රාදේශිය ලේකම්තුමිය කියන්නේ අප

රජයේ වැඩ කරන දක්ෂ රාජ්‍ය නිලධාරි වරියෙකි. ඒ වගේම තමයි ගරු මන්ත්‍රීවරුන්ට. අපහාසාත්මක ලෙස කතා කරන්න එපා. මට මතකයි ගරු සභාවේ මීට මාස කිහිපයකට ඉස්සර මාගේ මිත්‍රයෙක්

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මාතෘකාවට අදාලව කතා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ කොහේ හෝ සිට ඇවිත් වාඩිවෙනවා. විෂය පථය පිළිබඳ අවබෝධයක් නැහැ. ඔහේ කතා කරනවා. එකයි මේ වගේ තත්ත්වයක් ඇතිවෙලා තිබෙන්නේ. එහෙම කරන්න දෙන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා අපි ඕක නවත්වන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ පොඩ්ඩක් ඉන්න. මේ නිලානි මෙනවියගේ ප්‍රශ්නය වෙනත් කරුණු යටතේ කතා කළ යුතුයි. අනිත් එක මේ ප්‍රා දේශීය ලේකම්තුමියට විරුද්ධව නෙමේ. මේ එවන ලද ලිපිය සම්බන්ධවයි කතා කළේ. එහෙමනම් ඔබතුමා ඒ වේලාවෙම එය නවත්වන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි 03.08 අනුමත කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති "සපිරි ගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 වර්ෂය සඳහා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 බස්නැවතුම්පොළ පොදු වෙළඳපොළ සඳහා දිරන , නොදිරන , ප්ලාස්ටික් , යකඩ විදුරු ආදිය වෙන්වෙන්ව දැමීමට කසළ බඳුන් ඉල්ලා අම්බලන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය පරිපාලක නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බස්නැවතුම්පොළ පොදු වෙළඳපොළ සඳහා දිරන , නොදිරන , ප්ලාස්ටික් , යකඩ විදුරු ආදිය වෙන්වෙන්ව දැමීමට කසළ බඳුන් ඉල්ලා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මේවා ලබා ගන්නවා වගේම දැන් අපි කලින් ඔබතුමාගේ කාලයේ කොම්පොස්ට් පොහොර බඳුන් 500ක් බෙදුවා. ගරු හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබා දුන්නා. නමුත් අදවනතුරු පසු විපරමක් නැහැ. ඒවා පිළිබඳ පසුවිමරක් නැහැ. කාටද දුන්නේ කොහොමද කියන එක. එමනිසා මා කියන්නේ මේවා දුන්නා වගේම ආරක්ෂා කර ගැනීම පසු විපරම ආදි සියළු දේ සිදු වෙන්න ඕන. අන්න එමනිසා මා කියන්නේ දෙන්න. මේ අපේ කාර්ය ඉටු වෙන්න ඕන.

**තීරණය -**

බස්නැවතුම්පොළ පොදු වෙළඳපොළ සඳහා දිරන , නොදිරන , ප්ලාස්ටික් , යකඩ විදුරු ආදිය වෙන්වෙන්ව දැමීමට කසළ බඳුන් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.10 ත්‍රිරෝද රථ කමිටුවේදී තීරණය වූ පරිදි පුවරු 60ක් සකස් කරගැනීම සඳහා අවශ්‍ය පයිප්ප සහ තහඩු ලබාගැනීමට සහ ස්ටිකර් සකස් කරගැනීම සඳහා සභා අනුමැතියට යටත්ව අනුමැතිය ලබා දී ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ත්‍රිරෝද රථ කමිටුවේදී තීරණය වූ පරිදි පුවරු 60ක් සකස් කරගැනීම සඳහා අවශ්‍ය පයිප්ප සහ තහඩු ලබාගැනීමට සහ ස්ටිකර් සකස් කිරීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා. ඒ අනුව තහඩුවේ පළළ අඟල් 9දිග අඟල් 2ක විශ්කම්භය සහිත හෙවි ඩියුටි ජී.අයි බට60ක්. විෂ්කම්භය අඟල් 18 අරය අගල් 09 ප්‍රමාණයේ ස්ටිකර් 60ක් , තහඩුවේ පළල අගල් 09ක් දිග අගල් 18ක තහඩු 60ක් , විෂ්කම්භය අගල් 18 අරය අගල් 09 වූ රවුම් තහඩු 60ක් ලබා ගැනිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ පොලිසියේ අවශ්‍යතාවය මත තමයි මෙම බෝඩ් දෙනු ලබන්නේ. එතකොට මේ බෝඩ් ඉදිරිපත් කරන සැලැස්මක් ඉදිරිපත් කළ යුතු බව කියන්න. පොලිසියට ඕන තැන මෙය ස්ථාන ගත කිරිමත් වැරදියි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නැහැ මෙය ත්‍රිවිල් කමිටුවෙන් ඉල්ලා තිබෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

නැ මෙම ත්‍රිරෝද රථ නතර කිරිමේ ස්ථාන 60ක් නැහැනේ. මේ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ස්ථානගත කරන්නනේ මේ හැටම. එතකොට ප්‍රායෝගික නොවන තැන්වල තිබුණොත් අපි දන්නේ නැහැනේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

උප සභාපතිතුමා මේ හැට ඉල්ලුවේ මොකටද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අනුමත රථගාල් වල ගැසිමට හා ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට ගැසිමට

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ත්‍රිවිල් කමිටුව ගැන කතා කරද්දි මට කිව යුතු දෙයක් තිබෙනවා. අපි දැන් මේ කමිටුවලට රැස්වෙලා කමිටුවක් විදියට වැඩ කරගෙන යනවා. එතකොට මේ ජනවාරි 01 කිවුවා මේ ප්‍රශ්නය විසඳනවා කියා. එතකොට මේ ත්‍රිවිල් කමිටුව තිබුණට එය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියා. අනිත් එක ලොරි වලින් බඩු බානවා. රාත්‍රි 7ට කලිනුත් බානවා. තාම ගැසට් එකට නොදාපු නිසා වෙන්නැති ඔය ප්‍රශ්නය මා ඉල්ලා සිටිනවා ඉක්මන් කර මේ වැඩටික කර මෙය කරන ලෙස.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අනුමැතිය ලබා දෙනවා.

**තීරණය-**

ත්‍රිරෝද රථ කමිටුවේදි තීරණය වු පරිදි පුවරු 60ක් සකස් කරගැනීම සඳහා අවශ්‍ය පයිප්ප සහ තහඩු ලබාගැනීමට සහ ස්ටිකර් සකස් කර ගැනීම සඳහා සභා අනුමැතියට යටත්ව කරන ලද ඉල්ලීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.11 අම්බලන්ගොඩ, නගර සභාව සතු පොදු වෙළඳපොළ සංකිර්ණයේ කඩකාමර අංක 19,14 ස නව මාළු වෙළඳ සංකිර්ණයේ කඩ අංක 04 ටෙන්ඩර් කිරිම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ, නගර සභාව සතු පොදු වෙළඳපොළ සංකිර්ණයේ කඩකාමර අංක 19,14 ස නව මාළු වෙළඳ සංකිර්ණයේ කඩ අංක 04 ටෙන්ඩර් කර තිබෙනවා. එය සභා අනුමැතියට යටත්ව ටෙන්ඩර් කර තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ, නගර සභාව සතු පොදු වෙළඳපොළ සංකිර්ණයේ කඩකාමර අංක 19,14 ස නව මාළු වෙළඳ සංකිර්ණයේ කඩ අංක 04 ටෙන්ඩර් කිරිම සඳහා සභා අනුමැතියට යටත්ව සිදු කිරිම සම්බන්ධව අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කර ලදුව සභා සම්මත විය.

**03.12 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල , මුහුදු වෙරළ පාර, අංක 15 ලිපිනයේ පදිංචි ජේ.ඩබ්.චමිත් ප්‍රසංග මහතා විසින් අනුබෙදිම් පත්‍රය හා ගොඩනැඟිලි අයදුම්පත්‍රය සඳහා ගෙවන ලද මුදල් නැවත ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ පටබැඳිමුල්ල , මුහුදු වෙරළ පාර, අංක 15 ලිපිනයේ පදිංචි ජේ.ඩබ්.චමිත් ප්‍රසංග මහතා විසින් අනුබෙදිම් පත්‍රය හා ගොඩනැඟිලි අයදුම්පත්‍රය සඳහා ගෙවන ලද මුදල් නැවත ඉල්ලා ඇත. ඉහත නම සඳහන් වන 2019.10.14වන දින අම්බලන්ගොඩ නගර සභාවෙන් ඉඩම් අනුබෙදුම්

පත්‍රය හා ගොඩනැඟිලි අයදුම්පත්‍රය ඔවුන් වැරදිමකින් ලබා දී ඇත. එමනිසා එම අයදුම්පත්‍ර වල මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ,මොකක්ද එයට හේතුව

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙය දැමිය යුත්තේ නාගරික සංවර්ධන අධිකාරියටයි. වැරදිමකින් එය අපෙන් ලබා ගෙන. මුහුදු වෙරළ අසළ. එය ලබා දිමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ පටබැඳිමුල්ල , මුහුදු වෙරළ පාර, අංක 15 ලිපිනයේ පදිංචි ජේ.ඩබ්.චමිත් ප්‍රසංග මහතා විසින් අනුබෙදිම් පත්‍රය හා ගොඩනැඟිලි අයදුම්පත්‍රය සඳහා ගෙවන ලද මුදල් ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.13 සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් සඳහා ට්‍රේලර් 03ක් ලබා ගැනීම සඳහා අනුමැතියඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් සඳහා ට්‍රේලර් 03ක් ලබා ගැනීම සඳහා . අම්බලන්ගොඩ නගරයේ වානිජ්‍ය නගර සීමාවේ කසළ ඉවත් කිරිම සඳහා යොදවා ඇති විශේෂ අවශ්‍යතා ඇති ස්ථාන සඳහා ගාල් කර ඇති ට්‍රේලර් දිරාපත් වෙමින් පවති. විශේෂයෙන් පොදු වෙළඳපොළ හා මාළු වෙළඳසැල අසළ හා පුංචිපොළ අසළ නතර කර තිබෙන ට්‍රේලර් වල දිනපතා එකතුවන අපද්‍රව්‍ය හේතුවෙන් මුහුද අද්දර නතර කර තබන නිසා විඛාදනය වීම ඉතා වේගවත් සිදුවන බව ඉතා නොරහසකි. එම ට්‍රේලර් යන්ත්‍ර ලබන වසරේ 2020 වසරේ මුල් කාර්තුව වන විට ධාවනයෙන් ඉවත් කරන මට්ටමට පත්ව ඇත.කල්වේලා ඇතිව ඊට විකල්ප ලෙස ට්‍රේලර් 03ක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් සඳහා ට්‍රේලර් 03ක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.14 බූස්ස, යුධ හමුදා කඳවුරේ පැවැත්වෙන උත්සවයක් සඳහා 2019.12.17 වන දින සභා අනුමැතියට යටත්ව වර්ණ කොඩි 40ක් හා කොඩි කණු 20ක් ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මුලස්ථාන 58 සේනාංකය සඳහා වර්ණ කොඩි 40ක් හා කොඩි කණු 20ක් කපිතාන් සේනාංකාධිපති වෙනුවට ඉල්ලා තිබෙනවා. එය සභා අනුමැතියට යටත්ව ලබා දී තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

මුලස්ථාන 58 සේනාංකය බුස්ස, යුධ හමුදා කඳවුරේ පැවැත්වෙන උත්සවයක් සඳහා 2019.12.17 වන සභා අනුමැතියට යටත්ව වර්ණ කොඩි 40ක් හා කොඩි කණු 20ක් ලබා දිම අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.15 පෝරඹ ශ්‍රී ධම්මානන්ද දහම් පාසැලේ ත්‍යාග හා සහතික පත් ප්‍රධානෝත්සවය සඳහා 2020.01.04 දින ප්ලාස්ටික් පුටු 200ක් හා කැනපි 02ක් නොමිලේ ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පෝරඹ ශ්‍රී ධම්මානන්ද දහම් පාසැලේ ත්‍යාග හා සහතික පත් ප්‍රධානෝත්සවය සඳහා 2020.01.04 දින ප්ලාස්ටික් පුටු 200ක් හා කැනපි 02ක් නොමිලේ ඉල්ලා ඇත. ඒ සඳහා සභා අනුමැතිය ඉල්ලා සිටිනවා.2018 වර්ෂයේ ලබා දුන් සහායෝගයට ස්තුතිය පුද කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පෝරඹ කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරයා විදියට එය ලබා දිම පිළිබඳව ස්තුතිය පුද කර සිටිනවා.

තිරණය-

පෝරඹ ශ්‍රී ධම්මානන්ද දහම් පාසැලේ ත්‍යාග හා සහතික පත් ප්‍රධානෝත්සවය සඳහා 2020.01.04 දින ප්ලාස්ටික් පුටු 200ක් හා කැනපි 02ක් නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.16 දළුක්කන්ද , සිරි පියරතන දහම් පාසලේ ත්‍යාග හා සහතික පත් ප්‍රදානෝත්සවය සඳහා 2020.01.04 දින ප්ලාස්ටික් පුටු 500ක් , කැනපි 02ක් ,කොඩි කණු 25ක් සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබාදිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දළුක්කන්ද , සිරි පියරතන දහම් පාසලේ කාලගිරි විහාරයේ ත්‍යාග හා සහතික පත් ප්‍රදානෝත්සවය සඳහා 2019.12.29 දින පැවැත්වෙලා තිබෙනවා. ප්ලාස්ටික් පුටු 500ක් , කැනපි 02ක් ,කොඩි කණු 25ක් සභා අනුමැතියට යටත්ව නොමිලේලබා දිම අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පුටු කියක් තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පුටු 400ක් පමණි.

**තීරණය-**

දළුක්කන්ද සිරි පියරතන දහම් පාසැලේ ත්‍යාග හා සහතික පත් ප්‍රධානෝත්සවය සඳහා 2019.12.29 දින ප්ලාස්ටික් පුටු 500ක් , කැනපි 02ක් හා කොඩි කණු 25ත් නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.17 අම්බලන්ගොඩ, ඩයමන් හි කේ.එම්.තාරක මහතා විසින් 2020.01.18 වන දින පවත්වනු ලබන සජීවි ප්‍රසංගයේ ටිකට් පත් මුදා තැබීම 2020 සංශෝධිත ප්‍රතිශතයට ගෙවීම් කිරීම් සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සජීවි ප්‍රසංගයේ ටිකට් පත් මුදා තැබීම. කේ.එම්.තාරක මහතා.ඩයමන් අම්බලන්ගොඩ, අප ආයතනය විසින් 2020.01.18 වන දින පවත්වනු ලබන ප්‍රසංගයේ ටිකට් පත් මුදා තැබීම පහත සඳහන් වටිනාකම් සහිතව ඉදිරිපත් කර ඇත. එම ටිකට් මුද්‍රණය වෙනුවෙන් ඉල්ලා සිටී. ඉහත සඳහන් 2020 බදු සංශෝධන ප්‍රතිශතය අනුවය. එය සංශෝධනය සඳහා ඉදිරිපත් කර ඇති අඟයන් නමුත් මේ වන විට පවතිනුයේ 25% ක ප්‍රමාණයකි. එබැවින් අයකළ යුතු මුදල 25% කි. මේ වන සංශෝධනයේ අදාල විය යුතු මුදල ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉහත මා විසින් සඳහන් කරන බදු මුදල 2020 අයවැය ලේඛණය අනුව අයකළ යුතු බදු මුදල සභාවට යෝජනා කර ඇත. මේ කරුණ 2020 වර්ෂයට අදාල බැවින් 2020 ට ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.20% සහ රු.1500 ට වැඩි ඒවා 25% කි. ඒ අනුව විනෝද බදු අනුමත කළ ආකාරයට කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එහි තවම නීතිය ක්‍රියාත්මක වෙලා සම්මත වී පැමිණ නැහැනේ. ගැසට් කළාට තවම නීතිය ඇවිත් නැහැනේ.මොකද සියළුම පාසැල් වලට නිදහස් කළා. මොකද එක් කෙනෙකුට නිදහස් කරන්න බැහැනේ. ගැසට් එක එනකම් ඕක ඔයවිදියට යන්න. දැන් පාසැල් සියල්ලටම මෙය නිදහස් කළා.මෙය පුද්ගලික තමයි. එකත් අපට කරන්න බැහැනේ. පුද්ගලික තමයි. පුද්ගලිකලිකව නිදහස් කරන්න බැහැ කියා නැහැනේ. නිදහස් කළානම් හැමටම එකයි. නීතිය අනුව බැහැනේ එහෙම කරන්න. විනෝද බදුනේ. මෙයින් එකක් කරන එක ඉතා ආමාරු වැඩකි.මෙය සරල කාරණාවක් නෙමේ.තරුණ පරම්පාරාව වෙනුවෙනි මේවා කරන්නේ. සභානයක් මේ අවස්ථාවේ දී අවසන් කරන්න. ගැසට් එක පැමිණි පසු ඔතනින් අවසන්නේ ප්‍රශ්නය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ප්‍රශ්නය අවසන්. මෙය සභාවේ 2019.12.03 සභාවේ ගත් තීරණ 03.10 අනුව කටයුතු කරන්න තින්දු කරනවා.

**තීරණය**

කේ.එම්.තාරක මහතා.ඩයමන් අම්බලන්ගොඩ, අප ආයතනය විසින් 2020.01.18 වන දින පවත්වනු ලබන ප්‍රසංගයේ  ටිකට් පත් මුදා තබා විනෝද බදු අයකිරිම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ඉල්ලිම සම්බන්ධයෙන් 2019.12.03 දින මාසික සභාවේ සභා තීරණ අංක 03.10 අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.18 අම්බලන්ගොඩ පොලිසිය අසළ, ගාලුපාරේ නො 519 හි පදිංචි එම්.කැලුම් චින්තක මහතා විසින් අංක ATD/12/140 දරණ ඔප්පු සාරාංශයේ ආකාරයට ගෙවීමට නියමිත රු.34400/= ක 1% ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලා ඇති ඉල්ලීම සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ පොලිසිය අසළ, ගාලුපාරේ නො 519 හි පදිංචි එම්.කැලුම් චින්තක මහතා විසින් 2019.11.26 දින ඉදිරිපත් කර ඇති 1% ගාස්තු නිදහස් කිරිමේ ලිපිය හා බැඳේ. එම්.කැලුම් චින්තක මහතා විසින් අදාළ ලේඛණ අමුණා ඇත. පියාගේ විවාහ සහතිකය ආදි ලේඛණ දමා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා නිර්දේශ දමා තිබෙනවාද? අදාළ නිලධාරින්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ මෙම ඉඩම ඥාතින් අතර හුවමාරු විමක් සිදුව ඇති බවයි. ATD/12/140 දරණ ඔප්පු සාරාංශය ප්‍රකාරව ගෙවීමට නියමිත වු රු.34400/= ක ගාස්තුව කැලුම් චින්තක මහතා විසින් වෙනත් අයෙකුට විකිණීමක් සිදුකළහොත් අයකිරිමට යටත්ව සහා අනුමැතිය යටතේ නිදහස් කිරිම සුදුසු බවට නිර්දේශ කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා  කතා කරමින්</u>**

පත්ඉරුවල අයිතිය පිළිබඳ තිබෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය නිදහස් කරන්න පුළුවන් . වෙනත් නමක් ආවොත් අය කරනවා.

**තීරණය-**

මහ විදිය වරිපනම් අංක 519/1 දරණ දේපල සඳහා එබ ඉදිරි පත් කරන ලද එම්. කැලුම් චින්තක මහතාගේ ATD/12/140/2019 දරණ ඔප්පු සාරාංශ පෝරමයට අදාලව පිඹුරු අංක 1914 හා ලොට් අංක ‘C’ දරණ  කැබැල්ල සඳහා 1% ක ගාස්තු මුදල වු රු34400.00 ක මුදලක් නිදහස් කිරිම සුදුසු බවටත් මෙය වෙනත් අයෙකුට විකිණීමක් සිදුවුවහොත් එම මුදල අයකර ගැනීමට යටත්ව අනුමත කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

04. යථා පරිදි කල් දි ප්‍රශ්න

05. යථා පරිදි කල් දී යෝජනා

05.01 ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

**05.01.01 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ජලය රැඳෙන ස්ථානවල මැටි කැනීම් කර ඉවත් කර පස් පිරවීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ජලය රැඳෙන ස්ථානවල මැටි කැනීම් කර ඉවත් කර පස් පිරවීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකක්ද ගරු සභාපතිතුමනි. ඒ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩාංගණයෙන් මේ පැත්තේ පස් කැපුවාට පසු ජලය මතුපිට තිබෙනවා. බසින්නේ නැහැ. එහෙත් මේ අය කියනවා මෙහි එය ඉවත් කර පස්වලින් පුරවන්න කියා. මෙහි කිරිමැටි ගතියක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. දැන් මේ ක්‍රිඩාංගණය ඉදිකළානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය හැදුවාට මේ පැත්තේ තිබෙන්නේ කිරි මැටි ගතියකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කිරිමැටි ගතියක් තිබෙන්න එහෙනම් පස්වලට කිරිමැටි දමා ඇති.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය සාදා ලේවල් කලානේ. එහිදි මේ පැත්තේ තිබෙන්නේ කිරිමැටි. ක්‍රිඩාංගණය ලේවල් කළා. එහා පැත්ත පිරවුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැනේ මෙය මටත් පොඩි පැටලැවිල්ලක්. අපහැදිලි දෙයක්. මොකද දැන් මේ ක්‍රිඩාංගණය සම්පූර්ණ පස් පිරවුවා. පිරවුණු ප්‍රමාණයක් තිබෙනවානේ. අපේ තාක්ෂණසේවා නිලධාරින් එය අධික්ෂණය කළේ. මොකද මෙහි තිබෙනවා තව වියදම් කරන්න කියා. මොකද එක්කෝටි ගණනක් මෙහි වැඩත් කර තවත් වියදම් කරන්නේ මොකටද? දැන් අපි කියන්නේ පස් පුරවා සැකසුවානම් පස්නේ දැමිය යුත්තේ. කිරිමැටි නෙමේකේ. මේ තිබෙන එකේ තියෙන්නේ උඩ පස්ටික අයින් කළාම යට තිබෙන්නේ කිරිමැටි කියා. දැන් කලින් කොන්ත්‍රාත් එකක් කළානේ. එහිදි පස් අඩි 6ක් 7ක් විතර දැම්මානේ. එතකොට කොහොමද කිරිමැටි වුණේ. එතකොට දාපු එවත් කිරිමැටි වෙලානේ. අපි අහන්නේ එකම කිරිමැටි එන්න මෙය හැරිය යුතුයි.ඒ කියන්නේ මේ දමන ලද පස් ඉවත් කර ඊට පසු තමයි කිරිමැටි එන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා මෙය ලේවල් කරන විට මෙතැනින් ලේවල් එක ගසන විට අර පැත්ත පුරවන්න ඕන.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මෙහි පස් පිරවීමේදි පාරට සමාන තිබෙන අඩි 30ක පමණ තිරුවක පස් පිරවුණේ නැහැ. ඒ පැත්ත කැපුවේ නැහැ. අර පැත්ත තමයි පස් පිරවුණේ ගොඩක්. මේ පැත්ත පිරවුණේ නැහැ. මේ පැත්ත කාණුව ගාණටම තමයි තිබුණේ. දෙන ලද ලේවල් වලට මේ පැත්තේ පස් පිරවුනේ නැහැ. ගරු සභාපතිතුමනි මට හැඟෙන විදියට ඔය අඩි 30 තිරුවේ වතුර රැදෙනවා. මට තෙරෙන විදියට. දැන් කොන්ත්‍රාතුව කරන පුද්ගලයා කියනවා මේ වැලි තට්ටුවෙන් පසු වතුර යටට බසින්නේ නැහැ කියා. උඩින් එනවා. යටින් බසින්නේ නැහැ කියා. එමනිසා ඔය තිරුවේ යට බට දැම්මේත් නැහැ. අර බට දමන ක්‍රමය යටතේ බට දැම්මෙත් නැහැ. මේ අය කියන්නේ මේ වැලි තට්ටුවයි මැටි තට්ටුවයි ඉවත් කර මෙතැනට පස් දමන්න කියන එකයි මේ අය කියන්නේ. මේ අය ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කරන විට මා අසා සිටියා. ඒ අය කියන්නේ මේ සම්පූර්ණ තිරුව අයින් කර මෙහි පස් දමන්න. නැතිනම් යට කිරිමැටි ගතියට වතුර බසින්නේ නැහැ කියා. එමනිසා තමයි කියන්නේ ඔය තිරුව.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

පස් දමන එක ගැටළුවක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතකනම් අපි සෙල්ලම් කරන කාලයේ අර බෙන්ඩ් එක ගාව විනාඩි 10ක් වැස්සත් වතුර පිරෙනවා. ඔතන වතුර රැදෙනවා. ඔතන ලිස්සනවා. ඊළඟට ඔය ටික සිට ටිකක් දුර එනවිට නැවත වතුර ගතියක් තිබෙනවා. හැබැයි මේ හරියේ වතුර ගතිය නැහැ. අර මෙතුමා කියන්නේ මා ලක්ෂ 225 අරගෙන දුන්නා ගරු දයාසිරි අමාත්‍යතුමාගෙන්. ක්‍රීඩා ඇමති කාලයේ. ඉන් අපි පාවිච්චි කළේ ලක්ෂ 80 ගනනක්. ඒ වේලාවේ අපි මෙහෙන් කැපුවා. අපි මෙහෙන් ලොකු කළා. ලොකු කරද්දි අපි යට හැරුවේ නැහැ. මෙහේ පිරවුණේ නැහැ. මොකද මෙහෙන් කැපුවා. කපලා තමයි අපි මෙහෙන් පඩිපෙළ ගත්තේ. එතකොට කපද්දි අර පැත්ත පහතට තිබුණේ. අර පැත්ත පිරුණා. හැබැයි ඒ පැත්ත වැස්සට කවදාවත් මඩ රැදෙන්නේ නැහැ. අපි ඒ පැත්තේ තමයි පුහුණු වීම් කරන්නේ. ඒ දිනවල සිටම එහි මඩ පිරුණේ නැහැ. දැන් මේ පැත්තෙන් කපලා අර පැත්තට පිරුණා. ඔය කියන තැන අද ඊයෙක නෙමේ මගේ මතකය 1970 ගණන් වලත් පැය භාගයක් පැයක් වැස්සොත් ඔතන වතුර. මා හිතන්නේ අපේ ගරු උපසභාපතිතුමා කියන පරිදි ඔතන යට තිබෙනවා කිරිමැටි. ඕක තියාගෙන අපි මේ බොරු මුදල් වියදම් කර වැඩක් නැහැ. මෙය අවසන් කර හැබැයි හොඳ පස් දමන්න කියන්න. හොඳ පස් දමන්න කියන්න. රතු පස්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැම්මාට කමක් නැහැ. ඉංජිනේරුතුමාගෙන් වාර්තාවක් ගෙන පස් දමන්න. එහෙම නැතිනම් තාක්ෂණික පැත්තෙන් හරි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රීතුමා විනාඩියක් එහාට ගිහින් බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඔයට ඇත්තටම පස් නෙමේ දැමිය යුත්තේ . වැලි දැමිය යුත්තේ. මුහුදු වැලි දමන්න. ඊට උඩින් ඕන නම් පස් ටිකක් දමන්න. මා කියන දෙය සමඟ තාක්ෂණ නිලධාරිතුමාත් එකඟ වෙයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එක තමයි මා අහන්නේ තාක්ෂණික උපදෙස් මත සිදු කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සියල්ලම ඇස්තමේන්තුවලට යන යෝජනා. මගේ නමින් තිබුණට එහා පැත්තේ තිබෙනවා ඇස්තමේන්තුවත් සමඟ. මෙය විය යුතු දෙයක්නේ. මෙයට විරුද්ධ කවුරු හරි ඉන්නවාද? මෙය හරියට තමයි කරන්නේ . ඔබතුමා ගිහිල්ලාම අවබෝධ කර ගන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා, අවබෝධ කරන එක නෙමේ අපි කියන්නේ . ආපහු ඕක ඔය විදියට නෙවෙන්න කරන්න. කරලත්නේ ඔය වෙලා තිබෙන්නේ. වැලි පුරවන්න ඕන නම් තාක්ෂණසේවා නිලධාරි අසා එය කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙය කලින් ක්‍රීඩාංගණයේ තිබුණ කැල්ලක් නෙමේ. පඩිපෙළ යට තිබුණ කැල්ල.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

හරි එක තමයි කියන්නේ . හරියට කරන්න.

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ජලය රඳෙන ස්ථානවල මැටි කැනීම් කර ඉවත් කර පස් පිරවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජානා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.02 මහජන ක්‍රීඩාංගනයේ ළිං සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මහජන ක්‍රීඩාංගනයේ ළිං සඳහා කරන ලද යෝජනාව සුදුසු බවට යෝජනා කරනවා

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මහජන ක්‍රීඩාංගණයේ ළිංවල පියන් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03 මහජන ක්‍රීඩාංගනයේ ළිං සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මහජන ක්‍රීඩාංගනයේ ළිං අන්තර් සම්බන්ධ කිරීම හා කාණු පද්ධතියේ අතිරේක වැඩ සිදු කිරීම සුදුසු බවට යෝජනා කරනවා

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ළිං සඳහා අද තමයි යෝජනා කර තිබෙන්නේ. මෙහි ගෙවීම් එහෙම කළාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. ගෙවිම් කළේ නැහැ. ඇස්තමේන්තුවයි , යෝජනවායි දෙකම එකට යන්නේ.

**තීරණය-**

මහජන ක්‍රීඩාංගණයේ ළිං අන්තර් සම්බන්ධ කිරිම හා කාණු පද්ධතියේ අතිරේක වැඩ සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රි එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 05.01.04 හල්වතුර කසළ අංගනයේ කසල තුනී කිරිම ( අදියර 02 ) සිදු කිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හල්වතුර කසළ අංගනයේ කසල තුනී කිරිම ( අදියර 02 ) සිදු කිරිම සුදුසු බවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

හල්වතුර කසළ අංගනයේ කසල තුනී කිරිම ( අදියර 02 ) සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 05.01.05 මහජන ක්‍රිඩාංගණයේ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය පැත්තේ පැති බැම්ම හා සපත්තු කාණුව ඉදිකිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රිඩාංගණයේ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය පැත්තේ පැති බැම්ම හා සපත්තු කාණුව ඉදිකිරිම සුදුසු බවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

මහජන ක්‍රීඩාංගණයේ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය පැත්තේ පැති බැම්ම හා සපත්තු කාණුව ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.06 පෝරඹ වලව්වත්ත පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පෝරඹ වලව්වත්ත පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

පෝරඹ වලව්වත්ත පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.07 මාර්ග සති පාරේ පැති බැම්ම හා මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මාර්ග සති පාරේ පැති බැම්ම හා මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙය දැන් මෙයින් ඉවත් කරන්න පුළුවන් වෙයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ . මෙය අනුමත කර තබන්න මෙයට . මුදල් මදි වුණොත් අපට දෙන්න වෙනවා.

**තීරණය-**

මාර්ග සති පාරේ පැති බැම්ම හා මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.08 අම්බලන්ගොඩ නගර සීමාවේ ජාත්‍යාන්තර මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට භූමියක් ලබා දීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අම්බලන්ගොඩ නගර සීමාවේ ජාත්‍යාන්තර මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට භූමියක් ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා

__ගරු නගර සභා මන්ත්‍රී එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්__

එම යෝජනාව ස්ථිර කරනවා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

දැනට අපි බලාපොරොත්තු වෙන්නේ අපි සිංහ ක්‍රීඩා සමාජයත් සමඟ ගිවිසුමක් ගසා තිබෙනවා.

01. ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට . එය ඉදිකරලා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරන්න. අම්බලන්ගොඩට ක්‍රීඩාංගණයක් අයිති වෙනවා. එමනිසා එය ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් ලබා දෙන්න.

__ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මට වචනයක් කතා කළ යුතුයි. මේ ක්‍රීඩාංගණය ඉදිකිරීම ගැන සතුටු වෙනවා. මෙය පෝරඹ කොට්ඨාශයේ ජනතාවට විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්න වෙනවා. එහා පැත්තේ ඇළ . පෝරඹ කොට්ඨාශයේ මහජනතාවගේ විශාල විරෝධතාවයක් එනවා. ක්‍රමානුකූල නොවන විදියට ජලය බැස යන ආකාරයට මෙය ගොඩ නොකළහොත්. එහෙම නොකොළොත් ලොකු උද්ඝොෂණයක් ඇති වෙනවා පෝරඹ කොට්ඨාශයේ. ඒ පිළිබඳ දැනුවත් වෙලා ඉන්න.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

ගරු මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තිබෙනවා. මේ සම්බන්ධව අපි වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තුවක් අර ගත්තා. ඒ අනුව ලක්ෂ 66 ක ඇස්තමේන්තුවක් වාරිමාර්ග අධ්‍යක්ෂක විසින් අත්සන් කර අපට එවා තිබෙනවා. එම ලක්ෂ 66 වැඩ අපි සම්පූර්ණයෙන් අවසන් කර තිබෙනවා. එමනිසා තමයි ගංවතුර යම් මට්ටමින් පාලනය කරන්න පුළුවන් වුණේ. මේ යටතේ අක්කර 5ක වැවක් පන්සලත් ඔය අතරත් අපි නිර්මාණය කළා. ඒ දිනවල සාමාන්‍යය කාණුවක් ලෙස තිබුණ දෙය දැන් අපි විශාල ඇළක් බවට පත් කර තිබෙනවා. පොරොක් ඇළ සංවර්ධනය කළා. එතැන සිට හල්වතුර සිට කුලරත්න විද්‍යාලය පහළට අලුතින් ඇළක් කැපුවා. එමනිසා ලොකු වැඩ කොටසක් අපි කළා.

__ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්__

දැනටත් පොඩි වැස්සටත් ජලය පිරෙනවා.

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

දැන් වෙලා තිබෙන්නේ ආපහු උපදෙස් ගෙන ඒ අයට සුද්ද කරන්න කියන්න ඕන.

__ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, අක්කර 16ක පමණ ප්‍රමාණයක් මෙම ක්‍රිඩාංගණයට වැය වෙනවා කිවුවා. අපි අක්කර 16ට කෝටි ගණනක් වියදම් කර තමයි මෙම ක්‍රිඩාංගණය ඉදිකරන්නේ. එය අයිති වෙන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට. එතකොට ක්‍රිඩාංගණයක් ඉදි වෙන එක ඇත්තටම හොඳයි. මේ නගර සභා ක්‍රිඩාංගණය, පොල්වත්ත ක්‍රිඩාංගණය, තල්ගස්ගොඩ ක්‍රිඩාංගණය , මානාන ක්‍රිඩාංගණය වගේ අපේ දරුවන්ට ක්‍රිඩා කළ හැකි සාමාන්‍ය ක්‍රිඩාංගණ ඒවා. එවා බිහිවෙන්න ඕන. දැන් මේ ජාත්‍යාන්තර මට්ටමේ ක්රිඩාංගණ ඉදිවීම නෙමෙයි පලවෙනි ප්‍රශ්නය. අනිත් ගරු මන්ත්‍රීවරු උරන වෙන්න පුළුවන්. මේවා මෙහෙම කතා කිරිම සම්බන්ධව. එමනිසා මාගේ පුද්ගලික මතය හා පක්ෂයේ මතය අපි මේ ප්‍රකෝටි ගණනක් වියදම් කරන්නේ මොකටද? අපි මේ වියදම් කරන්නේ අපට මේ අම්බලන්ගොඩම ගැහුවාට ගාල්ල තිබෙනවා, දඹුල්ල තිබෙනවා. ඔය විදියට ක්‍රිඩාංගණ මහ ගොඩක් තිබෙනවා. හම්බන්තොට තිබෙනවා. මාත එක තමයි කිවුවේ මාත් එක්ක ඔබතුමන්ලා විරුද්ධ වෙන්න පුළුවන්. අද රටේ මුහුණ පා තිබෙන තත්ත්වයන් අද ලෝකයටම ත්‍රිලියන ගණනක් මුදල් ණයවෙලා සිටින වෙලාවේ මහ ආණ්ඩුව වුණත් මේ කරන්නේ මොකක්ද කියන ගැටළුව මට තිබෙනවා. ලංකාවේ මහජනතාවගේ පලවෙනි අවශ්‍යතාවය වන්නේ මේ පිටරට සුද්දෝ ගෙනවිත් ජාත්‍යාන්තර ක්‍රිඩාංගණ ඉදිකර ක්‍රිකට් ගසන එක නෙමේ. මෙය සැබැ ප්‍රශ්නයක් . ගරු මන්ත්‍රීවරු හැමදෙනාම තේරුම් ගන්න. එය මේ රටේ ජනතාව ණය කරලා රට කාබාසිනියා කරන ව්‍යාපෘති මේවා.මේවා කිරිම ගැන ජනතා විමුක්ති පෙරමුණ හැටියට මාගේ විරෝධතාවය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඔබතුමන්ලා කැමති දෙයක් කර ගන්න. රටේ ජනතාවට මට මේවාට උත්තර දෙන්න බැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ අවස්ථාවේ මා මතක් කරනවා. මෙය අපි හදන්නේ සුද්දොන්ට ක්‍රිකට් ගහන්න නෙමේ මෙය ඉදිකරනු ලබන්නේ. අම්බලන්ගොඩින් අද වනවිට ශ්‍රී ලංකා කණ්ඩායමෙන් ක්‍රිකට් කණ්ඩායමේ නායකයින් දෙදෙනෙකු බිහි වි තිබෙනවා. උපුල් තරංග මහතා ශ්‍රී ලංකා කණ්ඩායම මෙහෙයවුවා, දිනේෂ් චන්දිමාල් මෙහෙයවුවා. එතකොට අම්බලන්ගොඩින් එකතු වන සංඛ්‍යාව එන්න එන්න වැඩි වෙනවා. එතකොට අපි බලන්න ඕන මේ සියළු දෙනා ක්‍රිඩා කරන්නේ මේ රට වෙනුවෙනි. ලංකාව වෙනුවෙන් ක්‍රිඩා කරන්නේ. මේ ක්‍රිඩකයින් විශාල ගණනක් සිටියදි අද තමයි අම්බලන්ගොඩ නගර සභාව ටර්ෆ් විකට් එකක් සැදිමට හදන්නේ. මේ තිබෙන ක්‍රිඩාංගණයෙන් මේ කට්ටිය ඉහළ මට්ටමට දියුණු කරන්න බැහැ. මෙහිදි හොඳ ක්‍රිඩාංගණයක් වන අරය මීටර් 90ක් වන ක්‍රිඩාංගණයක් මේ ස්ථානයේ අපට හදන්න පුළුවනි. එහිදි මෙය රජයේ මුදල් වලින් නෙමේ හදන්නේ. මෙය හදන්නේ ලංකාවේ ක්‍රිකට් ගහන අය ක්‍රිකට් ගසා ගෙන එනු ලබන මුදල් වලිනි. ක්‍රිඩකයින්ගේම මුදල් වලින් තමයි මෙය හැදෙන්නේ. පළාතට එක ක්‍රිඩාංගණයක් සැදිමට යෝජනා වෙලා තිබෙනවා. එය මා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපතිතුමා සමඟ එකඟ කර ගෙන තිබෙනවා අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඉදිකිරිමට. ඉතිං එතකොට මෙය අපේ යටතේ තබාගෙන සිටිනවාට වඩා හොඳයි එහෙම ලබා දිම. මේ වගේ ක්‍රිඩාංගණයක් නඩත්තු කරන්න සේවකයින් සියයක් පමණ සිටිය යුතුයි. එතකොට ඒ පඩි නඩි ගෙවිම ඒ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් භාර ගන්නවා. නගර සභාවට මෙය භාර ගෙන කරන්න බැහැ. එක තේරුම් ගන්න. මේ ක්‍රිඩාංගණයටත් බලන්න . අපි දිනකට මේ සඳහා 4කු යෙදෙව්වොත් එහෙම රු.6000/=ක් අපි නිකන් වියදම් කරනවා. අපි වහලා තිබ්බාත් ක්‍රිඩාංගණය මේ තත්ත්වයෙන් තිබ්බාත් අපි තුන්දෙනෙකු යෙදෙව්වාත් රු.4500/= නිකම්ම වියදම් වෙනවා. අපි බලන්න ඕන හොඳ දක්ෂ ක්‍රිඩකයින්ට අවස්ථාව දෙන්න ඕන. ඇයි අම්බලන්ගොඩ ක්‍රිඩා සාමාජයක මේ අයට ක්‍රිකට් ක්‍රිඩා කරන්න බැරි. මෙහි පහසුකම් නැහැ. ටර්ෆ් විකට් නැහැ. හැමදාම අපි හදන නිෂ්පාදනය කරන හොඳම ක්‍රිඩකයා අපි කොළඹට යවනවා. ඉතිං අපි ගමෙන් යවන්න පුරුදු විය යුතුයි. ගමෙන් හොඳ ටිම් එකක් හදන්න පුළුවනි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය අම්බලන්ගොඩ ඉදිකළේ නැතිනම් මෙය පිට පළාතකට යනවා. එය එතැනින් නවතින්නේ නැහැ. රටට මුදල් ඉතිරිවෙන්නේ නැහැ කියන එකක් එතැනින් එළියට යනවා. මෙය අපි දන්නවා මේ තත්ත්වයට පත් කර ගැනිමට කොච්චර අමාරු වුණාද ? ක්‍රිකට් ආයතනයේ සභාපතිතුමාට කතා කර බොහොම අමාරුවෙන් තමයි මෙය මේ තත්ත්වයට මෙතැනට ගෙන එනු ලැබුවේ. අනිත් එක දැන් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිඩකයෝ හදිසි පුහුණු වීම් වලට අපි කැඳවනවා අම්බලන්ගොඩට. ඔවුන් දුක් වෙනවා. මොකක්ද මේ තත්ත්වය, මොකක්ද මේ ක්‍රිකට් ගැසීම, මොකක්ද මේ . පුදුම වැඩක් නේ මෙච්චර මේ ක්‍රිඩකයින් සිටියදී අම්බලන්ගොඩ මේ තත්ත්වයට පැමිණ තිබෙන්නේ කියා. ඔවුන් පුදුම වෙනවා. ඔවුන්ගේත් උනාන්දුව මත තමයි මෙය මේ තත්ත්වයට ගෙන එනු ලැබුවේ. බොහොම අමාරුවෙන් තමයි මේ ක්‍රිඩාංගණය මේ තත්ත්වයට ගෙන එනු ලැබුවේ. මා කියන්නේ මෙයට හැමදෙනාම සහයෝගය දෙන්න. තව කුඩා දරුවන් කොච්චර ඉන්නවාද මේ තත්ත්වයට එන්න. එමනිසා අපි හැමදෙනාම අපේ දරුවන්ගේ ක්‍රිඩා කෞශල්‍යයන් නංවන්න මෙයට හැමදෙනාම උදවු කරන්න. මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගේ කතාවේ එය එක පැත්තක්. එක අමතක කරන්න. එකත් අමතක කරන්න බැහැ. රටේ තත්ත්වයත් එක්ක. නමුත් එහෙමයි කියා ක්‍රිකටුත් නොගහා කන්නේ බොන්නේ නැතිව අඳින්නේ නැතිව අපට ජිවත් වෙන්න බැහැනේ. අපි එවත් කරගෙන අපි මෙය දියුණු කරගන්න බලන්න. අපේ අතිගරු ජනාධිපති කෙනෙක් පත්වෙලා ඉන්නවා. ඉදිරියට එවත් පුළුවන් විදියට දියුණු කරනු ලබයි. එමනිසා අපි ක්‍රිකටුත් ගැසිය යුතුයි . රටත් දියුණු කළ යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ ජාත්‍යාන්තර ක්‍රිඩාංගණයක් ඉදිකිරිම ගොඩක් ඉතිහාසයට යන කතාවකි. ඉතිහාසයේ සිංහ ක්‍රිඩා සාමාජය මේ සඳහා විශාල දෙයක් කරනු ලැබුවා. කැපවීමක් කරනු ලැබුවා. ඒ ඉතිහාසයේ ක්‍රිකට් වලට ආදරය කරන පිරිසක් තමයි මෙය කරනු ලැබුවේ. ගම් නියගම් පාසා ක්‍රිකට් ක්‍රිඩාව ජනතාවගේ ඇට මිදුලු නහර තුළ තිබෙනවා. අපි හැමදෙනාම ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත නොවුවත් ක්‍රිකට් තරඟයක් යනවිට බලනවා. ලංකාව දිනනවානම් අපි එයට සුභ පතනවා. අපි හැමදෙනාම රූපවාහිනිය දිහා බලා සිටිනවා ලංකාව දිනනකම්. හෘද ස්පන්දනය වැඩි වන අවස්ථා තිබෙනවා. එහෙම ක්‍රිඩාවක් එය. අපි අම්බලන්ගොඩ නගරයේ පාසැල් 4ක ළමුන් 12000 ක් 15000ක් සිටින නගරයක අම්බලන්ගොඩ විදියට ගත්තාත් මේ අවශ්‍යතාවය තිබෙනවා. එතකොට ජාත්‍යාන්තරයේ ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත විම හෝ වේවා දේශිය ක්‍රිකට් ක්‍රිඩාවේ නිරත විම හෝ වේවා අද වන විට සියළුම පාසැල් අතර තිබෙන අන්තර් පාසැල් ක්‍රිකට් තරඟ පවා මෙවැනි මට්ටමක නැතිනම් පසු බසින අවස්ථා තිබෙනවා. ඒ ලංකාවේ තිබෙන ජාත්‍යාන්තර මහ තරඟයකින් පැරදුණොත් දක්ෂයන් විය යුතයි නැවත එම තරඟයට ඇතුළු විමට. එතරම් තරඟකාරියි මේ තත්ත්වය . එතකොට අම්බලන්ගෙඩ තිබෙන ජාතික පාසැල් ධර්මාශෝකය හෝ වේවා, දේවානන්ද විද්‍යාලය හෝ වේවා මේ ජාතික තලයේ අන්තර් ක්‍රිඩා සාමාජ නියෝජනය කරමින් පාසැල් උත්සව වලට සහභාගි වෙනවා. ඒ දෙකම දැනට පවත්වාගෙන ගියාට මේ පහසුකම් මදිවිම නිසා ඒ අය නැවත පහළ මට්ටමට වැටෙනවා. එතකොට විශාල ප්‍රශ්නයක්. ඒ සම්බන්ධ සියව දෙනාගේ උත්සාහය. එමනිසා අපි අතදිම අත්‍යවශ්‍යයි. අපි නගර සභාවක් විදියට අපට හොඳ දැක්මක් තිබිය යුතුයි. අනාගතය පිළිබඳ සැලසුම් තිබිය යුතුයි. මට මතකයි 2020 දස අවුරුදු සැලසුම් හදද්දි ඔය ක්‍රිඩාංගණයේ ඉන්ට ඉස්ට්‍රේඩියම් ආදි සියළු පහසුකම් හල්වතුර කලාපය තුළ සකස් කරනු ලැබුවා. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂතුමා පැමිණ සාකච්ඡා කර ඔය ස්ථාන වෙන්කරනු ලැබුවා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි සිංහ ක්‍රිඩාංගණයට එම ප්‍රදේශයේ ඉඩම ලබා දුන්නේ. අපේ ගරු

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කිවූ පරිදි බරපතල ප්‍රශ්න තිබෙන්න පුළුවනි. හැබැයි එකට ඒ වගේ ආයතන තිබෙනවා. ඒ අයි වී වාර්තා , පරිසර වාර්තා ආදි මේ සියළු දේ ලැබුණාට පසුව තමයි මොන ආයතයට වුණත් මෙම ක්‍රිඩාංගණය ඉදිකරන්න වෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ගරු සභාපතිතුමනි, රටේ සංවර්ධනය කියන්නේ ආර්ථික සංවර්ධනය විතරක් නෙමේ. ආර්ථික , සමාජීය, සංස්කෘතික. මේ තුනේම සංවර්ධනය තමයි රටේ සංවර්ධනය කියන්නේ.මේ සාමාජය පැත්තෙන් ගත්තාම මේ ක්‍රිඩාව නැංවීම අපේ යුතුකම. අපේ වගකිම. ඉතිං මා දකින්නේ මේ අක්කර 30ක් මේ ඉඩම් ප්‍රමාධණය අපි තවම තියාගෙන ඉන්නවා. සමහර වේලාවට බලහත්කාරයෙන් මෙය දා ගන්න හදනවා. එතකොට අපි කොහොම හරි කැකෝ ගසා මෙය නතර කර ගන්නමවා. එයින් ප්‍රමාණයක් තමයි මෙයින් නතර කර ගන්නේ. ඉතිං මෙය දිම තුළ අපට විශාල අගතියක් ඇති වෙන්නේ නැහැ. ප්‍රතිලාභයක් මිසක්. මේ ක්‍රිඩාංගණය ඉදිකිරිම තුළ. අපි ක්‍රිකට් ආයතනයට පැවරුවත් ඔවුන් විසින් සංවර්ධනය කළ යුතුයි. අම්බලන්ගොඩ ප්‍රදේශයේ සංවර්ධනයක් මේ තුළින් ඇති වෙනවා. මෙය නිකම්ම නිකං පරිත්‍යාගයක් කිරිමක් නෙමේ. විශාල ප්‍රතිලාභයකට අයෝජනය කිරිමක් මෙය. එමනිසා මා දකිනවා මේ භුමි භාගය ක්‍රිකට් ආයනයට ලබා දිම සුදුසුයි කියා. හැබැයි අර කියන කොන්දේසි ප්‍රකාරව ක්‍රිකට් ආයතනය හෝ වේවා මේ ක්‍රිඩාංගණය ඉදිකරන විට මේ නගරයේ ගමේ ජනතාවට පිඩනයක් නොවන විදියට මෙහි ප්‍රතිලාභයක් ලැබෙන විදියට මෙය ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

අපිත් සුභ පතනවා. ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රිඩාංගණය ඉදිකිරිම සම්බන්ධව. එය අම්බලන්ගොඩ නගරයට ලොකු කිර්තියක්. මොකද ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රිඩාංගණයක් ඉදිකිරිම සම්බන්ධව ලංකාවේ පමණක් නෙමේ මුළු ලෝකයෙම ප්‍රසිද්ධ වෙනවා අම්බලන්ගොඩ නගරය. ඒ වගේම අම්බලන්ගොඩ සිටින ක්‍රිඩකයන්ටත් ලොකු හයියක් වෙනවා. එමනිසා මේ සඳහා ඉඩම් කට්ටි ලබා දිලා ඉක්මනින් මෙය සකස් කර ගන්නා ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ජාත්‍යාන්තරයට අම්බලන්ගොඩ කියන නාමය ගෙන යාමට පුළුවන් නම් එකත් ලොකු දෙයකි.

**තීරණය-**

අම්බලන්ගෙඩ නගර සිමාවේ ජාත්‍යාන්තර මට්ටමේ ක්‍රිකට් ක්‍රිඩාංගණයක් ඉදිකිරිමට භුමියක් ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා එච්. ඉනෝකා ක්‍රශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.09 මහ අම්බලන්ගොඩ , හිරිකැටිය පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මහ අම්බලන්ගොඩ , හිරිකැටිය පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවට යෝජනා කරනවා

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , හිරිකැටිය පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවට ( ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය නිවස අසළ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.10 මහ අම්බලන්ගොඩ , ධම්මකුසල අසළ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරිම සුදුසු බවට ( සිතා මහත්මියගේ නිවස අසළ) කිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

**මහ අම්බලන්ගොඩ , ධම්මකුසල අසළ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා යෝජනා කරනවා.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , ධම්මකුසල අසළ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරිම සුදුසු බවට ( සිතා මහත්මියගේ නිවස අසළ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.11 අම්බලන්ගොඩ ගාමිණී විද්‍යාල මාවතේ කොන්ක්‍රිට් ෂැලැබ් යෙදීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ගාමිණී විද්‍යාල මාවතේ කොන්ක්‍රිට් ෂැලැබ් යෙදීම සඳහා යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ ගාමිණි විද්‍යාල මාවතේ කොන්ක්‍රිට් ෂැලැබ් යෙදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.12** **මහ අම්බලන්ගොඩ මානිම්මුල්ල පාරේ අතුරු මාර්ගයේ තාර දැම්ම ( මනිම්මුල්ල හංදියේන් අජිත් මහතාගේ නිවස අසළ )සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ මානිම්මුල්ල පාරේ අතුරු මාර්ගයේ තාර දැම්ම ( මනිම්මුල්ල හංදියේන් අජිත් මහතාගේ නිවස අසළ ) සඳහා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

මහ අම්බලන්ගොඩ මානිම්මුල්ල පාරේ අතුරු මාර්ගයේ තාර දැම්ම ( මනිම්මුල්ල හංදියේන් අජිත් මහතාගේ නිවස අසළ ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.13** **මහ අම්බලන්ගොඩ පෝය සිමාව පාරේ තාර දැම්ම ( ධම්මික මහතාගේ නිවස අසළ )සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ පෝය සිමාව පාරේ තාර දැම්ම ( ධම්මික මහතාගේ නිවස අසළ ) සඳහා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා

**තීරණය-**

මහ අම්බලන්ගොඩ පෝය සිමාව පාරේ තාර දැම්ම ( ධම්මික මහතාගේ නිවස අසළ ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.02** ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණිය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

**05.02.01** **නව වසරේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරිමේදි පවතින චක්ලේඛයෝ ඇති දුබලතා පිටු දැකිම සුදුසු බවත් අදාල පළාත් පාලන බල ප්‍රදේශයන්හි දරුවන්ට ආසන්නතා ගණය යටතේ ලකුණු පිරිනැමෙන සේ පවතින චක්‍රලේඛය සංශෝධනය කරවා ගැනිම සුදුසු බවට ගරු අධ්‍යාපන අමාත්‍යාතුමන්ට යෝජනා කරනවා.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව සභාවෙන් ඉවත් කරනවා. ගරු මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉවත් කරනවා.

**05.03 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.03.01** අතිගරු ජනාධිපතිගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ රටම පිරිසිදු කිරිම වැඩ සටහන නිසි පරිදි අපද්‍රව්‍ය බැහැරලිම සම්බන්ධව සුදුසු බවට කර ලද යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ රටම පිරිසිදු කිරිම වැඩ සටහන නිසි පරිදි අපද්‍රව්‍ය බැහැරලිම ක්‍රියාත්මක කිරිම සුදුසු බවට යෝජනා කරනවා. මෙම වැඩ සටහන යටතේ අම්බලන්ගොඩ නගරයේ මාර්ග අයිනේ නොයොක් ආකාරයේ කැළිකසළ ගොඩ ගසා ඇත.උදාහරණයක් ලෙස ගෙවල් කඩා ඉවත් කරන කැබලි.ගස් කපා ඉවත් කරන ලද කොටස්.මේවා ඉවත් කිරිමේදි නගර සභාවේ සේවකයින් මහත් අපහසුතාවයට පත්වේ. මෙම අපද්‍රව්‍ය කාණු පද්ධති තුළ වැටිමේදි ජලය බැස යාම අවහිර වි මදුරුවන් වැනි සතුන් බෝවීම සිදුවේ. එහෙයින් මෙම අපද්‍රව්‍ය තමන්ගේ ස්ථානවල ගොඩ ගසා නගර සභාව වෙත මුදල් ගෙවා ඉවත් කර ගන්නා ලෙසත් , එසේ නොමැතිව පාර අයිනේ ගොඩ ගසා ඇත්නම් ඒවා ඉවත් කර ගන්නා ලෙසත් එසේ නොමැති නම් නිතිය මගින් කටයුතු කිරිමට පියවර ගන්නා ලෙසත් මෙම ගරු සභාවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව මා අපගේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාටත් දැනුම් දුන්නා. එතුමා ක්ෂණිකව පැමිණ මේ පිළිබඳව පරික්ෂා කළා. පරික්ෂා කර එතුමා ඒ අයට දැනුම් දුන්නා. ලිපිනයන් පවා ලියා ගත්තා. මේවා අයින් කරන්න. නැතිනම් නිති මඟින් කටයුතු කරනවා කියා. දැනටමත් ඒ කටයුත්ත සිද්ධ වුණා කිහිප තැනක. තව එක ස්ථානයක තිබෙනවා. ඒ වෙනුවෙන් මා අපේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට ස්තුතිය පුද කරනවා. එමනිසා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා නගර සභාවේ බලය අනුව දැන්වීමක් අලවන්න මේවා පාර අයිනේ දැමිමට විරුද්ධව නිති මගින් කටයුතු කරන බවට. මාගේ පුද්ගලික වියදමින් හරි ඒ පිළිබඳව දැන්වීමක් දැමිමට මා ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

**තීරණය**

අතිගරු ජනාධිපතිගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ රටම පිරිසිදු කිරිම වැඩ සටහන නිසි පරිදි අපද්‍රව්‍ය බැහැරලිම ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් අනුමත කිරිම සුදුසු බවටත් ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

05.03.02 2020 වර්ෂයේ නව රජය මගින් යෝජනා කර ඇති රැකියා ලක්ෂය සඳහා සමෘද්ධි ලාභින් නොවන අඩු ආදායම් ලාභින්ටත් එය පක්ෂ භේදයකින් තොරව ලබා දීමටත් දිවයිනේ ග්‍රාමසේවා වසම් 14200 ක් පමණ ඇති හෙයින් එක් ග්‍රාම සේවා වසමකට බෙදියන අයුරින් ( එක් ග්‍රාමසේවා වසමකට 7ක් පමණ ) ලබා දිමට කටයුතු කිරිම සම්බන්ධව ඉදිරිපත් කර ඇති යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

2020 වර්ෂයේ නව රජය මගින් යෝජනා කර ඇති රැකියා ලක්ෂය සම්බන්ධවයි. 2020 වර්ෂයේ නව රජය මගින් දිමට සැලසුම් කර ඇති අඩු ආදායම්ලාභි සමෘද්ධිලාභි පවුල් වලින් අ.පො.ස.( සාමාන්‍ය පෙළ අසමත් අයට ) වෙත රැකියා දශ ලක්ෂයක් ලබා දිමදිමට සැලසුම් කර ඇති අතර එය සමෘද්ධි ලාභින්ටත් එය පක්ෂ භේදයකින් තොරව ලබා දීමටත් දිවයිනේ ග්‍රාමසේවා වසම් 14200ක් පමණ ඇති හෙයින් එක් ග්‍රාමසේවා වසමකට බෙදි යන අයුරින් එක් වසමකට 7ක් හෝ 6ක් ලබා දිමට රජයට යෝජනා කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය

2020 වර්ෂයේ නව රජය මගින් යෝජනා කර ඇති රැකියා ලක්ෂය සඳහා සමෘද්ධි ලාභින් නොවන අඩු ආදායම් ලාභින්ටත් එය පක්ෂ භේදයකින් තොරව ලබා දීමටත් දිවයිනේ ග්‍රාමසේවා වසම් 14200 ක් පමණ ඇති හෙයින් එක් ග්‍රාම සේවා වසමකට බෙදියන අයුරින් ( එක් ග්‍රාමසේවා වසමකට 7ක් පමණ ) ලබා දිම සඳහා රජයට යෝජනා කිරිම සුදුසු බවට ගරු දිනයාදූර ධර්මදාස මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

05.04 ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

05.04.01 අම්බලන්ගොඩ . කරිත්තකන්ද වසමට අයත් පහත මාර්ග නම්කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ . කරිත්තකන්ද වසමට අයත් පහත මාර්ග නම්කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

- කුලරත්න හරස් පාර I ( සක්වා පාර)
- කුලරත්න හරස් පාර II ( නවාරා පාර)
- කුලරත්න හරස් පාර III ( හොරිවිල වෙද මැඳුර පාර)
- කුලරත්න හරස් පාර III දකුණ පළමු පටුමග ( පොරක් ඇළ සමඟ)
- කුලරත්න හරස් පාර III වම 2 පටුමග ( අලුතින් කොන්ක්‍රිට් කාණුව පාර)
- කුලරත්න හරස් පාර III වමට 3 පටුමග ( ශාන්ත ටියුෂන් පාර)

ඒ යටතේ කරිත්ත කන්ද ග්‍රාමසේවා වසමට අයිති මේ පාරේ හරස් පාරවල් කිහිපයක් තිබෙනවා. එම හරස් මාර්ග වලත් අතුරු මාර්ග කිහිපයක් තිබෙනවා. අපි නිතරම භාවිතා කරද්දි වරිපනම් අංක

ජනතාවට මතකත් නැහැ. ප්‍රසිද්ධ කෙනෙකුගේ නමින් තමයි මෙය පාවිච්චි වෙන්නේ. එතකොට ගොඩක් වෙලාවට අපහසුතාවයට පත්වෙනවා. පිට පළාතකින් පැමිණි අයෙකු හෝ වේවා මේ ලිපිනයක් දැනගැනීමට මේ මහා මාර්ගයක් දැන ගැනීමට. එම මාර්ග නම්කිරීමට මේ සභාවට මා යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

මෙහි තිබෙන්නේ කුලරත්න පාර අපි අම්බලන්ගොඩ සිට යනවිට රොසෙත් හංදිය වෙත යනවිට කරිත්ත කන්දට අයිති වෙන්නේ වම් පැත්ත. දකුණු පැත්ත අයිති වෙන්නේ විලේගොඩ වසමට. එතකොට මේ වම් පැත්ත වසම ගැන තමයි මා මේ කතා කරන්නේ. එකයි මා මේ වම දකුණ කියා පාරවල් දමා තිබෙන්නේ.කුලරත්න හරස් පාර I ( සක්වා පාර) කියා මා නම්කළේ එය හැඳින්වීමට දැනට දැම්මේ නමුත් මෙය කුලරත්න හරස් පාර I දැනට සක්වා එකට අලුතින් කොන්ක්‍රීට් කරන ලද පාර, කුලරත්න හරස් පාර II නවාරා පාර.නවාරා පංතිය සංඝරාජ මාවතට සම්බන්ධ වෙන එක. මේ අකාරයෙන් ඉහත මාර්ග නම්කරන ලෙස ගරු සභාවට යෝජනා කර සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඉහත යෝජනා සම්මත කරනවා විරෝධතා කැඳවා අවශ්‍ය කටයුතු කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ . කරිත්තකන්ද වසමට අයත් පහත මාර්ග නම්කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

- කුලරත්න හරස් පාර I ( සක්වා පාර)
- කුලරත්න හරස් පාර II ( නවාරා පාර)
- කුලරත්න හරස් පාර III ( හොරිවිල වෙද මැදුර පාර)
- කුලරත්න හරස් පාර III දකුණ පළමු පටුමග ( පොරක් ඇළ සමඟ)
- කුලරත්න හරස් පාර III වම 2 පටුමග ( අලුතින් කොන්ක්‍රීට් කාණුව පාර)
- කුලරත්න හරස් පාර III වමට 3 පටුමග ( ශාන්ත ටියුෂන් පාර)

ඉහත ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට විරෝධතා කැඳවා අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

05.05 ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා.

**05.05.01 2019 දකුණු අසියානු තරඟාවලියේ ලෝකඩ පදක්කම් දිනාගත් එම්.ඩබ්.තාරිකා සමන්මලි ක්‍රීඩිකාවට සුභාශිංසනය පල කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රීනී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**</u>

2019 දකුණු අසියානු තරඟාවලියේ ලෝකඩ පදක්කම් දිනාගත් එම්.ඩබ්.තාරිකා සමන්මලි ක්‍රීඩිකාවට සුභාශිංසනය පල කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.ගරු සභාපතිතුමනි , දකුණු ආසියානු තරඟාවලියේ රන් පදක්කම් හා ලෝකඩ පදක්කම් ලබාගත්ත එම්.ඩබ්.තාරිකා සමන්මලී ආදර දියණියට අපේ සුභාශිංසනත් මා ඇතුලු මගේ සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ සුභාශිංසන මෙවෙලේ එක් කරමින් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වගේ දක්ෂ ආදර දියණියන් හට ලබාදෙන්න පුළුවන් ක්‍රීඩා ඇමතිතුමාට කියලහරි එතුමිය නංවාලීමට අවශ්‍ය කටයුතු යෝජනාවක් යවල පුළුවන් දෙයක් එතුමියට ශක්තිය ලබාදෙන්න.එතුමිය ඉදිරියට ගෙන යන්න. මොකද අම්බලන්ගොඩ නගරයේ පෝරඹ කියන ග්‍රාමයේ ජීවත්වන පලාදූව කියන ගමේ ජීවත්වන ආදරණීය දියණියගේ අනාගතය සාර්ථක කරගන්න අවශ්‍ය පියවර ගන්න කියල ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපේ අතුල ප්‍රියන්ත නාගරික මන්ත්‍රීතුමා ගෙනැල්ල තියෙන යෝජනාව ඉතාමත් හොද යෝජනාවක්.මොකද මෙම ක්‍රීඩිකාව පෝරඹ , පලාදූව ප්‍රදේශයේ . මමත් දන්නෙ හැබැයි එක දවසක් ඔතනින් යනකොට උත්සවයක් තිබුණා. මං හිතන්නේ ඒ ගමේ උදවිය දර්ශන මහත්තයද කොහෙද ඒ සුජීව එගොඩගේ මහත්මයයි එකතුවෙලා පිළිගැනීමේ උත්සවයක් ලොකුවට තිබුණා එතන. මාත් ඉතින් බැලුවා ඔබතුමා ඉන්නවද කියලා. ඔබතුමා දන්නෙ නැතිව ඇති සමහර වෙලාවට මෙම ක්‍රීඩිකාව ඉතාමත්ම දක්ෂ අයුරින් ක්‍රීඩාකරන ක්‍රීඩිකාවක්. ඉතින් අපේ නගර සභාවේ ගරු මන්ත්‍රී අතුල මහත්මා දාපු යෝජනාවට අප් සුභාශිංසන කරනවා. එම ක්‍රීඩිකාවට සියලුම අනාගත බලාපොරොත්තු ඒ වගේම ක්‍රීඩාවන් සම්බන්ධ දක්ෂතා වැඩිවැඩියෙන් කරන්න යොමුවෙලා අපේ ශ්‍රී ලංකාවට කීර්තියක් ගෞරවයක් තව තවත් ඉදිරියට ගෙන එන්න ලැබේවායි කියල ප්‍රාර්ථනා කරනවා. එවගේම අපි ඉල්ලා සිටිනවා නගර සභාවෙන් මැයට සුභාශිංසන කරල ලිපියකින් දන්වල අපේ මාධ්‍යවේදීන් මහතෙකුත් මේකට බලල එතුමියට එම ක්‍රීඩිකාවට ශක්තියක් ධෛර්යයක් වෙන්න. ඒ මාධ්‍යවල එලකරලායම් ගරුත්වයක් ලබාදෙන්න කියල ඉල්ලා සිටිමින් නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම දිරිය දියණියක් ගැන කතා කරන්න මෙවැනි යෝජනාවක් දැමීම සම්බන්ධයෙන් ගරු අතුල මන්ත්‍රීතුමාට මගේ ප්‍රශංසාව පුද කරනවා. මොකද ඇත්තෙන්ම අද සමාජයට අවශ්‍යවෙලා තියෙන්නෙ මේ වගේ දිරිය දියණියන්.මොකද ඇත්තෙන්ම අපේ ලංකාවට මේ වගේ කීර්තියක් සාමාන්‍ය පන්තියේ දැරියක් වශයෙන් ඒ දැරිය ලබාදීල අපේ අම්බලන්ගොඩ නගරෙ ලබුදූව කියන්නෙ ඉතාමත් දුෂ්කර ගම්මානයක්.ඒ ගම්මානයේ මෙවැනි ක්‍රීඩිකාවක් බිහිවීම ඇත්තෙන්ම තවත් අපට අමරණීයයි. ඒ හින්දා ගරු සභාපතිතුමනි අපට නගර සභාව මගින් කළ හැකි දෙයක් තියෙනවනම් ඒ ක්‍රීඩිකාවගේ දියණියගේ අභිවෘද්ධිය තකා අපි යම්කිසි පියවරක් ගනිමු.ඒ වගේම ගරු මන්ත්‍රීතුමාට අපි කියනවා එවැනි උත්සවයක් සංවිධානය කිරීමේදී මොකද ගරු මන්ත්‍රීතුමන්ලාට යම්කිසි විදියකින් එයට සහභාගී වෙන්න ලැබෙනවනම් මං හිතන්නෙ ඒක අපේ භාග්‍යයක්.යුතුකමක්. ඒ නිසා එවැනි උත්සව සංවිධානය කරනකොට ඒ වගේ දිරිය දියණියො තවත් උත්සාහවන්ත කරන්න අපිවත් සහභාගි කරවන්න කටයුතු කළොත් හොඳයි කියල මම ඒ අවස්ථාවේ සහභාගි වෙන්න ලැබුණනම් ඒක භාග්‍යයක් ලෙස සලකනවා. ඒ හින්දා එතුමියට ශක්තිය ධෛර්යය

ලැබිල තවතවත් ශ්‍රී ලංකාවට අම්බලන්ගොඩට හොඳ ක්‍රීඩිකාවක් ගුණයහපත් දක්ෂ ක්‍රීඩිකාවක් වන්න ආශිර්වාද කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි අපේ අතුල මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතා වටින එකක්. මොකද මේ තාරිකා සමන්මලී කියන දියණිය මමත් ඉතා හොඳින් දන්නා දියණියක්.මං හිතන හැටියට මැය කරාටේ ක්‍රීඩාවෙන් තමයි මේ දස්කම් දක්වල තියෙන්නේ.ඇගේ පළමු ගුරුවරයා සුමිත් ගිණිගේ මහත්මයා. මට ආඩම්බරයි මමත් මැය සමග ටිකක් සෙල්ලම් කරන්න අවස්ථාව මට ලැබිල තියෙනවා.මං හිතන්නේ මං ජීවිතේ ලබපු ලොකු ගෞරවයක් හැටියටත් මං ඒක සලකනවා. ඒ වගේම උත්සවයක් ගැන මම දැනගෙන හිටියෙ නැහැ. දැනගෙන හිටියනම් සහභාගී වෙන්න ඒක මා ලැබූ ගෞරවයක් හැටියට සලකනවා. ඇයට අපට නගර සභාවක් හැටියට අත දෙන්න පුළුවන්නම් මොන ආකාරයෙන්හරි ඒ අප විසින් කළ යුතු රාජකාරියක් හැටියට මා දකිනවා.ඇයට සුභ පතමින් මා නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්න මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මම මේ ටික කිව යුතුයි. මොකද ගරු සභාපතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීවරුන්ගේ සුභාශිංසනය එලකරළා. මටත් අන්තිම මොහොතෙ කිව්වෙ.දේශපාලඥයො සම්බන්ධ කරගත්තෙ නැහැ. එයාගෙ ගුරුවරයෙකුයි ගමේ අයත් එක්ක තමයි ඒ උත්සවය පැවැත්වුවේ. මට අන්තිම මොහොතෙ කතාකරා මන්ත්‍රීවරයෙක් විදියට නෙවෙයි. ගමේ කෙනෙක් විදියට කතාකළා. අන්තිම මොහොතෙ මටත් කතාකළේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,ගරු අතුල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුව තාරිකා සමන්මලී ක්‍රීඩිකාව දකුණු ආසියාව නියෝජනය කරල ලෝකඩ පදක්කමක් ශ්‍රී ලංකාවට හිමිකරල දීල තිබෙනවා. අපි ඒ ගැන ඇයට සුභ පතන්න ඕන. ඒ වගේම අපි දිරිය දියණියක් විදියට ඇය අවම පහසුකම් යටතේ මේ වගේ දක්ෂතා ලැබීම පිළිබඳව අපි බොහොම සන්තෝස වෙන්න ඕන. එතුමා මුලදි ප්‍රකාශ කළා කරාටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් කියලා. ඇත්තටම කියනවනම් කරාටේ ක්‍රීඩාවට අම්බලන්ගොඩ තියෙන එකම ස්ථානය අර ඇඩ්වන්චරස් කියන ක්‍රීඩා සමාජය විතරයි . ඒ අර සුමිත් ගිණිගේ මහත්මයා මෙහෙයවන්නේ ඒක.එතුමගේ ගෝල ශිෂ්‍යාවක් වශයෙන් තමයි මේක ප්‍රගුණ කරලා තියෙන්නේ. ඒක නිසා අපි එම ආයතනයට වුණත් සුභ පැතීම අපේ යුතුකමක්.මං හිතන්නෙ මම ඇසින් දුටුවා ඒ අය සුභාශිංසනය කරලා නගරයේ වීදි වටේ වාහනවලින් ඒ දෙමව්පියන් ඇය කැඳවගෙන යනවා. ඔවුන් ඒ සතුට ලැබුවේ ඇය නිසා. ඒ නිසා අම්බලන්ගොඩ නගරයට ගෞරවයක් වශයෙන් අපි අම්බලන්ගොඩ නගර සභාව විදියට සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ප්‍රණාමය පුද කළ යුතුයැයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා ගරු අතුල මන්ත්‍රීතුමාගේ යෝජනාව සමග එකඟ වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ යෝජනාව ඒ මහත්මියට දන්වන්න. මීළඟට ගරු අයිරාංගනි මන්ත්‍රීතුමියගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**තීරණය**

2019 දකුණු අසියානු තරඟාවලියේ ලෝකඩ පදක්කම් දිනාගත් එම්.ඩබ්.තාරිකා සමන්මලි ක්‍රීඩිකාවට සුභාශිංසනය පල කර දන්වා යැවිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා විසින් කරන ලද යෝජනාව අනුමත කළ යුතු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

**05.06 ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.06.01 කාන්තාවන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා කාන්තා කමිටුවක් ආරම්භ කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා. කාන්තාවන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා කාන්තා කමිටුවක් ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කරමි.

<u>**ගරු නගර සභා මන්ත්‍රීනී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

කාන්තා කමිටුවක් පිහිටුවීමේ අරමුණ අදහස් කළේ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය ස්වයං රැකියාවන් හඳුනා ගැනීම. මම මෙතනදි බැලුවෙ ප්‍රජාමූල සමිති තියෙනවා කොට්ඨාශ දහතුනේම. මම ආසයි ප්‍රජාමූල සමිතිත් එකතු කරගෙන ඒ ඒ කොට්ඨාසවල කාන්තාවන් එක්ක මේ කමිටුව මගින් අපි පොඩි සාකච්ජාවක් කරල මොකද මේ කමිටුවට මන්ත්‍රීවරියන් අපි 06 දෙනා අනිවාර්යයෙන්ම සහභාගී වෙන්න ඕන. ඊලඟට ප්‍රජා සංවර්ධන නිලධාරී සංවර්ධන නිලධාරී මහත්මීන් ඉන්නවා නගර සභාවෙ ඒ අයගේත් සහයෝගය අරන් ගරු සභාපතිතුමාගේ ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඇතිව මේ කාන්තා කමිටුව මගින් අපි මේ වගේ දේවල් කරන්න බලාපොරොත්තු වෙනවා.එකක් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය ස්වයං රැකියා වැඩසටහන් හඳුනා ගැනීම.ගමින් ගමට තියෙන්නෙ එක එක ස්වයං රැකියාවල්.දැන් මොකද ධීවර පැත්තෙ තියෙන ස්වයං රැකියාව නෙමෙයි ඕකන්ද පැත්තට ඕන වෙන්නෙ. තල්ගස්ගොඩට ඕන වෙන්නෙ වෙනස් ස්වයං රැකියාවක්. ඒක නිසා අපි කාන්තාවන් හමුවෙලා මේ කමිටුව මගින් අදහස් කරනව ඒ කාන්තාවන්ගේ ස්වයං රැකියා කමිටු මොනවද කියල හඳුනා ගන්නවා. මොකද දැන් මේ පවතින රජයෙන් කියනව ස්වයං රැකියාවලට උදව් කරනව කියලා. අපි ඒ සම්බන්ධව ඊලඟට කාන්තාවන්ගේ සෞඛ්‍ය ගැටලු සාකච්ජා කරනවා. මොකද ගම්වල ඉන්න කාන්තාවන්ට සමහර සෞඛ්‍ය ගැටලු තියෙනවා. මේ අයට කතාකරන්න කියන්න කරන්න බැහැ. ගොඩක් අය ඉතින් බැරි අය ඉන්නවා. අපි නගර සභාවෙ මන්ත්‍රීවරියන් වශයෙන් යුතුකමක් තියෙනව ඒ කාන්තාවන්ගෙ තියෙන සෞඛ්‍ය ගැටලු හඳුනාගෙන ඒවට අවශ්‍ය විසඳුම් ලබාදෙන්න. ගරු සභාපතිතුමනි ඊලඟට හෙළ බොජුන් හලක්.මොකද හැමතැනම තියෙන දෙයක් තමයි හෙළ බොජුන් හලක්. අම්බලන්ගොඩ නගර සභාව මගින් හෝ ආරම්භ කරන්නේ කාන්තාවන්ගේ ආර්ථිකය නංවාලීමටත් , ජනතාවට පෝෂ්‍යදායි ආහාර ලබාදීමටත් අවශ්‍ය කටයුතු සලස්වා දෙන්න කියලා බලාපොරොත්තු වෙනවා මේ කමිටුව මගින්. ඊලඟට දරුවන් මත්ද්‍රව්‍ය උවදුරින් ඈත් කරගැනීම සඟඳහා අවශ්‍ය දැනුම ලබාදීමට. මොකද දරුවන් විතරක් නෙමේ මව්වරු මේ සම්බන්ධව දැනගන්න ඕන මොකද ළමයා ගැන සොයා බලන්න ළමයා ආරක්ෂා කරගන්න ඕන. ඒ අපේ කාන්තාවන්ගේ වගකීමක්. අපේ

ආදරණීය අම්මලා. ඒ නිසා ඒ සම්බන්ධව වැඩසටහනක් කරන්න මගේ අදහසක් තියෙනවා.දිරන කසල උපයෝගී කරගෙන නිවසේදීම කොම්පෝස්ට් පොහොර නිපදවීම .ඒ තුලින් ගෙවතු වගාවන් සඳහා දිරිගැන්වීම. ඒ මගින් වසවිසවලින් තොර ආහාර පරිභෝජනය කිරීමට හැකිවීම.සමහර අයට භූමි ප්‍රදේශ නැතත් සමහර අම්බලන්ගොඩ නගර සභාවේ ඉන්න වැසියන්ගේ ගෙවල්වල මේ ගෙවතු වගාව ලස්සනට කරගන්න පුළුවන්. කොම්පෝස්ට් නිෂ්පාදනය කරගන්න පුළුවන්. ඒවට දක්ෂ කාන්තාවන් අම්බලන්ගොඩ ඉන්නවා. ඒ නිසා ඒකත් අපි බලාපොරොත්තු වෙනවා හැම මන්ත්‍රීවරයෙක්ගෙම සහයෝගය අනුව හැම මන්ත්‍රීවරයෙකුගෙම කොට්ඨාසෙකම මේක කරන්න.ඊලඟට මල් වැවීම, අත්කම් නිර්මාණ, රූපලාවන්‍ය, මැහුම් ගෙතුම්, ගෘහ ආශ්‍රිත නිෂ්පාදන, විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රයේ දැල් මැසීම ආදී පුහුණුවීම් ලබාදී කාන්තාවන් සවිබල ගැන්වීම. මොකද අද කාන්තාවන් උපයන එක තමයි ගෙදරට වැදගත්ම වෙලා තියෙන්නේ. මොකද ස්වාමියා ගෙනත් දෙන මුදල්වලින් ජීවත් වන්න අපහසුයි. එතුමියත් දායකත්වයක් වෙන්නම ඕන පවුල ජීවත් කරවන්න. එතුමියගේ ආර්ථිකය පෝෂණය කරොත් තමයි කාන්තාව සවිබල ගැනුවුණොත් තමයි මේ ගෙදර වැඩකටයුතු ටික කරගන්න පුළුවන් කියල මා අදහස් කරනවා. ඒකට සහයෝගය ලබාදෙන්න.පාසල්වල 10 වෙනි ශ්‍රේණියෙන් ඉහල ශිෂ්‍යාවන්ට අඩු වයසින් විවාහවීම්,ලිංගික අපයෝජනයට ලක්වීම් ,විවිධ සමාජ රෝගවලට ගොදුරුවීම් පිළිබඳව දරුවන් දැනුවත් කිරීම . මේ සම්බනධව විශේෂඥ වෛද්‍ය රමණී මහත්මිය කැමති වෙලා තියෙනවා සම්පූර්ණ සේවය නොමිලේ ලබාදෙන්න. පාසල් විදුහල්පතිවරු එක්ක කතාකරල මොකද අපි කමිටුවක් මගින් ගිහිල්ල කතා කරනකොට අපිට ඒකට ආශිර්වාද ලබාගන්න පුළුවන්.ඒ යන පොඩි වියදම කිරි පැකට් එකක් වගේ සභාවෙන් ලබාදෙන්න වෙනවා. ඒ සම්බන්ධව වැඩපිළිවෙලක් අපි කරල අපේ ආදරණීය දරුවන්ව ආරක්ෂා කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඊලඟට නීතියෙන් කාන්තාව විශේෂයෙන් නීතියෙන් කාන්තාව සුරක්ෂිත කළහැකි ආකාරය පිළිබඳව කාන්තාවන් දැනුවත් කරනවා. අපේ නීතිඥවරියකුත් ඉන්නවා. අපිට අදාළ නීතිඥවරයෙකුත් ගෙන්න ගත්තම හොඳයි.මොකද කාන්තාවන් කොහොමද නීතියෙන් ආරක්ෂා කරල තියෙනවද කියල.සමහර කාන්තාවන් දන්නෙ නැහැ. මොකද අපේ ගරු සභාපතිතුමත් නීතිඥවරයෙක්. විවිධ ක්ෂේත්‍ර සම්බන්ධව අපේ නගරයේ සිටින කොට්ඨාසවල සිටින ආදරණීය කාන්තාවන්.විශේෂයෙන් දියණියන්.ඊලඟට ආදරණීය දරුවන් සියලු දෙනාම සවිබල ගැන්වීමට අරගෙන ආර්ථිකයට කාන්තාවන් සවිබල ගන්වල අපි කාන්තාවන් වශයෙන් සතුටු වෙන්න පුළුවන් එතකොට අපි කාන්තා මන්ත්‍රීවරියන් වශයෙන් පත්වෙලා අපි යමක් කළ යුතුයි කියන අදහස මං මේ කාන්තා කමිටුව ආරම්භ කරන්නේ. ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන්. මේ වැඩ කොටස තමයි කරන්නේ අපිට එක් එක්කෙනාගෙන් ලැබෙන උපදෙස් අනුව කවුරුහරි කිව්වොත් මේ දේ කරනවනම් හොඳයි කියල ඒ වගේ ගරු මන්ත්‍රීවරුන්ගේ සියලු උපදෙස් මත වැඩකරන්න කැමැත්තෙන් ඉන්නවා ඒ නිසා කාන්තා කමිටු ආරම්භ කිරීමට අවස්ථාව දෙන්න කියල මං ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු අයිරාංගනී මන්ත්‍රීතුමියගේ යෝජනාව එකක් නෙමේ.යෝජනා පොකුරක් තමයි ඉදිරිපත් කළේ. හැම එකම මට මතක නැතත් එක කාරණයක් කෙරෙහි මගේ හිත අවධානය යොමුවෙනවා. ළමයි සමාජගත වෙනකොට ළමයි විනාශය කරා යොමුවීම පිළිබඳව එතුමිය කතාකරා. ඒ වෙනුවෙන් අපට මොනවහරි කරන්න පුළුවන් නම් අපි කරන්න ඕන ප්‍රධානම දේ ඒක තමයි.මිනිස්සුන්ගේ ආර්ථික මට්ටම ගොඩනගාගන්න උදවු කරන එක කරන්න ඕන. නමුත් අනාගතය තමයි අපේ දරුවෝ. අපේ දරුවන්ව සමාජගත වෙද්දි ඔවුන්ව නිසිමගට විනාශ වෙන්න නොදී රැකගන්න කටයුත්තක් අපි ආරම්භ කරනවනම් ඒක තමයි අපි කරන්න ඕන ප්‍රධානම දේ. අපට මතකයි අපි පොඩිකාලෙ ඉඳන් සමාජයෙන් අපිව විනාශවෙන තත්ත්වයක් තිබුණෙ

නැහැ.මොකද පොඩිකාලෙ අපිට දෙමව්පියොන්ගෙන් එච්චරම අවවාද අනුශාසනා උවමනා වුණේ නැහැ. මොකද සමාජය දූෂිත නැහැ. අද වෙනකොට එහෙම නෙවෙයි. අද වෙනකොට සමාජය අන්ත දූෂිතවෙලා තියෙන්නෙ. එතෙන්දි අපි හඬනගලා ජනතාව අතරෙම තමයි දූෂිතයො ඉන්නෙ.ඒක නිසා අපි පුංචි කාලෙදි නොලැබූ විනාශයක් නව පරපුරේ දරුවන්ට අත්විඳින්න සිද්ධවෙලා තියෙනවා. ඒක නිසා මං හිතනවා ඒ යෝජනා පොකුරෙන් මගේ හිතට දැනුණු සංවේදී යෝජනාව හැටියට දරුවන් නිවැරදි මග කරා යොමුකිරීමේ ක්‍රියාමාර්ගයක් ගන්න. එහෙම ගන්නවනම් අපේ පූර්ණ සහයෝගය ලබාදෙනවා. ස්තූතියි.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පි. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ගරු අයිරාංගනී මන්ත්‍රීතිමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් කියන්න ඕන.ඇත්තෙන්ම හොඳ යෝජනාවක්.එතුමිය එකින් එක කරුණු පැහැදිලි කරල කිව්වා. අපිට වඩා හොඳට පැහැදිලි කරල කිව්වා. ගොඩාක්ම හොඳයි. ඇත්තටම කාන්තාවන් දරුවන් සුරක්ෂිත කිරීම සඳහා යම් වැඩපිළිවෙලක් කළ යුතුව තිබෙනවා. ඒක මං හිතන්නෙ අපිට ලංකාව පුරා කරගන්න බැරිවුණත් අපි හොඳ දෙයක් මේ සමාජයට කරා කියල දැනෙන ආකාරයට දෙයක් කරන්න පුළුවන් වෙයි මේ විදියට කාන්තා කමිටුවක් ආරම්භ කරොත්. කමිටුවෙ ගරු මන්ත්‍රීවරියන් 06 දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරුත් 15 දෙනෙක් ඉන්නවා. ඔබතුමා ඉන්නවා බොහොම හොඳට නීතිඥවරයෙක් විදියට අපේ ගරු සභාපතිතුමා.උප සභාපතිතුමා ඉන්නවා.අපේ විපක්ෂ නායකතුමා ඉන්නවා. මේකට අපට ඔබතුමන්ලගෙත් දායකත්වය දෙනකොට අපිට බොහොම හොඳට කරන්න පුළුවන්.මොකද ඔබතුමන්ල නැතිවුණොත් ඔබතුමන්ලගෙ භාර්යාවො සහභාගී කරාම දියණිවරු ඉන්නවනම් ඒ අය සහභාගී කරාම මේ කමිටුව අපිට හොඳට ගෙනියන්න පුළුවන්. නගර සභා සීමාවෙත් ඔය නොපෙනෙන ආකාරයේ ගණිකා වෘත්තියක් තියෙනවා ගරු සභාපතිතුමනි.ඇතිතටම මේ පාසල් ළමයි ගොඩක් ළමා අපචාරවලට ගොදුරුවෙලා තියෙනවා.ඉතින් ඒක නිසා අපට පාසල්වලට ගිහිල්ල ළමයින්ව දැනුවත් කරගන්න ගරු අයිරාංගනී මන්ත්‍රීතුමිය කිව්ව විදියට වෛද්‍යවරියක් , නීතිමය පැත්තෙන් නීතිඥ සහයකුත් අපට වඩා ජොෂ්ඨයන් ගෙන්නල අපටත් එහෙම සහයෝගයක් දෙන්න පුළුවන්. අගාධයට යන මේ පරිහානියට යන මේ සමාජය ගලවා ගැනීමට අපට මේ කාන්තා කමිටුවෙන් යම් දෙයක් කරන්න පුළුවන් වේවි කියල මං විශ්වාස කරනවා. ඉතින් ගරු සභාපතිතු1මා මාත් ගොඩක් කල් ඉඳන් හිතාගෙන හිටපු කාරණයක් ගරු අයිරාංගනී මන්ත්‍රීතුමිය කිව්වා හෙළ බොජුන් හලක් ආරම්භ කරමු කියල.මං හිතන්නෙ අම්බලන්ගොඩ එහෙම එකක් තිබ්බනම් හරි හොඳයි. හැමදාම ඒක තියෙනවා.අපට පුළුවන් නම් ඒක ඔය හල්වතුර ප්‍රදේශයෙන් හරි මොකද මං දැක්ක මං අනුරාධපුරේ ගිහිල්ල යාපනේ යනකොට අනුරාධපුර යාපනේ ප්‍රදාන මාර්ගයේ තියෙනවා. පාලම ලඟ වුණත් හෙඳයි ගරු සභාපතිතුමා. නුවර යනකොට තියෙනවා දෙතුන් පලක්ම. කතරගම යනකොට තියෙනවා. යාපනේ යනකොට තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා අපට හෙළ බොජුන් හලක් ආරම්භ කරොත් මේ ගෙදරවල්වලට වෙලා ඉන්න කාන්තාවන් මොකක්හරි රැකියාවක් කරයි. අනික එහෙම කරොත් ගරු සභාපතිතුමා මුලු මුලුවල තියෙන ඔය පොඩි කඩ අර පෙට්ටි කඩත් අහෝසි වෙනවා. ඇයි ඒ ගොල්ලන්ට එතකොට අපි එතනින් දෙනවනෙ තොටසක්.එතකොට ඒ ගොල්ලො ආප්ප තම්බන කෙනා ආප්ප තම්බයි.කොකිස් තම්බන කෙනා කොකිස් තම්බයි. ඒ නිසා ගරු සභාපතිතුමා ඒ ගැන නම් විශේෂ අවධානයක් යොමුකරන්න කියල අපි ඉල්ලා සිටිනවා.ඒක කරෝත් මං හිතන්නෙ ඔබතුමා ඉතිහාසගත වෙනවා.මොකද අම්බලන්ගොඩ නගරාධිපතිතුමා විදියට. ඇත්තටම ගරු සභාපතිතුමා ඒ වගේ දෙයක් කරන්න. ඔබතුමා මේ වගේ දෙයක් කරා කියල අම්බලන්ගොඩ ගරු සභාපතිතුමා විදියට ඔබතුමාගේ කාලයේ අපේ පාලන සමයේ අපේ ගරු මන්ත්‍රීවරුත් එක්ක මෙහෙම දෙයක් කරා කියන එක ඉතිහාසගත වෙනවා ගරු සභාපතිතුමා. ඒකත් කරන්න මං හිතන්නෙ ඌරුවත්තෙ පාලම

ලඟ පුළුවන් වෙයි. ඌරුවත්තෙ පාලම ලඟ අපේ කොටසෙ අපට පුළුවන් වෙයි පොඩි හෝල් එකක් ගැහුවම ඒකත් කරන්න.ගරු සභාපතිතුමා හොඳම අදහස ඒකයැයි කියමින් අපේ මේ කාන්තා කමිටුවට ඔබතුමනිලාගේ භාර්යාවන් දියණියවරුන් සහභාගී කරවල තවත් කාන්තාවන් අපේ තියෙනවනෙ ප්‍රජා කමිටු එහෙම. ගමෙන් එකතු කරල අපේ මේ කමිටුව පිහිටුවන්න ඔබතුමන්ලාගෙ සහයෝගය ලබාදෙන්න කියමින් ගරු මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මමත්මියට නැවතත් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු ඉන්ද්‍රා අයිරාංගනී මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද අපේ සියලුම කාන්තා මන්ත්‍රීතුමියන් එකතුවෙලා අම්බලන්ගොඩ නගර සීමාවට අපේ අනන්‍යතාවයත් තහවුරු කරමින් ඒ ගෙනා යෝජනා මාලාව ඉතාම කාලෝචිත යෝජනා. සමාජය නිසි මගට ගැනීම සඳහා අදහසකින් ඇතිව බොහොම පිවිතුරු යෝජනා මාලාවක්. එම යෝජනා මාලාව ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මම හිතනවා මම විශ්වාස කරනවා අපේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඒ ගරු මන්ත්‍රීතුමියන් 06 දෙනා වෙත ලබාදිය යුතුයි.ඒ වගේම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ඒ අයට ඒ වැඩසටහන් ඉදිරියට ගෙනියන්න අපි ශක්තියක් වෙමු කියලා ගරු සභාපතිතුමා ඇතුලු අපි සියලුම දෙනා සහයෝගය ලබාදෙන්න. ගරු සභාපතිතුමාගෙනුත් ඒ සඳහා අවධානය යොමුකරන්න කියල මං ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී මහගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ ඉන්ද්‍රා අයිරාංගනී ගරු මන්ත්‍රීතුමිය ගෙනා යෝජනාව ඉතාමත්ම වටිනා යෝජනාවක්. ඉතින් ඇත්තටම මේ වෙනකොට කාන්තාවන් විශාල ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදයක හිරවෙලා තියෙනවා. ඒක නිසා කාන්තාවො ඇත්තටම දැඩි මානසික පීඩනයක ඒවගේ විශාල වශයෙන් අවධානමකට ලක්වෙලා තියෙනවා මුළු ගම පුරාම. ඉතින් ඕකත් එක්ක මෙන්න මේ යෝජනා මට හිතෙනවා ඒකට ලොකු විකල්පයක් වෙන්න ඉඩ තියෙනවා. මොකද කාන්තාවොන්ට සල්ලි නැති නිසානෙ වියදම් කරන්න ණය ගන්නෙ. එතකොට ණය අරගෙන ණය ගෙවාගන්න බැරිවුණාම සමහරවිට තමන්ගෙ ස්වාමිපුරුෂයා දන්නෙත් නැහැ. ගෙදර අය දන්නෙත් නැහැ. ඒ නිසා කාන්තාවන්ට යම්කිසි ස්වයං රැකියාවක නිරතවීමේ අවස්ථාව මෙතනින් උදාවෙනවා. ඒක නිසා මම හිතනවා ඉතාමත්ම වටිනා යෝජනාවලියක් එතන තියෙනවා. ඒ වගේම තමයි දරුවො ගැන කතාකළා. දරුවො ගැන කතා කරද්දි ඇත්තටම බොහොම සංවේදීව කියන්න වෙලා තියෙනවා. ගම් මට්ටමේ පාසල් යන දරුවෝ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා තියෙනවා සාමාන්‍ය පෙළටත් අඩු වයසෙ ඉන්න අය. පෞද්ගලිකව දැනුවත් වෙලා ඉන්නවා නමුත් ඒ දෙමව්පියන්ට කතාකරන්න බැරි අවස්ථාවන් තියෙනවා. ඉතින් ඒ සඳහා අපට පුළුවන් මේ වගේ පොඩි රැස්වීමක් හරි කැදවලා ගෙදර අම්මා තාත්තා මේ පිළිබඳව දැනුවත් කරන්න පුළුවන් අපට.එතකොට ඉඟියක් හරි දෙන්න පුළුවන්නෙ ඒ වගේ අවස්ථාවකදි නේද? පෞද්ගලිකව කියන්න බැරි තැන් තියෙනවා. දරුවන් ගැන අපට කෙලින්ම ගිහිල්ල කතා කරන්න බැරි අවස්ථා තියෙනවා. අන්න ඒ වගේ තැනකදි මේක අපට උපයෝගී කරගන්න පුළුවන්. අපේ ගරු ලක්ෂ්මි මන්ත්‍රීතුමියත් කතා කරා. කුඩා දැරියන්ගේ තත්ත්වය පිළිබඳව.ඇත්තටම ඒ වගේ ලොකු ඛේදවාචකයක් අපේ රටේ මේ වෙනකොට පවතිනවා. විශේෂයෙන් ගම් මට්ටමින් පවා. ඔන්න ඔය සියලුම දේට අපට යම් තරමකින් හෝ මං හිතනවා දායකත්වයක් දරන්න ගරු මන්ත්‍රීවරු ගරු මන්ත්‍රීවරියන් විදියට හැකිවේවි කියලා.ඒ නිසා විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා ගරු සභාපතිතුමා සහ ගරු මන්ත්‍රීවරුන්ගෙත් දැඩි අවධානය මේ සඳහා යොමුකරන මෙනක් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේ අයිරාංගනී මන්ත්‍රීතුමියට

ස්තුතිවන්ත වෙනවා ඉතාමත්ම වටිනා යෝජනා කිහිපයක් සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. මෙහෙම එකක් තියෙනවා අපි සභාවට යෝජනා ගේනවා නමුත් යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ඒ යෝජනා ක්‍රියාත්මක නොවෙන අවස්ථා අපට දකින්නට තියෙනවා. මම හිතනවා මේ යෝජනාව අපි එකතුවෙලා දැඩි අධිෂ්ඨානයකින් යුක්තව කාන්තාවන් වශයෙන් ලොකු ශක්තියක් අරගෙන මේ යෝජනා ටික අපි ක්‍රියාත්මක කරමු කියල ඉල්ලමින් ඒ සඳහා සුභාශිංසන පතනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රිවරුනි අපගේ සහෝදර මන්ත්‍රීතුමිය විසින් ගරු අයිරාංගනී මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද යෝජනාව ගැන කතා කරනකොට ඇත්තෙන්ම මම කියන්න හිටපු දෙයක් මම හිතන විදියට අපගේ සහෝදර ජනතා විමුක්ති පෙරමුණේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීතුමියගෙන් කියවුණා. අපි දෙයක් යෝජනාවක් කතාවට විතරක් සීමාකරල යෝජනාවක් විතරක් වශයෙන් මේ සභාවට ගෙනැල්ල වැඩක් වෙන්නෙ නැහැ. ඒ හින්දා අපි ක්‍රියාත්මක තත්ත්වයට පත්වෙලා තමයි ගරු සභාපතිතුමාට හැම දෙයක්ම කරන්න බැහැ.විශේෂයෙන් රටේ අද කාන්තා නියෝජනය 25% ක් 30% ක් ඉන්න වෙලාවක ඇත්තෙන්ම අපේ සභාවෙ කාන්තා මන්ත්‍රීවරියන් 06 දෙනෙක් ඉන්නවා. විශේෂයෙන් ලේකම්තුමියත් කාන්තාවක්. ගණකාධිකාරිතුමිය කාන්තාවක්. ඒ වගේම වැඩි පිරිසක් කාර්යාලෙ ඉන්නෙ කාන්තාවො. ඒ නිසා කාන්තාවන් සඳහා ගෙනා යෝජනාවට අපි ඇත්තෙන්ම කතාවෙන් නැතිව ක්‍රියාවෙන් කටයුතු කිරීම අපේ යුතුකමක් කියල මං විශ්වාස කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමා ගැන කියන්න ඕන මොකද කාන්තාවො ගැන කතා කරනකොට ගරු සභාපතිතුමා අපි දාන්න ඕන යෝජනා කාන්තාවන් සම්බන්ධයෙන් සභාවට එතුමා දාල තියෙනවා. මොකද විශේෂයෙන් එතුමාට හොඳට දැනෙනවා කාන්තාවන්ගෙ ප්‍රශ්න.දැනෙන හින්ද තමයි එතුමා මං හිතන විදියට පහුගිය දවසක සභාවට දැම්මා අපේ දුගී ගැබිණි මව්වරුන් සඳහා අවශ්‍ය කරන දේවල් ලබාදෙන්න කටයුතු කරන්න කියලා. ඇත්තෙන්ම හොඳ යෝජනාවක්. මෙකද කාන්තාවක් මේ යෝජනාව දානවද පිරිමි මන්ත්‍රීවරයෙක් මේ යෝජනාව දානවද කියන එක නෙමෙයි ප්‍රශ්නෙ. අවශ්‍ය දෙයක් අවශ්‍ය විදියට කෙරෙනවනම් අපි ඒක අනුමත කිරීම තමයි යුතුකම. තව දෙයක් මම දැක්කා. අපේ සහෝදර නීතිඥ ගරු ලක්ෂ්මී මන්ත්‍රීතුමිය කිව්වා බොජුන්හලක්දාන කතාව. ගරු සභාපතිතුමනි සියලු මන්ත්‍රීවරුනි ඔබතුමාල අපි මේක ගැන කතා කළා.අපගේ ගරු ප්‍රධාන අමාත්‍ය වශයෙන් කටයුතු කරපු ෂාන් විජයලාල් මැතිතුමා ඇත්තෙන්ම එතුමා අපට කිව්වා ස්ථානයක් දෙන්න නගර සභාවෙන්. එතුමා ඒ අමාත්‍ය ධුරය දරණ කාලය තුළ ඒ සඳහා ප්‍රතිපාදන ලබාදීල ඒ කාර්යය කරන්න සැහෙන මහන්සි වුණා. ඇත්තෙන්ම අපෙන් ඒ දේ ඔබතුමාට කරගන්න බැරිවෙන්න ඇති. ඒ හින්දා මම දන්නවා ප්‍රධාන අමාත්‍ය කාර්යාලයට ගියාම අපි ඇත්තෙන්ම තේ බොන්න යන්නෙ එතන තියෙන ඒ දේශීය අවන්හලට. ඇත්තෙන්ම අපි මේ දේවල් අගය කරල විතරක් නෙමේ අපි ක්‍රියාවට නගන්න සූදානම් වෙන්න ඕන. ඒකට කැපකිරීම තියෙන්න ඕන. ඇත්තෙන්ම බොරුවට ඇවිල්ල සභාව දවසට අපි මෙතන කෑ කෝ ගහලා විවේචනය කරල ඒක නෙමේ අපේ යුතුකම හා වගකීම. අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් ප්‍රධානතම තැන දෙන්න ඕන මහජන නියෝජිතයො වශයෙන් ඒ කාර්යයන්ට. ගරු සභාපතිතුමාටවත් ගරු උප සභාපතිතුමාටවත් මේක තනියම කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව හොඳයි. ඔබතුමා කාන්තා මන්ත්‍රීවරියන්ගෙන් ප්‍රයෝජනය ගන්න. ලේකම්තුමියත් එක්ක කතාකරල අපි ඒකට සහයෝගය දෙන්නම්. වැඩපිළිවෙල හදන්න. හදල අපට භාරදෙන්න. මට වැඩ නැතුව නෙමේ මම ගොඩක් වෙලාවට සභාවට ඇවිල්ල නොයෙක් වැඩවලට ක්‍රියාත්මක වෙන්න සූදානම් වෙනකොට ඒ නිලධාරීන් ලඟට ගියාම නිලධාරීන් කියනවා අපට ගරු සභාපතිතුමා කියල තියෙන්නෙ කොට්ඨාසෙ මන්ත්‍රීගෙන් නිර්දේශය තිපුණොත් විතරයි මේ ටික කරන්න කියල තියෙන්නෙ කියල.එහෙමනම් ඉතින් ඒ වගේ ඔබතුමා ඇත්තෙන්ම දේශපාලනය අපි

කරන්න ඕන තමයි දේහපාලන පුහු මතවලින් අයින්වෙලා නගරෙට ආදරය කරන්න. ඒක හින්දා ඔය කොට්ඨාසෙ මන්ත්‍රීද මන්ත්‍රී කිව්වම මහජන නියෝජිතයෙක් කිව්වම අපි සියලු දෙනා මහජන නියෝජිතයො. ඒ හින්දා ඔබතුමා මේ ගැන ටිකක් අධ්‍යනය කරෝත් හොඳයි කියල මං විශ්වාස කරනවා.මොකද ගිය සභාවෙත් මං ඔබතුමාට කිව්වා. මොකද ඔබතුමා හැමදාම මේ සභාපති පුටුවෙ වාඩිවෙලා ඉන්නව දකින්න මම නම් කැමති නැහැ. මම කැමතියි ඔබතුමා ඉහලට ගිහිල්ල පළාත් සභාවෙ ප්‍රධාන අමාත්‍යතුමා වෙනවනම්. එහෙම නැත්නම් පාර්ලිමේන්තුවෙ මන්ත්‍රී කෙනෙක් වෙනවනම්. මොකද ඒක තමයි විය යුත්තේ. ඒ නිසා ගරු සභාපතිතුමනි ඔබතුමා මේ අපේ ගරු මන්ත්‍රිවරියො වශයෙන් නෙමේ සියලු දෙනා වෙනුවෙන් අම්බලන්ගොඩ නගරයේ යම්කිසි ක්‍රියාමාර්ගයක් සංවර්ධන වැඩවලදී හොඳ වැඩපිළිවෙලක් හදමු. හදලා මොකද ගරු විපක්ෂ නායක ඩෙනට් මන්ත්‍රීතුමාත් නගරෙට ආදරේ පුද්ගලයෙක්. අපි සියලු දෙනාට ප්‍රධාන දේ නගරේ. අපි නගරෙට ආදරේ වෙන්න ඕ◌ීන.ඊලඟට රටට ආදරේ වෙන්න ඕන. ඉස්සෙල්ල අපි 01 නගරය. නගරෙට ආදරේ වෙන්න ඕන.පවුලට ආදරේ වෙන්න ඕන. රටට ආදරේ වෙන්න ඕන. ඒ සඳහා අපි සූදානම් වෙමින් ඔබතුමාට ශක්තිය ධෛර්යය මේ සම්බන්ධයෙන් ලබාදෙන්න අපි කටයුතු කරන්න අපි එකතු විය යුතු බව කියමින් මම නිහඬ වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මගේ ඉතින් අසල්වැසි ගරු මන්ත්‍රීතුමිය ඉන්ද්‍රා අයිරාංගනී අපේ මන්ත්‍රීතුමිය. ඉතාමත්ම හොඳ යෝජනාවක්.මොකද මටත් ඇහට දැනෙන නිසා තමයි මාත් මේ නැගිටල කතා කරන්නෙ. මට තේරුණා ගරු සභාපතිතුමාට නම් මේ ගැන දැනීමක් නැහැ කියලා. ඇහට දැනුනෙ නැහැ කියල තේරුණා. ඒක නිසා තමයි මං මේ නැගිටලා අවදි කරල කතා කරන්න හදන්නේ. නැත්නම් මේ වෙලාවත් එච්චර හොඳ වෙලාවක් නෙමෙනෙ. කාන්තාවන් සවිබල ගැන්වීම එක අරමුණක්. අනිත් එක ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීම.මං හිතන්නෙ කතා කරන්න දෙයක් නැහැ අපේ ගරු සභාපතිතුමාට මේක ක්‍රියාත්මක කරගන්න ඕන විදියට මෙතුමිය කතා කළා. ඒක පොඩ්ඩක් හිතල බැලුවම ඒක හරි. ඒ කියන්නෙ එතකොට තමයි ගරු සභාපතිතුමා ක්‍රියාත්මක වෙන්නෙ කියල මට හිතෙනවා. ඒක නිසා අපිට වැඩිදුර කතා කරන්න දෙයක් නැහැ. මොකද මෙතුමිය නැත්නම් කියාවි මමත් කතා කරේ නැහැ නේද කියල. ඉතාමත්ම හොඳ යෝජනාවක්. මොකද ඕනම රැස්වීමක ඕනම කර්තව්‍යයක පෙරමුණ ගන්නෙ කාන්තාවො. ගෙදරත් එහෙමයි. බොරුද මං අහන්නෙ හැමදේටම පෙරමුණ ගන්නෙ කාන්තාවො. ගරු සභාපතිතුමා ඔය කමටු තියාගෙන ගියා නේද ? මොනවද සංවර්ධන කමිටු අරව මේව තියාගෙන ගියාම වැඩිපුර ඉන්නෙ කාන්තාවො. පන්සලක් ගත්තත් එහෙමයි. දායක සභාවෙ ඔක්කොම ක්‍රියාත්මක වෙන්නෙ කාන්තාවො. එතකොට මෙතුමිය ගේන්නෙ ඒ තත්ත්වය තුළ ගරු මන්ත්‍රීවරියන් හැටියට පෙරමුණ අරගෙන යම් තැනකට ගෙනැල්ල මහජනතාවට සේවය සපයන්න. පැතිකඩ ගණනාවක් තියෙනවා. සෞඛ්‍ය පැත්ත කිව්වා. දේශීය ආහාර සම්බන්ධව කටයුතු කරන්න කර්තව්‍යයන් කිව්වා. යම් යම් කරුණු කාරණා ගොඩක් කිව්වා. ගරු සභාපතිතුමා හිතට ගත්තහම අන්තිම තීන්දුව ගන්කෙ ඉතින් ගරු සභාපතිතුමානෙ. ඒ නිසා ගරු සභාපතිතුමාට කියන්නෙ මේක හොඳ යෝජනාවක් ත්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා ඒක කල්පනා කර මේක ක්‍රියාවට නංවන්න ඕන ආකාරය නීත්‍යානුකූලව කටයුතු කරන්න. ඒක ඉතාම වැදගත්.මොකද අපේ ගරු උප සභාපතිතුමා ඉන්නවා. ගරු උප සභාපතිතුමත් එක එක හොඳ අදහස් දන්නවාඔය කාන්තාවන් ගැන. හිනාවෙන්න නෙමේ.මං කිව්වෙ ඇත්තටම. එතුමගෙ බලකායෙ ඉන්නෙත් කාන්තාවන්ම. පෙරමුණ අරගෙන යන්නෙ බලකායෙ කාන්තාවන්. ජන්ද දායකයින් ඒ සියලු දෙනාම ඉන්නෙ වැඩිපුර ඉන්නෙ කාන්තාවො. ඉතින් ඒක ලොකු හයියක් ජයග්‍රහණය කරන්න. මෙතුමිය දැන් දායක සභාව ගම්වල පොදු කටයුතු වලදී. ඒ වගේම තමයි අනෙක් ගරු මන්ත්‍රීතුමයන්ලාත්. මෙතන නිහඬව හිටියට හොඳ කටවල් ටික තමා මේ ඉන්නෙ. ඉතින් වැඩ

කරන්න පුළුවන් හයියක් තියෙන කට්ටිය. ඕනම ගමේ ප්‍රශ්නෙකදි මුහුණ දෙන කට්ටිය.අනෙක් කෙනා මෙයාමෙයා ගැන ඉතින් කියන්න දේකුත් නැහැ.මුළු අම්බලන්ගොඩ ජනතාවම දන්නවා මෙයා කවුද කියලා. ඒ කියන්න වැඩ කටයුතු කිරීමෙදි ඒ වගේම ගරු චම්පා මන්ත්‍රීතුමියත් අපි දන්නවා එදා ඉඳලම පොදු මහජන සේවයන් කරනවා. හැබැයි ඔබතුමා තමයි මේක පොඩ්ඩක් හිතට ගන්න ඕන. ඔබතුමා මේකට වැඩ පිළිවෙලක් හදල මේ ගොල්ලොන්ට ක්‍රියාත්මක වෙන්න හයිය දෙන්න අපි ගරු මන්ත්‍රීවරු ඔක්කොම කැමතියි. ඔබතුමාට මේ සියළු ඉටු කිරිමට ශක්තිය ධෛර්යය වාසනාව ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින් කරනවා

**ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ගරු අයිරාංගනී මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද යෝජනා පිළිබඳ කතා කිරීමේදී කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා කාන්තා කමිටුවක් පිහිටුවීම සම්බනධයෙන් කතා කළාම මං හිතන්නෙ අපේ කාන්තා මන්ත්‍රීතුමියන්ලා 06 දෙනෙක් ඉන්නවා. ඒ හැරුණම නගර සභාවෙත් විශාල කාන්තා නියෝජනයක් තිබෙනවා. කාන්තා ආධිපත්‍ය පෙරමුණේ තිබෙන යුගයක නැවත කමිටුවක් පිළිබඳව අමුතුවෙන් දෙන්න බලයක් නැහැ. ඔබතුමීලට බලය තිබෙනවා. ඉතින් ඒක නිසා මමත් කාන්තාවක් බිරිඳත් කාන්තාවක් දුවත් කාන්තාවක්. එතකොට අපි පිරිමි වශයෙන් කාන්තාවන්ට බැඳිල තියෙන්නේ. එතකොට ඒ බැඳීම තුළ කාන්තාවන්ට දිය යුතු උපරිම ශක්තිය අපි දෙනවා. ඉතින් ඒක නිසා ඔවුන්ගේ දක්ෂතාවය තමයි කමිටුවක් විදියට පත්වෙලා ඒ උපරිම ප්‍රතිලාභ ජනතාවට අත්කර දීමට කටයුතු කිරීම. විශේෂයෙන්ම කාන්තාවො විදියට කාන්තාවොන්ගෙ දුක පිළිබඳව තමයි කතා කරන්නෙ. හැබැයි පිරිමිත් කාන්තාවන්ගෙ දුක පිළිබඳව තමයි කතා කරන්නෙ. මොකද ඒ ගොල්ලො මහන්සි වෙලා රස්සාව කරන්නෙ කාන්තාවො වෙනුවෙන්. ගෙදර අය වෙනුවෙන්නෙ. ඒ අය හම්බ කරල කාන්තාවොන්ට තමයි ගෙනියල දෙන්නෙ. ඉතින් ඒක නිසා අපෙන් මේකට අඩුවක් වෙනවා කියල හිතන්න එපා. පිරිමි පක්ෂය විදියට හෝ වේවා නගර සභාව විදියට හෝ වේවා ගරු සභාපතිතුමා සභාවෙ ඒ අවශ්‍ය පහසුකම් සපයනවනෙ කොහොමහරි. මං මේ කියන්නෙ කාන්තාවො 06 දෙනා එකතු වෙලා මේක ශක්තිමත් කිරීම ඔවුන්ගේ වගකීම හා යුතුකම. ඉතින් ඒකට මේ යෝජනාව සභාවට දැම්ම පලියට සභාවෙන් මේකට විශේෂ දෙයක් කරන්න ලේකම්තුමියත් කාන්තාවක්.එතකොට ඔයගොල්ලන්ට පුළුවන් සංවිධානය වෙලා ඒ වැඩ කටයුතු කරගන්න. ගරු චම්පා මන්ත්‍රීතුමිය කිව්වා ක්ෂුද්‍ර මූල්‍ය තත්ත්වය. විශාල වශයෙන්ම කාන්තාවො අද ඒ ප්‍රශ්නෙට මුහුණපාල ඉන්නවා. වස බොන තත්ත්වෙ පවා ඉන්නවා සමහර කාන්තාවො. ඒ මොකද ගෙදර වියදම දන්නෙ කාන්තාවො. කුස්සියෙ බරපතලකම දන්නෙ කාන්තාවො. දරුවන්ගෙ අධ්‍යාපන කටයුතුවල සියලු දේ දරන්නෙ කාන්තාවො. ඉතින් ඒක හන්දා කාන්තාවොන්ට විශේෂ තැනක් දුන්නට විශේෂ ගැටලුවක් නැහැ. නමුත් ඔබලා එකතුවෙලා සමස්ථ කාන්තා පරපුරේම යම් යම් ප්‍රශ්න නිදහස් කරන්න කටයුතු කරනවනම් ඒක තමයි හොඳ. ඇත්තටම අපි නගර සභාවක් විදියට දිය හැකි උපරිම සහයෝගය දෙන්න කියන ඉල්ලීම මමත් කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ අවස්ථාවෙදි යම්කිසි වචනයක් නොකිව්වොත් හොඳ නැහැ කියල මං කල්පනා කරා. මං ඇත්තටම කල්පනා කරපු දෙයක් තමයි කාන්තාවන් පළාත් පාලන විෂය ක්ෂේත්‍රයට ඇතුල් කරනකොට ඇයි කාන්තා නියෝජනය සඳහා බලකරලා කාන්තා නියෝජනයක් අවශ්‍යයි කියන හැඟීම ආවෙ ව්‍යවස්ථාදායකයේ කුමන හැඟමක් තුළද මේ අය මේ විදියට පත් කළේ. මට මතකයි අපි අවුරුදු 35 ට අඩු ලැයිස්තුව තමයි අම්බලන්ගොඩ නගර සභාවට තේරුණේ. එතකොට අපි තේරුණු අයගෙන් හත් දෙනාගෙන් අපි 06 දෙනෙක් අපේ කණ්ඩායමෙන්ම 35 ට අඩු ලැයිස්තුවෙන්

ආවේ. ඒ කාලෙ තිබුණා ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලත් එක්ක තරුණ අසහන කොමිසම කියලා. ඒ කොමිසම මගින් තරුණයන්ට නියෝජනයක් ලබාදුන්නා. නමුත් ඒකත් යටපත් කරල තමයි කාන්තාවො වෙනුවෙන් මෙහෙම සමතැන් දීමේ ක්‍රමවේදයක් යෝජනා කළේ. මට ඇතතටම මතක් වෙනවා ගරු මන්ත්‍රිනී අයිරාංගනී මහත්මියත් ලක්ෂ්මි හේමන්තා ගරු මන්ත්‍රීතුමියත් දෙන්නම කාන්තා අයිතීන් වෙනුවෙන් රූපවාහිනියෙ කතාකරා මට හොඳට මතකයි. හැබැයි ගරු අයිරාංගනී මන්ත්‍රීතුමිය කතාකරේ තිරයෙ එහා පැත්තෙ ඉඳන්. ඒත් මං කොණ්ඩෙන් අඳුරගත්තා මෙයා තමයි ඉන්නෙ කියලා. එතකොට මන්ත්‍රී නෙවෙයි. ඒ අවස්ථාවෙත් කතා කරේ කාන්තා අයිතීන් වෙනුවෙන්. ඉතින් සටන කරල ආපු පිරිසක්.මමත් කල්පනා කරපු පළවෙනි දේ තමයි මේ කාන්තාවො ආවම අපේ පනතෙ කාන්තාවන් සම්බන්ධයෙන් මොන විදියෙ මේ පළාත් පාලන විෂය ක්ෂේත්‍රයේ දි කොහොම යෙදීමක් කරන්න තියෙනවද කියන එක ඇත්තටම කොහේවත් සඳහන් වෙලා නැහැ. කාන්තාවන්ට අයිතීන් දුන්නා විතරයි. නමුත් මන්ත්‍රීතුමියට මතක ඇති මං කිව්වා මොකක්ද මේ කාන්තාවගෙන් මේ රටට බලාපොරොත්තු වෙන්නේ. මේ ප්‍රදේශයට බලාපොරොත්තු වෙන්නේ මොනවද කියල කල්පනා කරල අපි අලුතෙන් යම් නිර්මාණයක් කරන්න ඕන. ඒ නිර්මාණය තුළ ඇත්ත වශයෙන්ම ඔය කාන්තාවට සම අයිතීන් ලබාදීම පිළිබඳව මීට අවුරුදු 10 කට කලින් 15 කට කලින් ලෝකයේම විවාද වෙච්ච එක කරුණක්. ඒ කරුණු තුළ තමයි මේක නිර්මාණය වුණේ. ඒ අනුව අනිවාර්යයෙන්ම කාන්තාවන් මෙපමණ ප්‍රමාණයක් සිටිය යුතුයි කියල නියමයක් ආවා. ඒ අනුව කාන්තා නියෝජනයක් ආවා. කාන්තාව මොන විදියට සවිබල ගන්වනවද කියන එක කොහොවත් සඳහන් වෙලා නැහැ. ගරු රාහුල මන්ත්‍රීතුමා නම් දන්නව ඇති එතුමා සවිබල ගැනුවුවෙ අපි උප සභාපති කාලෙ. ඒ නිසා මේ යෝජනාවට අපෙත් කැමැත්ත සහ එකඟතාවය එලකරමින් මේ මන්ත්‍රීතුමියලාම එකතුවෙලා අපිට රටාවක් දෙන්න. ඒ කියන්නෙ මොන විදියටද අපි මේ වැඩසටහන් කරන්න ඕන කියල අපේ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය යටතේ අපි ඉස්සරහට ගෙන යමු. හොඳ යෝජනාවක්. අපි ඒක අනුමත කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මං ස්තූති කරනවා මගේ යෝජනාවට සහයෝගය ලබාදීම සම්බන්ධයෙන්. මම බය නැතිව කියනවා අපේ කාන්තාවන් 06 දෙනාම අපි මේ සඳහන් කරපු හැමදේම අකුරටම ඉෂ්ඨ කරනවා කියල ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. මොකද අපි සත්‍යාවෙන් වැඩ කරනවා. පැය 24 ම පාරට බාහැල හරි අපි මේක මේ මාසෙ ඉඳන් කරන්න සූදානම් වෙනවා.

**තීරණය**

කාන්තාවන් සවිබල ගැන්වීම හා ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා කාන්තා කමිටුවක් ආරම්භ කිරිම සඳහා ගරු නගර සභා මන්ත්රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් කරන ලද යෝජනාව ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය සමඟ එකතු වි සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් අනුමත කළ අතර ගරු නගර සභා මන්ත්‍රි මඟගේ චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මීලඟට ගරු රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමා විසින් කරනු ලබන 05.07.01 යෝජනාව ඉදිරිපත් කරන්න.

**05.07 ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.07.01 බැහැර කරන කසළ උපයෝගි කරගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කිරිම.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

බැහැර කරන ලද කසල උපයෝගී කර ගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට මා යෝජනා කරනවා ගරු සභාවට.

<u>**ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , අම්බලන්ගොඩ නගරයේ ඒ වගේම මුළු ලංකාවෙම වැඩිපුරම ප්‍රශ්නයක් තියෙන ප්‍රශ්නයක් තමයි මේ කැලිකසල ප්‍රශ්නය. විශේෂයෙන් අම්බලන්ගොඩ ගත්තම පාරසරික ප්‍රශ්න මුලින්ම එන්නෙ මේ කැලිකසල දැමීම අනවශ්‍ය විදියට බැහැර කිරීම ඒව තුළින් තමයි මේ පාරසරික ප්‍රශ්න එන්නෙ. ඩෙංගු උවදුර ඒවගේම අනෙකුත් පාරසරික ප්‍රශ්න. අපි ඇත්තටම ස්තූතිවන්ත වෙනවා අම්බලන්ගොඩ නගර සභාවෙ මහජන සෞඛ්‍ය පැත්ත ගත්තම ඒ විධායක ශ්‍රේණියෙ නිලධාරීන් ඇතුලුව අනෙකුත් කම්කරු නිලදාරීන් හා සියලුම නිලධාරීන් ඉතාමත්ම හොඳින් කැලිකසල එකතු කරල විශාල වෙහෙසක් දරනවා මෙම අම්බලන්ගොඩ නගරය පිරිසිඳු කරන්න. සමහර තැන්වල අපිට ඇහිල තියෙනවා ගන්නා වූ තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්න ගියාම කුණු එකතු කරන්න යන අපගේ කම්කරුවන්ට දැඩි දෝෂාරෝපණය කරන අවස්ථාත් තියෙනවා. මොකද අපි යම් තීන්දු තීරණ ගන්නවා. ගත්ත වගේ නෙමේ ඔවුන් ක්‍රියාත්මක කරන්න ගියාම. ප්ලාස්ටික් එක දවසකටත් අනෙකුත් කැලිකසල වෙන දවසකටත් ඔය වගේ ගන්නකොට තෝරාගැනීමේදී රණ්ඩු වෙන අවස්ථාවලුත් තියෙනවා. සමහර දවස්වලට.මමත් නවත්තල ප්‍රශ්නවලට මැදිහත් වෙච්ච අවස්ථාවලුත් තියෙනවා. ඒ මොකද මේ නිතරම මහජනතාව බලන්නෙ තමන්ගෙ අවශ්‍යතාවය කොහොමද ඉටුකරගන්නෙ කියලා. මේ ගෙදර තියෙන කුණු ටික ගෙනියල තියනවා අල්ලපු ගෙදර වත්තෙ වැට අයිනෙ හරි කොහේහරි.නැත්නම් එල්ලනව කොහේහරි. එතකොට බල්ල මැරුණද කාඩ්බෝඩ් පෙට්ටියක දැම්මා . ගැට ගැහුවා.කුණු ගොඩ උඩින් ගෙනිහින් තිබ්බා. ඔය වගේ තත්ත්වයක් මේ නගර සභාව තුළ තිබුණා. අපේ රැකියා කරන ඔක්කොම සියලු දෙනාම මනුශ්‍යයෝ.මේක හිතන්නෙ නැහැ.ඒ නිසා විශාල ප්‍රශ්නයක් ඉදිරියට එනවා. පහුගිය දවස්වල මං මේ යෝජනාවට මුල්ම හේතුවක් වුණේ මහ අම්බලන්ගොඩ මළ ගෙදරක ගියා පුහුගිය දයසක හැන්දෑවෙ. ගරු සභාපතිතුමා සියලු දෙනාම දොස් කිව්වා මොකද මහ අම්බලන්ගොඩ මළ ගෙදර තිබ්බට මානිමුල්ල පාරෙ. අර ගඳ එනවා අරහෙ දාන ඒව හැන්දෑවට මාර විදියට එනව ඉන්න බැහැ. ඔය තත්ත්වයක් තියෙන්නෙ. මොකද ඉදිරියෙදි මේක වර්ධනය වුණොත් අපිට කුණු දැමීම සඳහා යම් ගැටලුවකට මුහුණ පාන්න පුළුවන්. ඒක නිසා පෝරඹ, කුලරත්න පැත්ත ඒ සියලුම තැන්. කළුවඩුමුල්ල එක් කොටසකට. ඒ වගේ තැන්වලට මේ ගඳ පැතිරිලා තියෙනවා හැන්දෑවට. මොන හේතුවක් නිසාද මං දන්නෙ නැහැ. පස් දාලත් වහනවා. මං බැලුවත් මේ කැලි කසල දාන ස්ථාන ගොඩකරන්න. ගොඩකරන්න ඒ යන්ත්‍රයට පස්වලට ගොඩකිරීමේ ගාස්තු ලක්ෂ 22 කට වැඩියෙන් වියදම් කරනවා අවුරුද්දකට. මේ එකතු කරන එකට අමතරව. ඉතින් මේකට මොනවහරි ස්ථිරසාර විසඳුමකට අපි යන්න ඕන ගරු සභාපතිතුමා. මෙක අපි අවංක ලෙසින් ඉදිරිපත් කරන්නෙ. මොකද මේක නැත්නම් ඉදිරියේදී මේ

කුණු දැමීම සඳහා ඒ වගේම තමයි මේව ඇළවල්වලට බේරිලා යනවා. ඔය කුණු දාන තැන්වල බලන්න පනියන්දූවෙත් ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා ඉන්නවා. ඒ පැත්තෙත් ඉන්න බැරිව ඇති. ඒ වතුර කලු පාට වෙලා මේකෙ දානවනෙ දානකොට මිනිස්ස් බලන්නෙ නැහැ හැම ජරාවම මේකෙ දානවා.එක්කො වෙන්කරල දුන්න නම් ඒක වෙන්කරල හදාගෙන යන්නත් තිබුණා. මාර්කට්වල තියෙන මාළු දැන් අපි දන්නවා මහර කඩවල්වල පෞද්ගලික මාර්කට්වල මං දැක්ක බාස්කට් එකක වගේ දාල ලස්සනට මං දැක්කා උදේ තියනව ටයිම් එකට. උදේට එනව ටයිම් එකට අර ඌරු කොටුවල මිනිස්සු. ඇවිල්ල අර අපතෙ දාන ඔක්කොම ටික අරන් යනවා. මං දැකල තියෙනවා ඒව දාගන්නවා ඒ ගොල්ලන්ගෙ භාජනයකට.ඒව අරගෙන යනවා. ඒක හොඳයි. මං හිතන්නෙ මාර්කට් එකටත් ඔබතුමා මැදිහත්වෙලා ෆීසර් අරන් දුන්නත් කමක් නැහැ. මේව දාල තියල මිනිස්සුන්ට අරගෙන යන්න පුළුවන් විදියට ක්‍රමවේදයක් හදනවනම් අපතේ යන ඒව ටික.මේක දානව අර අතන එහෙම්මම ලේ. පණුවො වහලා.ඉතින් මේව පාරසරික ගැටලු ගරු සභාපතිතුමා. ඔබතුමාගෙ හොඳ උනන්දුවක් තියෙනවා.අපි ඒක අගය කරනවා ඇත්තටම. රෑටත් කුණු ඇදලා උදේටත් කුණු ඇදලා දවල්ටත් කුණු ඇදලා. ඒ කර්තව්‍ය හරියට කෙරෙනවා. ඒ නිලධාරීන්ගෙන්. මොනව කරත් වැඩක් නැහැ.ඒවයි අගයක් නැහැ අරන් ගිහිල්ල අතන දානකොට. මං හිතන්නෙ ගරු ලසන්ත මන්ත්‍රීතුමාට තමයි වැඩිම බලපෑමක් තියෙන්නෙ. ඒක නිසා අපි මේ ලක්ෂ 22 ක් මේකට වියදම් කරනවා. මං හිතන්නෙ කුණු අදින්නත් ලක්ෂ 200 කට කිට්ටු වෙන්න වියදම් කරනව ඇති. 400 ක් සෙල්ලංද. ඉතින් මං හිතන්නෙ දැන් නව තාක්ෂණය ඇවිල්ල මං දැක්කා රූපවාහිනියෙත් යනවා. කුණු දාල කොම්පෝස්ට් පොහොර ඇතිකරන වැඩපිළිවෙලක්. ඒ වගේම ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන්. ඒ වගේ ඒව තියෙනවා. ගරු සභාපතිතුමා ඉතාමත්ම ගරුත්වයෙන් මං ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නෙ මේකට වැඩි අවධානයක් යොමු කරන්න. වැඩි අවධානයක් යොමු නොකරොත් ඉදිරියේදී වෙන විනාශය ටිකක් බරපතලයි. ඒක නිසා අපි ඉල්ලා සිටින්නේ අපට කිසි ප්‍රශ්නයක් නැහැ හොඳට වැඩසටහන කරගෙන යන මේ කුණු ඇදීම හරියට කෙරෙනවා. නමුත් මේ දාන කැලිකසල එතෙන්ට දැම්මට පස්සෙ ඕක කාක්කො හරි අරගෙන ගිහිල්ලා තැන්තැන්වල දානවා.ලිංවල දානවා. එතනත් ප්‍රශ්න තියෙනවා. ප්‍රශ්නයක් වෙන්න ඉස්සෙල්ලා අපි මේකට විසඳුමක් ගන්න ඕන. මොකද දැන් ඔය ඇළවල්වල අපිත් දන්නවා ඒ දවස්වල ඕකෙ ඉස්සො හිටියා හරියට. දැන් එක ඉස්සෙක් හොයාගන්න නැහැ. දැන් ඉන්නෙ මැස්සො. ඔබතුමාට මේකෙ අවධානෙ තියෙනවා. මං දන්නෙ නැහැ උනන්දුවක් නැති කමත් නෙමේ. ඔබතුමා මේක ඇහට ගන්නෙ නැද්ද මං දන්නෙ නැහැ. මේක ලොකු බරපතල ප්‍රශ්නයක් ගරු සභාපතිතුමා. ඒක නිසා ඔබතුමා මේක පොඩ්ඩක් ඇහට ගන්න. ඔබතුමාට කාර්යබහුලත්වය වැඩිනම් ඔබතුමාගෙ පාලන තන්ත්‍රෙය ඉන්නවා මන්ත්‍රීවරු . මේවට හැකියාව තියෙන අය ඉන්නවා. කැලිකසල ප්‍රශ්නය විසඳන්න පුළුවන් මං හිතන්නෙ මට මතකයි ඔබතුමත් හිටියා. ඔය කුණු දාන්න දෙන්නෙ නැතිව උද්ඝෝෂණයක් ගියා . ඒකට මැදිහත් වුණා උප සභාපති වශයෙන් හිටියෙ ගරු සරත් මන්ත්‍රීතුමා මං හිතන්නෙ. ඒ කාලෙ එතුමා මැදිහත් වුණා. මානානෙ හරි දැඩි උද්ඝෝෂණයක් ආවා. නමුත් ඉදිරියේදී මේක නොවෙන විදියට අපි තාක්ෂණයට මුහුණ දීල ඒ වැඩ කටයුතු කරන්න කියල අපි ඉල්ලා සිටිනවා. මේක සියලු ගරු මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට ඒ වගේම මහජනතාවට දැඩි සේ බලපාන ප්‍රශ්නයක් මොකද හැන්දෑ 6.00 වෙනකොට මැස්සො වහල තියෙන්නෙ ඇත්තටම කෑම කන්නත් අමාරු තත්ත්වෙට පත්වෙලා තියෙන්නෙ. නමුත් මිනිස්සු කියන්නෙ නැහැ මොකද දේශපාලන වශයෙන් හෝ වේවා මොනවහරි ප්‍රශ්න ඇති. ඔබතුමා දන්නවා. දන්නව වුණාට මේක ඇහට අරගෙන මේකට විශාල වශයෙන් කොම්පෝස්ට් පොහොර මැෂින් ගෙනැල්ල මේකට නව ක්‍රමයක් ඇති කරන්න. ඇති කරල ඉවරවෙලා ඉතුරු ටික වහලල දාන්නහරි මොකක්හරි ක්‍රමවේදෙකට යන්න. ඒක නිසා මං ඉල්ලා සිටිනවා සියලු ගරු මන්ත්‍රීවරුන්ගේ සහය ලබාදීල නව ක්‍රමවේදයක් අනුගමනය කරල මෙම කැලිකසල ප්‍රශ්නය දැන් මොකද මිනිස්සු හැමදේම මේ නගර සභාව ගෙනියන්න ඕන. වරිපනම්

ගෙවනවනෙ අපි ගෙනියන්න ඕන.ඒ මතේ ඉන්නෙ. එහෙම වෙන්න බැහැ. මිනිස්සුත් දැනුවත් කරන්න ඕන. මහජනතාවටත් ඔබතුමා වියදම් කරල නාමපුවරු හරි එල්ලලා යම්කිසි ක්‍රමවේදයකට දැනුවත් කරන්න ඕන. කැලි කසලවලින් වන හානියත් දැනුවත් කරන්න ඕන. මොකද දැන් රෝහල්වලින් දාන ඒව තියෙනවා . ඒව ඔක්කොම ගෙනියනවද. ඔබතුමා ඒක බලන්න. මොකද වලලනවද පුච්චනවද මොනවද කරන්නෙ. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඉන්නවා . මොනවහරි යම් දෙයක් සිදුවුණාට පස්සෙ නගර සභාවට ඇඟිල්ල දික් කරන්නෙ. ඔබතුමන්ලා බැලුවෙ නැහැ කියලා.ඩෙංගු ප්‍රශ්නෙට ඔබතුමා දැඩිව මුහුණ දුන්නා. ඒක හොඳයි. හැබැයි ඔය ප්‍රශ්න ඔක්කොම අඩු වෙනවා මේ තත්ත්වය තුළ. නීතිය ක්‍රියාත්මක කරල හරි අනවශ්‍ය විදියට කසල බැහැර කරනවනම් දැනුවත් වීමකින් තොරව ඒ ප්‍රශ්නෙට එන්න ඕන. මට මතකයි මමත් උප සභාපති වෙලා ඉන්න කාලෙ බල්ලා මැරුණම කාඩ්බෝඩ් පෙට්ටියෙ තියලා කුණුගොඩ උඩින් තියල යනවා. අර මිනිස්සු ගෙනියනවා.ඕක තමයි තත්ත්වෙ. ඒක නිසා මං ඉල්ලා සිටිනවා මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්න ඔබතුමාගෙ පූර්ණ දායකත්වය දීල ගරු මන්ත්‍රීවරුන්ගේත් දායකත්වය දෙන්න කියල මම නිහඬ වෙනවා. ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ඇත්තටම කාලීන යෝජනාවක්. මෙ ගැන අපි පසුගිය රැස්වීමෙදිත් කතාකළා මට මතක විදියට.මම එතනදි යෝජනාවකුත් ගෙනාවා තාවකාලික විසඳුම් හරියන්නෙ නැහැ කිව්වා.අපේ ගරු මන්ත්‍රීවරුන්ට හම්බවෙන ප්‍රතිපාදනවලින් හරි ලක්ෂ 20 හරි 50 හරි හම්බවෙන එකක් අරගෙන අපි පටන් ගනිමු මේක. ගඳම විතරක් නෙමේ දැනට තියෙන ප්‍රශ්නෙ. මට තේරෙනවා මේ තියෙන ජරාවල් අර කලුපාට වතුර අපේ අම්බලන්ගොඩ නගරයේ භූගත ජලයට එකතු වෙනවා. උල්පත්වලට මේව එකතු වෙනවා.එකතු වුණාට පස්සෙ අම්බලන්ගොඩ නගරයේ භූගත ජලය සම්පූර්ණයෙන්ම අපවිත්‍ර වෙනවා. ලිදකවත් කොහොමවත් අම්බලන්ගොඩ නගරයේ ජලය පාවිච්චි කරන්න බැරි තත්ත්වයට පත්වෙනවා. ඒව උල්පත්වලට එකතුවෙලා මුළු අම්බලන්ගොඩටම පැතිරිලා යනවා. මේක විශාල ප්‍රශ්නයක් අම්බලන්ගොඩ. පහුගිය සභාවෙත් කතාකරල අපි කිව්වා ඒ ඔක්කොම කැන්සල් කරල හරි කමක් නැහැ අපේ ලක්ෂ 20 න් රීසයිකල් ප්ලාන්ට් එකක් හදන්න අඩිතාලම දානවනම් අපි ඒකට එකමුතුයි.ගමේ ඔක්කොමත් කැමතියි.කළුවඩුමුල්ලෙ එහෙම විශේෂයක් නැහැ. අපේ ඔක්කොම සල්ලි ටික දාල අපේ පඩිය හරි අපි දෙන්නම්.මම කියන්නෙ මේකට අත තියමු. ඇඹිලිපිටිය නගර සභාවෙ හරිම කාර්යක්ෂම විදියට මේ ප්ලාන්ට් එක කරනවා. ආදර්ශමත්. අපි ඕන්නම් කට්ටිය ගිහිල්ල බලමු. කොහොමද ඒ අය කරන්නෙ කියලා. හරිම ලස්සනට කුණු ටික එකතු වෙනවා. ලස්සනට වැඩේ කොරොනවා.මම යෝජනා කරනවා අපේ සල්ලි හරි දාල කොහොමහරි මේක ඉක්මනට කරමු. පොඩිපොඩි ප්ලාස්ටර් ගහල නම් මේක හරියන්නෙ නැහැ. මම කියන්නෙ රීසයිකල් ප්ලාන්ට් එකක් අම්බලන්ගොඩට ඕනමයි. ඒක නැතිව මේ ප්‍රශ්නෙ විසඳන්න හම්බ වෙන්නෙ නැහැ. ගරු රාහුල මන්ත්‍රීතුමාල ඒකට එකඟ වෙනවා.හැමෝම සහයෝගය දෙන්න කියලත් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමණිනි, ගරු රාහුල මන්ත්‍රීතුමා විසින් ගෙනා යෝජනාව ඉතා වටිනා යෝජනාවක්. මොකද ඔය ගැටලුවට ගරු සභාපතිතුමනි මමත් හරි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා. මොකද පහුගිය වකවානුව තුළ පිට නගරෙකින් අපේ ගෙදරට පිරිසක් ඇවිත් රැයක් ගත කළා. ඇත්තටම ඔවුන්ට ඉන්න බැරි තත්ත්වයටම ඒ ගඳ ආවා ගරු සභාපතිතුමනි. ඕකට අපි දැන්ම පිළියමක් යෙදුවෙ නැතිවුණොත් ගරු සභාතිතුමනි ඇළවල් මාර්ග ඔක්කොම කලුපාට වෙලා.එක මාළුවෙක්වත් නැහැ ගරු සභාපතිතුමනි. චූටි කාලෙ අපි ඔය ඇළවල්වල බැහැල මාළු ඇල්லුවා. දැන් එහෙම මාළුවෙක්

අල්ලන්න තියා පතුල් වත් පේන තත්ත්වෙක නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි ඔය කුණුගොඩට දැන්ම මොනවහරි ක්‍රියාමාර්ගයක් ගන්න ඕන. බිම් ප්‍රමාණයත් ඉවරවේගෙන එන්නෙ ගරු සභාපතිතුමනි. මොකද ඟඟ අයිනට වෙන්න තව බොහොම ස්වල්ප දුරයි තියෙන්නෙ. තව ටික කාලයයි. ඕක ඟඟ අයිනට ගියාම අපට ඔය කුණු දැමීම විශාල ගැටලුවක් වෙනවා. මට දැනගන්න ලැබුණා.හෙට අනිද්දට හල්වතුරෙ ඉන්න ගම්වාසීන් උද්ඝෝෂණය  කරන්න  ලෑස්ති වෙනවා. මොකද එම  උදවියට  රාත්‍රී කාලය වගේම දවල් කාලයෙත් ඉන්න බැහැ ඒ ඟඳ නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි ගරු ධම්මික මන්ත්‍රීතුමා කිව්ව වගේ කසලවලට කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් හදල ගමට හම්බවෙන ලක්ෂ 20 දෙන්න මාත් කැමතියි. ලක්ෂ 20 ඒකට යොදවලා නැත්නම් අපේ ආණ්ඩුවක් තියෙන්නෙ අපේ ගරු ජනාධිපතිවරයෙක් ඉන්නෙ. අපේ අගමැතිවරයෙක් ඉන්නෙ. අපි මේ ව්‍යාපෘතියට වෙනම හෝ සල්ලි ප්‍රමාණයක් ඉල්ලගෙන අපි මේ ව්‍යාපෘතිය සකස් කරමු. නැත්නම් මොකද ලොකු අවධානම් තත්ත්වයක් ඇතිවෙනව මේ නගරෙ කුණු පිළිබඳව. සියලු දෙනාටම මුහුණ දෙන්න වෙනවා. පහුගිය කාලෙත් උද්ඝෝෂණයක් කළා. හිටපු ප්‍රධාන අමාත්‍යතුමා එතනට පැමිණිලා මොකක්හරි උපදෙසක් දුන්නා.දීල ඒ වෙලාවට ඒක නැවැත්වුවා. නමුත් ආයත් පාරට බැස්සොත් නම් ගරු සභාපතිතුමනි මේ ගම්වාසීන් නවත්වන එකක් නැහැ. මොකද අපේ ගම්වල උදවියත් ඔය උද්ඝෝෂණයට අනිවාර්යයෙන් සහභාගී වෙනවා. ඒ නිසා ඒකෙ ගඳ හරි නැති කරන්න මොනවහරි ක්‍රියාමාර්ගයක් අරගන්න කියල මං ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ කුණු දැමීමේ තැනට එක්කෝ වෙන කොහේහරි තැනකට කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් අපේ ආණ්ඩුවෙන් ඉල්ලගන්න කියල මං යෝජනා කරනවා. ඒ වගේම ගරු රාහුල මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා මෙවැනි යෝජනාවක් ගරු සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව. බොහොම ස්තූතියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී  ඩෙනට් පනියන්දූවගේ මහතා  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ගරු රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද මෙම යොජනාව ඉතාමත් කාලීන හා රට අද මුහුණදීල තියෙන ප්‍රධාන ගැටලුවක්. අතිගරු ජනාධිපතිතුමා මම හිතන්නෙ මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරමින් මුළු ලංකාවෙම මෙම කුණු ප්‍රශ්නය පිළිබඳව දැඩි තීන්දු අරන් තියෙන යුගවක්. එවැනි අවස්ථාවකදී දැන් පනියන්දූවෙත් , පෝරඹත් , විලේගොඩ පැත්තෙත් සියලුම අපේ ගරු ජගත් මන්ත්‍රීතුමා කිව්ව පරිදි අපි පොඩි කාලෙ තිබ්ච්ච දැකපු ඇළවල් නෙමේ දැන් තියෙන්නෙ කලු පාට වතුර. ඒ එක්කම අපේ ගරු ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා දක්ෂ ඉංජිනේරුවෙක් වගේම ජල සම්පාදන මණ්ඩලයේ හිටපු ප්‍රවීන ඒ පිළිබඳව දන්න පුද්ගලයෙක් විදියට තව බොහෝ කාලයක් ටික කාලයක් යනකොට මේ යන විදියට ගියොත් මේ කලු වතුර අපිරිසිඳු වූ වතුර අපේ භූගත ජලයට එකතු වෙන්න පටන් ගත්තොත් අම්බලන්ගොඩ නගරෙට මහ විශාල පාරසරික ප්‍රශ්නයක් බවට පත්වෙයි.මම ගරු ධම්මික මන්ත්‍රීතුමත්, ගරු ජගත් මන්ත්‍රිතුමත් යෝජනා කළා එක්කො රජයෙන් මුදල් ප්‍රතිපාදන ඉල්ලගෙන හෝ මොකද අතිගරු ජනාධිපතිතුමා මේ පිළිබඳව දැඩි අවධානක් යොමුකරන නිසා. එහෙමත් නැත්නම් මේ දීපු මුදල් ප්‍රතිපාදනවලට සමස්ථ ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය ඔබතුමා ඇතුලු කැමැත්ත පුකාශ කරල මොකද ඔබතුමාම කියන පරිදි අපි වසරකට ලක්ෂ 450 කට ආසන්න මුදලක් නගර සභාව වියදම් කරනව මේ වෙනුවෙන්.ඔබතුමත් අඳුරනවා.ඔබතුමත් අඳුරනවා.මගෙත් මිත්‍රයා. හල්දුම්මුල්ලෙ ප්‍රාදේශීය සභාවෙ අපේ උපුල් ගාල්ලෙ කෙනෙක්. හල්දුම්මුල්ල  සභාව කියන්නෙ අපි වගේ ආර්ථික ආදායම් තියෙන තැනක් නෙමෙයි.ඉතාම ආදායම නැති ප්‍රාදේශීය සභාවක්. අපිට වගේ මේ වගේ භූමිය නැහැ. කඳු පල්ලම් තියෙන්නෙ.නමුත් එතුමා ඉතා හොඳ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් කරගෙන යනවා. එතුමා මගේ හිතවත් කමට මට කිව්වා මම වවන එළවළු පලතුරු කොහෙන්වත් ගන්න එපා මචං මගෙන් ගනින් කියල. මං කිව්වා ඔක්කොම ගන්නවා කියල. මොකද හේතුව අපි ඒ උදව්වක් කළ යුතුයි

සභාවට. ඒ වගේ එතුමා ඒ අඳුරන අඳුරන සියලුම අනෙකුත් ඉඩම් හෝටල් අයිතිකරුවන්ට කතා කරගෙන එතුමගෙ කොම්පෝස්ට් පෝර මුකුත් නැතිවෙන්න එතුමා දෙනවා. අපඅට වගේ කැපාසිටියක් එතුමට නැහැ. අපි උදාහරණයට ගතයුතු වෙන්නෙ අන්න ඒවා. ඒ නිසා මම යෝජනා කරනවා ගරු ධම්මක මන්ත්‍රීතුමත්, ගරු රාහුල මන්ත්‍රීතුමත්, ගරු සරත් මන්ත්‍රීතුමත් කිව්වා මේක ඉතාම හොඳ යෝජනාවක් මේ. ආර්ථිකමය වශයෙනුත් සමාජීය වශයෙනුත් පාරසරික වශයෙනුත් සහ අපි ඉදිරියට මුහුණ දෙන අපිට බොන්න තියෙන පිරිසිඳු ජලය අහිමිවීමේ ඒ විකල්පෙකට යන්න් තියෙන හොඳම යෝජනාවක් මේ. මම යොජනා කරනවා ඔබතුමාට එක්කෝ අපට සභාවට වෙන්කරන මුදල් හරි එහෙමත් නැත්නම් ගරු ජනාධිපතිතුමා එක්ක කතා කරගෙන හරි අම්බලන්ගොඩ කියන්නෙ ප්‍රධාන නගරයක් මේ ප්‍රශ්නෙ බරපතල වෙන්න කලින් අපි කොම්පෝස්ට් ව්‍යාපෘතියක් කිරීම සඳහා නවීන පන්නයේ යන්ත්‍ර අරගෙන අපි ඔය කොහේහරි ඉඩමක මේ ව්‍යාපෘතිය ඉක්මනට පටන් ගනිමු. මං හිතනවා අපේ නගර සභාවට විශාල ආදායමක් හොයාගන්න පුළුවන්. එතකොට අපේ නගරෙ විතරක් නෙමේ.යාබදව ඉන්න අය කොම්පෝස්ට් පොහොර භාවිත කරල ශරීරයට හිතකර එළවළු පලතුරු හදන්න යොමු කරන්නත් පුළුවන්. ඒක අපට පිසද්ධ වෙනවා එක පැත්තකින්. අනෙක් පැත්තෙන් පාරසරික ප්‍රශ්න විසඳෙනවා. මං හිතන්නේ අපේ ගරු රාහුල මන්ත්‍රීතුමා ඉතාම හොඳ යෝජනාවක් කළේ. ඔබතුමා  මේක බොහොම හිතල මේ ගැන දැඩි අවධානයකින් තීන්දු ගන්න කියල ඔබත්‍රමාගෙන් හා සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ එක්කම පෝරඹත් ඔය අවට අපේ තියෙන අනෙක් ගම්මානවල හවසට ඉන්න බැහැ. මම මෙහේ දිනපතා නොහිටියත් අපි ගියාම මිනිස්සු කියනවා ගඳේ ඉන්න බැහැ කියලා. එතකොට මේකෙ බරපතලම ප්‍රශ්නෙ බලපානවා ගරු අතුල මන්ත්‍රීතුමාටත් අපේ ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමාටත් . ඒ ප්‍රදේශයේ ඉන්න විලේගොඩ සහ පෝරඹ සහ අපේ පනියන්දුව පල්ලෙහා කැල්ලෙ මේ අයටත් ඉන්නම බැහැ හවස පහ හමාර හය වෙනකොට හුලඟ තිබුණොත් පුදුම ගඳක් ඉන්නෙ. ඉතින් මේක එන්න එන්න වැඩි වෙනවා ගරු සභාපතිතුමනි. මේකට ඔබතුමා අවධානය යොමු කරන්න. හම්බවෙච්ච සල්ලිවලින් හරි අපි මේක සාමාන්‍ය ප්‍රමාණයෙන් හරි පටන් අරගෙන මේ වැඩේ කරමු. අනිත් එක තමයි දැන් කඩුවෙල නගර සභාව ගත්තොත් නගර සභාවෙ කුණු ට්‍රැක්ටරේ කුණු ගන්නෙ නැහැ වෙන්කරල නැති වුණොත්. අපට ඒ නීතිය ක්‍රියාත්මක කරන්න වෙනවා ගරු සභාපතිතුමනි. මේක දිරන කුණු , නොදිරන කුණු , ප්ලාස්ටික් ඒව වෙන්කරල දෙන්න කියල අපි කියල තියෙනවා.ඒ වුණාට කෙරෙන්නෙ නැහැ. හැබැයි කොරෙන්නෙ නැති වුණාට අපේ ට්‍රැක්ටර් ගියාම කුණු ගන්නවා.අරයා නොගෙන ඉන්න ඕන. දැන් කඩුවෙල ප්‍රාදේශීය සභාවෙ කිසිසේත් ගන්නෙ නැහැ වෙන්කරල නැත්නම්. එතකොට ඊලඟ දවසෙ කුණු තියන්නෙ නැහැ.ඒ වගේ අපි ක්‍රියාමාර්ග ගන්න වෙනවා මේ ප්‍රශ්නෙ විසඳන්න. මොකද මේක පාරසරික ප්‍රශ්නයක් බරපතල. ඒ නිසා මේ සම්බන්ධව සියලුම නිලධාරීන්ගෙත් ඔබතුමා මේකට විශේෂ අවධානය යොමුකරල මේ ප්‍රශ්නෙ විසඳන්න ක්‍රියාමාර්ගයක් ගන්න කියලත් ඉල්ලමින් මේ වැදලත් කටයුත්ත පිළිබඳව යෝජනාව ඉදිරිපත් කරපු ගරු රාහුල මන්ත්‍රීතුමාට මගේ ස්තූතිය පුද කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී  ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා  කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි මේ ප්‍රශ්නය ගැන ගරු සභාපතිතුමනි මට තමයි විශාලම ප්‍රශ්නය වෙලා තියෙන්නෙ. මොකද ගරු සභාපතිතුමනි සමහර වෙලාවට මට කෝල් එනවා දවසට 10 ක් 15 ක් විතර. මම සමහර වෙලාවට කෝල් ආන්සර් කරන්නෙත් නැහැ. ඊට පස්සෙ මැසේජ් දානවා ජංගම දූරකථනයකට. දානයක් තියෙනවා හෙට ගඳ එනවා වැඩියි මේක විසඳලා දෙන්න.පස් දාල දෙන්න කියලා. ගරු සභාපතිතුමනි තාවකාලිකව හරි පෙහෙතක් හරි ගහලහරි මේකට මේ ගඳ එන්නෙ නැති වෙන්න මේක තවත්තල දෙන්න. මොකද හල්වතුරෙ මැස්සො පිරිල ඉන්නෙ. තේ එකක් අරගෙන එළියට එන්න බැහැ. කන්න බැහැ කෑම එකක් අරගෙ ඇවිල්ලා. ජානකලයි ගෙවල්වල ගරු

සභාපතිතුමා ඒ ගෙවල්වල පැය 24 ම දොරවල් ජනෙල් වහගෙන ඉන්නෙ . ඒ තත්ත්වයක් උදාවෙලා තියෙන්නෙ.ලඟදි හොඳම සිදුවීම වුණේ මම නමය හමාරට විතර ගෙදර ඉන්නකොට හෙන ගඳක් එනවා. මං කිව්වා පුතාට බලන්න මේ ටයර් එකේ මොනවහරි ජරාවක්වත් ගෑවිලාද කියල. ඒ ළමය බලල කිව්වා නෑ මොකුත් නෑ කියල. බලනකොට හුලංපාරට අපේ ගේ ගාවට එනව අර ගඳ දැන්. මහජන බැංකුව ගාවට වෙනකන් එනවා. හොයාගන්න බැහැ.කොහෙන එනවද ගරු සභාපතිතුමා මේක. ඉතින් ගරු සභාපතිතුමා ගරු ජනාධිපතිතුමාට හරි මේක සාකච්ජාවක් හරි ඉල්ලලා ගරු ජනාධිපතිතුමාට හරි කියමු මේක. අම්බලන්ගොඩ නගරෙ තියෙන ලොකුම ප්‍රශ්නයක් කියල මේක.නැත්නම් ගරු සභාපතිතුමා මාළු කඩේ තියෙන ඔක්කොම මාළු බඩ අනංමනං ඒව නිකං දාන අව්වට මේවවෙනකොට ඒත ගඳ එනවා. වලලන්න පුළුවන් නම් හරි ගරු සභාපතිතුමා ඒ මාළු කඩෙන් එන ලෝඩ් එක. ගරු සභාපතිතුමා ගරු රාහුල මන්ත්‍රීතුමා මේ ගැන හොඳ යෝජනාවක් ගෙනාවෙ. ගරු සභාපතිතුමා මේ ගැන දැඩි අවධානය යොමු කරන්න කියල මං ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුන් .ඇත්තෙන්ම දීර්ඝව මේ ගැන කතා කරන්න ඕන වෙන්නෙ නැහැ. නමුත් එක දෙයක් කියන්න ඕන. මොකද ඔබතුමා ගරු ජනාධිපතිතුමා පත්කළේ ඔබතුමා සහ අපි ලොකු අභිමානයකින්. ඉතින් ඒ අභිමානය තවත් වර්ණවත් කරන්න තමයි මේ වගේ මොකද එතුමාගේ ලොකුම වැඩසටහනක් තියෙනවා ගම හදනවා රට පිරිසිඳුව තියාගන්න එක. අම්බලන්ගොඩ තියෙන ප්‍රධානම ප්‍රශ්නය මම හිතන විදියට කුණු ප්‍රශ්නය. ඒක හින්දා ඔබතුමා ගරු ජනාධිපතිතුමා එක්ක කතා කරල මගේ සහෝදර සියලු මන්ත්‍රීවරු කිව්වෙ ඒකයි.එයට තමයි විසඳුම සොයන්න ඕන. ඒ වගේම මොකද අම්බලන්ගොඩ මාදම්පා ගඟේ බෝට්ටුවලින් ගිහිල්ල බලල තියෙනවා ඔබතුමා වෙලාවක සියලු ගරු මන්ත්‍රීවරුන්ට ඒ සඳහා චාරිකාවක් සූදානම් කරන්න. ඇත්තෙන්ම ගියාම කුණු දාන තැන යන්න බැරි තරම් කට්ට කලු පාටයි . මම කීප අවස්ථාවකම ඔරුවකින් ගියා. බෝට්ටුවෙන් යන්න බැරි නිසා ඔරුවකින් ගියා. ඒක හින්දා එතන බැම්මක් ගහලා කුණු දාන එක නවත්වන්න කුණු දාන එක වැටෙන්නෙ දැන් කෙලින්ම ඇලට. කට්ට කලු පාටයි ගරු සභාපතිතුමනි ඔබතුමා ගිහිල්ල බලන්න නිරීක්ෂණ චාරිකාවක් යන්න.ලේකම්තුමියත් ගියාම හොඳයි. හරිම සුවඳයි.යන්න ආසයි අයෙත් යන්න හිතෙනවා.එච්චරටම. මං හිතන්නෙ රුහුණු සංචාරක කාර්යාංශෙ අපගේ ගරු කොඩිකාර මන්ත්‍රීතුමාගෙ සහෝදරයෙක් වෙන්න පුළුවන්.එතුමා ඇත්තටම හැදුවා හොඳ ව්‍යාපෘතියක්. ලක්ෂ අනූ නවයක සීයක විතර බැම්මක් බැඳලා දැල් ගහලා කුණු ගඟට වැටෙන්නෙ නැති විදියට ඇලට වැටෙන්නෙ නැති විදියට ක්‍රියාත්මක කරා.නමුත් පහුගිය කාලය තුළ ක්‍රියාත්මක කරන්න හදනකොට කොහොමහරි ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මොන දූර්වලතා සියලුම රජයවල් මේවට වගකියන්න ඕන. අපි එකහෙලාම කියනවා අපේ පාලන කාලය තුළද කාගෙ පාලන කාලය තුලද දන්නෙ නැහැ අම්බලන්ගොඩට කුඩම්මගෙ සැලකිලි තමයි ගොඩක් ලැබිල තියෙන්නෙ. ඔබතුමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමයි ඔය ඇල සුද්ද කරන්න ප්‍රධාන වෙලා ජනතාව කුණු දානකොට විරෝධ වුණා. මම නවත්තන්න බැහැ ලේසියෙන්.ඇලේ බැහැල පුරුදුයිමට.මම ගඟේ නාල මට ඒව හොඳට පුරුදුයි. දුක දන්නව මම හොඳට. ඒක හාන්දා ගරු සභාපතිතුමා මොකද ලොකු විරෝධතාවයක් තිබුණා කුණු දාන එකට. යාන්තම් ඇත්තටම ගරු ලසන්ත මන්ත්‍රීතුමා කිව්වෙ බොරු නෙමෙයි. මොකද මමත් හල්වතුරෙ. ගරු ලසන්ත මන්ත්‍රීතුමා එන්න කලින් මම තමයි හල්වතුරෙ ජනතාවත් එක්ක හිටියෙ. ඉතින් මම හොඳට දන්නව ඔය ගෙවල්වලින් තේ බොන්නෙ බත් කෑවෙ මම. ඉතින් ඇත්තෙන්ම දැන් එහෙම බැරි හිනද තමයි දැන් අයින්වෙලා ඉන්නෙ.ඔබතුමාට මේව භාරදීල.ඒවගේ ඔබතුමා කිව්වෙ ජානක මහත්තයලගෙ ගෙදර ගැන. ජානක මහත්තයලගෙ ගෙදර නම් ලොකුයි. හොඳට පිරිසිඳුව තියාගෙන ඉන්න ගෙදරක්. නමුත් දුප්පත් පැල්පත ඊට වඩා ඒ ගෙවල්වල ඉන්නම බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමිය ඉන්න ගෙදර මොකක්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

මම මගේ හැම ගෙදරකම හිතවත් සහෝදර සහෝදරියො ඉන්නවා. ඒ ගෙවල්වලට මම යනවා.ඉතින් ඒ වගේ ඇත්තටම බොරු නෙමේ ගරු ලසන්ත මන්ත්‍රීතුමා කිව්වෙ බත් ටික කන්න බැරි තත්ත්වෙ තියෙනවා. මරණ ගෙයක් මගුල් ගෙදරකදි පුදුම අපහසුතාවයකට පත්වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා අපි හිනාවෙලා විහිළු කරලා ප්‍රශ්න මගහරින්න සූදානම් නොවී අපි ඇත්තටම ඔබතුමාට බැරිවෙන්නෙ නැහැ ඔබතුමා අභිමානයෙන් ජනාධිපතිතුමා ගැන කතා කරනවා. ඔබතුමා ගරු මන්ත්‍රීවරුත් එක්ක හරි තනියම ගිහිල්ල හරි මේ සඳහා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ මොකද මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ කෘෂිකර්ම නිලධාරීතුමා වශයෙන් කටයුතු කරන සනත් මහත්තයා මාළු ගොජරවලින් හදනවා ගෑස්. ගෙදර පාවිච්චි කරන්නෙ ගෙදරට ගියාම විදුලි ආලෝකය තියෙන්නෙ එයා බයෝ ගෑස් ක්‍රමයෙන් තමයි විදුලිය පාවිච්චි කරන්නෙ. ඒවගෙන් ඇත්තෙන්ම හොඳ ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. මොකද රත්දොළගම නිවාස යෝජනා ක්‍රමයට මම ගියා. අර මෙතුමාල කිව්ව වගේ තංගල්ලෙ වගේ තමයි. ඇත්තෙන්ම මේ අම්බලන්ගොඩ තමයි හොඳට කුණු රත්දොළගම නිවාස යෝජනා ක්‍රමය කියන්නෙ ලොකු නිවාස යෝජනා ක්‍රමයක්. ඒ නිවාස යෝජනා ක්‍රමයේ ඇත්තෙන්ම අපවිත්‍ර ද්‍රව්‍ය වෙනමයි. ලස්සනට ටැංකියක් හදල වෙනවෙනම ඒ දේවල් සිද්ධ වෙනවා. ඒක හින්දා ඇත්තෙන්ම අවශ්‍යම දේ ක්‍රිකට් ක්‍රීඩාංගන ඔය මොනවා ඒවට ඉතින් මුදල් දෙන්නෙ එක එක ආයතනවලින් එක එක දේවල්වලට. ඔබතුමා අතිගරු ජනාධිපතිතුමත් එක්ක කතා කරන්න. එතුමා ආසයිනෙ ලස්සන රටක් හදන්න. ඉතින් ඒ හින්දා ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා කියමින් මේ යෝජනාව ගෙනාපු එක ගැන අප සියලු දෙනාගෙ ඇස් ඇරීම සම්බන්ධව ගරු රාහුල මන්ත්‍රීතුමාට මගේ ප්‍රශංසාව හිමිකරමින් මා නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මං හිතන්නෙ අද දවසේ ඉදිරිපත් වුණු හොඳම යෝජනාව කියල කිව්වත් වැරදි නැහැ මේ යෝජනාව. අපි නගරයේ පුරවරසියො සියලු දෙනාම ප්‍රායෝගිකව මුහුණදෙන ගැටලුවක් පිළිබඳව. අපි කරන්නෙ දවසින් දවස අපේ පහත් බිම් ටික ගොඩ කරමින් යන එක. ඒකත් එච්චරම හොඳ කාරණයක් නෙමෙයි. මොකෙදි අපි මේ ව්‍යාපෘතිය එක්ක ප්‍රායෝගිකව සම්බන්ධ වෙන්නෙ කොහොමද කියන එක ගැන අපට සැලකිල්ලට ගන්න වෙනවා. ඒකෙදි වෙනත් නගරවල විශේෂයෙන් ඇඹිලිපිටිය වගේ නගරවල ඉතාම සාර්ථක ලෙස පවත්වාගෙන යන ව්‍යාපෘති. අපට ඒවයින් ආදර්ශෙට ගන්න පුළුවන්. ගිහිල්ල නරඹන්න වුණත් පුළුවන්. මං මේ ඉතාම කෙටියෙන් කියාගෙන යන්නෙ. කුණු කියන්නෙ සම්පතක්.අපේ විපත හැටියට තමයි අපි පවත්වාගෙන යන්නෙ. ඒකෙදි අපේ නගරයෙ ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යයට අනිවාර්යයෙන් තර්ජනයක් වෙලා තියෙනවා. ඒකෙදි දැන් පුද්ගලිකව මට ගැටලුවක් නැහැ.මම ඉන්න ප්‍රදේශයට මේ ගඳ එන්නෙ නැහැ. නමුත් අපිට ඒක දැනෙන්න ඕන. අපේ නගරයේ ඉන්න අනෙකුත් වැසියොන්ගේ අපහසුතාවය වේදනාව දැනෙන්න ඕන. හැබැයි අපේ රටේ මිනිස්සුන්ගෙ එහෙම හැඟීමක් නැහැ.මොකද අපේ මායිමේ අඟල් දෙකක් මෙහාට කරල හිටෙව්වොත් අපි මරාගන්න යනවා. අරහෙන් අක්කර ගානක් වික්කට ප්‍රශ්නයක් නැහැ. එහෙම සංස්කෘතියක් තමයි අපේ රටේ යන්නෙ. ඊට අමතරව මේකෙන් අපට ලැබෙන අතුරුවා තමයි හොඳ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් හරහා නගරයට පොහොර ටික නිෂ්පාදනය වෙලා ඒවයින් සහල් නිෂ්පාදනය වගේ දේවල් ලඟා කරගන්න පුළුවන්. ඉතින් මම ඉතාම සංශිප්තව කරුණු ඉදිරිපත් කළේ. ගරු රාහුල මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම ඉතාම ගෞරව

කරනවා.ඉතාම හොඳ යෝජනාවක්. කාලීන යෝජනාවක්. අප විසින් ඉදිරිපත් කළ යුතුව තිබූ යෝජනාවක් ඔහු ඉදිරිපත් කළා කියා මං සතුටු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මාත් ඉතින් වචනයක්වත් කතා නොකරන එක හොඳ නැහැ. මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් කරපු නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි ගරු රාහුල මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ඉතාමත් හොඳ කාලෝචිත යෝජනාවක්. මෙතුමාට මේ වෙලාවෙ ස්තූති කරනවා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන. මේ යෝජනාව හැමෝම කියනවා වැදගත්ම දෙයක් නිසා අත්‍යාවශ්‍ය නිසා මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු ඉටු කරන්න කියල මම සභාවට අදහස් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු රාහුල මන්ත්‍රීතුමා ගෙනා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සෑදීම පිළිබඳ යෝජනාව කතා කිරීමේදී මේක ඉතාම කාලෝචිත යෝජනාවක්. මං හිතන්නෙ ගරු මන්ත්‍රීවරු සියලු දෙනාම අපේ නගර සභාවෙ ඉතිහාසය තුළ වරින් වර ඉතාම ගට්ටනවලට මුහුණදීපු කාරණාවක්. වර්තමානයෙත් තිබෙනවා.මේක ඉදිරියෙදිත් තියේවි ගරු සභාපතිතුමනි. පාලයො විදියට අපේ යුතුකම හා වගකීම වන්නේ මේ ප්‍රශ්නය සඳහා ස්ථිරසාර විසඳුම් සෙවීම. එතනදි මේ ප්‍රශ්නය ගත්තම අපට ස්ථිර විසඳුම්වලට යෑමේදී විශාල බාධක තියෙනවා. හැබැයි මේ ප්‍රශ්නය අපි නිරාකරණය කරගැනීමට අත්‍යාවශ්‍ය නිසා තාවකාලිකව වර්තමානයේ තියෙන ප්‍රශ්නය ගරු ලසන්ත මන්ත්‍රීතුමා පෙන්නල දුන්නා ඔබතුමාට. එතුමා කිව්ව මේකට බෙහෙතක් යොදල හරි දුර්ගන්ධය ඉවත් කරල දෙන්න කියල ගරු සභාපතිතුමනි. ඒකට අපි අනුගත වෙන්න ඕන. දෙවැනි කාරණය විදියට අපට මේකට අවශ්‍ය සම්පත් අපි මේ කාරණා කොහොමද සිද්ධ කරන්නෙ කියන එක ගරු සභාපතිතුමනි අපට සන්තෝස වෙන්න පුළුවන් කාරණාවක් තියෙනව මේ සම්බන්ධයෙන්. දිවයිනේ අනෙක් නගර හා කල්පනා කරනකොට භූමි ප්‍රමාණයක් ලබාගැනීම ඉතාම දුෂ්කර කාරියක් ගරු සභාපතිතුමනි. ඔබතුමා දන්නවා අපට තිබ්බ්ච භූමි භාගය තමයි අපි අර ටී.එච්.ඩබ්. නිවාස ව්‍යාපෘතිය සඳහා ලබාදුන්නේ. එතකොට ඒ ඉඩම අහිමිවීම තුළ අම්බලන්ගොඩ මේ වර්ග කිලෝමීටර් 07 ඇතුළෙ වෙන කිසිම භූමිභාගයක් නැහැ. මේ කුණු බැහැර කිරීම සඳහා ස්ථානයක් හදන්න. දැනට නීත්‍යානුකූලව හෝ නීතියේ අවසර නැතිව හෝ ඒ භූමිභාගවල් පාවිච්චි කරමින් තිබෙනවා. එතකොට මේක ආරක්ෂා කරගැනීම නගර සභාවෙ යුතුකම හා වගකීම. මෙතනිනුත් යන්න වුණොත් මහජන උද්ඝෝෂණ මත ඔබතුමා හෝ අපේ ගරු මන්ත්‍රීවරු කල්පනා කරන්න ඕන කරුණාකරල කොහෙටද අපි මේ කුණු දාන්නෙ කුණු බැහැර කරන්නෙ කියල. ඒ නිසා අපි කලින් මේක සොයන්න තිබෙනවා. තුන්වෙනුව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මුළු ලංකාවෙම කුණු කසලවලින් තොර රටක් නිර්මාණය කිරීමේ භාරදූර කර්තව්‍යයක අතගහල යෙදෙමින් ඉන්නවා. එතුමාටත් ආශිර්වාදයක් වෙන්න තිබෙනවා. හැබැයි අපි අම්බලන්ගොඩ නගර සභාව විදියට එතුමා ගිහිල්ල හම්බවෙලා හෝ එතුමාට ලිඛිතව මේ අම්බලන්ගොඩ නගර සභාවෙ කුණු ප්‍රශ්නයක් තියෙනවා කිව්වට වැඩක් නැහැ ගරු සභාපතිතුමනි. මේ මුළු ලංකාවටම මේ ප්‍රශ්නෙ තිබෙනවා. අපි වගකිව යුත්තෙක් ගාවට යන්න ඕන අපි විසඳුම් අරගෙන. අපට මෙන්න මේ කාරණා ටික තියෙනවා ගරු ජනාධිපතිතුමනි මේ ටික අපට කරල දෙන්න කියල. එහෙම නැතිව අපි නිකන්ම අතපය වන වන කිසිම තාලයක් නැතිව කුණු අස්කරදෙන්න විසඳුමක් දෙන්න කියල එතුමගෙන් ඉල්ලුවට වැඩක් නැහැ ගරු සභාපතිතුමනි. අපට යෝජනාවක් තිබෙන්න ඕන. අපට ව්‍යාපෘතියක් තිබෙන්න ඕන. අපට සැලැස්මක් තිබෙන්න ඕන. වර්තමානයට අනාගතයට සැලැස්මක් සමහර

වෙලාවට අර කොම්පෝස්ට් ව්‍යාපෘතිය සෑදීමේදී අපේ ගරු ධම්මික මන්ත්‍රීතුමා යෝජනා කළ පරිදි මහා පරිමාණ යනුත්‍ර සූත්‍ර ව්‍යාපෘතිත් තිබෙනවා.අර්ධ කාලීන මධ්‍ය කාලීන ව්‍යාපෘතිත් තිබෙනවා. ඊයෙ පෙරේදත් වැලිගම මහ නගර සභාවෙ කොම්පෝස්ට් පොහොර බෑග් 02 ක් ගෙදර ගෙනාවා මං පෝර විකුණන මනුස්සයෙක්ගෙන්. ඒ ගොල්ලො එතෙන්ට ගිහිල්ල. ගිය පාලක කණ්ඩායම අපි ගියා බලංගොඩ. ඔය කොම්පෝස්ට් පොහොර හදන ව්‍යාපෘතිය නරඹන්න. මේ නිලධාරීන් මං හිතන්නෙ මාසෙට සැරයක් ඔය ව්‍යාපෘති සඳහා විශේෂ ව්‍යාපෘති සඳහා එක්ක යනව ඇති. වැඩසටහන් සඳහා සහභාගී වෙනව ඇති. තිරසාර සංවර්ධනය කියන වචනෙ විතරයි. එච්චරයි.එතනින් එහාට අම්බලන්ගොඩ නගර සභාව යන්නෙ නැහැ. ඒක නිසා ගරු සභාපතිතුමනි මම යෝජනා කර සිටිනවා ගරු සභාවට ඔබතුමාට පුළුවන් නම් මේ සඳහා මන්ත්‍රීවරුන්ගෙන් කමිටුවක් පත් කරන්න. කමිටුවක් පත්කරල ඒ කමිටුවට බලය දෙන්න මේ ප්‍රශ්නෙ සඳහා ඒ විසඳුම් සැලසුම් සකස් කරල ඉදිරිපත් කරන්න. මේ ගරු සභාවට. එතකොට අපේ නිලධාරීන්ගෙ මට්ටමේ අපේ සාරංග මහත්තයා ඉන්නෙත් ඔය කුණු ගොඩේ. පෝරඹ. ඒ මන්සුසයට තරම් මේකෙ බරපතලකම වෙන කාටවත් නැතිව ඇති. මේ කුණු සම්බන්ධව සියලුම බැහැර කිරීමේ වගකීම දරන්නේ එතුමා. එතුමා ඉන්නෙත් පෝරඹ ඔය කියන ප්‍රදේශයේ. ඉතින් ඒක නිසා එතුමාට හෝ නිලධාරීන් දෙදෙනෙකුට මේක තනියම මේ වගකීම දරන්න බැහැ. එතුමන්ලගෙ රාජකාරිය 100% ක් කුණු බැහැර කිරීම් කරනවා. හැබැයි එතනින් එහාට මේ කර්තව්‍යය සිද්ධ වෙන්නෙ නැහැ. මම අත දාල මගේ ගෙදර කුණු පෙට්ටි හතර පහක් සුද්ද කරල පොලිතින් බෑග් වෙනම සුද්ද කරල දවසගානෙ මං දැම්මා. ඒ කරල ගිය සතියෙ මම ගිහින් බැලුව යාඩ් එකට මොකද මේකෙ වෙන්නෙ කියල. මම දැක්කා ටවුන් එකේ එහෙම අවධිමත්ව කුණු බැහැර කරල තියෙනවා. මං බැලුවා සත්‍ය වශයෙන්ම විසඳුමක් තියේද කියල.නැහැ ගරු සභාපතිතුමනි.ඒ ඔක්කොම එකට බැහැර කරන්නේ. විසඳුමක් නැහැ එහෙම.මං ඔය ලීෆ්ලට් ගහද්දිත් සෞඛ්‍ය කමිටුවෙදිත් මගින් මගටම කිව්වා ලීෆ්ලට්වලින් විතරක් මේක ක්‍රියාත්මක හදන්න එපා. මේක ප්‍රායෝගිකව භෞතිකව ක්‍රියාත්මක වෙන්න කියල.නිකං ලීෆ්ලට් ගැහුවට වැඩක් නැහැ. මිනිස්සු කුණු තෝරල දුන්නට වැඩක් නැහැනෙ. අවසානයේ අපි බැහැර කරන්නෙ එකට නම්. එතනත් ඒ මිනිස්සුන්ට කරන්න දෙයක් නැත්නම් ඊට එහා විසඳුමක් නැත්නම් ඒ ගොල්ලො කරන්නෙ ඒ ටික තමයි ගරු සභාපතිතුමනි. එතකොට ගඟ අයින දක්වා පාර කපාගෙන ගිහිල්ල ඒ.බී.සී. දාල දැන් පාර යම් මට්ටමකට හදාගෙ ගිහිල්ල තියෙනවා. එතකොට ඒ හදනකන් කරන්න දේකුත් නැහැ. ඒත් එකට තමයි ඔක්කොම බැහැර කරන්නේ. එතකොට ගරු සභාපතිතුමනි මේවට සැලැස්මක් තිබෙන්න ඕන. මේ සැලසුම මේ නිලධාරීන් දෙන්න තුන්දෙනාට විතරක් ෙමේක පවරලා අපි මේ මන්ත්‍රීවරු මාසෙට සැරයක් මෙතන ඇවිල්ල කෑ කෝ ගහල වැඩක් නැහැ ගරු සභාපතිතුමනි. මේක මන්ත්‍රීවරුන් දෙන්න තුන්දෙනෙක්ගෙන් කමිටුවක් පත්කරල ඒ කමිටුවට සම්පූර්ණ වගකීම භාරදෙන්න. මේක කරන්න. අවශ්‍ය යන්ත්‍ර වාහන ට්‍රැක්ටර්ද ඒ නිලධාරීන්ද ඒ සියලු දේ කමිටුව හරහා අපි ක්‍රියාත්මක කරගන්න උත්සාහයක් ගනිමු.අඩු වශයෙන් සැලසුමවත් සකස් කරගන්න. එතකොට අපට ඒ සැලසුම් ටික අරගෙන ගරු ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා ගාවට යන්න පුළුවන්. මෙන්න මේ කාරණාවෙ අපි ඉන්නවා. අපට මේ අවශ්‍ය භූමිභාගය තිබෙනවා. අපට අවශ්‍ය සම්පත් ටික ලබල දෙන්න කියල නගර සභාවක් විදියට මේ ආදායමින් අපට යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීමේ නොහැකියාවක් පවතිනවා කියල. ඉතින් ඒක නිසා ගරු සභාපතිතුමනි මේ කොම්පෝස්ට් පොහොර සෑදීමේ යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි. හැබැයි මේක අපි තවත් කතා කරපු එක් යෝජනාවක් විදියට පත් නොවේවා කියල මං ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය ඉතා දැඩිසේ බලපාන ප්‍රශ්නයකි.මෙය ඉදිරියටත් බලපාන ප්‍රශ්නයක් වශයෙන් සලකා කටයුතු කළ යුතුයි.මං හිතන්නෙ සභාපතිතුමා ඔබතුමාටත් වැඩ වැඩියි ඇත්තටම.

මොකද ඔබතුමා මං දන්නවා මෙතන ඉන්නවා වාඩිවුනාට පස්සෙ ෂීට් එකේ ප්‍රශ්න එනවා අරක මේක. ලේකම්තුමියටත් ඕකෙ වගකීම ඇත්තටම දන්න් අමාරුයි. මං හිතන්නේ ඔබතුමාගේ පාලක පක්ෂයේ මන්ත්‍රී කෙනෙක් කැමැත්තෙන් හරි ඉදිරිපත්වෙලා මේ සම්බන්ධව සොයාබලා යම් ක්‍රමවේදයක් සලසන්න. ක්‍රමවේදයක් ඇතිකරගන්න කියල මං ඉල්ලීමක් කරනවා. මොකද ඕකට සාමාන්‍ය යෙන් කුණුවලට ඒ දැනීම තියෙන මන්ත්‍රී කෙනෙක් මං හිතන්නෙ මෙතන ඉන්න කවුරුහරි මන්ත්‍රී කෙනෙක් කොඩිකාර මන්ත්‍රීතුමා ඉන්නවා,ඩෙනට් මන්ත්‍රීතුමා ඉන්නවා,ලසන්ත මන්ත්‍රීතුමා හරි කවුරුහරි පත්කරලා දීර්ඝකාලීකව වගේම කෙටිකාලීනව විසඳුම් දෙන්නත් තියෙනවා මේ මන්ත්‍රීවරු ප්‍රකාශ කළ ආකාරයට. ඔබතුමා මේක දැඩිලෙස කල්පනා කරල ඔබතුමාටත් කාර්යබහුලත්වය තියෙන නිසා මේක යම් ක්‍රමවේදයකට යන්න කියල ප්‍රකාශ කරනවා.අපේ මන්ත්‍රීවරු විපක්ෂ නායකතුමා ඇතුලු පාලක පක්ෂයේ සියලුම මන්ත්‍රීවරු සහයෝගය දීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අනුමතයි. මේකෙ කමිටුව පත්කිරීම ලබන සභාවට දාන්න.

**තීරණය:-**

බැහැර කරන කසළ උපයෝගි කරගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් කරන ලද යෝජනාව අනුමත කිරිමටත් මේ සඳහා කමිටුවක් පත්කිරිමට ලබන සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එබ්.ඩබ්. අරුන ප්‍රදිප් මහතා විසින් අනුමත කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

05.07.02 යෝජනාව ගරු රාහුල ලලිතවික්‍රම මහතා ඉදිරිපත් කරන්න .

**05.07.02** **නගර සභාව මගින් මහජනතාව වෙත ඉටුකරනු ලබන සේවාවන් තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී .**

<u>**ගරු නගර සභා මන්ත්‍රි එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

නගර සභාව මගින් මහජනතාව වෙත ඉටුකරනු ලබන සේවාවන් තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීතුමා මේකටත් අපි ලබන සභාවෙන් වගකීම් පවරනවා මන්ත්‍රීවරුන්ට ඒ විෂයන් හතරට පහට කඩලා. ඒක අපි ලබන සභාවට ඉදිරිපත් කරනවා.මේක අපි කණ්ඩායම් රැස්වීමේදිත් කතාවුණා. කර්මාන්ත,සෞඛ්‍ය,ටෙන්ඩර්,ක්‍රීඩා ඒ වගේ මන්ත්‍රීවරුන්ට වෙනම වගකීම් පවරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රි එම්.ඩබ්.රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා මෙහෙමයි දැන් ඇත්තටම මේකෙ අපි නිලධාරීන්ටත් බනිනවා යම් යම් දේවල් ඉටුවෙන්නෙ නැහැ කියලා. මන්ත්‍රීවරුන්ගෙත් වගකීමක් තියෙනවා ඒකට උනන්දුවෙලා වැඩකටයුතු කරගන්න.ඉතින් මේ දෙකක් තියෙනවා මෙතන.ගරු මන්ත්‍රීවරුන් උත්සාහ වෙන්නත් ඕන මේ කර්තව්‍ය කරගන්න. අපිට හරි කණගාටුදායක තත්ත්වයක් තමයි මේ ප්‍රධාන නගර සභා ගොඩනැගිල්ල සම්බන්ධ ප්‍රශ්නය.ඔබතුමා කමිටුවක් පත්කළා.නමුත් ඒකට තාම ක්‍රියාමාර්ගයක් ගන්න එකතුවෙලා සාකච්ඡා කරල මොකක්ද කරන්න ඕන කියන තත්ත්වෙටවත් යන්න බැරිවුණා. නමුත් මේක මහජනතාවගේ මෙහෙමයි ගරු සභාපතිතුමා ඔතන කාර්යබහුලත්වය නිසා හරි අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙත් වගකීමක් සහ යුතුකමක් තියෙනව මේකට දායකත්වය දාල මේක නිලධාරීන් උනන්දු කරවල යවන්න.මොකද නිලධාරීන්ගේ පැත්තෙනුත් යම්යම් අඩුපාඩුනම් තියෙනවා.උදාහරණයක් ගත්තම අපේ තාක්ෂණ නිලධාරී මහත්මයත් නෑ මෙතන නෙ. මොකද මේ සභාව වැදගත්ම නගරයේ තීන්දු තීරණ ගන්න සභාව. එතකොට ඒ අයශ්‍ය කරන නිලධාරීන් මෙතන ඉන්නකොට තමයි අපිටත් මේක යම් අදහසක් අරගෙන යම් තීන්දුවකට එන්න පුළුවන්. මේ කමිටු පත්කළා වගේම කමිටුවල ක්‍රියාකාරීත්වයක් එන්න ඕන. මොකද දැන් මේක බලන්නකොට .යට එක්කො ඒ සී කරල දෙන්න. මොකද අපි දැන් ඕනම භාණ්ඩයක් ගත්තම ඉස්සරහා තිනෙවා ටාටා කැබ් රථයක්. බලන්නකො දිරල යන හැටි.ඕක දැක්කහම කවුරුහරි.මේක ඉස්සරහම තියෙන්නෙ.එක්කො මේක පැත්තකට ගෙනිහිල්ල දාන්න ඕන. ඉස්සරහම තියෙන එක දැක්කහම වාහන පිළිබඳව සොයාබලන මේ නගරයේ ඉන්නව ජනතාව එක්එක් අදහස් දරණ මත දරණ. ඔබතුමා දන්නවා කියන්න දෙයක් නැහැ. නිතරම ටෙලිෆෝන් කරලත් අහනව මොකක්ද අර වැඩේ කියල අහන අය ඉන්නවා.එතකොට මේ නගරයේ ඔබතුමා පිළිබඳව දැඩි විශ්වාසයක් තියාගෙන තමයි මේ බලයට ඔබතුමාල පත්කරල තියෙන්නේ. එතකොට දැන් මේ වගේ වාහන තියෙනඑක එක්කො මේව ගාල්කරන්න තැනක් හදන්න ඕන. මේකෙ ඇන්ජින් එකනම් මං හිතන්නෙ හොඳයි.පොඩි මලකෑම් අරහෙ මෙහේ.බලන්නකො. සොයා බැලීමක් තියෙන්න ඕන අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ අපෙත් වගකීම වෙනව මේක. නිලධාරීන්ටම පටවල මේක ඉන්නත් බැහැ. නමුත් මේවට අපි ක්‍රියාත්මක වෙලා කටයුතු කරන්න ඕන. ඒක එකක්.එතකොට දැන් ඔය හදන එක සම්බන්ධව වහලට මොකක්ද ගන්න ඕන තීන්දු මොකුත් තවම නැහැනෙ. එතකොට බලන්නකො නිලධාරීන් කොහොමද මනස එකතැන් කරගෙන. දැන් කම්පැනි එකකට ගියාම බලන්න ලස්සනට කාපට් කරල මල් පැළ හිටවලා ඒ වටපිටාව වපසරිය හදල තියෙන්නේ.සීට් එකේ වාඩිවුණාම අදහස් එනව ඕනතරම් වැඩකරන්න. ගරු සභාපතිතුමා ඒකයි කියන්නේ සභාපතිතුමා ඉන්න කාමරේ වුණත් ඇත්තටම අපි අසතුටුයි ඔබතුමා එතන ඉන්නවට.මොකද හේතුව දැක්කහම කවුරුහරි ඇවිල්ල බැලුවම වටපිටාව බැලුවම අපේ නගර සභාවේ තත්ත්වය පැටිකිරිය ඔක්කොම තේරෙනවා. ඉතින් ඒක එහෙම වෙන්න බැහැ. ගරු මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය තියෙන්න ඕන. ඔබතුමාගේ ඒවගේම නිලධාරීන්ගේ ගරුත්වය තියෙන්න ඕන විදියට අපි ඒක හදල දෙන්න ඕන. ඒ නිසා පැතිකඩ කිහිපයක් තියෙනව.මං මේ යෝජනාව දැමීමට හේතුවක් වුණේ මේ නගර සභාවේ වැඩපිළිවෙලත් දැක්මක් එක්ක යන්න ඕන.ඒක ඔබතුමාට ඒ දැක්ම තියෙනවා.නැත්තෙ නැහැ. නමුත් ඔබතුමාටත් මං හිතන්නේ මං ඉල්ලා සිටිනවා පාලක පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සහයෝගය දෙන්න ඕන. විපක්ෂයේ සියලු දෙනා ගේන ප්‍රතිපත්තිමය තීන්දුවලදි හැමෝම සහයෝගය දෙනවා. ඉතින් අපිත් ඒකෙ වගකීමක් දරන්න ඕන. ඔබතුමා යම් වැඩපිළිවෙලක් හදන්න. ඒ පිළිබඳව නිපුනත්වය තියෙන මන්ත්‍රීවරු සහභාගී කරවලා ඔබතුමා කිව්ව වගේ කම්ටුවක් හරි පත්කරලා.හැබැයි ඉක්මනින්ම කෙරෙන්න ඕන එක තමයි මේ ගොඩනැගිල්ලේ කර්තව්‍යය. අපි අරන් දෙනවා දැන් කම්පියුටර්. පහුගිය මේ වාර්තා දෙන්න බැරිවුණේ මොකද? නමුත් කවුරුවත් හිතන්නෙ නැහැ මෙතෙන්ට අවම මේක නැතිවුණාම නිලධාරීන්ට බැනල වැඩක් නැහැ.අපෙත් යටිතල පහසුකම් ඒව සපයල ඒ කරන්න ඕන ක්‍රමවේදය යොමුකරල දෙන්න ඕන.යොමුකරල දෙනකොට තමයි නිලධාරීන්ටත් ඒ

වැඩ කරන්න පුළුවන්. ඉතාමත් භාරදූර කාර්යයක් මේ කරන්නේ. මොකද මොනවහරි ප්‍රශ්නයක් වුණාම මේකෙ වැදිල නැතිවුණොත් එහෙම අපිත් බනිනවනෙ.අපෙත් මේකෙ වැරදි කියනවා. මොකද අපි බලන්නෙ නැහැ මේක.අපිට වැඩක් නැහැ.නමුත් කර්තව්‍යය කරන කෙනා තමයි මේකෙ ප්‍රශ්න ගැටලුවලට මුහුණ පාන්නේ. බඩුවක් ගන්න ගියාම අරගෙ යන්න ඕන මෙහේ යන්න ඕන.ඒ පාර සල්ලි ගෙවල නැතිවුණාම ඒක දෙන්නෙ නැහැ. මේක දම්වැල් පුරුක වගේ යන්න ඕන ප්‍රශ්නයක් මේ. ඒක නිසා අපි ඉල්ලා සිටිනවා ඔබතුමා ඒකට මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා. ඔබතුමා හොඳ අදහසක් කිව්වේ බලය බෙදීම කරන එක.ඒක හොඳයි ඔබතුමාට තියෙන කර්තව්‍යයත් එක්ක රැස්වීම්වලට යනවා.ලේකම්තුමියත් සමහර වෙලාවට රැස්වීම්වලට යනවා. මං උපසභාපතිතුමාට බනින්නෙ මොකෝ. බනින්නෙ හේතුවක් නිසා.එයා ඉන්න ඕන කියන මතේ ඉන්න නිසා .එතුමා නැත්නම් මෙතුමා ඉන්න ඕන. ඔබතුමා හරි රැඳෙන්න ඕන කියන එක මං කියන්නේ. ඒ නිසා කේන්ති ගන්න නෙමේ.අපි මේ කරන්නේ බැනල හරි යොමුකරන එක. ඒක නිසා කම්පියුටර් ගෙනාවට වැඩක් නැහැ ඒක සවිකරගැනීමේදී අපහසුතාවයන් තියෙනවා. වයර් කෑල්ලක් අවශ්‍ය වුණොත් ඒක ගන්න විදියක් නැහැ. ප්ලග් පොයින්ට් එකක් ගන්න විදියක් නැහැ. ඉතින් ඒ වගේ අපහසුතාවයනුත් තියෙනවා. මං කියන්නේ ප්‍රායෝගිකව ඒක අනුමත කරගෙන අපි මේ කටයුත්ත කරන්න ඕන. අපිට ප්‍රශ්නයක් නැහැ. අපිට ඕනත්ම මෙන්න මේක කරන්නෙ නැහැ වැරදි මතයක් දීගෙන යන්න පුළුවන්. ඒක නෙමේ වෙන්න ඕන. දැන් ඔය තියෙන තත්ත්වය තුළ වෙනදා ඇතුල්වෙන කොටම කොච්චර ආස හිතෙනවද? දැන් ආස හිතෙන්නෙ නැහැ. අතන කෑල්ලයි.මෙතන කෑල්ලයි. ඔය තත්ත්වෙ තියාගෙන. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ නගර සභාවේ මහජනතාව මොකද මූලික වශයෙන්ම අපි මන්ත්‍රීවරු වෙලා තියෙන්නේ මහජනතාවගෙන්. එතකොට අපි බලන්න වෙන්නෙ ප්‍රායෝගිකව මහජනතාව ගැන.මහජනතාවගේ අවශ්‍යතාවයන් සපුරන ආකාරයෙන් මේක සැදිය යුතුයි. ඒව සපුරන්න නම් අපි මේ නිලධාරීන් එක්ක සහයෝගයෙන් වැඩකරගෙන යන්න වෙනවා. ඒ නිලධාරීන්ගේ සහයෝගය ගන්න ඒ යටිතල පහසුකම් ඒ අවශ්‍ය කරන මූලධර්ම ටික තියෙන්න ඕන.ඒක ඇතිකරන්න තමයි.අපි ගරු සභාපතිතුමා පත්කරල සභාවක් තියෙන්නේ. අපේ කර්තව්‍ය ඉටුකරන්න ඕන ඊට පස්සෙ තමයි නිලධාරීන්ගේ කර්තව්‍ය ඉටුකරන්න පුළුවන් වෙන්නේ.අපි ඉතින් බැනල හරියන්නේ නැහැ. එක එක වෙලාවට දේශපාලන ඩීල් ගහනවා ඉතින්. ඒක වෙනම කතන්දරයක්. ඒක ඉතින් ඔබතුමා දන්නවා.ගහන්නෙ මොකක්ද කරන්නේ මොකක්ද කියල. අපි හැරෙනකොටත් ඔබතුමා දන්නවා. නමුත් අපි මේ ඉදිරියේදී මේ වැඩකටයුතු කරන්න නැත්නම් බැනුම් අහන්න වෙන්නේ නැත්නම් ඇත්තටම කියනවනම් හැන්දෑවට මළගෙදරක යන්න බැහැ. ප්‍රශ්න ගැටලු මොනවහරි එකක් අදිනවා. ඒක නිසා ඔබතුමාට යම් දැක්මක් තියෙනවා.ඔබතුමාට පළපුරුද්ද තියෙනවා. ඔබතුමා බලය බෙදලහරි මේක කරන්න පුළුවන් කවුද මන්ත්‍රීවරයා එයාට වගකීම භාරදීල වැඩේ කරන්න කියන්න. උප සභාපතිතුමා ඔබතුමා තරහවෙන්න එපා.ඔබතුමාට බැන්නට. බනිනවා නෙමේ.ඔබතුමත් උනන්දු වෙලා වැඩටික කරනවනම් බොහොම ස්තූතියි.

<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි මෙතුමා මෙතන ඇවිල්ල කතාකළාට මං කාගෙන්වත් බැනුම් අහන වැඩ කරන්නෙත් නැහැ. කාගෙන්වත් බැනුම් අහන්නෙත් නැහැ මම. මං කරන වැඩේ මං කොහොමත් කරනවා. මං මෙතන නිකං ඇවිල්ල ඉන්නෙ නැහැ. මීට වඩා වැඩ තියෙනව මට. මට වැඩක් තියෙනවනම් මං කරනවා.ඔබතුමා දැන් ඔය ලොරිය ගැන කතාකළා. ඔය ලොරිය අර කැළේ තිබිල ඇදල අරන් ස්ටාර්ට් කරල ඔතෙන්ට ගෙනාවෙ මං තමයි ඕක හදන්න. මෙතන නිලධාරීන් ඉන්නවා අහන් ඉන්නවනම් හොඳයි ඕක. ඉංජිනියර්ටත් කතාකරලා ඔය ප්‍රශ්නෙ විසඳලා දැන් මාස දෙකකටත් වැඩියි. අද වෙනකන් බැරිවුණා ඒකෙ ඉස්සරහා මූණ ගෙන්න ගන්න. සභාපතිතුමත් කතාකරල

සභාපතිතුමත් අවසර අරන් දුන්නා. අද වෙනකන් බැරිවුණා මූණ ගෙනැල්ල හදාගන්න.ඔතන කිසිම අවුලක් නැහැ.දුවන තත්ත්වෙ තියෙන ලොරියක්. ස්ටාර්ට් කරල ඔතනට දැම්මේ. ඉතින් ඔතන තිබුණු කුණුගොඩ මම දවසක් මහන්සිවෙලා අස්කරල දැම්මේ. මේ පැත්තේ.මට වැඩක් පැවරුවම මං ඒ වැඩේ කරනවා ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා මට වැඩක් පවරන්නෙ නැතිව මං මෙතනට ඇවිල්ලා නිකන් පුටුව උඩ වාඩිවෙලා ඉඳලා මට යන්න බැහැ. මට තේරුමක් නැතිව. ඊට වඩා හොඳයි මං මගේ වැඩක් කරගන්න එක. ඒ නිසා ඔබතුමා මට කිව්වට මං කාගෙන්වත් බැනුම් අහන්නෙත් නැහැ.ඔබතුමා එහෙම කතාකරන්න එපා. ඒ නිසා ගරු සභාපතිතුමනි වැඩක් තියෙනවනම් වැඩ කරන්න පුළුවන්.මං දවසක් කිව්වා ගිහින් බලන්නකො අර එහා පැත්තෙ තියෙන යකඩ ගොඩ. මොන තත්ත්වයක්ද තියෙන්නෙ කියලා. මේ පැත්ත මං සුද්ද කළා.ඔබතුමා මේ පැත්ත තියෙන තත්ත්වෙ බලන්නකො ගිහිල්ල. ඉතින් ඒව කරන්න අපට  කරන්න පුළුවන්.නීත්‍යානුකූල පැත්තකුත් තියෙනවනෙ මේවයෙ. නිලධාරීන් කියන්නෙ අපට මේව අයින් කරල ඔඩිට් එකෙන් එනවා මේව භාරගන්නෙ කවුද කියලා. මේ පැත්තෙ තිබ්ච්ච ඒව ඔබතුමා දකින්න ඇති ග්‍රවුන්ඩ් එකේ තිබුණු අර මැට්න් ටික.මැට්න් හතරක් පහක්. මෙතන ගොඩගහල තිබ්බා.මම උස්සල බලනකොට පස්වෙලා යට. මේව ඉන්වෙන්ට්‍රිෙය තියාගන්න ඕන බඩු නෙමේ මේව. අර එහා පැත්තෙ තියෙන යකඩ ගොඩ එක්කො වෙන්දේසි දාල දෙන්න ඕන. ඉතින් ඒව කරන්න අපි කිව්වට මං නම් දැන් කියන්නෙ නැහැ කියල මට එපාවෙලා තියෙන්නේ. සාමාන්‍යයෙන් මං වැඩක් කරන්න ගත්තොත් මට වැඩ කරනහැටි කියන්න ඕන්නැහැ. මං ළඟ කොහොමත් සේවකයො 50 ක් විතර වැඩකරනවා දවසකට.ඒ හින්දා මට වැඩකරන හැටි කියන්න ඕන්නැහැ. මං දන්නව වැඩ කරවන්න .ඒ නිසා දොස් කියන්න එපා ගරු රාහුල මන්ත්‍රීතුමා දන්නෙ නැතිව. ඒ නිසා ඔබතුමා දැනගෙන සමහරවෙලාවට ඔබතුමා එන වෙලාවෙ මං නැතිවෙන්නත් පුළුවන්. ඒක ගැටලුවක් නැහැ.හැබැයි මම මෙතන ඇවිල්ල නිකන් ඉන්නවට වඩා හොඳයි ගරු මන්ත්‍රීතුමා මගේ වැඩක් කරගන්න එක. ඉතින් ඒ නිසා තමයි ඒ තත්ත්වෙ උදාවෙලා තියෙන්නේ. ඒ නිසා ඔබතුමා දන්නෙ නැතිව කතාකරන්න එපා.දැනගෙන කතාකරන්න කියන ඉල්ලීම කරනවා ගරු මන්ත්‍රීතුමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මට කියන්න ඕන ගරු රාහුල මන්ත්‍රීතුමාගෙයි , ගරු උප සභාපතිතුමාගෙයි, ගරු සභපතිතුමාගෙයි තුන්දෙනාගෙම කතාවලින් මට තේරුණේ දැන් අපි කමිටු පත්කරනවා. ඒ වුණාට ඒ කමිටුවේ වැඩ කොයිවෙලාවකවත් රිවීව් වෙන්නෙ නැහැ. ඒ කියන්නෙ මේක කෙරුණද? මොකද වුණේ? මේකෙ තියෙන අඩුපාඩු මොනවද? කියන එක. මම කියනව ඔබතුමා කිවුව විදියට කමිටු පත්කරල මේ වගේම අපි රැස්වෙලා  ඔබතුමාගෙ ප්‍රධානත්වයෙන් ඔබතුමා රිවීව් කරන්න. මේ කමිටුවේ වැඩටික වුණාද? ඇයි වුණේ නැත්තේ? මොනවද මගෙන් කෙරෙන්න ඕන. එතකොට මාසෙකට සැරයක් මේ වගේම අපි ටිකදෙනා රැස්වෙලා මේ කමිටු ටිකේ ප්‍රධානියා හරි කවුරුහරි අරගෙන බැලුවොත් ඒ අය කරාද? ඇයි කරන්න බැරිවුණේ? ඔයගොල්ලන්ට මොකක්ද ඕන වුණේ?එහෙනම් ඔයා කවදද මේක කරන්නේ?කියල අපි රිවීව් එකක් අරගෙන දිගටම කරගෙන යමු. එතකොට මං හිතනව ඔය වැඩටික ක්‍රියාත්මක වෙයි කියලා.අර වෙන්නෙ අපි පත්කළාට ඒක එතනින් එහාට බැලෙන්නෙ නැති එකයි ප්‍රශ්නෙ තියෙන්නේ. මම යෝජනා කරනවා එහෙම. එතන මට තේරුණු විදියට අපි මේ වගේම එක දවසක රැස්වෙලා වරුවක් අපි ඒ කමිටු ටික අරගෙන රිවීව් කරමු ඒ වැඩ කොහොමද?මොකද වුණේ කියලා. මම යෝජනා කරනවා එහෙම කරන්න කියලා.

**තීරණය:-**

නගර සභාව මගින් මහජනතාව වෙත ඉටුකරනු ලබන සේවාවන් තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට ගරු නගර සභා

මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් කරන ලද යෝජනාව ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභාගත කරන ලදී .

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරුසභාපතිතුමනි, ගොඩනැගිල්ලෙ තත්ත්වෙ ගැන පොඩ්ඩක් කියන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

තාක්ෂණසේවා නිලධාරී විස්තර කරන්න ඒ පිළිබඳව.

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රීවරු දන්නෙත් නැහැ.දැනගතයුතුයි.ඉතාම තියුණු ප්‍රශ්නයක් තමයි අපේ නිලධාරීන්ට තිබුණු ගැටලුවක් අපේ කාර්මික නිලධාරීත් එක්ක ඒක මං විසඳුවා පළාත් පාලන ඉංජිනේරුතුමා ගෙන්නලා. පෞද්ගලිකවම මං මැදිහත්වෙලා ගෙන්නල විසඳුවා ඒක. එයින් ඉස්සරහට යන්න ඉතින් එතුමා කිව්වා මේක කවර හෝ ආයතනයක් ලවා කරගන්න කියලා. හැබැයි දැන් ඉතින් ආයතනයක් ලවා කරගන්න ආයතනවල මං හිතන්නේ අගේ ගරු ධම්මික මන්ත්‍රීතුමත් ඔබතුමත් .එම්.බී.ආර්.වාර්තාවෙ තියෙනව ගරු මන්ත්‍රීතුමා ආයතනයක් ගවා කරගන්න කියල වාර්තාවක් දීල තියෙනවා. ඒ අනුව කරගන්න කියලා.ඒ අනුව ප්‍රධාන ඉංජිනේරුතුමා ප්‍රකාශයක් කළා මෙතන ආයතනයක් ලවා කරගන්න කියලා. එතකොට දැන් ඔබතුමා මැදිහත් වෙලා ගරු ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා මැදිහත් වෙලා කම්පැනි දෙකක් ආවා. හැබැයි ඉතින් මේ කම්පැනි දෙක මොකක්ද තාක්ෂණ නිලධාරී මහත්තය කියන්නෙ? ඔබතුමාට තිබුණා එහෙමනම් මේ සභාවට වාර්තාවක් දාල මේ සභාවෙන් තීන්දුවක් ගන්න. ආයෙත් සභාවක් එන්නෙ මාසෙකින්. එක්කො දැන් ගරු සභාපතිතුමා මේ සභාවෙන් තීන්දුවක් දෙන්න මන්ත්‍රීවරු මේ කාගෙහරි කම්පැනි එකකට දීල මේක කරගන්න. ගරු මන්ත්‍රීතුමා කරගන්න කියනව කියල කිව්වට ඒ කම්පැනි දෙක කියනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේකෙදි එම්.බී.ආර්.එක කියනව මෙහෙම. කෙමිකල් ට්‍රීට්මන්ට් එකක් තමයි. ඒ කම්පැනි දෙකම මාත් එක්ක ඇවිල්ල කතාකළා. ඒ අය කියන්නේ ඒ කෙමිකල් ට්‍රීට්මන්ට් එක කරන්න පුළුවන්. කළාට ස්ට්‍රක්චර් එක තියෙන තත්ත්වය අනුව ආපහු පොඩ්ඩක් මේවවුණොත් ඒක ආයෙත් පළල් වෙනවා. ලොකු වෙනවයි කියලා. ඒ නිසා යටින් සපෝර්ට්ස් ගහලා ඒක කරන එක තමයි හොඳම කියලා. ඕක තමයි තියෙන්නෙ.

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ඉතින් ගරු සභාපතිතුමා එහෙම ඒ අය කිව්වනම් ඒක්කො අපි සභාවෙන් වගකීම භාර අරන් යට ඉඳන් සපෝර්ට්ස් දෙන්න ලෑස්ති කරන්න ඕන. නැත්නම් කම්පැනි එකකට දාල හරි මේක කරගන්න ඕන. ඔය දෙකින් එකක් මේ සභාවෙ තීන්දු කරන්න.ලබන සභාවට යන්නෙ නැතිව ඉන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

තාක්ෂණ නිලධාරී මහතා ඕක කලින් ඇඳල දුන්නා. ඔය උපදේශෙම අපේ තාක්ෂණ නිලධාරී මහතා දීල තියෙනවා. මෙන්න මේ විදියට කරන්න කියලා.

<u>**ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ඉතින් ගරු සභාපතිතුමා කරන්න එහෙනම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මෙහෙමනෙ ඔය කිසිඳු ආයතනයක් වගකීම ගන්නෙ නැහැ.ඒ අයට දෙන්න වෙනව පරණ ගොඩනැගිල්ලක් නිසා දෙන්න වෙනව ස්ට්‍රොබිලිටි එක.කෙමිකල් ගහල එලක් තිබේද?මේකෙ මොනවහරි ට්‍රැක් වුණොත් පැත්තක් බැස්සොත් ඒ ආයතනය වගකියන්න වෙනවා.මොකද අපි ඒ ආයතනත් එක්ක ගිවිසුමක් අත්සන් කරනවා. ඒ නිසා තමයි ආයතන දෙකම පළපුරුදු ආයතන කොළඹ. එතකොට ඔය ආයතන දෙකම ඉල්ලන්නෙ මේ ගොඩනැගිල්ලේ තියෙන ස්ට්‍රක්චරල් එකේ තියෙන ස්ට්‍රේබිලිටි එක.ඉතින් ඒක අපි දෙන්න වෙනවා. නැත්නම් මේක ස්ට්‍රෙන්ත් කරන්න සයිට්වලින් වෙනම කොලම්ස් යන්න වෙනවා. කොලම්ස් ගිහිල්ල බීම් ගිහිල්ල මේකට සපෝර්ස්ට් එකක් දෙන්න වෙනවා. ඒ නිසා මම කියන්නෙ ගරු උප සභාපතිතුමා කිව්ව වගේ මේක ඇදඇද ගිහිල්ල හරියන්නෙ නැහැ ගරු සභාපතිතුමා. මේකට තව මාසයක් බලන් ඉන්න වෙනවා. මේ මිනිස්සු වැඩ කරන්නෙ අමාරුවෙන්. ඔබතුමා ඉන්නෙ කුකුල් කූඩුවක.මේක මහ අපහාසයක් අම්බලන්ගොඩටත් එක්ක. ඒක නිසා මේක අද තීන්දුවක් ගනිමු මොකක්හරි කම්පැනි එකක් ගෙන්නල ඒ අයට දෙන්න කියන්න අපිට මේ ගොඩනැගිල්ලෙ තියෙන. කොලම්ස්වල යට බීම් නැහැ.ඒ කාලෙ බීම් දාල සම්බන්ධ කළේ නැහැ.දැන් අලුතින් තමයි දැන් හදන ගොඩනැගිලිවල තමයි හරස් අතට බීමුත් එක්ක කොලම්ස් සම්බන්ධ කරන්නේ. ඉතින් ඒක නිසා මේ පරණ ගොඩනැගිල්ලේ තියෙන කොලම්ස්වල සහ බීම්ස්වල තියෙන ස්ට්‍රෙන්ත් එක පිළිබඳව රිපෝර්ට් එකක් ඔය ඉල්ලන්නෙ. එතකොට ඒ අය කියයි මේකෙ අමතර තව කොලම්ස් හයක් ගිහිල්ල බීම්ස්වලින් මේක වේට් එක දරන්න. ඒක අපිට කරන්න වෙනව ගරු සභාපතිතුමා. මොනවහරි කරල මේක මේ හැමදාම මාසයක් වනකන් බලාගෙන ඉන්නෙ නැතිව අද සභාවෙම තීන්දුවක් අරගෙන මේක ක්‍රියාත්මක කරමු ගරු සභාපතිතුමා. නැත්නම් මේක හැදෙන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මම ඇත්තටම මේ කියන ගැටලුව අනුව අපිටත් අත්දැකීම් තියෙනවා වැඩකරල පළපුරුද්ද තියෙනවා අවුරුදු 20 ක් 25 ක් විතර. ඒ නිසා ගරු සභාපතිතුමා මේකෙ තියෙන්නෙ උඩ දෙදරණ ගතිය තමයි. නැතුව මේ ගොඩනැගිල්ලෙ වෙන එකක් නෙමේ.ඒ අය කියන්නෙ ඔය උඩ ගැස්සෙන නිසා මේ අයට බයක් තියෙනවා. ගරු සභාපතිතුමා මේකට ඔය කොලම්ස් ගගහා ඉන්නවට වඩා යට බේස් ටිකක් ගිහිල්ල මැදින් අර එච් අයිරං ටිකක් ගෙනල්ල උඩට ගහමු එච් අයිරංවලින්.උඩ යකඩ තියෙන්නේ. යකඩවලට කෙලින්ම පාහන්නත් පුළුවන්. නැත්නම් හැමදාම බීම් ගහන්න ගියොත් බේස් එක්ක කණු ගහන්න ගියොත් තව මාස ගාණක් යනවා. ඊට වඩා මං දන්නැහැ අපේ නිලධාරීන් මොනව කියාවිද කියලා. සමහර වෙලාවට එහෙම ගොඩක් මෙහෙම කරල තියෙනව ගරු සභාපතිතුමා. මේක හැමදාම කතාකරන එක විතරයි වැඩක් නම් කෙරෙන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගැල්වනයිස් තියෙනවනෙ.ගැල්වනයිස් කර ගසන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි.අපට යෝජනා කරන්න පුළුවන්. තාක්ෂණසේවා නිලධාරි එකෙන් අපට දෙන්න ඕන ඇස්තමේන්තුවක්. නැත්නම් සල්ලි ගෙවන්නෙ කොහොමද? මේක මුකුත්ම වෙන්නෙ නැහැ තාක්ෂසේවා නිලධාරින් මීට වඩා ඉදිරියෙන් බයනැතිව වැඩකළා නම් අපි දැන් මේක ඇතුළෙ උඩ.

ඕක මුකුත්ම කරන්න ඕන්නැහැ ස්ලැබ් එක කඩල ඕන්නම් යකඩ පටි දාන්න. ඒක උඩ වැඩකරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඕක පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙන්නේ හෝල් එකක් විදියටද?නැත්නම් මැද කණුද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ.යට හෝල් එකක් .උඩ කාර්යාලයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එහෙමනම් කරන්න වෙන්නෙ අර ඩෙනට් මන්ත්‍රීතුමා කිවව වගේ දෙපැත්තෙන්

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඔය කාපට් එක දානකොටත් ඔය වගේනෙ තිබුණෙ. දැන්නෙ ඔය ගැස්සෙනව කියන බයට මන්ත්‍රීවරු මෙතනට එනව කිව්වම ගැලෙව්ව බයට. ඉරි දෙකක් දැකල.ඕක මුකුත් වෙන්නෙ නැහැ. දැන් උඩට ගියත් මුකුත් වෙන්නෙ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ඊලඟට කාරක සභා වාර්තාවන් සලකා බලමු.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා එතකොට තීරණේ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි එකහයි. මේ ගැන නෙමේ කතා කර තිබෙන්නේ. ගොඩනැගිල්ල ගැන තාක්ෂණික වාර්තාව අනුව කටයුතු කරන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඕකවත් කරගන්න බැරි තාක්ෂණසේවා නිලධාරීන්

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරීන්ගෙ ප්‍රශ්නයක් තියෙනවා.ඒක නිසා තමයි මේක කරන්න බැරිව ඉන්නේ. යම් මට්ටමකට හරි දැනුමක් තියෙන්නෙ එක්කෙනෙකුට විතරයි. අනිත් අය ඇති වැඩක් නැහැ. සම්පූර්ණම ප්‍රශ්නෙ එතන තමයි. අපේ නගර සභාවෙ දැන් මුදල් ධන ශේෂයක් වුණා නම් ඒ තාක්ෂණසේවා නිලධාරීන්ගෙ ෆේල්වීම මත තියෙන තත්ත්වයක් හැරෙන්න හොඳට වැඩකරන සභාවක්. එස්.ඩබ්.තනතුර අහෝසි කරල තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඔබතුමා ඕකට පොඩ්ඩක් මේ අය එන්නෙ නැත්නම් ගාල්ලෙන් හරි අහලා අර කොළඹ දැන් තට්ටු තුනේ බිල්ඩින් ගහන්නෙත් ඔක්කොම ගැල්වනයිස් යකඩවලින්. ගැල්වනයිස්

යකඩ කියල මේකෙ අපිට ගැටලුවක් නොවෙන්න මූල්‍යමය වශයෙන් අපි තීන්දුවක් ගනිමු ගරු සභාපතිතුමා .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ සභාව ඉවරවෙලා අපි කතාකරන්න. අපි තාක්ෂණසේවා නිලධාරීන් එක්ක එකට වාඩවෙලා කතාකරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීවරුන් 17 දෙනෙක් අත්සන් කරපු යෝජනාවක් තියෙනවා ගරු ලක්ෂ්මී මන්ත්‍රීතුමියගේ එය ඉදිරිපත් කරන්න.

05.08 ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් කරන ලද යෝජනා

**05.08.01 ගරු සභාපතිතුමනි 2020 වසරේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පවතින චක්‍රෙල්ඛනයේ ඇති දුබලතා පිටුදැකීම සුදුසු බවත් අදාල පළාත් පාලන බල ප්‍රදේශයේ සිටින දරුවන්ට ආසන්නතා ගණයේ ලකුණු පිරිනැමෙන සේ පවතින චක්‍රෙල්ඛනය සංශෝධනය කරවා ගැනීම පිළිබඳ ඉදිරිපත් කර ඇති යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තාද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි 2020 වසරේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී පවතින චක්‍රෙල්ඛනයේ ඇති දුබලතා පිටුදැකීම සුදුසු බවත් අදාල පළාත් පාලන බල ප්‍රදේශයේ සිටින දරුවන්ට ආසන්නතා ගණයේ ලකුණු පිරිනැමෙන සේ පවතින චක්‍රෙල්ඛනය සංශෝධනය කරවා ගැනීම සුදුසු බවටත් ගරු අධ්‍යාපන ඇමතිතුමාට යෝජනා කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තාද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේක ඇත්තටම විශේෂයෙන් අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ ළමුන්ට ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා. පසුගිය සභා වාරයෙදිත් අපි කිව්වා මේ සම්බන්ධයෙන් අපි ඕනම පිකටින් එකකට වුණත් ලැස්තියි කියල. කෙසේ නමුත් පිකටින් එකක් කළා. ඒවෙලේ මොන හේතුවක් හෝ වේවා මම විතරයි සම්බන්ධ වුණේ. ගරු සභාපතිතුමත් මං ගැන වැරදියට හිතුවද දන්නෙ නැහැ. ලකුණු ලබාගැනිමේ චේතනාවකින් නම් නෙමෙයි ගියේ. මම අධිකරණයේ වැඩකරමින් ඉන්නකොට මෙතන හිටපු දෙමව්පියො තමයි ගිහිල්ල මාව ත්‍රීවිල් එකකින් එක්කන් ආවේ.ඒක එතන හිටපු අය දන්නවා. ගරු සභාපතිතුමා හිතුවේ මං විතරක් පාලක පක්ෂයෙන් ගිහිල්ල ඉන්නකොට මට විතරක් ලකුණු ලබාගන්න ගියා කියල එහෙම පොඩි මතේකුත් තිබුණා. එහෙම කිසිම නැහැ.සද්භාවයෙන් ගියේ. මට ළමයි ඇත්තෙත් නැහැ. නමුත් අනාගත ළමයි වෙනුවෙන් ඒ කැපකිරීම මං කළා. ඉතින් ගරු සභාපතිතුමනි ඇත්ත වශයෙන්ම මේ සභාවෙදි අපි උප සභාපතිතුමත් කිව්වා පසුගිය සභාවෙදිත් කිව්වා අපි ඕනම පිකටින් එකට ඕනම වෙලාවක ලැස්තියි කියලා අපි එකඟතාවයකට ආවා. නමුත් අපේ පිකටින් එකට කට්ටිය ආවෙ නැති එක ගැන කිසි අමනාපයක් නැහැ.කෙසේ නමුත් අපේ ගරු සභාපතිතුමා උනන්දුවෙලා ගිහිල්ල අපි අධ්‍යපන ඇමතිතුමා

හම්බවුණා. ඒ අතරට අපි ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාටත් කතාකරල එතුමා ගරු අධ්‍යාපන ඇමතිතුමාට සහ අධ්‍යාපන ඇමතිතුමාගේ ලේකම්තුමාට කතාකරල ඒ සම්බන්ධයෙනුත් ඒ දෙම්පියන්ට ලියුමක් දීල තිබුණා.අපි ගරු අධ්‍යාපන ඇමතිතුමා හම්බවුණේ අඟහරුවාදා හවස. අපේ මේ ගරු මන්ත්‍රීවරු ඔක්කොම ගියා. නමුත් බදාදා යන්න තිබ්ච්ච ගමන මේ තැනැත්තන් ගියේ නැහැ අර ගැන විශ්වාසයක් තියල ගරු සභාපතිතුමනි. අපි ගිහිපු ගමන ගැන විශ්වාසයක් තියල අධ්‍යාපන ලේකම් හමුවීමට යන්න තිබුණු අවස්ථාව නැතිකරගත්තා බදාදාට තිබුණු ඇපොයින්මන්ට් එක. කෙසේනමුත් අද දින බොහොම කණගාටුයි කියන්න ගරු සභාපතිතුමා අද දින ප්‍රාථමික විද්‍යාලයට තමයි ළමයි ඇතුළත් කළේ.ප්‍රාථමික විද්‍යාලයෙන් අර සර්කල් එක ලකුණු කරන්න බැරිනම් ප්‍රාථමික විද්‍යාලයට කොහොමද ළමයි ඇතුළත් කරගත්තේ. මූලික ප්‍රශ්නය ඒකයි. ප්‍රාථමික විද්‍යාලයට අහස් ගව්දුර ගණන් කරන්න බැරිනම් ප්‍රාථමික විද්‍යාලයට ළමයි ඇතුළත් කරන්නත් බැහැ. මහා විද්‍යාලයේ සිට දැන් කියනවනම් සර්කල් එක ගහනව කියල එතෙන්ටයි ළමයි භාරගන්න තිබුණේ. අද ඔක්කොම වීඩියෝ කරල මේ වෙනකොට ගරු සභාපතිතුමනි ඒ සම්බන්ධව ෆේස්බුක් එකට ගිහිල්ල තියෙන්නෙ.එතකොට අවධානෙ යෙමාමුවෙන කට්ටියගෙ යොමුවෙයි. අද දින ප්‍රාථමික විද්‍යාලෙ ළමයි මෙතෙන්ට ඇතුළත් කරගත්ත.එහෙනම් ඉතින් මෙතනින් සර්කල් එක ගැසිය යුතුයි කියන එක අපිට නොමේ එක වසරේ ළමයෙකුට වුනත් තේරෙනවා. ඉතින් අපේ නගර සභා සීමාවෙ ගොඩක් ළමයි අපහසුතාවයට පත්වෙලා ඉන්නවා මේ වැඩෙන්. පනියන්දූව, මහ අම්බලන්ගොඩ, හිරේවත්ත,විලේගොඩ, මං හිතන්නෙ පටබැඳිමුල්ල පැත්තත් අහුවෙන්නැති අවස්ථා තියෙනවා. එතකොට මේ හැම ළමයෙක්ම වෙනද ධර්මාශෝකෙට ආපු ළමයි. එතකොට ගරු සභාපතිතුමාල අපි ගිය වෙලාවෙත් අම්බලන්ගොඩ ප්‍රධාන පාසල ධර්මාශෝකෙ කියන එක පිළිගත්තා. එතකොට අපේ අම්බලන්ගොඩ උපත ලබපු ළමයින්ට අම්බලන්ගොඩ ප්‍රධාන පාසලට යන්න බැරිනම් කුමන තත්ත්වයක්ද? ඇන් අද අපේ අම්බලන්ගොඩ නෙමේ මහ අම්බලන්ගොඩ ළමයි ඉන්නව කන්දෙගොඩට යන ළමයි. පොල්වත්තෙ ඉන්නව කන්දෙගොඩ ඉස්කෝලෙට යන ළමයි. කන්දෙගොඩින් ධර්මාශෝකෙට එනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ සම්බන්ධව මේ චක්‍රෙල්ඛනය සංශෝධනයක් කරවා ගැනීමට ගරු අමාත්‍යතුමාට අපේ සභාවෙන් යෝජනා කරල යවන්න කියල යෝජනා කරන අතර හැබැයි චක්‍රෙල්ඛනය සංශෝධනය කරන්න දේකුත් නැහැ. අපි එදා චක්‍රෙල්ඛනෙත් බැලුවා. අපි ගරු ඇමතිතුමාට පෙන්නුවා. එහි හිටපු තව අධ්‍යක්ෂකතුමා නෙ එතුමත් කිව්වා ප්‍රාථමික විද්‍යාලයේ සිට තමයි මේ සර්කල් එක ගණනය කරන්න ඕන කියලා.ඒ නිසා සංශෝධනය කරන අවශ්‍යතාවයක් මං නම් දකින්නෙ නැහැ. මං ඒක දැම්ම වුණාට. නමුත් අපි නැවතත් ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියල යවන්න ඕන මේ අපි සභාවෙ සම්මත කරගෙන මේ ප්‍රාථමික විද්‍යාලයේ තියෙන චක්‍රෙල්ඛනයට අනුව මේ ළමයි ඇතුළත් කරගැනීමේ ක්‍රමයක් සකස් කරන්න සහ මේ වෙච්ච අසාධාරණය සම්බන්ධයෙන් අද මේ වන විට අම්බලන්ගොඩ නගරයේ ඉන්න ගොඩාක් දෙමව්පියො ඇඩූ කඳුලින් ඉන්නවා. බොහොම අසරණ වෙලා ඉන්නවා. ඉතින් මටත් නිදි නැහැ. මට ළමයි නැතිවුණාට මොකද මට රෑ 12 ටත් ආවම මට ඒ මිනිස්සුන්ව එලවන්න බැහැ. ගරු නිලානි මන්ත්‍රීතුමියට එහෙන් එනවා. හැමකෙනෙකු ළගටම එනවා. මටත් වඩා ගරු සභාපතිතුමාටත් හරි කරදරයි. නිතරම කෝල්කරල කියනව.ඒ නිසා ගරු සභාපතිතුමනි මම යෝජනා කරනවා මේ සම්බන්ධයෙන් ඉතා දැඩිව ඉතා ඉක්මන් ඉතා දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න කියල.මං හිතන්නෙ අද පන්ති තුනයි ඇතුළත් කරල තියෙන්නෙ. ඒකත් ප්‍රශ්නයක් තියෙනවා.මං හිතන්නෙ අපේ මේ ඉල්ලීම මං අද කරන යෝජනාව ජයග්‍රහණය කරාවි ඉල්ලීම සාර්ථක වේවි.මොකද අද වෙනකොට පන්ති තුනයි ඇතුළත් කරල තියෙන්නේ. තව පන්ති තුනක් තියෙනවා.සමහරවිට ඔබතුමාල අපි ගිහිල්ල ගරු ඇමතිතුමාගෙන් කරපු ඉල්ලීම සාර්ථක වෙයි කියල හිතනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මට දැනුම්දීපු හැටියට අසාධාරණයට ලක්වෙච්ච හැමකෙනාටම සාධාරණය ඉෂ්ඨ කරනව කියන අදහසින් තමයි ඉන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තාද සිල්වා මහත්මිය කතා කරමින්</u>**

ඒක තමයි ගරු සභාපතිතුමා මං යෝජනා කරනව නැවතත් ඉදිරියටත්..

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නෙ ධර්මාශෝක විද්‍යාලයේ ඉහළ පංති පැත්තෙන් ගසන ලද එකෙන් ගහපු වෘත්තය ප්‍රාථමිකයට ගියාම ඒකට අහුවෙන අය ඇතුල් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඒ.පී.ලක්ෂ්මී හේමන්තාද සිල්වා මහත්මිය කතා කරමින්</u>**

ඒක තමයි ගරු සභාපතිතුමා නමුත් මං යෝජනා කරනවා මේ අවස්ථාවේ අම්බලන්ගොඩ නගරවාසීන් වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ඨ කරන්න.ගරු ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ස්ථිර කරල යවන්න.බොහොම ස්තූතියි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මං හිතන්නෙ අපි හැම අවුරුද්දෙම මෙතෙක් කල් අපි නගර සභාවට පත්වුණු දා සිටන් හැම අවුරුද්දෙම මේ වගේ යෝජනා කතාකරනවා . හැබැයි මේ නගරයේ ඉන්න දරුවන්ට අවුරුද්දකට ළමයි 250 ක් විතර තමයි මං හිතන්නෙ මේ නගරය ඇතුළෙ ඉන්නෙ. මේ අවුරුද්දෙනම් මං හිතන්නෙ අපට සංඛ්‍යාලේඛණ ආවෙ නැහැ. හැබැයි ඉස්කෝල තියෙනවා හතරක් පහක් විතර.මේ ළමයි 250 ගන්න ඉස්කෝල පහටම බැරි තතත්වයක් උදාවෙලා තියෙනවා. ඒ නිසා හරිම කණගාටුයි ඉතින්. හැමදාම අපි මේ සභාවෙ කතාකරනවා. විශේෂයෙන්ම අම්බලන්ගොඩ නගරයේ ඉන්න දරුවන්ට මීටර් 200 ක් 300 ක් මෙහායින් තියෙන ඉස්කෝලෙට ඇතුළත් වෙන්න බැහැයි කිව්වම ඒ දෙමව්පියන්ට මොනතරම් පීඩාකාරී තත්ත්වයක්ද තියෙන්නේ. හැම දෙමව්පියෙක්ම බලාපොරොත්තු වෙන්නේ තමන්ගේ ළමයා හොඳ අධ්‍යාපනයක් ලබාදීල මේ රටේ හොඳ වැදගත් පුරවැසියෙක් කරන්න තමයි ගරු සභාපතිතුමනි සාමාන්‍යයෙන් දෙමව්පියො බලාපොරොත්තු වෙන්නේ.හැබැයි ඒකට අපි දන්නව පහුගිය කාලෙ මේ දෙමව්පියන් පහුගිය සති දෙකතුන තුල කොච්චර දේශපාලඥයො ලඟට ගියාද .අපි හම්බවෙන්න ඇවිල්ල මේකට මොනවද කළේ කියල.අපි ගරු අමාත්‍යතුමා හම්බවෙලා මොකක්ද කතා කළේ .හැබැයි ඉතාම කණගාටුයි ගරු සභාපතිතුමනි කියන්න. අද ධර්මාශෝක විද්‍යාලයේ සර්කල් එක ගැහුවෙ ලොකු ඉස්කෝලෙ කාර්යාලෙ ඉඳල තමයි ළමයි ඇතුළත් කිරීමේ වෘත්තය ගැහුවේ. හැබැයි අද ළමයි ඇතුළත් කරගත්තේ ප්‍රාථමික විද්‍යාලයේ කාර්යාලයේ ඉඳලා. එතකොට මේකෙන්ම පේනව ගරු සභාපතිතුමා කොච්චර මේ දෙමව්පියන්ට මේ නගරයේ දරුවන්ට කොච්චර අසාධාරණයක් වෙනවද කියලා.මම ඒ දේවානන්දෙ ධර්මාශෝකෙ ගැන කතාකළේ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම මේ නගරයේ ජීවත් වෙච්ච මිනිස්සු තමයි තල්ගස්ගොඩ ප්‍රදේශයට ගිහින් ජීවත් වෙන්නෙ සුනාමියට ගිහිපු අය. මං හිතන්නෙ පවුල් 200 කට එහා පැත්ත ඉන්නවා. මේ ළමයින්ට අද ඉස්කෝලයක් නැති තත්ත්වෙකට පත්වෙලා ඉන්නෙ.මං දිගින් දිගටම කතාකළා.ගිය සභාවට ඉස්සෙල්ල සභාවෙත් කතාකළා. මේ ළමයි ඇතුළත් නොවුණොත් මං වාඩිවෙනව කියල ඉස්කෝලයක් ලඟ. ඇත්තටම ඒ තත්ත්වය උදාවෙනව ගරු සභාපතිතුමනි යන්න ඉස්සෙල්ල. අද ඉස්කෝලවල විදුහල්පතිවරු ප්‍රකාශ කරනවනම් උදාහරණයක් ගත්තොත් තල්ගස්ගොඩින් ළමයි 40 ක් 50 ක් විතර පන්ති දෙකකට විතර

එනව කියල ඒක ගමේ වැරැද්ද නෙමේ ගරු සභාපතිතුමා. ඒක මේ දෙමව්පියන්ගෙ වැරැද්ද නෙමේ. වෙච්ච සුනාමි ව්‍යසනය හින්දා ඒ ප්‍රදේශවලට ගියාම ඒ ඉන්න ළමයි 40 ක් 50 ක් ඉස්කෝලෙට එනව ගරු සභාපතිතුමා ඒ ගමෙන්. ඒක අපිට වළක්වන්න බැහැ. ඒ ළමයින්ට අධ්‍යාපනයක් දෙන්න ඕන. ඒ ළමයි ධර්මාශෝකෙට දේවානන්දෙට අහුවෙච්ච ළමයි තමයි තල්ගස්ගොඩ ගිහිල්ල ඉන්නෙ. ඒ නිසා කණගාටුදායක තත්ත්වය මේ ගැන මේ වෙනකන් ළමයි 22 ක් විතර තල්ගස්ගොඩ ප්‍රදේශයේ ඉන්නවා ඕකන්ද ප්‍රදේශයේ කෙරමිණිය ප්‍රදේශයේ ළමයි විශාල ප්‍රමාණයක් ඉන්නවා මේ අධ්‍යාපනයට අහුවෙන්නැතුව. අපි කණගාටුවෙනවා අපි මොනවද ගරු සභාපතිතුමා කතාකරන්නෙ මගේ ළමයත් අද කුලරත්න ඉස්කෝලෙට යන්නෙ. අපේ අම්බලන්ගොඩ නගර සභාවෙ හිටපු උප සභාපතිතුමාගෙ ළමයත් කුලරත්නෙට යන්නෙ. ගරු රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමාගෙ ළමයා. පහුගිය කාලෙ ඕනතරම් ළමයි මේ ධර්මාශෝක ඉස්කෝලෙට දැම්මා 40 ක් 50 ක් විතර. 40 ක් දැම්මා. මං දන්නව මගේ හොඳම යාලුවගෙ ළමයා ඇල්පිටියෙ ඒ ළමයත් ධර්මාශෝකෙට ආවා. හැබැයි මේ නගරයේ අපි පැත්තකට දාමු. මගේ ළමයි තුන්දෙනෙක් ශිෂ්‍යත්වෙ පාස්වෙලා ධර්මාශෝකෙට යන එක ඇත්ත. හැබැයි ඊලඟ ළමයත් ශිෂ්‍යත්වෙ පාස්වෙලා ලකුණු පොඩි ගානයි අඩු ධර්මාශෝකෙට යන්නෙ නැහැ. කුලරත්නෙට යනවා. ගරු රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමාගෙ ළමයටත් ලකුණු 02 යි අඩු ඒ ළමයි දෙන්නම එක මට්ටමේ ශිෂ්‍යත්ව ලකුණු. ඒ නිසා ඉතාම අසාධාරණ විදියට ඉතා කැත විදියට තමයි මේ ළමයි ඇතුළත් කරගන්නේ ඉස්කෝලවලට.ඒ නිසා විශේෂයෙන්ම අද අම්බලන්ගොඩ නගරයේ ළමයින්ට වෙන අසාධාරණය ගැන කතාකරන අපි හැමදාම කතාකළත් කොහෙට කතාකරල ගියත් ඒක ක්‍රියාත්මක වෙන්නෙ නැහැ ගරු සභාපතිතුමනි. හැබැයි ගරු ඇමතිතුමා ඒ වෙලාවෙ උපදෙස් දුන්නා ජාතික පාසල් අධ්‍යක්ෂතුමාට මේ ගන්න ක්‍රියාමාර්ගය අම්බලන්ගොඩ නගරාධිපතිතුමත් එක්ක ගිහිල්ල කතාකරල සාකච්ඡා කරල ගන්න ඕන කියල. හැබැයි ඔබතුමාවත් දන්නෙ නැහැ ඉස්කෝලෙට ජාතික පාසල් අධ්‍යක්ෂතුමා ඇවිල්ල යනවා. ගරු ඇමතිතුමා ප්‍රකාශ කරනව මන්ත්‍රිවරු ඉස්සරහ අම්බලන්ගොඩ නගරාධිපතිතුමත් එක්ක සාකච්ඡා කරල ඉස්කෝලෙට ගිහිල්ල ප්‍රශ්නෙ විසඳන්න කියල. ඔබතුමත් දන්නෙ නැතිව ජාතික පාසල් අධ්‍යක්ස ඉස්කෝලෙට ඇවිල්ල යනවා. කොච්චර කැත ක්‍රියාමාර්ගයක්ද ගරු සභාපතිතුමා. ඒ නිසා මං මේක දිගින් දිගටම කියන්න යන්නෙ නැහැ. තව විස්තර තියෙනව කියන්න. කිව්වොත් අපේ මන්ත්‍රීවරුන්ට තියෙන ගරුත්වය නැතිවෙනවා. හැබැයි විදුහල්පතිවරු දැනගත යුතුයි මේක අම්බලන්ගොඩ නගරය.මේක බුද්ධිමතුන් බිහිකරපු නගරය අම්බලන්ගොඩ කියන්නෙ. ඒ නිසා විදුහල්පතිතුමා දැනගත යුතුයි අම්බලන්ගොඩත් ඉන්නෙ අම්බලන්ගොඩ නගරය පාලනය කරන මන්ත්‍රීවරුන්ට යම්කිසි දෙයක් කරන්න පුළුවන් කියන සිහිනය තියාගත්තොත් හොඳයි විදුහල්පතිතුමා.ඒක මතක් කරදෙමින් අම්බලන්ගොඩ නගරයේ දරුවන් වෙනුවෙන් මේ ඉස්කෝලෙට ඇතුළත් වීමට සිටින දරුවන් වෙනුවෙන් මම පෙනීසිටිනවා පෞද්ගලිකව. මේ අවුරුද්දෙ ළමයි ඇතුළත් කළේ නැතිවුණොත් මං අනිවාර්යයෙන් වාඩිවෙන එක වාඩිවෙනවා ඉස්කෝලයක් ලඟ මේ ළමයි ගත්තෙ නැතිවුණොත්. ඒ නිසා කරුණාකරල මං දන්නෙ නැහැ ඔබතුමාල මට සහයෝගය දේවිද නැද්ද කියල. ඒ නිසා කරුණා කරල ගරු සභාපතිතුමා ඔබතුමා අපට කියන්නෙ තියෙන්නෙ ගරු සභාපතිතුමා ඔබතුමාට විතරයි. අපේ දේශපාලන නායකයා වශයෙන් ඔබතුමාට කියන්න තියෙනවා. ඒ නිසා ඔබතුමා මේකට ඉතා ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ ගත්තෙ නැතිවුණොත් එහෙම අපිට සිද්ධවෙනවා රජය ආණ්ඩු අපේ නොවුණත් අපි පාරට බහින එක බහිනවමයි ගරු සභාපතිතුමනි.ඒක ස්ථිරයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

මේක හොඳම මාතෘකාවක්.නගරයේ ජනතාවට දැනෙන මාතෘකාවක්. මං හිතන්නෙ අපේ ගරු ලක්ෂ්මී මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව. අපි ඒක ඇත්තටම කතාකළ යුතු මාතෘකාවක්. මොකද දැන් ළමයි හදන එකත් ප්‍රශ්නයක් වෙලා තියෙන්නෙ. අධ්‍යාපනය ලබාදෙන්න නැත්නම් වැඩක් නැහැනෙ.මමත් ඒකයි පස්සට ගියේ.මොකද වැඩක් නැහැ හදලා. ගරු සභාපතිතුමාට ප්‍රශ්නයක් නැහැ.එතුමගෙ ළමයි ඔක්කොම දැන් අංග සම්පූර්ණ වෙලා ඉන්නෙ ඉතින්.ඒක ප්‍රශ්නයක් නැහැ. නගරෙ ජනතාව වෙනුවෙන් මෙතුම පෙනීහිටීම සම්බන්ධව අපි ස්තූතිවන්ත වෙනවා. මටත් කතාකළා අපේ ගරු සභාපතිතුමා හම්බවෙලා යන්න මොකද අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා පොදුජන පෙරමුණේ ඇමතිවරයෙක් ඉන්නෙ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා. මමත් ලොකු බලාපොරොත්තුවක් තියාගෙන මේ මහජනතාවගෙ ඉල්ලීම ඉටුවේවි කියන බලාපොරොත්තුව තියාගෙන තමයි ගියේ. ගිහිල්ල මං ඒ ගැන වචනයක්වත් කතාකරන්න ගියේ නැත්තෙ මොකද අපෙත් ඉතින් රතු කට්ට පැන්නොත් එහෙම අර යන්අයගෙ වැඩේ කෙරෙන්නෙ නැහැනෙ. ඒක නිසා මං ඔය යනවිදියට යන්න දුනනා. මොකද යම්දේක අපිත් මේ ගරු ඇමතිවරුත් එක්ක අපේ හිටපු ගරු ජනාධිපතිතුමාල එක්ක කතා කරනකොටම තේරෙනව ඉතින් ඒ වැඩේ කෙරෙනවද නැද්ද කියන එක. අපි සලකන්නෙ ඔබතුමාට. ඔබතුමාගෙ වචනෙට. එතුමා සලකන්නත් ඕන ඔබතුමාට මොකද මන්ත්‍රීවරු මේ ගිහිල්ල තියෙන්නෙ. සාමාන්‍ය කෙනෙක් කියන ප්‍රශ්න අපි මේ එක්කන් ගිහිල්ල තියෙන්නෙ ප්‍රශ්නෙ යොමුකරන්න. ඒක නිසා මට කතාකරන්න ගියොත් එහෙම ගැටලුවක් ඇතිවෙන නිසාතමයි මම බෝලෙ පාස් කළා කෙලින්ම ගරු සරත් මන්ත්‍රීතුමාට. පැහැදිලි කරල දෙන්න කියල. මොකද හේතුව ජාතික පාසල් අධ්‍යක්ෂකල කරපු එයා කතාකරපු ආකාරය පිළිබඳව ඇමතිතුමා ගෙන්නල කතාකළා. කතාකළාම ජාතික පාසල් අධ්‍යක්ෂක කතාකරපු තාලෙට මං දැනගත්ත වැඩේ ටිකක් අංජබජල් තමයි කියල. මොකද ගරු ඇමතිතුමා අපේ ගරු මන්ත්‍රී ජගත් කුමාර මන්ත්‍රීතුමාගෙ සහෝදරයට කිව්ව කතාව මං කියන්නෙ නැහැ මෙතන. මොකද කිව්වොත් එහෙම හරි නැහැ. ඉතින් ඒකෙන් හිතාගන්න පුළුවන් මොකක්ද ඇහුන්කන්දීම කියල. ඔබතුමා ළඟට මම ඇවිල්ල කියනකොට ගරු සභාපතිතුමා ඇහුන්කන් දෙනවනෙ. මේ මනුස්සය එන්නෙ ප්‍රශ්න ගැටලුවක් ඔළුවෙ තියාගෙන. මේ ප්‍රශ්නෙට විසඳුම ගන්න. තමන්ගෙ දරුව කියනවට වඩා ලොකු මේවඑකක් නැහැනෙ. එතකොට ගරු සභාපතිතුමා ඇහුන්කන් දීල තමයි එතෙන්ට එක්කන් ගිහිල්ල තියෙන්නෙ. එතුමාගෙ ගරුත්වයත් තියෙනවා. මොකද එක බැජ් එකේ කිව්ව.ඉතින් ඔහොම කියල තමයි පටන් ගත්තෙ.ඉතින් අර කියපු කතාවත් එක්ක මං හිතාගත්ත මං එළියට ඇවිල්ලත් මේ අයට කිව්වා මේකයි කියල.අපිටත් කතාකරන්න ගියොත් එහෙම තැනනොතැන පේන්නෙ නැති නිසා. නමුත් දැන් කෙසේ හෝ අර උප සභාපතිතුමා කිව්ව වගේ මටත් දැනගන්න ලැබෙනවා එතනදි අපිට ජාතික පාසල් අධ්‍යක්ෂ කිව්වා හැමෝමත් එක්ක මට ගණුදෙනු කරන්න අමාරුයි. කතාකරල ටෙලිෆෝන් එකෙන් හරි එන්න. මන්ත්‍රීවරු හිටියනෙ. ගරු සභාපතිතුමාව සම්බන්ධ කරන්න.ඉතින් මන්ත්‍රීවරුන්ගෙ සියලු අදහස් ගරු සභාපතිතුමා දන්නවනෙ.අපි එතුමා සම්බන්ධ කළා.නමුත් මෙහෙ ඇවිල්ල ගිහිල්ල තියෙනව ඔබතුමා දන්නෙත් නැහැ.ඒ අය තීන්දු තීරණ අරගෙන ඉවරයි දැන්.ඒ වෙලාවෙ කිව්වා ලැයිස්තුවක් තාවකාලිකව අපි නවත්වනව කියලා. එතකොට අපිත් ඕක ඇවිල්ලා මේ මන්ත්‍රීතුමියලාගෙ ඒ ඒ ප්‍රදේශවල කියනකොට ඕක කියනවා. කිව්වට පස්සෙ මන්ත්‍රීවරුන්ගෙ තත්ත්වෙ මොකක්ද? මොකද ජන්දෙන් පත්වෙලා ගිහිල්ලා මටනම් පේනව මේ විෂය පිළිබඳවත් ගැටලුවක් තියෙනවා.මොකද අපේ ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා හොඳ කතාවක් කිව්වා එතන. මේ විදුහල්පති මේ ගරු සභාපතිතුමා ගැන තැකුවෙවත් නැහැ. නගර සභාව කියන එක ගණන් ගන්නෙත් නැහැ. ඒක නිසා මේකට මොනවහරි කරන්න කියල.බොහෙම අමාරුවෙන් කිව්ව විදුහල්පති කෙනෙක් පත්කර ගත්තේ. මං නම් කියන්නේ තනතුර දාල යන්න ඕන විදුහල්පති කෙනෙක් පත්කර ගන්න බැරි ජාතික පාසල් අධ්‍යක්ෂ කෙනෙක් ඉන්නවනම්. ඕකනෙ වෙන්න ඕන.ප්‍රශ්න දෙකතුනක් පැටලැවුන එක හරි.නමුත් තමන්ගෙ බුද්ධිය තුළ දන්නවනෙ තමන් මේ ක්ෂේත්‍රය තුළ ප්‍රශ්න

බේරගෙන වැඩකටයුතු කරගෙන යන්න. මේකෙ චක්‍රෙල්ඛන පිළිබඳව ප්‍රශ්න තියෙනවා. ඒක වෙනම කතන්දරයක්. මෙතන මානුෂීය පැත්තෙන් ගත්තම යම් වරදක් වෙලා තියෙනවා. ඒක නිවැරදි කරන්න ඕන. මහාචාර්ය කෙනෙක් ඉන්නව පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳව ගරු සරත් මන්ත්‍රීතුමා.මහාචාර්ය දැනුම. එයා ඉතින් පැමිණිල්ලයි විත්තියයි දෙකම රඟපාන බව අපි දන්නවා. ඒ අස්සෙත් පස්සට වෙලා ගිහිල්ල ඇමතිතුමාට කියල මොකක්හරි කරගත්තා.ඒක හරි. මොකද අර කොමිෂන් සභාවට ගියාම මානව හිමිකම් එකට ගියාමත් ඕක තමයි කතන්දරේ. හරි.මේ ඔක්කොම ඩීල්. ඕක තමයි තත්ත්වේ. ඉතින් ඕක හරියන්නෙ නැහැනෙ අපිට. අපි ඉතින් කෙලින් කතාකරල අපි අවංකව ඉතින් ඕක යනවා. ප්‍රාදේශීය සභා මනිත්‍රීවරු නගර සභා මන්ත්‍රීවරු තමයි මේකෙන් අපහසුතාවයට පත්වෙන්නේ. ඉතින් අපේ බලාපොරොත්තුව මොකද මේ ළමයින්ගෙ ප්‍රශ්නෙ විසඳන එක. හැබැයි ඉතින් මේ චක්‍රෙල්ඛණ ගැටලුව තියෙන්නෙ මෙහෙමයි. කොළඹට ඕන විදියට තීන්දු තීරණ චක්‍රෙල්ඛණ හදනවා. අපට ගැලපෙන්නෙ නැහැ. ජනප්‍රිය පාසල් මේ අම්බලන්ගොඩ නගරෙ වටේම. එතකොට මේ ලකුණු කැපීම තුළ ඇත්තටම කියනවනම් ලකුණු කොහෙන්හරි කැපෙනවනෙ. අන්න ඒක නිසා චක්‍රෙල්ඛන සංශෝධනය කරගන්න පුළුවන්නම් වඩා හොඳයි. ඒක හැබැයි මටනම් පේන්නෙ ඒ ඇමතිතුමාගෙන් ඕක කරගන්න බැහැ. අතිගරු ජනාධිපතිතුමාම හම්බවෙලා කතාකරල ඔබතුමාලගෙ ජනාධිපතිවරයෙක් හොඳට ඇහුන්කන් දෙනවා. ආර්.එම්.බී.එකට ගියා. අහුන්කන් දුන්නා මහජනතාව කියන දේ. ප්‍රශ්න ආවා. අද නැහැනෙ තැරැව්කාරුවො. අද පත්තරේ තිබුණා මං දැක්කා තැරැව්කරුවො එකෙක්වත් නැහැ හොයාගන්න.ප්‍රශ්නවලට විසඳුම් දුන්නා. අන්න ප්‍රායෝගික බව. ඉතින් ඕක හැම ඇමතිවරුන්ටම ප්‍රශ්න තියෙනවා. ගරු සභාපතිතුමාට මං කියන්නෙ ඔබතුමාට පුළුවන්නම් මොනවහරි ක්‍රමවේදයක් තුළ සාකච්ජා කරල මොකද කටටිය ගියාම බයවෙන්නත් ඇති ඇමතිතුමා.මොකද නොනිදන ඇමතිවරයෙක් කිව්වා. නිදාගන්න බැරිනම් ඇමතිකම නොගෙන හිටියනම් හරිනෙ. හොඳට නිදාගන්න තිබුණනෙ.මං මේ කවුරුවත් අපහසුතාවයට ලක්කරනව නෙමේ. ජනාධිපතිතුමා කියනවා. මහජනතාවගේ බලාපොරොත්තු ඉටුවන ආකාරයෙන් වැඩකටයුතු කරන්න කියල. ඉතින් පත්කරන ඇමතිතුමත් දැනගන්න ඕන ජනාධිපතිතුමාගෙ න්‍යායට ගිහිල්ල මහජනතාවගේ බලාපොරොත්තු ඉටුවන ආකාරයෙන් වැඩ කරන්න. ඒකයි කියන්නෙ.මේක කරන්න බැරිදේවල් කරන්න බැරි එක හරි.ඇත්තටම චක්‍රෙල්ඛනය සංශෝධනය විය යුතුයි.කිලෝමීටර් ගානක්හරි දාල.ලඟ තියෙන නගරවලට ඒක සංශෝධනය කරල පොදුවේ මොකද එකඑක නගරවලට චක්‍රෙල්ඛන ගහන්න බැහැ. මොකද ඒ විදියට යන්න ඕන. අම්බලන්ගොඩ නගරෙ භාගයක් තියෙන්නෙ මුහුද. එතකොට මේ නගරයේ ළමයි 250 ක් හිටියි උත්පත්තිය ගත්තහම. ජනප්‍රිය පාසල් කීයක් තියෙනවද? ඇත්තටම කියනවනම් කුලරත්නෙ ළමයෙක් ගන්නෙ නැත්නම් බලෙන්හරි දාන නිසා අපි හරි.කොහොමහරි කරල.නැත්නම් ඉතින් කොහෙටද යන්නෙ ළමයි.අනිත් එක මෙතුම ගෙනාව හොඳ යෝජනාවක් ඉදිරියෙදි ඒක ක්‍රියාත්මක වෙයි. බුද්ධදත්තෙ උසස් පෙළ දක්වා ඒකත් කෙරෙයි. මං දැක්කා අද උදේ ගරු ආණ්ඩුකාරතුමා පැතිකඩ එකේ ගියා. පැතිකඩ එකේ හොඳ කතාවක් දුන්නා ගරු ජනාධිපතිතුමාගෙ ඔළුවෙ ඒක තියෙනව කියලා.එයා ඒක කරනව කියල කිව්වා 46 ක් ද කොහෙද.අන්න ඒක තමයි මිනිස්සුන්ගෙ ප්‍රශ්න ගැටලු තියෙනකොට ඒවට විසඳුම් දෙන්න ඕන. මේක මේ ඇමතිකම ඔළුවෙ තියාගෙන මේක කරන්න බැහැ. මන්ත්‍රීවරු ගිහිල්ල තියෙන්නෙ.මං කියන්නෙ ඒකයි. මටනම් හරියන්නෙ නැහැ ඕක. මන්ත්‍රීවරයෙකුගෙ ආත්ම ගරුත්වයක් තියෙනවා. යන්නෙ මේ ජන්දෙ ගස්සල බොහොම අමාරුවෙන් ගෙයින් ගෙට ගිහිල්ල පාන් කැල්ල කාල කැන්වසින් කරල තමයි ආණ්ඩු පත්කරල තියෙන්නෙ.හැම මන්ත්‍රීවරයගෙම සහයෝගය දීල. මළගෙදර වල කපනවා කොඩිය දානවා කතාවල් පවත්වනවා. ඔක්කොම සුද්ද කරල තමයි ගෙදර යන්නෙ. ඇමතිකම හම්බවුණාම සලක්න්නෙ නැහැ.ඕක තමයි තත්ත්වේ. මං නම් කියන්නෙ විශේෂ ඇමතිකම් ඔය අධ්‍යාපනය සම්බන්ධව සෞඛ්‍ය සම්බන්ධව මහජනතාවට ඇහුන්කන් දෙන අය

පත්කරන්න ඕන. තනතුරු ඔළුවෙ තියාගෙන වැඩකරන්න බැහැ.ඒකයි මං කියන්නෙ. මේව කතාකරාම සමහරවිට කෙරෙන දේවල් නොකර ඉඳියි. ඒ නිසා හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඔබතුමාට සලකනවා.අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට කියන්න. කියල මේ ප්‍රශ්නෙට විසඳුමක් දෙන්න. ඔය ගරු සරත් මන්ත්‍රීතුමාල කියන දේවලි එච්චර ගණන් ගන්න යන්නත් එපා. මොකද මේ කියන ඒවත් විදුහල්පතිතුමාට යාවිද දන්නෙත් නැහැ. ඒක නිසා කොහොමත් අපි ළමයි හදන්න බලාපොරොත්තුවකුත් නැහැ මේ නිසා. ඒක නිසා මං කියන්නෙ ගරු සභාපතිතුමා මේක විහිළුවක් නෙමේ. මේක ලොකු ප්‍රශ්නයක්. ඔබතුමා හැල්ලුවට ලක්කිරීමක් මන්ත්‍රීවරු හැල්ලුවට ලක්කිරීමක් ආපු වෙලාවක අපි ඒක කතාකරමු ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමත් එක්ක. එතුමා උත්සවේකට ආපු වෙලාවක අපි උත්තර දෙන්නම්. ඒ නිසා චක්‍රෙල්ඛනයෙ වෙනසක් මෙහෙට ගැලපෙන විදියට අපේ මහාචාර්යතුමාගෙනුත් උපදෙස් අරගෙන මේකට ගොණුකරල හදල අතිගරු ජනාධිපතිතුමාටයි ගරු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාටයි මේක භාරදෙන්න චක්‍රෙල්ඛනය හදන්න කියලා ඉල්ලා සිටිමින් අපේ ගරු මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙනවා ඒ වෙලාවෙ ලොකු ඉවසීමක් කරගෙන ආපු නිසා.මහජනතාවගේ ප්‍රශ්නවලට ඇහුන්කන් දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.ඔබතුමාටත් ඒ ඇහුන්කන් දීම පිළිබඳව මොකද උද්ඝෝෂණයක් කරල ගියේ ඔබතුමා ඇහුන්කන්දීල සම්බන්ධීකරණය කිරීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ව්‍යාකූල තත්ත්වෙකට පත්වුණා.මොකක්ද මේ සභාවෙ වෙන්නෙ කියලා. මොකද පහුගිය අවුරුදු 15 විතර ආපස්සට හැරිල බැලුවොත් මේ අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතමා හිටියා.ඊට පස්සෙ අපේ ගරු රාහුල මන්ත්‍රීතුමාලගෙ එක්සත් ජාතාක පක්ෂයේ නියෝජනය එතන තිබුණා. එතකොට අවුරුදු 15 ක් තිස්සේ අපිට මේ ගැටලුව තියෙනවා.එතකොට දැන් වර්තමාන ජනාධිපතිවරයෙක් අපි පත්කරගෙන ඉන්නවා.ඒත් මේ ගැටලුව තියෙනවා. එතකොට මම ටිකක් ව්‍යාකූල වෙලා තියෙනවා. ඒ කියන්නේ ජනාධිපතිවරු වෙනස් කිරීමෙන් අපේ ප්‍රශ්න විසඳෙන්නෙ නැද්ද කියලා.එහෙම හිතෙනවා.මොකද අපි මේ දැන් මාස 02 ක් විතර ගතවුණා.ගතවෙලා අපි ඇමතිවරයා හම්බවෙන්න ගියාම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නොසෑහීමකට පත්වෙලා තියෙනවා. අපුසාදයට පත්වෙලා තියෙනවා. අපේ ගරු උප සභාපතිතුමා බොහොම නිර්භය විදියට බොහොම ආවේගශීලී විදියට එයා බොහොම ස්වයං විවේචනයක් කරනවා.ඉතින් මේක ටිකක් ගැටලුකාරී ත්ත්ත්වයක්. අපේ මේ රාහුල මන්ත්‍රීතුමා කිව්ව වගේ මළ ගෙදරක ගිහිල්ල කතා පවත්වලා කොඩිය දාලා ආපහු පුටු ටිකත් අකුලගෙන ඇවිල්ල ඒ විදියට කැපකිරීමෙන් වැඩකරපු මිනිස්සුන්ගෙ උවමනාවන් මේ රජයන් විසින් නොසලකා හරිනවා.මේක හොඳ නැහැ.එතකොට මේ රටේ පාලකයො තේරුම් ගන්න ඕන. මේව මහජන අවශ්‍යතාවයන්. අධ්‍යාපන, සෞඛ්‍යය, ප්‍රවාහනය, මේ සියලුම ක්ෂේත්‍රවලට රටේ පාලකයොන්ගෙ අවධානය යොමුවෙන්න ඕන.එහෙම නැත්නම් මේව මේ මිනිස්සු කැරලි ගහනවා.ඒක තමයි වෙන්නෙ.ඒක නිසා මං යෝජනා කරනවා රටේ ඉහල පාලකයොන්ටමේ පිළිබඳව දැන්වීමක් කරන්න.මේ මිනිස්සුන්ගෙ අවශ්‍යතාවයන් ඉෂ්ඨවෙන විදියට මේ රටේ පාලනය කරගෙන යන්න කියලා.ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා සහ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි හිරේවත්ත කොට්ඨාසයේ ළමයි දහ දෙනෙක් විතර අහුවෙලා නැහැ ඉස්කෝලෙට.අපි එදා ඔබතුමත් එක්ක අමාත්‍යාංශයට ගියා සාකච්ජාවට.මම ස්තූතිය පලකරනවා අපි එක්කන් ගිය නිසා ගරු සභාපතිතුමනි.ඒ සාකච්ජාව පැවැත්වුවට මට තේරුණා කෙසේ වෙතත් අධ්‍යාන්ෂතුමා හිටියෙ

විදුහල්පතිතුමා සමඟ කියා. මං ලක්ෂ්මි මන්ත්‍රීතුමියටත් කිව්වා හුඟක් දුරට මේ වැඩේ කොරෙන්නෙ නැහැ කියලා.ඒ මොකද අධ්‍යක්ෂතුමා ඇවිල්ලා කියා ගරු සරත් ශ්‍රී ලාල් මන්ත්‍රීතුමා ඔබතුමාට කෝල් එකක් දාල කිව්වෙ අධ්‍යක්ෂතුමා ඇවිල්ල ඉන්නව කියලා. ඒ වුණාට එතුමත් කියනව ඔබතුමා කිව්ව පරිදි ඔබතුමා තමා පත්කළේ අපේ ප්‍රශ්න වෙනුවෙන් කතාකරන්න. ඔබතුමා එතේට ගෙන්නුවෙ වත් නැහැ.හිරේවත්ත ගත්තොත් ආසන්නතාවයෙන් තුක්දෙනෙක් අහුවෙන්නෙ පොඩි ඉස්කෝලෙට. දේවානන්දෙ අහුවෙන්නෙත් නැහැ.මොකද දේවානන්දෙ ලකුණු 05 ක් කපල තියෙනවා.අනිත් කට්ටිය හැමෝම තමන්ගෙ ඉස්කෝලෙට අහුවෙනවා.මං හිතන්නෙ අධ්‍යක්ෂතුමා ඇවිල්ල ඔබතුමත් එක්ක කතාකරල කිසිම පිළිතුරක් හම්බවුණේ නැහැ. මම ඉතින් හුඟක් කණගාටු වෙනවා. අපි එතනට ගිහිල්ල ඔබතුමා අපි පත්කරල ඔබතුමා ඒ සාකච්ඡාවට මුහුණදුන් එක ගැන. හුඟක් කණගාටුවට පත්වෙනවා. මොකද ඔබතුමාගෙ රජයක් ඇතුලෙ ඔබතුමාට එහෙම සලකනවනම් අපිට කෙසේ සලකාවිද කියල.මං ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න් පුළුවන් විදියට ඉක්මන් කරල ඒ ළමයි ටිකට ඒ ඉස්කෝලෙටදාගන්න.ඒ අධ්‍යක්ෂකවරු මාර්ගයෙන් හරි ඒ ඇමතිතුමා හම්බවෙලා ඒ ටික කරල දෙන්න කියලා.මං හිතනවා ගරු සභාපතිතුමා ඇත්තටම මේ වැඩේ කොරෙන්නෙ නැහැ කියලා එක පැත්තකට හිතෙනවා. ඒ මොකද කෙරෙනවනම් ඔබතුමා එතනට ගෙන්නල විදුහල්පතිතුමා එක්ක සාකච්ජාවට ගෙන්නන්න ඕන. ගෙන්නල තුන්දෙනෙක් එක්ක ඕන සාකච්ජා කරල තීරණයක් ගන්න.මොකද කරන්නෙ කියල.එතුමා එතෙන්ට ඇවිල්ල ඔබතුමාට බෝලෙ පාස්කරලා එතුමා ගියා. මං සතුටු වෙනවා ළමයි ටික දාගන්න පුළුවන්නම්. ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ කෙසේ හෝ ළමයින්ගේ ප්‍රශ්න විසඳන්න කියල ඉල්ලා සිටිනවා.ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම අපගේ ගරු ලක්ෂ්මි මන්ත්‍රීතුමිය විසින් ගෙනාපු යෝජනාව මීට කලින් මම හිතන විදියට අපගේ ගරු ශ්‍රේෂන් මන්ත්‍රීතුමා විසින් ඒ යෝජනාව දාල මෙතනින් පැනල ගියා. ඒ නිසා එතුමා නැති නිසා දීර්ඝව කතාකරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි ඇත්තෙන්ම මේ ප්‍රශ්න සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ජනතාවගෙ දූදරුවො.ඉතින් අපේ ප්‍රධාන සම්පත දරු සම්පත. ඇත්තෙන්ම මේ දරුවන්ගෙ ප්‍රශ්නයක් අපේ නගරයේ ඇතිවෙනකොට අපි ඒ ගැන කතාකිරීම අපේ ලොකුම වගකීමක්. ඒ සම්බන්ධයෙන් කතාකරනකොට ඇත්තටම විදුහල්පතිතුමා ගැන කතාකරනකොට ඇත්තෙන්ම කියන්න ඕන ගරු සභාපතිතුමනි. විදුහල්පතිතුමා කියන්නෙ ඒකාධිපතියෙක් වගේ කටයුතු කරන පුද්ගලයෙක් කියල අපට පෙනී යනවා. මොකද අපි ගිය පාලන කාලය තුළ ඔබතුමා කැඳවන්නෙ නැතිවුණාම ධර්මාශෝක විද්‍යාෙල කරන වැඩසටහන්වලට .සාකච්ජාවලට.සම්මන්ත්‍රණවලට.ඔබතුමාගෙ සහයෝගය ගන්නකොට අපි මේ සභාවෙ විවේචනය කළා.ඒ නිසා දැන් ඇත්තෙන්ම ඔබතුමාගෙ පක්ෂෙ පාලන බලයක් තියෙද්දි එතුමාල ඇවිල්ල ඔබතුමා කැඳවන්නෙ නැතිව ඒ අය ඇහුම්කන් නොදෙන්නේ එතුමාලගෙ තියෙන දරදඬු ඒකාධිපති තත්ත්වය කියල මං විශ්වාස කරනවා. ඒ වගේම ඇත්තෙන්ම ගරු ඩෙනට් මිත්‍රීතුමා මෙතන නැතිවුණත් ඇත්තෙන්ම ගරු ඩෙනට් මන්ත්‍රීතුමාට මේකෙ වගකීම තියෙනවා.මොකද එතුමා නැතිහින්දා මං එතුමාට කියන්න ඕන ටික කියන්නෙ නැහැ.මං කැමති නැහැ සභාවක් තුළ නැති කෙනෙකුට ඒ අඩුපාඩුව එතුමා ඉදිරියෙ කියන්න ඕන නිසා. ඒවගේම ගරු සරත් මන්ත්‍රීතුමාටත් දෙයක් කියන්න ඕන.මොකද ගරු සරත් මන්ත්‍රීතුමා තමන් අම්බලන්ගොඩ ජනතා ජන්දයෙන් ගිහිල්ල එතුමා ඉන්නෙ මහජන නියෝජිතයෙක් වශයෙන්.ඉතින් එතුමා ඇත්තෙන්මනියෝජනය කරනවා ආදි ශිෂ්‍ය සංගමයෙ ලේකම් නතනුරක්.පාසල් සංවර්ධන සමිතියෙ. ඇත්තෙන්ම ඉතින් එතුමාට කොන්දක් තියෙනව වශයෙන් මට කිව්ව දේ තමයි මේකට විරුද්ධව මෙහෙම දෙයක් වෙන්න යනවා.මේකට විරුද්ධ වෙන්න කියලා.ඇත්තෙන්ම තනතුරට වඩා ලොකු වෙන්න ඕන ගරු

මන්ත්‍රීතුමනි ජනතාව.ජනතාවගෙ දරුවො මේ ප්‍රශ්නෙදි ඔබතුමාට එතනදි ඇත්තෙන්ම සමිතිය වෙලාවෙදි නැගිටල කියන්න පුළුවන් වෙන්න ඕන මේකට මම විරුද්ධයි.මම අම්බලන්ගොඩ නගර සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ වගේ තීරණයක් ගන්න කොට මට කැමති වෙන්න බැහැ. මේ ක්‍රමය වැරදියි.කොමසාරිස් පාලන කාලවත් තුළ හිටන් ඇතිතෙන්ම ළමයි ගත්තෙ මම දන්න කාලෙ ඉඳලා.මම ධර්මාශෝකෙට ගියේ නැහැ.මම ගියේ ගමේ ධම්මකුසල විද්‍යාලයට.නමුත් මට ඒ දවස්වල ධර්මාශෝකෙට යනවනම් ඇත්තෙන්ම තරුණාරත්න මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕන. මට ගෙදරට පණිවුඩේ එව්වා ධජ්මාශෝක විද්‍යාලයට යන්න.මගෙ තාත්තා කිව්වා යන්න කියලා.මම ගියේ නැහැ.ගමේ විද්‍යාෙල මහින්ද දේශප්‍රිය මහත්මයාගෙ තාත්තා තමයි මට එතකොට අපි ප්‍රින්සිපල් කියන්නෙ නැහැ.ලොකු මහත්තයා කියල කියන්නෙ. ඒ ලොකු මහත්තය හිටියෙ පියසේන වඩුගෙ මහත්තටා.ඉතින් ඇත්තෙන්ම හොඳ අධ්‍යාපනයක් තිබුණා ධම්මකුසල විද්‍යාලයේ. ඒ නිසා තමයි මම ඒ බස්කෝලෙ දාල යන්නෙ නැතිව එම විද්‍යාලයෙම හිටියේ. හැම අතින්ම හොඳ තත්ත්වයක් තිබුණා ධම්මකුසල විද්‍යාලයේ. උත්තරා ගිණිගේ මහත්මිය,ජාලිය සිල්වා මහත්කයගෙ නෝනල .සිතාරා වර්ණකුලසූරිය මහත්මිය ඔය වගේ ගුරු මණ්ඩලයක් තිබුණු ඉස්කෝලයක් තමයි  අද වහල දාන තත්ත්වෙට පත්වෙලා තියෙන්නෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ ප්‍රශ්නෙදි මොකද ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කියන්නෙ අධ්‍යාපන ඇමති වශයෙන් අපි හිතන විදියට අපේ රජය තුළ හොඳ දැනුමක් තියෙන ඇමති කෙනෙක් වශයෙන් තමයි අපි ඇත්තෙන්ම ජනතාව සතුටු වුණා.අධ්‍යාපන ඇමතිකම ගරු ඩලස් අලහප්පෙරම  ලබාදෙන කෙට.නමුත් ඇත්තෙන්ම මම නම් ගියේ නැහැ ඒ අමාත්‍යතුමා හමුවන්න. අපේ මන්ත්‍රිවරු ගිහිල්ල ඇවිල්ල ගරු රාහුල මන්ත්‍රීතුමා මට විස්තරේ කිව්වා.ගරු ලක්ෂ්මි මන්ත්‍රිතුමියත් කිව්වා. දෙයක් කියන්න ඕන  ගරු ලක්ෂ්මී මන්ත්‍රීතුමියලගෙ ගෙදරදි ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාට එතුමගෙ ජංගම දුරකථනයට මං කෝල් එකක් ගත්තා. ඇත්තෙන්ම කියන්න ඒන සතුටුයි තියන්නෙ මොකද.මොන රඟපෑම් ගැන කතාකළත් එතුමා එවෙලේම කතාකළා. කතාකරල මට කිව්වා . මම කිව්වා මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරියක් කතාකරන්නේ. මට එදා එන්න බැරිවුණා ඔබතුමා සමග මේ ප්‍රශ්නෙ ගැන කතාකරන්න. එතුමා කිව්වා මේ ලැයිස්තුව දැම්මට ඒ වැරැද්ද හදනවම කියලා. ඒ වෙලාවෙදි  ඇත්තෙන්ම ප්‍රකාශ කළා. ඒ වගේම ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාටත්  මම කතාකළා. එතුමත් ඇත්තෙන්ම ජංගම දුරකථනයට සවන්දීල කතාකරල කිව්වා මං කිව්වා මේ වගේ වැරැද්දක් වෙලා තියෙනවා .මෙන්න  ලැයිස්තුව දාල තියෙනවා . එතුමා ඇමතිතුමත් එක්ක කතාකරල අධ්‍යාපන අධ්‍යක්ෂකතුමත් එක්කත් කතාකරල ඒ වරද නිවැරදි කරනව කියල පොරොන්දු වුණා. එහෙමනම් ගරු සභාපතිතුමනි  ඔබතුමත් පොරොන්දු වුණා.ජනතාවට මේ අහිංසක අම්බලන්ගොඩ ජනතාවට වන මේ අසාධාරණය මොකද විශේෂයෙන් කියන්න ඕන.ගැහැණු ළමයෙක් වුණාම ධර්මාශෝකෙට යන්න බැහැයි කියනවා. ලකුණු 05 ක් කැපෙනවා. ඇත්තෙන්ම ඒ චක්‍රලේඛනය යෙවස් කරන්න කියන්න. වැරැද්ද කොයි පැත්තකින් හරි වෙනවනම් වුරැද්ද නිවැරදි කිරීම අපේ වගකීමක් වෙනවා. අපි ඒව පෙන්නල දෙන්න ඕන රජයට නිවැරදි මාර්ගයේ යන්න. එහෙමනම් ඔබතුමා ඇත්තෙන්ම ඒක පෙන්නන්න. ගැහැණු ළමයෙක් වුණාම ධර්මාශෝකෙට කවදාවත් යන්න බැහැනෙ.ප්‍රජාපතියට ලකුණු 05 ක් කැපිල. ඒ නිසා ඇයි අපේ ප්‍රදේශයේ  ඉන්න ගැහැණු ළමයින්ට ධර්මාශෝක විද්‍යාලය අරහංද? ඒක නිසා ඔබතුමා  මේ ගැන අවධානය යොමුකරල මේක නිකන් කතාකරල සභාව හිනස්සල අපි මෙතනින්  තේ ටික බීල එළියට ගිහිල්ල වැඩක් නැහැ. අපි මොනවහරි කරනවනම් අපි යම්කිසි දීමනාවක් ගන්නවා.මෙතනට ඇවිල්ල කෑම ටිකක් කනවා. ඒක නිසා ඒක සද්භාවයෙන් කෙරෙන්න ඕන කියලයි මගේ මතේ තියෙන්නෙ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ ගැන දීර්ඝව කතාකරන්න ඕන නැහැ. අපි ඉන්නෙ අම්බලන්ගොඩ ජනතාවත් එක්ක. අපේ උප සභාපතිතුමා කිව්ව වගේ  මං එතුමට ස්තූති කරනවා. ඇත්තෙන්ම අපි උද්ඝෝෂණ ව්‍යාපාරය කරනකොට  මගේ සියලුම සහෝදර මන්ත්‍රීවරු ඇත්තෙන්ම

අපේ ගරු ජගත් මන්ත්‍රීතුමා,ගරු ලක්ෂ්මි මන්ත්‍රීතුමිය, ගරු රාහුල මන්ත්‍රීතුමා, ගරු ධනසේන මාදුවගේ මන්ත්‍රීතුමා,ගරු සරත් මන්ත්‍රීතුමා සහයෝගය දුන්නා. හැබැයි ගරු සෝභිත මන්ත්‍රීතුමාගෙ ප්‍රදේශෙ ළමයි තමයි ගොඩක් තේරිල නැත්තෙ. ගරු ඉනෝකා මන්ත්‍රීතුමියත් ආවා. එතුමා මෙනෙ හේතුවක් නිසා ගරු සෝභිත මනුත්‍රීතුමත් අර අමුතු චරිතයක් මං දකින. ඒක නිසා තමන්ගෙ හෘද සාක්ෂියට එකඟව වැඩ කරන්න කියල මහජන නියෝජිතයන්ගෙන් ඉල්ලමින් මේ සඳහා ඔබතුමා මැදිහත්වෙලා මේ ප්‍රශ්නය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වන විදියට වැඩකටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි එදා අධ්‍යාපන ඇමතිතුමා හමුවෙන්න අපි ගිහිපු අවස්ථාවෙදි මම නම් එතන දකින එකදෙයක් තියෙනවා. මොකද අපේ උප සභාපතිතුමා ඇහුවා ජාතික පාසලේ අධ්‍යක්ෂකගෙන් ඔබතුමා ගියවර ආණ්ඩුවෙත් හිටිය නේද කියලා.මං හිතන්නෙ ඒ වෙලාවෙදි පාසල් අධ්‍යක්ෂතුමා කිව්වා ඔව් මං ගියවරත් හිටියා කියල. එතකොට මං හිතන්නෙ ඔතන තමයි ගැටලුව තියෙන්නෙ. ජාතික පාසල් අධ්‍යක්ෂතුසාගෙ සම්බන්ධෙයි විදුහල්පතිතුමාගෙ සම්බන්ධෙයි ඉතා දුරදිග ගිය එකක් නිසා මං හිතන්නෙ ඇමතිතුමා අභිබවා ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා විදුහල්පතිතුමත් එක්ක. ඒ සම්බන්ධය අනුව තමයි කටයුතු කොරොන්නේ.සිද්ධ වෙන්නේ. අධ්‍යාපන ඇමතිතුමා ඔබතුමා ඉතාමත්ම ඉහලින්ම පිළිගත්තා. මගේ හිතවත් මිත්‍රයක්.මගේ බැජ්මේට් කෙනෙක් කියල ඔබතුමාට ඒ ගෞරවය තිබුණා. ඔබතුමාට විශාල සැලකීමක් එතන තිබුණට නමුත් අපේ කාර්යයට එච්චර ප්‍රථිඵලයත් ලැබුණෙ නැහැ. මොකද මං මේ අවස්ථාවෙදි මෙතන අපිට රහසක් නැහැ. ගරු සෝභිත මන්ත්‍රීතුමා ගියා ගරු රාහුල මන්ත්‍රීතුමා ගියා.ඒත නිසා අපේ උප සභාපතිතුමා යම්කිසි ෆෝම් එකක් ඇමතිතුමාට පෙන්නුවා. ඇමතිතුමාට පෙන්නුව අවස්ථාවෙදි අපි මෙතන කියන්න ඕන මොකද අපි කණගාටු වෙන්න ඕන. ඒ වගේ වචන අහනවට.එතුමා නගර සභාවෙ උප සභාපතිතුමා. පෙන්නපු වෙලාවෙ එතුමා කිව්වා ඔව් මට ජේනවා.මට හොඳට කන් ඇහෙනවා. මට කියවන්න පුළුවන්. ඔය වගේ වචන කියනකොට අපේ හිත රිදෙනවා. මොකද අපි මන්ත්‍රීවරු. මන්ත්‍රීවරු වශයෙන් ගිහිල්ල එහෙම එක එක දේවල් අපේ උප සභාපතිතුමෙකුට කියනවනම් ඔබතුමාට සලකපු සැලකිල්ල අපි වෙනුවෙන් සලකන්න ඕන. ඔබතුමාට සැලකුව නම් ඔබතුමා වෙනුවෙන් ඒ ගෞරවය තියන්න ඕන. මොකද අපි මන්ත්‍රීවරු ගිහිල්ල එතන එහෙම කිව්වනම් සාමාන්‍ය කොනෙකු ගියානම් කොහොම ආකාරයෙන්ද සලකන්නෙ කියන එත අපිට මේ අවස්ථාවෙ හැඟෙනවා. අපි ඇත්තටම අපි තමයි එතුමාල ඔය පුටුවලට ගෙනාවෙ. අපි තමයි ප්‍රාදේශීය මට්ටමේ දේශපාලඥයො තමයි මහින්ද සුළඟ කියල පටන් අරගෙන මේක ගෙනාවෙ. විශේෂයෙන් අම්බලන්ගොඩින් තමයි පටන් ගත්තෙ ඔය සමූපකාර ජන්දෙන් ඔබතුමාගෙ යෝජනාවෙන්. ඉතින් ඒ වගේ තත්ත්වයක්. අපිට කියන්න කණගාටුයි මේ තත්ත්වෙ උඩ තමයි ඔබතුමා මේක අපේ ගරු අගමැතිතුමාට පැහැදිලි කරන්න මේ තත්ත්වයක් තියෙන්නෙ කියලා. මං ඉල්ලා සිටිනවා ඒක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මං පොඩි අදහසක් දක්වන්නම්. මේ මන්ත්‍රීවරු කියනවට වඩා හාත්පසින්ම වෙනස් අදහසක් කියන්නෙ. ඒ විදුහල්පතිතුමා ගැන අපි හැමෝම කතාකරනවා. ධර්මාශෝකෙ විදුහල්පතිතුමා ගැන. හැබැයි එකක් තියෙනවා විදුහල්පතිගෙන් ඉගෙන ගන්න ළමයි දිහා බැලුවම අම්මල කියනව ඕන වෙලාවක විදුහල්පතිතුමා අයින් කළොත් අපි උද්ඝෝෂණයකට ඇවිල්ල අපි වාඩිවෙනවා කියල. එතකොට අපි මන්ත්‍රීවරියන් ටිකයි පොඩි ප්‍රමාණයක් වාඩිවුණාම අම්මලා

තුන්භාරදාහක් වාඩිවුණාම විදුහල්පතිතුමා රැකෙනවා. එතකොට විදුහල්පතිතුමා දක්ෂ නිසානෙ රැකෙන්නෙ. නැතිනම් ඉගෙන ගන්න ළමයින්ගෙ ගෙවල්වලින් මොකද බහුතරයක් මං දන්නෙ නැහැ කොහොමද විදුහල්පතිතුමා කියල ඇහුවම විදුහල්පතිතුමා නම් මාරුකරන්න දෙන්නෙ නැහැ කියල කියනවා. මං කියන්නෙ මේකයි විදුහල්පතිතුමාගෙ වැරදි නෙමේ. පුළුවන්නම් ඔබතුමන්ලා අපි හැමෝම අධ්‍යාපන ඇමතිතුමා දැන් පවතින රජයෙ ඉන්නෙ. එතුමට කියල හෝ අගමැතිතුමාට හෝ ජනාධිපතිතුමාට කියලහරි මේ චක්‍රලේඛෙ පොඩ්ඩක් වෙනස් කරගන්න බලන්නකො. චක්‍රලේඛනය වෙනස් කළාම අම්බලන්ගොඩ නගරයේ වරිපනම් ගෙවන ළමයින්ට යන්න පුළුවන්. මේ චක්‍රලේඛනය නිසානෙ අර ඉස්කෝලෙට 05 යි මේ ඉස්කෝලෙට 05 යි එහෙම කැපිල අහුවෙන්නෙ. මේ චක්‍ර ලේ කනය වෙනස්වෙලා අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ වරිපනම් ගෙවන මොකද මේ මගේ ළමයිනුත් යන්නෙ ධර්මාශෝකෙට නෙමේ. වරිපනම් ගෙවන විදියට මොකද කුලරත්කෙටවත් අහුවෙන්නෙ නැහැ. මෙතුමාල බොහෙම අමාරුවෙන් තමයි තුලරත්නෙටවත් දාල දුන්නෙ මේ ගරු රාහුල මන්ත්‍රීතුමාල එකතුවෙලා. මං කියන්නෙ මේ චක්‍ර ලේඛන ක්‍රමේ දොස් කියන එක නෙමේ. මොන ඇමතිටවත් නෙමේ. ඇතිකරපු එක හරි නැතිකරපු එක හරි හැමෝම එක්ක කතාකරල ඇමතිතුමාට දැන් මං හිතන්නෙ අපේ ගරු සභාපතිතුමාට හොඳ හයියක් තියෙනව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හරි අගමැතිතුමාට හරි කියල මේ චක්‍රලේඛනය අයින් කරන්න. අයින් කළාට පස්සෙ ඒ ප්‍රශ්නය වෙන්නෙ නැහැ. විදුහල්පතිතුමාට පෞද්ගලික තරහක් නැහැ අම්බලන්ගොඩ අර ළමය ගන්නයි මේ ළමය ගන්නයි කියල. චක්‍රලේඛ ආවොත් ළමය ගන්න ඕනනෙ විදුහල්පතිතුමා. ඒ වැරැද්ද නිවැරදි කරල ළමයි ගැනීම කරයි. ඒක නිසා දෙමව්පියොනුත් ඉන්නව විදුහල්පතිතුමා එක්ක. මම දන්නම අය ඉන්නව ගොඩක් අය. දෙමව්පියන් කිහිප දෙනෙක්ම ඇත්තටම කතාකරපු වෙලාවෙ කිව්වෙ අධ්‍යාපනය පැත්තෙන් ගත්තම ඉහල මට්ටමේ ධර්මාශෝකෙ තියෙනව මං දන්නෙ නැහැ විනය පැත්තෙන් ගත්තත් හොඳයි. මම ඉතින් ධජ්මාශෝකෙට යන්නෙ නැහැ.මට අම්මල කියන දේ තමයි කියන්නෙ.ඉතින් එහෙම වුණොත් ඒ අය කියන්නෙ අපිත් පාරට බහිනවා කියල විදුහල්පතිතුමා යවන්න දෙන්නෙ නැහැ කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම දැන් සියලු මන්ත්‍රීවරුන් කියන දේ අහන් හිටියා. ඇත්තටම කියනවනම් පෝරඹ කොට්ඨාසයේ අපට තමයි වැඩියෙන්ම අවාසි. මොකද පාසල් තුන හතරක් තියෙනවා. කතාකරල වැඩක් නැහැ කතාකරන්නෙ නැත්තෙ ඒකයි. උද්ඝෝෂණ කරල වැඩකුත් නැහැ. ඔබතුමාල සියලු දෙනාගෙ අදහස් මම අහගෙන හිටියා. දැන් ඔබතුමාලගෙ ජනාධිපති කෙනෙක් ඉන්නෙ.විෂයභාර ඇමති ඔබතුමාලගෙ කෙනෙක්.ඔබතුමාල අද මේකට සම්බන්ධ වෙලා වැඩකටයුතු කරල මේකට සාධාරණයක් කරන්න පුළුවන්. ඇත්තටම දුකයි. මගේ කොට්ඨාසෙට ධර්මාශෝකෙ ඉස්කෝලෙ සණ්ඨාරෙ ගහන සද්දෙ ඇහෙනවා පෝරඹට. ඇත්තටම කියන්න කණගාටුයි. මගේ නැගණියගේ දරුවා ඒ චක්‍රලේඛනය ආපු හැටියෙම පල්ලෙහා දරුවා අහුවුණා. මගේ නැගණියගෙ දරුවා අහුවුණේ නැහැ. මම ඉස්කෝලෙ කිසිද දේකට සම්බන්ධ වෙන්නෙ නැහැ.ආදි ශිෂ්‍ය සංගමයේත් මා නැහැ.මම පහුගිය 90 කණ්ඩායමත් එක්ක සම්බනධවෙලා ඉන්නවා.කිසිම දේකට සම්බන්ධවෙලා නැහැ. මොකද මං ඔය ඉස්කෝලෙ ගැන කතාකරන්නෙත් නැත්තෙ ලොකු කලකිරීමකින් මං සිටින්නෙ ඇත්තටම. වැඩියෙන්ම අවාසි සහගත තත්ත්වයක් උදාවෙලා තියෙන්නෙ පෝරඹ ගම්මානයට. මොකද කුලරත්නයටත් අහුවෙන්නෙ නැහැ ළමයි සමහර වෙලාවට. පෝරඹ ළමයි කුලරත්නෙට අහුවෙන්නෙ නැහැ. යන්නෙ බුද්ධදත්තෙට. ඉතින් ලොකු කලකිරීමක් තියෙනවා. ඔබතුමාගෙ දේශපාලන බල අධිකාරිය ඇනුවත් කරල විෂයභාර

ඇමතිතුමා දැනුවත් කරල මේ ගැන සාධාරණ විසඳුමක් අම්බලන්ගොඩ ජනතාවට ලබාදෙන්න කියල ඉල්ලමින් මා නිහඬ වෙනවා.ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඇත්තටම හොඳ මාතෘකාවක්. හැම අවුරුද්දෙම අපි කතාකරනවා. කියන්න හදපු සියලුම දේවල් ගිලගත්තා. මොකද අපේ ගරු සභාපතිතුමා කිව්වා අධ්‍යාපන ඇමතිතුමා පොරොන්දු වුණා කියල අසාධාරණයක් වෙච්ච ළමයින්ට සාධාරණයක් කරන්න. ඒ වගේම ගරු නිලානි මහත්මියත් දුරකථනයෙන් කතාකරල එතුමාට කතාකරාම පොරොන්දු වුණා කිව්වා අසාධාරණය වෙච්ච ළමයින්ට සාධාරණයක් කරනවා කියලා. බොහොම හොඳයි එහෙම දෙයක් වෙනවනම්. අපේ ආණ්ඩුවක් තියෙන්නේ. අපේ ඇමතිවරයෙක් ඉන්නේ. හරිම කණගාටු වුණා මම නම් ගරු සභාපතිතුමනි. මං හනගමන් ගරු සභාපතිතුමා එක්කත් රණ්ඩු වුණා. ඒවගේ අධ්‍යාපන ඇමතිවරයෙක්අපිට ප්‍රකාශ කර විදිය ගැන. ගරු සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරු ගියේ. අපි 10 ක් විතර ගියේ. ඇත්තෙන්ම අපි ලැජ්ජ වුණා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් හිටියා. දෙමව්පියන් හිටියා. මන්ත්‍රීවරු ඉදිරියේ ගරු සභාපතිතුමාට ඇමතිතුමා කතාකරපු විදිය ගැන. කියන්න කණගාටුයි. ඇත්තටම ගරු සභාපතිතුමනි අඬන්න වෙනවා කියන්න ලැජ්ජායි. ඇත්තටම ගෙදරකට එළිය දෙන්නෙ ගැහැණු ළමයෙක්. අම්බලන්ගොඩ නගරයේ ගැහැණු ළමයෙක් ඉපදුණොත් ඒ ළමයට අධ්‍යාපනය නැහැ. ඒ ළමයා කාලකන්නි වෙනවා.යන්න ඉස්කෝලයක් නැහැ. අපේ ගෙවල් ලඟත් ළමයෙක් ඉන්නවා. වසරකට උපත ලබන්නෙ ගරු සභාපතිතුමනි 250 ක් 300 ක වගේ ප්‍රමාණයක්. නමුත් එක ඉස්කෝලෙකට ගන්නව ළමයි 450 ක් 500 ක් විතර. 200 යි. නමුත් එක ඉස්කෝලෙකට වත් ඇතුළත් වෙන්න බැරිවුණා.කන්දෙගොඩ ඉස්කෝලෙට තමයි ඒ ළමයට ඇතුල් වෙන්න වුණේ. කියන්න කණගාටුයි. අපේ පනියන්දුවෙ. මගේ සහෝදරයෙකුත් ඉන්නව අවුරුදු 05 කට කලිනුත් ලොකු දරුවා ඇතුළත් වුණා මේ දුර ප්‍රමාණෙ වෙනස් කරපු එකෙන් බාල දරුවා ඇතුළත් කරන්න බැරිවුණා. දුර ප්‍රමාණෙ වෙනස් කරපු එකෙන් ඒ ළමයත් එළියට ගියා. අපේ අධ්‍යාපන ඇමතිතුමා පොරොන්දුවෙලා තියෙනවා අපේ අම්බලන්ගොඩ නගරෙ වෙනුවෙන් සාධාරණයක් කරනව කියල.ඊලඟ මාසෙත් අපි බලමු. බලන් ඉඳලා අපේ උප සභාපතිතුමා ප්‍රකාශ කළ විදියට අපේ ආණ්ඩුව වුණත් අපේ ඇමතිවරයෙක් වුණත් අපිට විවේචනය කරන්න වෙනවා. අපි ලබන මාසෙ ඉඳන් බලන්ඉන්නවා ගරු සභාපතිතුමා මේ නගරයෙ ඉන්න ළමයින්ට සාධාරණයක් වෙයි කියන බලාපොරොත්තුවෙන් මම නවතිනවා.බොහොම ස්තූතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඔක්කොම කුණු බේරුවල බොක්කට වගේ මේ සභාවෙ සියලුම දේත් මගේ පිටින් යන්නේ. ආදි ශිෂ්‍ය සංගමේ කුණුත් යන්නෙ මගේ පිටින්. පාසල් සංවර්ධන සමිතියෙ කුණු යන්නෙත් මගේ පිටින්. මේ සියලු දේ අම්බලන්ගොඩ නගරෙ පුරවැසියෙක් විදියට මේ සියලු දේට සම්බන්ධවීම නිසා. මං සතුටු වෙනව මිසක් මං කණගාටු වෙන්නෙ නැහැ. පොඩි වේදනාවක් තියෙනවා. ඒකෙ ප්‍රශ්නයක් නැහැ.මොකද ජනතාව වෙනුවෙන්. පළවෙනිකොටම මං උත්තර දෙන්න ඕන මං මේ ගරු මන්ත්‍රීතුමගෙයි ගරු මන්ත්‍රීතුමියගෙයි ප්‍රකාශ කරපු දේ ගැන. ගරු ලක්ෂ්මි මන්ත්‍රීතුමියගෙ යෝජනාවට කතාකිරීම මත්තෙන්. මං කියා සිටින්න කැමතියි ඇත්තෙන්ම ගරු නිලානි මන්ත්‍රීතුමියගෙ යෝජනාවෙදි කියවුණා පාසල් සංවර්ධන සමිතියෙ ලේකම්වරයා වශයෙන් එතුමාට කොන්දක් තිබෙන්න තිබුණා මේ ගැන කෙලින් කතාකරල මේ ප්‍රශ්නෙ විසඳන්න. මෙ ගරු සභාවේ මන්ත්‍රීවරු 21 ක් ඉන්නවා. මම නැගිටලා යමක් කතාකළාම විසිදෙනා ඒකට එකඟතාවයක්

එන්නෙ නැත්නම් ඒක සම්මත වෙන්නෙ කොහොමද කියන ප්‍රශ්නෙ විතරයි මෙතන තියෙන්නෙ. තේරුණයි.අම්බලන්ගොඩින් ඉන්නෙ මං විතරයි. දෙමව්පියො කීදෙනෙක් මෙතන ඉන්නවද? කවුරුහරි සහභාගි වෙනවද? තමුන්ගේ වගකීම පැහැර හැරලා මට ඇඟිල්ල දික්කළාට වැඩක් නැහැ. මේ තරම්වත් අරගෙන යන්නෙ මං. ඒක මතක තියාගන්න.ඒ නිසා ඔබතුමියට වඩා තුන්පාරක් මං ඉදිරියෙන් ඉන්නව අම්බලන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන් අම්බලන්ගොඩ නගරයේ මේ ප්‍රාථමිකය එතන තියන්න ඕන කියන තැන. මට හැංගිහොරා කියන්න දෙයක් නැහැ.මං ඇමතිතුමා ඉස්සරහා ප්‍රසිද්ධියෙ කිව්වේ. මමයි කතාව කිව්වේ. ඔයගොල්ලො නෙමේ. මමයි කිව්වෙ අම්බලන්ගොඩ ප්‍රාථමිකය මෙතන තියෙන්න ඕන කියලා.ඉතින් ගරු ඇමතිතුමා පොරොන්දු වුණාට පස්සෙ ඒ සාධාරණය යුක්තිය ඉෂ්ඨ කරනව කියල ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා එක්ක අපි සභාපතිතුමා එකක සම්බන්ධ කරල එතනින් එහාට මට තියෙන බලය මොකක්ද ඒ ගැන කතා කරන්න. ඉන් එහාට මට බලයක් නැහැ ගරු සභාපතිතුමනි. මං අදත් ඉන්නව එතන.මොන ලැයිස්තු මොන ඇතුල් කිරීම් කළත් මං ඉන්නෙ ප්‍රාථමික අංශයට මේ චක්‍රලේඛනය අනුව ගරු සභාපතිතුමනි ළමයි ඇතුළත් කරමු කියන තැන. හැබැයි ඔයගොල්ලො එක්කෙනෙක්වත් මේ චක්‍රෙල්ඛනය නිසියාකාරව පරිශීලනය නොකර තමයි සියලු දේ කතා කරන්නේ. පළවෙනිම කාරණාව මං කොහොමහරි ගරු සභාපතිතුමනි මේ චක්‍රලේඛනයේ පිටපත් හැමෝටම දෙන්නම්. මුලින්ම මේක අවබෝධ කරගන්න. රටේ චක්‍රලේඛනයක් තියෙනවනම් ඒක තමයි නීතිය. ධර්මාශෝකෙට විතරක් නෙමෙයි. පාසලට ළමයි ඇතුළත් කිරීම පමණක් නෙමෙයි ගරු සභාපතිතුමනි. අපේ රටේ සාමාන්‍ය නීතියක් තියෙනවනෙ. ඒ නීතියට අපි හැමෝම යටත්. ඒ නීතියට අනුව ජාතික පාසල් අධ්‍යක්ෂක කතාකරනකොට අපේ කටවල් වැහෙනවා. ඒක තමයි අපට සිද්ධ වුණේ. ඇමතිතුමා ඒ සම්බන්ධව වැඩිය ඉදිරිපත් වෙන්න ගියෙ නැහැ. මොකද අපි දේශපාලන නායකයො නිසා පල්ලෙහා. හැබැයි මේ කතාව ජාතික පැසල් අධ්‍යක්ෂක පාසල් 4000 ක දෙමව්පියොන්ට කියනවා. අපට විතරක් නෙමේ. ධර්මාශෝකෙට විතරක් නෙමේ මුළු ලංකාවටම. නොනිදන අමාත්‍යාංශයක් මේකෙ තියෙන්නෙ. අපි ගියාම තව පාසලක කට්ටය එනවා. තව පාසලක කට්ටිය එනවා.මේ වගේම මන්ත්‍රීවරුන්ට විශාල ප්‍රශ්න තියෙනවා. ප්‍රශ්න නැති ගමක් නැහැ මේකෙ. ජාතික පාසලක් වශයෙන් බරපතලම ප්‍රශ්න තියෙන්නෙ අම්බලන්ගොඩ ධර්මාශෝකෙ.දේවානන්දෙ ඒ ප්‍රශ්න නැහැ. දේවානන්දෙ වෙනුවෙන් කවුරුහරි ගිහිල්ල තියෙනවද අමාත්‍යාංශෙට . ගිහිල්ල නැහැ.අධිකරණයට ගිහිල්ල තියෙනවද. ගිහිල්ල නැහැ. ඉතාම කලාතුරකින්. ඒ වෙන ප්‍රශ්නෙකටනෙ. නමුත් මං මේ කියන්නෙ ධර්මාශෝකෙට පවතින අධික ඉල්ලුමයි මේ කියන්නෙ. එතකොට මේක ප්‍රෙෂර් එකක්. ඇමතිතුමාට වුණත් ඔය අධ්‍යාපන අමාත්‍යාංශයෙ සියලුම නිලධාරීන් වැඩිම බය ධර්මාශෝකෙට. මොකද අවුරුදු පතා නඩු 10 කට වඩා එනවා. සමහර විදුහල්පතිවරු වන්දි ගෙවල තියෙනවා. සමහර අය ගෙවල නැහැ. සමහර අය බේරිලා තියෙනවා. ඉතින් ඒක නිසා මේ ගණුදෙනුව කිරීමේදී ඉස්සෙල්ලාම අපි මේ චක්‍රලේඛණය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම අවශ්‍යයි. මහජන නියෝජිතයො විදියට. ඒක අනුව ඕනනෙ කතාකරන්න. දැන් උදාහරණයකට ගරු සෝභිත මන්ත්‍රීතුමාගෙ හිරේවත්තෙ ප්‍රශ්නෙ ඔප්පුවට ලකුණු 10 නොදීම මෙතන කතාකරන්න බැහැ. ඒක චක්‍රලේඛණයෙන්ම නිවැරදි වෙන්න ඕන. ඒකට විදුහල්පතිට බැන්නත් ජාතික පාසලට බැන්නත් ඇමතිතුමාට බැන්නත් වැඩක් නැහැ. මේ කිව්ව මේ යෝජනාව අනුව චක්‍රලේඛණය සංශෝධනය කරවගන්න ඕන. හැබැයි මම එකතැනක ඉන්නවා. මේ කාරණාවෙදි මේ ප්‍රාථමික අංශය මාරුකිරීම සම්බන්ධයෙන් ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා ප්‍රකාශ කළා. මේන පාර දෙපැත්තෙ තියෙනනම් ඒක වැරදියි. ඒකට තමයි එයාට බලය දුන්නෙ මෙතන ඇවිල්ල වාර්තාවක් දීල මේක නිවැරදි කරනින කියලා. අපි හිතමු ඒක ජාතික පාසලුත් ඇමතිතුමාට ඒ වාර්තාව දුන්න කියලා. හැබැයි ඇමතිතුමා ප්‍රකාශයක් කළා.මේක තාවකාලිකව මේ ලැයිස්තුව නවත්වන්න කිව්වෙ නොදා ඉන්න නෙවෙයි. එතුමගෙ මතේ වුණේ මේ සර්කල් එක නිසා අසාධාරණය වුණු අපි හිතමු හිරේවත්ත , මහ

අම්බලන්ගොඩ, විලේගොඩ ළමයි 10 හරි 12 හරි  ඇතුල් කරගන්න. ඒක තමයි මේ ප්‍රකාශ කළේ ගරු සභාපතිතුමනි. ඒකෙදි එයා අදහස් කළේ මේ චක්‍රලේඛණය නැවත ගහල නැවත ගෙනඒම විශාල ප්‍රශ්නයක්. මොකද අධිකරණයට යා හැකි දෙයක්. ඉතින් ඒක නිසා තමයි ඒ තීන්දුව දුන්නේ. හැබැයි ඒක ගරු සභාපතිතුමනි තාවකාලික තීන්දුවක්. මං ඉන්නෙ එතන නෙවෙයි. මං ඉන්නෙ මේ චක්‍රලේඛණය සදාකාලිකවම තිබ්ච්ච මේ ධර්මාශෝකෙ ප්‍රාථමිකය එතන තියෙන්න ඕන කියන මතේ මං ඉන්නෙ. හැබැයි ඉතින් මේක මට විතරක් පාසල් සංවර්ධන සමිතියේ හෝ ආදි ශිෂ්‍ය සංගමෙයේ හිටියා කියල කරන්න පුළුවන් දෙයක් නෙමේ. මේ විදුහල්පතිවරයා අද  ඉන්නවා හෙට වෙන කෙනෙක් එනවා. එයා ආවා එයා නාවා කියල මෙයා හිටියා කියල එකක් නැහැ. අපි අපේ යුතුකම කරගන්න ඕන ඇමතිතුමා හරහා මේ  චක්‍රලේඛණය වෙනස් කරවා ගැනීමට. එහෙ නැත්නම් විදුහල්පතිතුමා වරදක් කරල තිබෙනවනම් අපිට පුළුවන් පැහැදිලිවම දැන් ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා පැවරුවනෙ. ඒ උත්තරේ ගන්න. ජාතික පාසල් අධ්‍යක්ෂකතුමාගෙන් ලිඛිතව ගන්න මේ ප්‍රාථමික අංශය මේ විදුහල්පතිතුමා කරල තියෙන මේ කරල තියෙන තීන්දුව නිවැරදියි කියල.එය නිවැරදි නම් දෙයිනෙ. එහෙනම් ඉතින් අපි වැරදිකාරයොනෙ. එහෙනම් ඇමතිතුමත් වැරදියිනෙ. ඉතින් ඒක නිසා මගේ දැනුම අනුව මේ ධර්මාශෝක විද්‍යාලයෙ ප්‍රාථමික අංශය තිබෙන්න ඕන. එතෙන්ට තමයි මේ සර්කල් එක ගහන්න ඕන. මෙහෙම එකක් තියෙනවා ගරු සභාපතිතුමනි ජාතික පාසල් අධ්‍යක්ෂකතුමාට හෝ ඇමතිතුමාට හෝ විදුහල්පතිතුමාට ප්‍රකාශ කරනවනම් කරන්න තිබෙන්නේ අභ්‍යන්තර ගැටලු. මේකෙ අභ්‍යන්තර ගැටලු ගණනාවක් තියෙනවා. මං ඇත්තටම ඇමතිතුමා ඉස්සරහා කියන්න ගියේ නැහැ අපට අවාසි නිසා.මං දැන් කියන්නම් ඒවා. ඇත්තම කතාව 01 වසරේ සිට 05 වසර දක්වා පන්ති 05 යි අපි ඇතුළත් කරගන්නෙ ගරු සභාපතිතුමනි. හැබැයි 06 වසරෙදි ධර්මාශෝකෙ පන්ති 10 ක් වෙනවා. 05 ට තව 05 ක් ඇතුළත් කරගන්නවා අලුතෙන්. ශිෂ්‍යත්ව පන්ති 05. මේ 10 ට ඉඩකඩ සලසන්න ඕන එක ගොඩනැගිල්ලේ. මෙතන 02 යි.මෙතන 03 යි. මෙතන 04 යි.එහෙම දාන්න බැහැ. එතකොට 06,07,08,09,10 මේ කියන පන්ති වෙනුවෙන් පන්ති දහය දහය 50 ක් ඕන. එතකොට එක පැත්තෙ පන්ති තැබීම අත්‍යාවශ්‍ය වෙනවා. මොකද නැත්නම් මේ කොටසෙ ඉඳලා අර කොටසට සීනුවට ගුරුවරු මාරුවෙන්න විතරක් විනාඩි 15 ක් යනවා. එතකොට පැය භාගයයි උගන්නන්න පුළුවන්. ඒවා අභ්‍යන්තර ගැටලු. අපි ඒව දක්න්නෙ නැහැනෙ. සාමාන්‍ය මහජනතාවට ඒව ප්‍රශ්න නෙමෙයි. අපි ගමේ ජනතාව විදියට ඒ මිනිස්සු වෙනුවෙන් අපි බැඳී සිටින්නේ ප්‍රාථමිකය මෙහේ තිබිය යුතුයි කියලා. ඉතින් ඒක අභ්‍යන්තර ගැටලු ගරු ඇමතිතුමාට කතාකරල ගොඩනැගිලි අරගෙනහරි ඒව විසඳන්න ඕන ඒ පාසල් අධිකාරිය. ඒක වෙනම කතාවක්. මම දැනුත් කියන්නෙ මේ අවුරුද්දෙ මේ  චක්‍රලේඛණයට මේ ළමයි 10 ක් 12 ක් ඇතුළත් කරගන්න එක නෙමේ අපේ දක්ෂතාවය. අපේ රාජකාරිය වෙන්න ඕන  චක්‍රලේඛණය තුළ ප්‍රාථමික අංශය මෙතන සදාකාලිකව තිබීම. ඒක විතරයි ගරු සභාපතිතුමනි අපේ මේ ගරු මන්ත්‍රීවරු ඉදිරිපත්  කරපු අදහස්වලින් චක්‍රලේඛණයට පරිබාහිරව යන්නෙ.අනෙක් සියල්ල චක්‍රලේඛණය තුළ තිබෙන දේවල්.අපි චක්‍රලේඛණය පරිශීලනය කරලා ඒව වෙනස් කරගත යුතු වෙනවා. මම 18 නැත්නම් 19 වැනි අවුරුද්ද මේ සභාව නියෝජනය කරන්නෙ. අරගෙන බලන්න වාර්තා අවුරුදු 19 ම මේ ගැන කතා කරනවා. මේ අවුරුදු 19 ම මං කියල තියෙනවා මේක වාර්තාව සංශෝධනය කරන්න යන්න ඕන කාලවකවානුත් මං කියල තියෙනවා. මොකද ජුනි 30 ට තමයි සම්මුඛ පරීක්ෂණයට කැඳවන්නෙ.ජනවාරි, පෙබරවාරි ඇතුළත මේ ජාතික පාසල් අධ්‍යක්ෂක මේ  චක්‍රලේඛණය වෙනස් කරනවා. එතකොට මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා ගරු සභාපතිතුමනි. අම්බලන්ගොඩට බලපාන ප්‍රශ්නය නෙමේ කොළඹට.කොළඹට තියෙන එක නෙමේ ගාල්ලට. ඉතින් මේකෙදි අධ්‍යාපන අමාත්‍යාංශය හෝ ගරු ඇමතිතුමා හෝ රටේ පාලකයො වැඩිම අවධානය යොමුකරන්නෙ කොළඹට. අපට නෙමෙයි.කොළඹට කිරි ගමට කැකිරි. ඕකනෙ වෙන්නෙ. හැබැයි ඒක කරන්න නෙමේ අපි ඇමතිවරයෙක් ආණ්ඩුවක් බිහිකරගෙන තියෙන්නේ. එතන අපි ඉන්නවනෙ. ඉතින් ඒක

නිසා තමයි මං මේ කියන්නෙ හැබැයි අම්බලන්ගොඩට ඕන විදියට මේ කිලෝමීටර ගාන ඇතුළත අම්බලන්ගොඩ අය ගන්න එහෙම චක්‍රලේඛණ හදන්න බැහැ. ඒව ප්‍රායෝගික ගැටලු. හැබැයි අපිට යම් යම් සාධාරණ වූ දැන් මෙතුමා ඉදිරිපත් කළා පෝරඹ. ධර්මාශෝක විද්‍යාලෙ නම කියවුණාම ප්‍රධාන ආදි ශිෂ්‍ය විදියට කියන්නෙ මැතිවරණ කොමසාරිස්තුමාගෙ නම. ඇමතිතුමා කිව්ව ඔබතුමාගෙ ප්‍රධාන ආදි ශිෂ්‍යයා මහින්ද දේශප්‍රිය මැතිතුමා මැතිවරණ කොමසාරිස්තුමාගෙනි ලියුමක් අරගෙන එන්න කිව්වා මේකට. එතකොට එතුමගෙ ගම මොකක්ද? එතුමගෙ ගම පෝරඹ. එතුමා කොච්චර උත්සාහ කරල ඇත්ද මේ චක්‍රලේඛණය වෙනස් කරන්න. කාලයක් එතුමාගේ බැජ්මේට් අවුරුදු 03 ක් හිටපු බැජ්මේට් තමයි ජාතික පාසල් අධ්‍යක්ෂක. ඒත් බැරිවුණා සමහර කාරණා මේවකර ගන්න. මොකද හේතුව එයාටත් පැහැදිලි කරදුන්නම මේක රටටම බලපාන විදියටයි මේ චක්‍රලේඛණය හදල තියෙන්නෙ පරස්පරයි ගරු සභාපතිතුමනි. එතනයි ප්‍රශ්නෙ. කාටහරි යෝජනාව දෙන්න පුළුවන් නම් ලංකාවටම හරියන අම්බලන්ගොඩ බේරගන්න පුළුවන්. පෝරඹ දරුවො ධර්මාශෝකෙට ගන්න පුළුවන් යෝජනාව ඒක තමයි යෝජනාව. එහෙම බැහැ.මං දන්නෙ නැහැ ඒක පළාතෙන් දෙන්නෙ නැහැනෙ.ජාතික පාසල් කියන එක ජාතික.මටත් තියෙනව යෝජනා ඕනතරම් මේ පළාත් සභාවලට කපන එක නවත්වන්න. මේක මිශ්‍ර පාසලක් නිසා ප්‍රජාපතියට කපන එක නවත්වන්න. දකුණු පළාතෙන්ම තියෙන ප්‍රසිද්ධ පාසලක් මේක.ගාල්ලෙ ගත්තොත් ජාතික පාසල් 10 කට වඩා තියෙනවා.මේ තරහෙ නැහැ.අපිට විතරයි මේ ප්‍රෙෂර් එක තියෙන්නෙ. ඔක්කොම කියන්න පුළුවන්. ඒ කිව්වට ජාතික පාසල් විදියට චක්‍රලේඛණය හැදීමේදී මේ ඔක්කොම කරුණු සලකා බලන්න බැහැ. පොදු නිර්නායකයට තමයි යන්නෙ. ඇමතිතුමාට වුණත් කරන්න පුළුවන් සීමාවක් තියෙනවා. මේකයි ප්‍රශ්නෙ. ඒක නිසා අපි ප්‍රායෝගිකව යම්කිසි වෙනසක් ප්‍රාථමික අංශය වෙනස් කිරීම ජාතික එකක් නෙමේ. ඒක ජාතික වශයෙන් චක්‍රලේඛණයේ තියෙනවා. මාවතකින් වෙනස්වෙලා තියෙනවනම් ඒක එහෙම තිබුණට කමක් නැහැ කියලා. ඒ ප්‍රශ්නෙ සාධාරණයි. ඒ ප්‍රශ්නෙ අපිට දිනනත් පුළුවන්. ඒ ප්‍රශ්නෙ අපිට අතහරින්නත් බැහැ. ඒ ප්‍රශ්නෙ අපි කතාකරන්න ඕන. ඉතින් මේ අවුරුද්දෙ මේ ටික දුන්නට ගරු සභාපතිතුමනි මම කියන්නෙ මේ චක්‍රලේඛණයෙ මේක වෙනස් කරන්න එපා. මේ විදියට තියෙන්න අරින්න කියන ඉල්ලීම කරනවා.එතකොට මෙකෙද ප්‍රාථමිකය අපට මෙතන තියෙනවා. අභ්‍යන්තර ප්‍රශ්න විදුහල්පතිතුමාට තියෙනවනම් ඒව අමාත්‍යාංශය එක්ක කතාකරලා විසඳගන්න කියලා කියන එක තමයි ගරු සභාපතිතුමනි පිළිතුර. මෙතුමාගෙ කාරණාව ගැන කතාකරත් සුනාමි ප්‍රශ්නය ගැන කතාකරත් පොඩි සාධාරණත්වයක් තියෙනවා. මොකද පටබැඳිමුල්ල,හිරේවත්ත ප්‍රදේශයේ ජනතාව තමයි ඕකට පදිංචියට ගියේ. ඉතින් එහෙමනම් සුනාමි ආවෙ අම්බලන්ගොඩට විතරක් නෙමේ. ඔය තර්කෙට උත්තර දෙන්න බැහැනෙ.ත්‍රිකුණාමලේ ඉඳලා ඒ පැත්තත් මෙතන ඉඳලා තංගල්ල වෙරළ තීරයේ ඒ දක්වාත් ගිහිල්ල තියෙනවා. එහෙමනම් චක්‍රලේඛණයේ පොඩි එකක් ඇතුළත් කරගන්න ඕන සුනාමි ව්‍යසනය නිසා සත්‍ය වශයෙන්ම සුනාමි නිවාස හිමිවුණු දරුවන්ට යම්කිසි ප්‍රතිශතයක් ලබල දෙන්න කියලා. මොකද කාලයක් තිබුණා ත්‍රිවිධ හමුදාවේ අයට 1% ක් දෙන්න කියලා. ඊලඟට අනධ්‍යාන කාර්ය මණ්ඩලවල අයට 1% ක් දෙන්න කියලා. ඒව හදන්න පුළුවන්. බැරිවෙන්නෙ නැහැ. ඒව අපි අපේ ඇමතිතුමාට තේරුම්කර දීල මේ බරපතල ප්‍රශ්නයක් තියෙනව කියල පෙන්නල දීල හැමෝම එක්ක එකතුවෙලා මේක කරන්න පුළුවන් ගරු සභාපතිතුමා. මෙතුමියට මම මාස 02 කට උඩදි කිව්වහම එතුමියට බැරිවුණා එක පුද්ගලයෙක් ඕකට ගෙන්න. එතුමියගෙ අදක්ෂකම නෙමෙයි. කිසිකෙනෙක් එන්නෙ නැහැ ගරු සභාපතිතුමනි.හැමකෙනාම හිතාගෙන ඉන්නෙ ලැයිස්තුව දානකන් අපේ ළමයා ඇතුලේ කියල. එළියට ගියාට පස්සෙත් අභියාචන බලාපොරොත්තුවෙන් ඉන්නවා. අභියායචනයෙත් නැතිවුණාට පස්සෙ තමයි අපි ගාවට එන්නෙ අපේ ළමයා නැහැ කඩුපොලු අරගෙන. හැමෝම විදුහල්පතිතුමා සරණං ගච්චාමි කියාගෙන සද්ද නැතිව ඉන්නෙ. අපි මන්ත්‍රීවරු කොච්චර දැහලුවත් මහජන සහාය නැතිව මහජන විරෝධතාවයක් අපිට ගොඩනගාගන්න

බැහැ.ඒක තමයි ඔයගොල්ලන්ගෙ උද්ඝෝෂණය අසාර්ථක වෙන්න ප්‍රධානතම හේතුව. මන්ත්‍රීවරුන්ගෙ අඩුකම නෙමෙයි.ඒ දෙමව්පියොවත් ආවෙ නැහැනෙ. ඒක තමයි ඇත්ත කතාව. එන්නෙ නැහැ.එන්නෙ නැත්තෙ හැම දෙමව්පියම කල්පනා කරනවා අපි මොකටද ඉල්ලන් කන්නෙ ගිහිල්ල. අපේ ළමයා යන්න තියෙන එකත් නවතිනව ඔය වැඩෙන් ගිහිල්ල. ඒකනෙ දෙමව්පියො හිතන විදිය. ඉතින් අපට ඒක නවත්වන්න බැහැ. අපි පාලකයො වශයෙන් එතන නෙමේ අපි ඉන්න ඕන.ඇමතිතුමාත් එක්ක මේක සාකච්ඡා කරලා ජාතික පාසල් අධ්‍යක්ෂතුමා එක්ක කතාකරන්න අපි හදාගන්න ඕන යෝජනා මාලාවක් මේකට. නිකත් ඕතන ගිහිල්ල ගරු ඇමතිතුමා හම්බවෙලා යම්යම් කාරණා අතපසු වුණේ ඒ නිසා. අපි ඒකට සුදුසුකම් හදාගෙන මෙතන මෙන්න මේ යෝජනා ටික දනවා.එතකොට ඒ අය පුළුවන් ඒව ගනීවි බැරි ඒවා ඉවත් කරාවි. එතනයි ගරු සභාපතිතුමා තියෙන්නෙ. මම පහුවුණේ නැහැ. මෙතුමට පැන දෙන්න ගිහිල්ලනෙ පහුවුණේ. එතුමා සාකච්ඡා කළා විදුහල්පතිතුමා කොයිච්චියද කියලා. මං කිව්වා විදුහල්පතිතුමාගෙන් මට ප්‍රශ්නයක් නැහැ කියල මං එළියට ආවා. එච්චරයි.මට අදාල නැහැ. එහෙනම් මම කියන්න එවැයි 01 වසර ගන්න එපා කියලා. ඔබතුමා ඒකද අදහස් කරන්නෙ. ඒ නිසා ප්‍රාථමික අංශය වැහුව කියලද? මට එහෙම එකක් නැහැ.මම පාසල් සංවර්ධන සමිතියෙ ලේකම්වරයනෙ. මගෙන් ඇහුවා විදුහල්පතිතුමා තත්ත්වය . මං කිව්වා මට අදාලත් නැහැ කියල එච්චරයි.මං ඔබතුමා අහපු ප්‍රශ්නෙට උත්තරේ දුන්නෙ. මට ළමයි දාන්න කිසි කෙනෙක් නැහැ. මගේ දරුවො තුන්දෙනා ඔක්කොම ඉගෙනගෙන ඉවරයි. මෙතුමගෙ ළමයෙකුත් මං දැම්මා. ගරු උප සභාපතිතුමාගෙ ළමයෙකුත් මං එක වතාවක් දැම්මා. ඇත්ත කතාව. මට පුළුවන් වුණානම් මං උදව් කරනවා පුළුවන් වෙලාවට. මට බැරිදේ බැහැ. මෙතුමගෙ දෙවැනි ළමයා දැම්මෙ මං පාසල් සංවර්ධන සමිතියෙ ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම්වරයා විදියට. නෑ ඒක තමයි.එහෙම කිව්වට කවුරුත් මේකට ඉදිරිපත් වෙන්නෙ නැහැ.ඉතින් ඒ නිසා මීට වඩා කතා කරන්න දෙයක් නැහැ මේ ගැන.මෙහෙම කතා කරත් ලබන අවුරුද්දෙත් මේ ගැන මේ විදියටම කතාකරන්න වේනවා.ඒක තමයි ඇත්ත කතාව. බොහොම ස්තූතියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මට පොඩි උණපූරණයක් ගැන කතා කරන්න තියෙනවා. මං දැඩි ලෙස විශ්වාස කරනවා ගරු ඇමතිතුමා අපට සාධාරණය ඉෂ්ඨ කරයි කියලා. ඒ අනුව ඉවසීමෙන් ඉන්න.ඒ වැඩේ කරල දේවි.හැබැයි මෙහෙම දෙයක් තියෙනවා.ඒකෙන් සමස්ථ ලැයිස්තුවකටම අපට දෙන්න බැහැ. නමුත් අර පරණ විදියට තියෙන වෘත්තය ගැහුවම ඒකට ඇතුල්වෙන අය ඒ ටික ඇතුල් කරල දෙයි කියල මම දැඩි විශ්වාසෙන් කියනවා. හැබැයි මගේ ළමයෙක් හිටියානම් මම ධර්මාශෝකෙට දාන්නෙත් නැහැයි කියන එකත් කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මං ගෙන ආ යෝජනාවට ස්තූති කිරීම සම්බන්ධයෙන් ගොඩක්ම සතුතියි. නමුත් මට පොඩ්ඩක් ඒ ගැන කියන්න තියෙනවා. 30 වෙනිදා තමයි අපි ගියේ. ර 7.00 යි. අපි ගෙදර එනකොට ර 10.00 විතර වුණා.කොහොම නමුත් 31 ර වෙනකොට මේ ලැයිස්තුව දැන්වීම් පුවරුවේ දාල තිබ්බා.ඒ අවස්ථාවෙත් ගරු ඇමතිතුමා කිව්වා නොනිදන අමාත්‍යාංශය අපේ ගරු ඇමතිතුමා කිව්වා ලැයිස්තුව හෝල්ඩ් කරන්න කියලා. කොහොමහරි හෝල්ඩ් කිරීම කෙසේවෙතත් ප්‍රසිද්ධ කිරීම නම් 31 ර කළා. නිදාගෙන නැහැ.නිදාගෙන නැතිව නරල තියෙන්නෙ. විදුහල්පතිතුමා අපි අගය කරනවා විදුහල්පතිතුමාගේ ඉතාමත් කාර්යශූර කාර්යක්ෂම සේවාව පිළිබඳව සහ මේ වන විට කිසිම ඉස්කෝලෙක මං හිතන්නෙ තවම ළමයි ඇතුළත් කරගෙන නැහැ.නමුත් පළවෙනිදා වෙනකොට ලියුනුත් ගහල ඉවරයි හෝල්ඩ් කිරීම කෙසේවෙතත්. හත්වෙනිදා ළමයිනුත් ගත්තා . ජාතික පාසල් අධ්‍යක්ෂකතුමත් බොහොම කාර්යශූර බව පෙනීගියා අපට. හරිම ලැජ්ජයි. මේ දේ

නොකෙරුණොත්. උප සභාපතිතුමා කිව්ව වගේ අපි ගන්න ඕන පියවර අපේ ගරු ජනාධිපතිතමා අපේ ගරු අගමැතිතුමා අප පත්කරල තියෙන්නේ. අපේ ගරු ජනාධිපතිතුමා අප පත්කළේ අපේ ප්‍රාදේශීය මට්ටමින් ඉන්න නායකයො තමයි ජාතික තලයට ගෙනැල්ල තියෙන්නෙ. අපට සාධාරණයක් ඉෂ්ඨ වෙන්නෙ නැත්නම් අපේ මේ අරගලය නවත්වන්නෙ නැහැ කියන මතේ සිටිමින් ඔබතුමන්ලා මට දැක්වූ සහාය පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා ඉදිරිපත් කරන්න.

**05.09 ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.09.01 ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා දෛනික සේවකයින් 10 දෙනෙක් බඳවාගැනීමට කරන ලද යෝජනාව සහාගත කරන ලදී.**

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා දෛනික සේවකයින් 10 දෙනෙක් බඳවාගැනීමට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි. අනිත් යෝජනාවත් ඉදිරිපත් කරන්න.මේක ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉල්ලා යවන්න ඕන.

**තීරණය**

ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා දෛනික සේවකයින් 10 දෙනෙක් බඳවාගැනීමට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කරන ලද යෝජනාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.09.02 86 වෙනි තල්ගස්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට දකුණු පසින් ඇති පහත් බිමක් ඇති ඉඩම නගර සභාවට පවරා ගන්නා ලෙස කරන ලද යෝජනාව සහාගත කරන ලදි**

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි 86 වෙනි තල්ගස්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට දකුණු පසින් ඇති පහත් බිමක් ඇති ඉඩම නගර සභාවට පවරා ගන්නා ලෙස සභාවට යෝජනා කරමි.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මම එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

86 වෙනි තල්ගස්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට දකුණු පසින් ඇති පහත් බිමක් ඇති ඉඩම නගර සභාවට පවරා ගන්නා ලෙස ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් කරන ලද යෝජනාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.** **කාරක සභා වාර්තා :-**

06.01 2019.12.16 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.12.16 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

**2019.12.16 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.02 2019.12.27 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.12.27 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

**2019.12.27 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.03 2019.12.26 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.12.26 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

**2019.12.26 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.04 2019.12.27 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.12.27 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය:-

2019.12.27 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.12.27 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.12.27 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේකෙදි වෙළඳ සංගමයේ මෙන්න මේ කාරණය තියෙනවා.සභාවේ ඒ එක්කම අවසරයත් ඉල්ලනවා. පොලීසිය හා බස් නැවතුම්පොලෙහි ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථාන වශයෙන් තියල සීසීටී කැමරා පද්ධතියක් මුළු නගරයේම ඇති කරන්න කියල තියෙනවා. ඒ වෙනුවෙන් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරල තියෙනවා වෙළඳ සංගමය.ටෙලිකොම් ආයතනය මගින්. එහිදී අපි එකඟතාවය එලකළා. සම්පූර්ණ වියදම විසිඅට ලක්ෂ අසූ දෙදහස් එකසීයයි. ඒකෙ ප්‍රධාන සැපයුම් ස්ථාන වන අම්බලන්ගොඩ පොලිසියේ නිරීක්ෂණ ස්ථානයත් ඒවගේම අම්බලන්ගොඩ බස් නැවතුම්පොලේ නිරීක්ෂණ ස්ථානයත් සඳහා වැයවන මුදල ලක්ෂ 07 ක් විතර වෙනවා.ඒ හත වැයකිරීම සඳහා සභාවේ අනුමැතිය මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒ කියන්නෙ ගරු සභාපතිතුමා වෙළඳ සංගමෙන් කරනව කියල දැන් නගර සභාවෙන් කරන්න වෙනවද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ. වෙළඳ සංගමෙන් ලක්ෂ 28 ක් මේකට වැයවෙනවා. වෙළඳ සංගමෙන් ඉතුරු මුදල දානකොට මේ පද්ධතිය ක්‍රියාත්මක කරන්න ඕනනම් මුළු නගරයම ආරක්ෂිත කැමරාවලින් ආවරණය කරනවා.නිරීක්ෂණය කරන්න ස්ථාන දෙකක් තියෙනවා.එකක් අම්බලන්ගොඩ පොලීසිය.අනෙක් එක අපේ පොලිස් මුරපොලේ නිරීක්ෂනය වෙනවා.එතකොට ඒකට යන වියදම ලක්ෂ 07 ක් විතර වෙනවා. ඒ මුදල අපි සභාවෙන් දැරීමට තීන්දු කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා අපි බලන්න ඕන ඕකෙ මිළ ගණන් අරගෙන තියෙනවනම් කොටේෂනුත් අපි මෙහෙට ගෙන්න ගන්න.මොකද වගකීමක් තියෙන ආයතන වෙන්න ඕන කරන්න පලපුරුදු ආයතන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වෙළඳ සංගමේ කරන්නෙ කවුද?

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මං ඔබතුමාට යෝජනා කරනවා වෙළඳ සංගමෙන් ලක්ස 28 ක් යනවනම් අපට 07 යි කියන්නෙ 21 ක් ඒ අය වියදම් කරනවා. එතකොට අම්බලන්ගොඩ නගරයේ ගරු සභාපතිතුමා තව වෙළෙන්දො ඉන්නවා වෙළඳ සංගමේ නැති.කාගිල්ස් එක තියෙනවා.කාගිල්ස් ෆුඩ් සිටි 02 ක් තියෙනවා.අබාන්ස් එක තියෙනවා. ඒ.එස්.බී.එක තියෙනවා.එතකොට ඒ ආයතන ගරු සභාපතිතුමා ලොකු ආයතන

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ.සියලුම ආයතන අපි මේකට ඇතුලු කරනවා. ටවුන් එක ඇතුළට ඇතුලු වන ඕනෑම පුද්ගලයෙක් හඳුනාගැනීමට හැකිවන අයුරින් ටී.වී. පද්ධතියක් ඇති කරනවා.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඒක නෙමේ මං කියන්නෙ .ඒක හොඳයි. හැබැයි අපේ වෙළඳ ප්‍රජාව මධ්‍යම වෙළඳපොල ලක්ෂ 21 ක් වියදම් කරනව නම් අම්බලන්ගොඩ අද වෙළඳ නාමයෙන් 50% කට වැඩිය වෙළඳාම කරන්නේ ෆුඩ් සිටි දෙකයි අබාන්ස් එකයි ඔය ඔක්කොම ටික ගරු සභාපතිතුමා. ඒ නිසා මං ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි මේ ආයතනවලට අනිවාර්යයෙන් ලිඛිතව දන්වන්න. මෙන්න මෙහෙම වැඩක් කරනවා.මෙච්චර මුදලක් යනවා.මේ මුදල ඔයගොල්ලො සපයන්න කියල.මොකද ඒ අයටත් නගරයේ යම්කිසි වගකීමක් තියෙනවා. මේ අම්බලන්ගොඩ නගරයේ කරන ව්‍යාපාරවලින් වැඩි මුදලක් යන්නේ මේ ආයතනවලට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කොහොමත් ගරු මන්ත්‍රීතුමා වෙළඳ සංගමය මේකට යොදවන්නෙ ලක්ෂ 12 යි.අපි 07 යි.එතකොට 19 යි.තව 10 ක් ඕන. ඒ 10 අපි දෙගොල්ලො එකතුවෙලා පොලිසියයි අපියි වෙළඳ සංගමයයි එකතුවෙලා අනෙක් බාහිර පාර්ශවවලින් හොයල දෙන්න ඕන.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මං කියන්නෙ ගරු සභාපතිතුමා මේ අම්බලන්ගොඩ නගරෙ කිසිම දේකට ඔය කාගිල්ස් ආයතනයෙන් කිසිම සහයෝගයක් ලැබෙන්නෙ නැහැ. මේකෙ තියෙන දේවල් හූරාගෙන යනව මිසක් අපටත් නගරෙටත් යම්කිසි සේවයක් කරන්න ඕන.ඒ නිසා ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි ඔබතුමා මේක මේ ආයතනවලට දැනුවත් කරලා මේකට කොටස්කාරයො කරගන්න කියන ඉල්ලීම කරනවා ගරු සභාපතිතුමනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ධීවර සංගමය රැස්වීමක් තියල ඒ අය දැනුවත් කළා නම් හොඳයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේකට වරායත් ඇතුලු කරන්න තමයි බලාපොරොත්තුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී  ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මොකද එතනත් කැමරා වගයක් ගහනව කිව්වා. මොකද එතකොට ඒ අයගෙනුත් සල්ලි ටිකක් ගන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්.වරාය ඇතුලු කරනවා.වරායෙ ප්‍රශ්න රාශියක් තියෙනවා.ඒ නිසා ඇතුලු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී   ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

වරායෙ ප්‍රශ්න රාශියක් තියෙනව ගරු සභාපතිතුමා. ඒ නිසා ඒ අය රැස්වීමක් කැඳවලා ඒ අය....

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට අම්බලන්ගොඩට ඇතුලු වන ඕනෑම තැනකින් එන වාහන සහ පුද්ගලයන් හඳුනාගානීමේ හැකියාව තියෙන පරිදි ස්ථානගත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා පැහැදිලිව අපි දෙන ගාන ඕකෙ සටහන් කරන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක තමයි මං මේ පුෂ්පරාණි මිස්ට කතාකළේ.මෙතන එයා වරද්දල තියෙන්නේ. නිරීක්ෂණයට වැය වන එකයි හැත්තෑව නෙමේ.දෙකයි හතයි ගානක් විතර වෙනවා.ඒක අපි කතාකරමු පස්සෙ.

**තීරණය:-**

**2019.12.27 දින පැවති වෙළඳ සංගමයේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**06.06 2019.12.29 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2019.12.29 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය:-**

**2019.12.29 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. **ටෙන්ඩර් හා මිළ ගණන්**

07.01 ටෙන්ඩර්

07.02 මිළ ගණන්

07.02.01 අම්බලන්ගොඩ නගර සභා අපන ශාලාව සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | A.M.G.T ලක්මාල් | K.T. දමිත් වජිර කුමාර |
|---|---|---|---|
| **01** | අම්බලන්ගොඩ නගර සභා අපන ශාලාව බදුදීම | 90900/= | 78230/= |

තීරණය-

අම්බලන්ගොඩ නගර සභා අපන ශාලාව සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් වැඩිම මිලක් ඉදිරිපත් කර ඇති ඒ.එම්.ජී.ටී. ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදි.

07.02.02 **අම්බලන්ගොඩ නගර සභා පොදු වෙළපොළ කඩකාමර අංක 14 බදුදීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති මිළගණන්**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විරද්දන ඉනෝකා කුමුදුනි |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| **01** | අම්බලන්ගොඩ නගර සභා පොදු වෙළඳපොල කඩ කාමර අංක 14 බදු දිම සඳහා (2020-01-07 සිට 2023-01-07 දක්වා කාලයට ) | 01 | 500500/= |

**තීරණය:-**

අම්බලන්ගොඩ නගර සභා පොදු වෙළඳපොළ කඩ කාමර අංක 14 බදුදිම සඳහා ලැබී ඇත්තේ මිල ගණන් එකක් පමණි. ඒ විරද්දන ඉනෝකා කුමුදුනි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළි ගැනිමට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.03 අම්බලන්ගොඩ නගර සභා ආරක්ෂක අංශයට අවශ්‍ය පාපැදි මිලදි ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්

| අංකය | **ද්‍රව්‍යහා උපකරණ විස්තරය** | ප්‍රමාණය | වර්ගය | දුල්ෂාන් මැෂින් සෙන්ටර් | ගමගේ ට්‍රෙඩ්සෙන්ටර් | Universal Gift Market Ambalangoda |
|---|---|---|---|---|---|---|
| 01 | ලුමාලා වීරයා 28 ස්ටැන්ඩඩ් බයිසිකල් | 02 | ලුමාලා | 19950 | 19550 | 19650 |

තීරණය-

අම්බලන්ගොඩ නගර සභා ආරක්ෂක අංශයට අවශ්‍ය පාපැදි මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ගමගේ ට්‍රේඩ් සෙන්ටර් විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.04 **හල්වතුර කසල අංගනය සඳහා කන්ටේනර් පෙට්ටියක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළගණන්.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Hybrid Cargo teture Colombo** | **Modular containers Kelaniya** | **Wever Engineering Kelaniya** |
|---|---|---|---|---|---|
| **01** | **කන්ටේනර් පෙට්ටි ( හල්වතුර කසල අංගනය සඳහා )Hybrid Office Transportation** | **01** | **335000/=**<br>**52000/=** | **325000**<br>**35000/=** | **790000/=**<br>**45000/=** |
| | | | **587000/=** | **86000/=** | **1035000/=** |

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කන්ටේනර් පෙට්ටි 01 ක් සඳහා කසල අංගනය සඳහා හයිබර්ඩ් ඔෆිස්කීම් එකක් මිලදීගැනීම සඳහා ඉදිරිපත් කර ඇති කන්ටේනර් එකක් පරික්ෂා කර බලා මිලදී ගැනීම නිර්දේශ කරනව කියල තියෙනවා. පන්ලක්ෂ අසූහත්දාහයි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නෑ නෑ ඒක බලන්න ඕන ගරු සභාපතිතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් ඒක බලල තීරණය කරන්න කියල කියනවා. මේ වෙනුවෙන් අපි ටෙක්නිකල් එලූෂන් එක කරන්න පත්කරනවා. ලේකම්තුමිය,ගණකාධිකාරිතුමිය,තාක්ෂණසේවා නිලධාරීතුමා. ඒවගේම අපේ මන්ත්‍රීවරුන් වන ගරු ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා හා රාහුල මන්ත්‍රීතුමා නම් කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා හල්වතුර කසළ අංගනය සඳහා කන්ටේනර් පෙට්ටියක් මිලදි ගැනිම සඳහා Hybrid Office එකක් මිලදි ගැනිම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනයන්හි කන්ටේනර් පෙට්ටි පරික්ෂා කර බලා මිලදි ගැනිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදි.

08. **ගෙවීම් :-**

08:01 2020 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභාවේ ආයතන, කර්මාන්ත,සෞඛ්‍ය අංශයේ නිලධාරින් සඳහා විශේෂ අත්තිකාරම් ලෙස රු.348,000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.02 2020 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභාවේ විශේෂ අත්තිකාරම් ලෙස රු.4000/= ක මුදලක් තලංගම එරික් ප්‍රසන්න මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.03 ගලිබවුසර් ලෝඩ් 25ක් සඳහා එකවර මුදල් ලෙස රු.25875/= ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.04 2020 වර්ෂයේ විශේෂ අත්තිකාරම් ලෙස අම්බලන්ගොඩ නගර සභාාවේ ලියාපදිංචි සේවකයන් සඳහා රු.60000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ් ජගත් කුමාර විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.05 අම්බලන්ගොඩ නගර සභාාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2019 නොවැම්බර් මස ගමන් වියදම් ලෙස රු.66000/= ක මුදලක් සහා අනුමැතියට යටත්ව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.06 හල්වතුර බී.ජී.සුනිල් මහතාගේ නිවස අසළ කාණු පද්ධතිය සහා අරමුදලින් ඉදිකිරිම සඳහා රු.976,332.53 ක මුදලක් විලේගොඩ ප්‍රජා මණ්ඩලයට ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ අනුමැතිය ලද පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.07 පටබැඳිමුල්ල ආදාහනාගාරයේ අභ්‍යන්තර මාර්ග කිරිම උපමාන පාදක අරමුදල් යටතේ සිදු කිරිම වෙනුවෙන් රු.511,279.35 ක මුදලක් ගාල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ අනුමැතිය ලද පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.08 හල්වතුර කසළ අංගනයේ කුණු බැහැර කරන ස්ථානයේ D4 යන්ත්‍රය යොදා කුණු තුනී කිරිම වෙනුවෙන් රු.438900/= ක මුදලක් P.H.C.C ද සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.09 දෙල්දුව පාර අලුත්වැඩියාව සඳහා ABC ගල් කියුබ් 02ක් සැපයීම වෙනුවෙන් රු.13500/= ක මුදලක් P.H.C.C ද සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.10 මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය චිප් ගල් කියුබ් 10.30ක් සැපයිම වෙනුවෙන් රු.77250/= ක මුදලක් අයි.ඩී. ප්‍රියන්ත මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.11 මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය 1 ½ හා ¾ ගල් සැපයිම වෙනුවෙන් රු.85050/= ක මුදලක් P.H.C.C ද සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.12 ගාමිණි විද්‍යාල මාවතේ පැතිබැම්ම ඉදිකිරිම සඳහා රු.247,495 ක මුදලක් කළුවඩුමුල්ල සහජිවන ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08.13 මහ අම්බලන්ගොඩ අතුරුමාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු.423,902.94 ක මුදලක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරින්

විසින් මෙම මාර්ගයේ ඉදිකිරීම් සම්බන්ධව සොයා බලා මෙය ලබන සභාවට ඉදිරිපත් කිරිමසුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි එතන පොඩි ප්‍රශ්නයක් තියෙනවා 8.13. මහ අම්බලන්ගොඩ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම කියල ඒ සල්ලි නිදහස් කිරීමට පෙර පොඩ්ඩක් අධීක්ෂණය කරන්න.එතන ජනතාව කියනවා ඒ පාරෙ තවම වතුර රැඳිල තියෙනවා. සර්ව සම්පූර්ණ විදියට හදල නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරී මහතා මේක බැලුවද? මේ අර වතුරට කඩපු එක නේද?ඉතින් මොකක්ද එතන

**<u>ගරු නගර සභා මන්ත්‍රීනී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ඔව් ඔව්.අන්තිම හරිය හොඳට කෙරිල තියෙනවා. ඉස්සරහින් වතුර රැඳෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙමනම් මේ කියන කාරණේ බලන්න.බලල අපි ලබන සභාවට තීන්දු කරමු. ඒ අනුව 8.13 ඉවත් කරනවා.ලබන සභාවට ඉදිරිපත් කරන්න ඒ වාර්තාත් එක්ක.

08.14 පටබැඳිමුල්ල වසමේ චන්ද්‍රාවාස පාර අතුරු මාර්ගය ( ගඩොල් ඇල්ලිම ) වෙනුවෙන් රු.333,407.27 ක මුදලක් තිලෝනා කන්ට්‍රක්ෂන් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.15 කෙරමිණිය දුව වත්ත පාර තාර දැමීම වෙනුවෙන් රු.40300/= ක මුදලක් තිමිර කන්ට්‍රක්ෂන් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.16 පින්නදූව 4 වන හරස්පාර මාර්ගයේ තාර දැමීම වෙනුවෙන් රු.53805.25 ක මුදලක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.17 සුදුවැල්ල පාර අළුත්වැඩියා කිරිම සඳහා ( සභා ප්‍රතිපාදන මත ) 10% රැඳවුම් මුදල් නිදහස් කිරිම වෙනුවෙන් රු.99942.08 ක මුදලක් සභා අනුමැතියට යටත්ව තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්

අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.18 පටබැදිගෙදරවත්ත මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් කිරීම ( කොඩිතුවක්කු මහතාගේ නිවස අසළ ) වෙනුවෙන් රු.304895.54 ක මුදලක් කළුවඩුමුල්ල සහජීවන ප්‍රජා මණ්ඩලයට වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.19 බුද්ධදත්ත මාවත කොන්ක්‍රීට් කාණුව ඉදිකිරීම වෙනුවෙන් රු46952.54/= ක මුදලක් තල්ගස්ගොඩ ප්‍රජා මන්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.20 බුද්ධදත්ත දෙවන පටුමග නිපුන් රන්සික මහතාගේ නිවස අසළ කාණු පද්ධතිය වෙනුවෙන් රු.7000/= ක මුදලක් ඕකන්ද ප්‍රජා මන්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.21 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Led Monitor 02ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.23600/= ක මුදලක් Tulip Computer වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.22 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Printer 02ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.11800/= ක මුදලක් Omak Technology වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.23 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය Led Monitor 02ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.11800/= ක මුදලක් Tulip Computer වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.24 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ට්‍රැක්ටර් රථ අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු.252680/= ක මුදලක් රත්න මෝටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.25 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය නිර්පාංශු ගෙවතු වගාව සඳහා සෘජුෆොම් පෙට්ටි 104ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.33280/= ක මුදලක් ලක්ෂාන් ෆිෂින් ලයින් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.26 අම්බලන්ගොඩ නගර සභාව ආයුර්වේදයට අවශ්‍ය ඇණවුම් කරන ලද බෙහෙත් ඖෂධ මිලදී ගැනිම වෙනුවෙන් රු.24324/= ක මුදලක් Sri Lanka Ayurveda Drugs Corporation වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.27 අම්බලන්ගොඩ නගර සභාව ආදාහනාගාරවලට අවශ්‍ය ගෑස් මිලදී ගැනිම වෙනුවෙන් (ඇ.අ2326 2019.12.27 දින) රු.48280/= ක මුදලක් S.H.N.A. de Silva වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.28 අම්බලන්ගොඩ නගර සභාව ආදාහනාගාරවලට අවශ්‍ය ගෑස් මිලදී ගැනිම වෙනුවෙන් (ඇ.අ2306 2019.12.05 දින) රු.48280/= ක මුදලක් S.H.N.A. de Silva වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.29 අම්බලන්ගොඩ නගර සභාව ආදාහනාගාරවලට අවශ්‍ය ගෑස් මිලදී ගැනිම වෙනුවෙන් (ඇ.අ2268 2019.11.11 දින) රු.48280/= ක මුදලක් S.H.N.A. de Silva වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.30 මහ අම්බලන්ගොඩ මහජන පුස්තකාලය පිංතාරු කිරිමට අවශ්‍ය තින්ත මිලදී ගැනිම වෙනුවෙන් රු.14910/= ක මුදලක් Athula Colour House වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.31 මනාන ක්‍රිඩාංගණය , තල්ගස්ගොඩ පෙර පාසැල , පටබැඳිමුල්ල ආදායනාගාරයට ඇණවුම් කරන ලද කොන්ක්‍රිට් ගල් බංකු මිලදී ගැනීම වෙනුවෙන් රු.58000/= ක මුදලක් රංජිත් කොන්ක්‍රිට් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.32 අම්බලන්ගොඩ නගරය පිරිසිදු කිරිමේ ව්‍යාපෘතියට අදාලව මුද්‍රණය කරන ලද අත් පත්‍රිකා වෙනුවෙන් රු.23700/= ක මුදලක් සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා මෙහෙමයි අපේ ඩුප්ලෝ මැෂින් එකක් තියෙනවා නේද? ඩුප්ලෝ මැෂින් එකට මොකද වෙලා තියෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කැඩිලා.අලුත්වැඩියා කරන්න දාල තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේව පිටින් ගහන්නේ ඒකනෙ ඉතින් ඒව කරගන්න.නැත්නම් අපරාදේ මුදල්නෙ මේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි.

08.33 අම්බලන්ගොඩ නගර සභාවට අයත් ඡායරූප යන්ත්‍රයේ ටෝනර් මිලදි ගැනීම ( ෆොටෝ කෝපි ) වෙනුවෙන් රු.31970/= ක මුදලක් Metropolitan Office ( Pvt) Ltd වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.34 මහ අම්බලන්ගොඩ පුස්තකාලයේ පොත් බැදිම වෙනුවෙන් රු.108850/= ක මුදලක් එස්.ඩබ් .හරිස්චන්ද්‍ර මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා 8.34 මේ මුදල කොච්චරද ගරු සභාපතිතුමා. මේ දහදාහස් ගානක්ද? එක්ලක්ෂ ගානක්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක් ලක්ෂ අටදහස් අටසිය පනහයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

පොත් බැඳීම වෙනුවෙන්

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔව් ඔව්. එකපාරට පොත් ගොඩක් දාල

08.35 අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩා පිටිය විසිරි ජල සැපයුම සඳහා ජලය ලබා ගැනිමට ජල පොම්ප කිරිමේ කුටියක් සකස් කිරිම වෙනුවෙන් රු.260427.90 ක මුදලක් ප්‍රගීත් කන්ස්ට්‍රක්ෂන් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.36 අම්බලන්ගොඩ ආර්.ඊ. ද සිල්වා මාවත , හෙප්පුමුල්ල ඩබ්.ඩබ් . එස් අනෝමා ද සිල්වා මහත්මියට සමෘද්ධි සහානාධාර හිමිකම් ඇත. සමෘද්ධි අයෙකුට ලබා දෙන ගන්නා ලද මුදලින් රු.2000/=ක මුදලක් ආර්. තිලකරත්න රොෂාන් මහතා වෙත ලේකම්ගේ නිර්දේශය

පරිදි නිදහස් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදි.

## 09. ගිණුම් :-

09.01 2019 නොවැම්බර් මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සහාගත කරන ලදී.

**තීරණය:-**

2019 නොවැම්බර් මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2019 නොවැම්බර් මස ලැබිම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

## 10. ඇස්තමේන්තු :-

**10.01 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ජලය රැඳෙන ස්ථානවල මැටි කැණීම්කර ඉවත්කර පස් පිරවීම සඳහා රු.490000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඒකෙ දැන් පස් වෙනුවට වැලි නේද අපි දාන්නෙ. ඕකට පස් වෙනුවට වැලි දැම්මනම් හරි ගරු සභාපතිතුමා.එතකොට තමයි පෙරෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පස් කියල තමයි ඇස්තමේන්තුවෙ තියෙන්නේ. තාක්ෂණසේවා නිලධාරීතුමා මේ කියන එක සංශෝධනය කරල දාන්න පුළුවන්ද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පස් දාන්න වෙනව කොහාම ගියත්.එහෙම වුණොත් වැඩිපුර කැණලා මුහුදු වැලි දාමු මුලින්.

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ජලය රැඳෙන ස්ථානවල මැටි කැනිම් කර ඉවත් කර පස් පිරවිම සඳහා රු.490,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 මහජන ක්‍රීඩාංගනයේ ළිං ඉදිකිරීම සඳහා රු.125000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

මහජන ක්‍රීඩාංගණයේ ළිංවල පියන් ඉදිකිරිම සඳහා රු.125,000/= ක  ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 මහජන ක්‍රීඩාංගනයේ ළිං අන්තර් සම්බන්ධ කිරීම හා කාණු පද්ධතියේ අතිරේක වැඩ සිදුකිරීම සඳහා රු.150,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.( ළිං වල පියන් )**

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා දැන් මේකෙ අම්බලන්ගොඩ ක්‍රීඩාංගනයේ ළිං සෑදීම කියල අද තමයි යෝජනාව ගත්තෙ ගරු සභාපතිතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේක අමතර එකක් තමයි රු.125000/- ක.මොකක්ද මේ යෝජනා කරන්නේ? ළිංවලට වෙනම ඇස්තමේන්තුව ගිහිල්ල අපි ගෙවල තියෙන්නේ.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

මං අහන්නෙ ගරු සභාපතිතුමා මේක නීත්‍යානුකූලද කියල විතරයි. අදම යෝජනා කරල අදම ඇස්තමේන්තුව .එතකොට එකම සභාවෙ වෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ.ඒකෙ ගැටලුවක් නැහැ. ඇස්තමේන්තුවලට යන ඒව තමයි යෝජනාවලට ගිහිල්ල තියෙන්නේ. දෙකම තියෙන්න ඕන කියල නියමය තියෙන්නේ. ඒක ගැටලුවක් නැහැ. මේක ළිං ඉදිකිරීම නෙමේ ළිංවල පියන් ඉදිකිරීම වෙන්න ඕන.

**තීරණය-**

මහජන ක්‍රීඩාංගණයේ ළිං අන්තර් සම්බන්ධ කිරිම හා කාණු පද්ධතියේ අතිරේක වැඩ සිදු කිරිම සඳහා රු.150,000/= ක  ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 හල්වතුර කසළ අංගනයේ කසල තුනී කිරීම (අදියර 02) සඳහා රු.500,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

හල්වතුර කසළ අංගනයේ කසල තුනී කිරිම ( අදියර 02 ) සිදු කිරිම සඳහා රු.500,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.05 මහජන ක්‍රීඩාංගනයේ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයේ පැත්තේ පැති බැම්ම හා සපත්තු කාණුව ඉදිකිරීම සඳහා රු.380,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය-

මහජන ක්‍රිඩාංගණයේ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය පැත්තේ පැති බැම්ම හා සපත්තු කාණුව ඉදිකිරිම සඳහා රු.380,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි එච්. ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 පෝරඹ වලව්වත්ත පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.1,000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මේ ඔක්කොම එකනෙ. මේ ඇස්තමේන්තු ලබන මං දන්නැහැ හදිස්සිනම් ගන්න.අනිත් ඒව ගරු සභාපතිතුමා එකට දාන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අභ්‍යන්තර විගණන නිලධාරී මේකෙ වරදක් තියෙනවද? දිගටම ගිහිල්ල තියෙන්නෙ මේ ක්‍රමේට තමයි. මෙතනදි ගෙවීමත් එනවනම් තමයි ප්‍රශ්නෙ තියෙන්නේ. යෝජනාවයි ඇස්තමේන්තුවයි කියන එක සාමාන්‍ය දෙයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතතුමනි 10.06 සම්බන්ධව මට දැනගැනීම සඳහා ගරු සභාපතිතුමනි.මේ පෝරඹ කොන්ක්‍රීට් පාර පාර විතරද?නැත්නම් සපත්තු කාණුවක් එක්කද ලක්ෂ දහය දාල තියෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේක ඇස්තමේන්තු කළේ කවුද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මීටර් 50 ක් 60 ක් වගේ වැඩිය දුර නැහැ මේ පාර. ලක්ෂ දහයක් යනවද කියන එක කතන්දරයකුත් තියෙනවා.තව වතුර බැසයාම සම්බන්ධයෙන් ගැටලුවකුත් තියෙනව ගරු සභාපතිතුමනි. බෑවුමක් තියෙනව ගරු සභාපතිතුමනි. තාක්ෂණ නිලධාරීතුමියන්ට ඒ ගැන අවධානය යොමුකරන්න කියල ඉල්ලා සිටිනවා.

**තීරණය-**

පෝරඹ වලව්වත්ත පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු.1,000,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා

කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.07 මාර්ගසති පාරේ පැතිබැම්ම හා මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සඳහා රු.2,000,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි යෝජනාවයි ඇස්තමේන්තුවයි අතර වෙනස මං මේ කතාකරන්න හැදුවේ. ඇත්තටම මේ නිලධාරීන් වෙහෙස මහන්සිවෙලා මේ ඇස්තමේන්තු හදන්නෙ.අපි මන්ත්‍රීවරු 21 කගෙ ඇස්තමේන්තු හදන්න ඕන. මේ යෝජනාවල ප්‍රමාදයක් තියෙනව.නමුත් මාසෙට දවසයි යෝජනාව දාන්නත් පුළුවන්. ඉතින් ඒ නිසා ඔවුන් කරපු කාර්යය පිළිබඳව ප්‍රශංසා කළ යුතුයි. මොකද ලබන සභාවට දෙන්නම් කියල එතුමන්ලට කියන්න පුළුවන්. අපේ මන්ත්‍රීවරුන් නිසා තමයි ඇස්තමේන්තු හදන්නෙ. ඉතින් පොඩි තාක්ෂණ ගැටලුවක් ඇති. විගණන නිලධාරීන්ට ඒක ප්‍රශ්නයක් නොවෙනවනම් අපි ප්‍රශ්න කරගත යුතු නැහැ කියන එකයි මං ඉල්ලා සිටින්නේ. මොකද අපේ උදව්වටයි මේ දෙකම එක දවසෙ එන්නේ. මං හිතන්නෙ ඒක එන එක හොඳයි.නැත්නම් තව මාසෙකට පස්සට යනවා මේ ඇස්තමේන්තු සෑදීම ගරු මන්ත්‍රීතුමන්ලාගෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ළිං අනුමත කරනකොට මතක් වෙන්නැද්ද පියන් ඕන කියල. අපේ දෝසයක් නෙමේනෙ ඒක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපේ දෝසයක් නෙමේ .මේක තේරුම් ගන්න. මේ ළිං හදන අවධිය වෙනකොට අපේ තාක්ෂණ සේවා නිලධාරී කෙනෙකුට අනුමත කරන්න පුළුවන් ලක්ෂ පහයි. එතකොට මේ ළිං තුන අස්තමේන්තු තුනකට ගියේ. එතකොට ලක්ෂ 15 ක් ගිහිල්ල තියෙනවා. ඊට පස්සෙ පියන් හදනකොට පියන දැම්මනම් ලක්ෂ 16 යි.එහෙනම් තවම ගාල්ලෙ. ඔයාගෙ මහ ඇමතිතුමා කරපු දේවල් නිසා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ අහන්නකො ගරු සභාපතිතුමා එහෙමනම් ඒක දාන්න තිබුණා පියන් සැපයීම කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේකෙ තාක්ෂණසේවා නිලධාරීතුමා ලියන විදියට තමයි මං කියන්නේ. දැන් අපි අරගෙන තිබෙන්නේ. දැන් ප්‍රශ්නයක් නැහැ.

**තීරණය-**

මාර්ග සති පාරේ පැති බැම්ම හා මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම සඳහා රු.2,000,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.08** මහ අම්බලන්ගොඩ , හිරිකැටිය පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවට ( ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය නිවස අසළ) රු.219,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ , හිරිකැටිය පාරෙන් අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවට ( ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය නිවස අසළ) රු.219,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.09 මහ අම්බලන්ගොඩ , ධම්මකුසල අසළ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා ( සිතා මහත්මියගේ නිවස අසළ) රු.380,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය-

මහ අම්බලන්ගොඩ , ධම්මකුසල අසළ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා ( සිතා මහත්මියගේ නිවස අසළ) රු.380,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.10** අම්බලන්ගොඩ ගාමිණී විද්‍යාල මාවතේ කොන්ක්‍රිට් ෂැලැබ් යෙදීම සඳහා රු.35000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය-

අම්බලන්ගොඩ ගාමිණී විද්‍යාල මාවතේ කොන්ක්‍රිට් ෂැලැබ් යෙදීම සඳහා රු.35000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.11 මහ අම්බලන්ගොඩ මානිම්මුල්ල පාරේ අතුරු මාර්ගය සංවර්ධනය කිරිම ( මනිම්මුල්ල හංදියේන් අජිත් මහතාගේ නිවස අසළ ) සඳහා රු.200,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය-

මහ අම්බලන්ගොඩ මානිම්මුල්ල පාරේ අතුරු මාර්ගය සංවර්ධනය කිරිම ( මනිම්මුල්ල හංදියේන් අජිත් මහතාගේ නිවස අසළ ) සඳහා රු.200,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.12 මහ අම්බලන්ගොඩ පෝය සීමාව පාර ( ධම්මික මහතාගේ නිවස අසළ ) සඳහා රු.700,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

මහ අම්බලන්ගොඩ පෝය සීමාව පාර ( ධම්මික මහතාගේ නිවස අසළ ) සඳහා රු.700,000/= ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජානා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**11.** වෙනත් කරුණු :-

**12** න්‍යාය පත්‍රයට ඇතුළත් නොවු වෙනත් කරුණු :-

**12.01 පොල්වත්ත පියවර පෙරපාසල පින්තාරු කිරීම සඳහා වෙදර්ෂීල් තින්ත ලීටර් 13 යි. ඉමල්ෂන් තීන්ත ලීටර් 15 යි. අඟල් 04 පින්සල් 02 යි. අඟල් 02 පින්සල් 01 ක් ගැනීමට සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

තව එකක් තියෙනවා.පොල්වත්ත පියවර පෙරපාසල පින්තාරු කිරීම සඳහා වෙදර්ෂීල් තින්ත ලීටර් 13 යි. ඉමල්ෂන් තීන්ත ලීටර් 15 යි. අඟල් 04 පින්සල් 02 යි. අඟල් 02 පින්සල් 01 ක් ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

පොල්වත්ත පියවර පෙරපාසල පින්තාරු කිරීම සඳහා වෙදර්ෂීල් තින්ත ලීටර් 13 යි. ඉමල්ෂන් තීන්ත ලීටර් 15 යි. අඟල් 04 පින්සල් 02 යි. අඟල් 02 පින්සල් 01 ක් ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.02 නව පරිගණක යන්ත්‍ර 10 ක් මිලදී ගැනීමට පරිගණක ස්ථාපනය කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නව පරිගණක යන්ත්‍ර 10 ක් මිලදී ගැනීමට පරිගණක ස්ථාපනය කිරීම .ඒ අනුව නගර සභාවේ දැනට භාවිත වන බොහොමයක් පරිගණක 2013 වසරේ මිලදී ගත් පරිගණක වේ. මෙම පරිගණක සඳහා වගකීම් කාලය වසර 03 ම ඉක්මවා තවත් වසර 03 ක් ඉක්මවා ඇත. මේ වන විට සෑම පරිගණකයක්ම බොහෝ අක්‍රීය තත්ත්වයට පත්වේ. එම නිසා මෙම අයට පරිගණක 10 ක් මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලනවා. ප්‍රධාන පරිගණක පද්ධතිය , මිශ්‍ර ආදායම් 01,මිශ්‍ර ආදායම් 02, වෙළඳ බලපත්‍ර වැඩසටහන, කඩ කුලී වැඩසටහන, ගිණුම් කටයුතු හා චෙක්පත් මුද්‍රණය, තොග හා ගබඩා

කටයුතු පරිගණකගත කිරීම, සභා වාර්තා පරිගණකගත කිරීම, ඇඟිලි සලකුණු යන්ත්‍රය නිවාඩු විෂය ඇතුළත් වැඩසටහන, සැපයුම් නිලධාරී වෙනුවෙන් පරිගණක ගැනීමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

නව පරිගණක යන්ත්‍ර 10 ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.03 සභා කාර්යාලය තාවකාලිකව වෙනත් ස්ථානයකට ගෙනයාම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මීලඟට සභා කාර්යාලය තාවකාලිකව වෙනත් ස්ථානයකට ගෙනයාම. අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ ප්‍රතිසංස්කරණය කටයුතු කිරීමට සිදුව ඇති බැවින් මෙම කාර්යාලය තාවකාලිකව වෙනත් ස්ථානයකට ගෙනයාමට අවශ්‍යාව ඇත. සාමාන්‍යාධිකාරී,විවිධ සේවා සමූපකාර සමිතිය, මහවීදිය, අම්බලන්ගොඩ. එබැවින් කාර්යාල සේවය හා සමූපකාර සමිතිය ස්ථාපනය කිරීම සඳහා අවසර ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි. අප ආයතනයේ ආදායම් පරීක්ෂක විසින් තක්සේරුගත රු.40000/- ක මාසික බද්දක් ගෙවීමේ එකඟතාවය පලකර ඇත කියල ඉල්ලීමක් කරල තියෙනවා. සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තිරණය**

සභා කාර්යාලය තාවකාලිකව වෙනත් ස්ථානයකට ගෙනයාම සම්බන්ධයෙන් සාකච්ජා කළ බැලිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලිපියක් තියෙනවා. අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ ස්ථාපිත කොට ඇති ලොතරැයි අලෙවි කුටිවලින් අයකරන බදු මුදල් 2020 වසරේ සිට වැඩිකිරීමට තීන්දුව සම්බනධයෙන් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

ඊලඟට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලිපියක් තියෙනවා. අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ ස්ථාපිත කොට ඇති ලොතරැයි අලෙවි කුටිවලින් අයකරන බදු මුදල් 2020 වසරේ සිට වැඩිකිරීමට තීන්දුව සම්බනධයෙන් . අම්බලන්ගොඩ නගර සභා සීමාවේ ස්ථාපිතව ඇති ලොතරැයි කුටිවලින් අයකරන බදු මුදල් 2020 වසරේදී රු.10000/- ක් දක්වා වැඩිකර ඇති බවට අදාළ නියෝජිතයන් විසින් අප ආයතනයට දැනුම් දී ඇත.ඒ සම්බන්ධයෙන් මා විසින් ඔබතුමන් හා දුරකථනය මගින් සාකච්ජා කිරීමෙන් පසු තවදුරටත් ඒ පිළිබඳව සාකච්ජා කිරීම සඳහා 2020.01.06 වන දින අප ආයතනයේ කලාප කළමනාකරුවෙකු සහභාගී විය. එහිදී ඔබතුමා දැනුම් දී ඇත්තේ 2020.01.07 වන දින පැවැත්වෙන සභාවටද ඒ සම්බන්ධව ලිඛිත ඉල්ලීමක් කරන ලෙසය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සිය අලෙවි කටයුතු සිදුකිරීම සඳහා දිවයින පුරා නියෝජිතයින් පත් කර ඇති අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමග ඔවුන් ගිවිසුම්ගතව ඇති බවත් ඔවුන් යටතේ අලෙවි සහායකයින් පිරිසක් එම ස්ථානයේ අලෙවි කුටිවල අලෙවි කටයුතු සිදුකරනු ලබයි. අප ආයතනය විසින් අලෙවි නියෝජිතයින් සඳහා රු.3.75 ක කොමිස් මුදලක් ලබාදෙන අතර එම කොමිස් මුදලින්

සාමාන්‍ය වශයෙන් 2.75 ක් අලෙවි සහායකවරයාට ගෙවන අතර රුපියලක් පමණ අලෙවි නියෝජිතයා තබා ගනී. රුපියලක මුදලින් ඔහුගේ සියලු ව්‍යාපාරික වියදම් හා පුද්ගලික ජීවන වියදම් දරණ අතර පළාත් පාලන ආයතනවලට ගෙවනු ලබන බදු මුදල ගෙවන්නේද රුපියලක මුදල යොදාගෙනය. එසේම දිවයිනේ සෑම මහනගර සභාවකින්ම , නගර සභාවකින්ම හා ප්‍රාදේශීය සභාවක්ම අයකරනු ලබන්නේ මීට වඩා අඩු බදු මුදලක් වන අතර අලෙවි නියෝජිතයන් රු.10000/- ක් බදු ගෙවීම ඉතාමත් දුෂ්කර කාර්යයකි. නගර සභා සීමාව තුළ වසර 30 කට අධික කාලයක් අප ආයතනයේ අලෙවි නියෝජිතයන් විසින් අලෙවි කුටි පවත්වාගෙන යන අතර එක් වරම බදු මුදල් වැඩිකිරීම මත ව්‍යාපාර පවත්වාගෙන යාම අපහසුතාවයක් ඇති වන අතර අලෙවි නියෝජිතයන් සහ අලෙවි සහායකයන් ලොතරැයි අලෙවි කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වන අතර එක් පාර්ශවයකට හෝ මූල්‍යමය හානියක් සිදුවුවහොත් එම ව්‍යාපාරය මෙන්ම ජීවිතවල පැවැත්මට බාධාවක් වනු ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 1997 අංක 20 දරණ පනතින් සංස්ථාගත කොට කර ඇති ජනාධිපති අරමුදලට හා මහපොළ උසස් අධ්‍යාපන අරමුදලට මුදල් ඉපයීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයක් වන අතර වාර්ෂිකව අප මණ්ඩලය මගින් ජනාධිපති අරමුදලට බැරකරනු ලබන ප්‍රතිපාදනවලින් සෞඛ්‍ය, අධ්‍යාපනය, සාමාජීය, ආගමික, කලා,ක්‍රීඩා කටයුතු ආදී කටයුතු සඳහා මෙන්ම රටේ සංවර්ධන කටයුතු සඳහා විශාල මුදලක් දායකත්වය ලබාදේ. මෙම අරමුදලේ උපයනු ලබන දිවයින පුරා ව්‍යාප්තව ඇති ලොතරැයි බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්, අලෙවි නියෝජිතයින්,අලෙවි සහායකවරුන් විසින් උපයා දෙන මුදල්වලිනි. මේ පිළිබඳව සලකා බලා අදාල බදු මුදල වන රු.10000/- ක මුදල අඩුකර පළාත් පාලන ආඥා පනතට අනුකූලව කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමු. මේ සම්බන්ධව ඔබතුමාගෙන් ලැබෙන සහයෝගය ඉතා අගයකොට සලකමි. සාමාන්‍යාධිකාරී ලිපියක් ඉදිරිපත් කරල තියෙනවා.මගේ අදහස නම් අතුරු බදුදීම වළක්වල යම්කිසි මුදලක් සභාවට ගැනීම වඩා සුදුසුයි කියන එක. අපේ අතින් පොඩි වරදක් තියෙනවා. බස් නැවතුම්පොලේ තියෙන එකට අමතරව උදාහරණයක් වශයෙන් පරණ පාරේ තියෙන ඒවටත් මේ රු.10000/-ම තමයි ඇප්ලයි වෙලා තියෙන්නෙ. එතන වෙනසක් විය යුතුයි කියන අදහසේ ඉන්නව මං.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මෙහෙමයි.අපි දැන් නගර සභාවෙන් බස් නැවතුම්පොළ ඇතුළත ගිවිසුම් ප්‍රකාරව අලෙවි කුටි කීයක් තියෙනවද? අපි ඒව නීත්‍යානුකූලව දීපුවනෙ. මෙහෙමයි සමහර ඒව තියෙනවා අපෙන් අනුමැතියක් නැතිව තියාගෙන ඉන්න ඒව. ගිවිසුමක් ගහලත් නැහැ.මොකක්වත් නැහැ. ඒ අය තමයි ඔය බද්දෙන් බද්ද දෙන්නෙ. අර ඇතුළෙ තියෙන ඒව නීත්‍යානුකූල විදියට අපි දීල තියෙනවනම් ඒ අයට සාධාරණයක් කරාට කමක් නැහැ. පිට තැන් තැන්වල ගිහිල්ල කුටි තියාගෙන ඉන්නවා. ඒක වළක්වන්න තමයි අපි මේ කියන්නෙ. ඇතුළෙ ඉන්න අයගෙ ගිවිසුමක් ගහල නගර සභාවෙ ඒ තත්ත්වෙ තුළ කරාට අඩුකිරීමක් කරන්න ඕන.ඒකෙ ගැටලුවක් නැහැ.නගර සභාවෙ අනුමැතියකින් තොරව තියාගෙන ඉන්න ඒව තියෙනවා.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මම නම් කියන්නෙ නියෝජිතවරු තමයි ජාතික ලොතරැයි මණ්ඩලයට දන්වල තියෙන්නේ. ජාතික ලොතරැයි මණ්ඩලය දන්නෙ නැහැනෙ ගරු සභාපතිතුමා අයිතිකාරයොන්ට 1500 ක් 2000 ක් දෙනව කියල දවසගානෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ජාතික ලොතරැයි මණ්ඩලය මාත් එක්ක සාකච්ජා කළා. ඒ අයට කිව්වා මෙන්න මේ විදියට මේ අය රු.500/- ගානෙ ගන්නවා. ඒ නිසා අපි කල්පනා කරපු දේ තමයි සභාව අපි මිනිස්සුන්ට වැඩ කරන්න ඕන. අතරමැදියොන්ට දෙන ලාභය වෙනුවෙන් ඒක අපි අරගෙන ගමේ යම් කිසි සංවර්ධන ව්‍යාපෘතියක් කරන එක හොඳයි කියන අදහස තුළයි අපි ඒක වැඩිකළේ.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා කිසිසේත්ම ඕක අඩුකරන්න යන්න එපා. මොකද අඩු කරොත් එහෙම දිගින් දිගටම අපට ගැටලු එනවා.මොකද සාමාන්‍යයන් මාසෙට රු.10000/- ක් මාසෙට දෙන්න බැරි කමක් නැහැ ගරු සභාපතිතුමා. රු.3.50 ක් රු.4.00 ක් ටිකට් එකකින් කොමිස් එක තියෙනවා. ජාතික ලොතරැයි මණ්ඩලයට ඔය නියෝජිතවරු ගරු සභාපතිතුමා ඔය ලියුම දාල තියෙන්නේ. විකුණගන්න කට්ටිය නෙමේනෙ. ඉතින් ඒ නිසා ඒ අයට අමාරුවක් ඇති ඕක ගෙවන්න. අමාරු කිව්වට කොහෙද අමාරු ගරු සභාපතිතුමා.එහෙමනම් නොකර ඉන්න එපැයි. කුටි කීයක් තියෙනවද අම්බලන්ගොඩ නගර සීමාව ඇතුළෙ. ලොතරැයි කූඩු 20 කට එහා පැත්ත තියෙනවා. මම නම් කියන්නෙ ඕක රු.15000/- කරල තමයි ඕක රු.10000/- කළේ. රු.15000/- ට තමයි අනුමැතිය දුන්නෙ සභාවෙ. දැන් රු.10000/- කරල තවත් අඩු කරන්න කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ගරු සභාපතිතුමා නීත්‍යානුකූලව බස් නැවතුම්පොළ දෙනකොට ගිවිසුමක් ගැහුවද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් ගිවිසුමක් ගහල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහෙමයි බද්දක් වැඩි කරනකොට ඒ අයට අපි නගර සභාවෙන් නිත්‍යානුකූලව. සමහර අය ඉන්නවා පස්සෙ ඕව අනුමත කරල තියාගන්න ඒව වෙනම කතන්දරයක්. උදාහරණයක් ගත්තම බස් නැවතුම්පොළ ඇතුළෙ කුටි කීයකට අනුමැතිය දීල තියෙනවද කියල බලන්න පුළුවන්. කුටි 05 නීත්‍යානුකූලව කලින් දීපුවද? පස්සෙ දීපුවද?මොකද මෙහේ ලිපිනයන් නෙමේ මං දැක්කා පිට ලිපිනයන් තියෙනවා. අම්බලන්ගොඩ කරන අයත් ඉන්නවා එක්කෙනෙක්ද දෙන්නෙක්ද.අපේ හේමසිරි මන්ත්‍රීතුමා අම්බලන්ගොඩින් ගනිපු එක්කෙනෙක්. තව ඉන්නවා එක්කෙනෙක්ද දෙන්නෙක්ද. නගර සභාවෙ ඒ කාලෙ පටන් ගත්ත ඒවා මේ ලඟ ඒව නෙමෙයි. එදා ඉඳලම කරන අයට යම් සහනයක් දුන්නට ඒක ගැටලුවක් නැහැ ගරු සභාපතිතුමා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන මන්ත්‍රීතුමාම තමයි රු.500/- ගානෙ දෙන්නෙ දවසකට.පඩිය නෙමෙයි එයා ගන්නව බද්ද.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපිට ඕව ඔප්පු කරන්න බැහැ. බද්දෙන් බද්ද දීලද මොනවද කියන එක. අපි දීල තියෙනවනෙ නීත්‍යානුකූලව එදා ඉඳලම ලොතරැයි කූඩු කීපයක්. ඊට අමතරව එනවයි කියන්නෙ වෙන විදියකට ඇවිල්ල තියෙන ඒවත් තියෙනවනෙ. මං හිතන්නෙ ඕක බලපාන්නෙ බස් නැවතුම්පොළේ අයට තමයි ඔය මුදල.අනිත් අය මේ අරහෙන් මෙහෙන් ඇවිල්ල කූඩු තියාගන්නව කට්ටිය. ඒකයි මං කියන්නෙ. පොඩි සාධාරණයක් කරන්න. අම්බලන්ගොඩ නගරෙ ඒව කොච්චර තියෙනවද? සභාවෙ ඒව 08 ක් තියෙනවා. සභාවෙ 08 ට මං කියන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි . ලක්ෂ්මි මෙනවිය කතා කරමින්</u>**

සභාවට ලියුමක් එවනවා කිව්වා. එතනින් එහාටත් යන්න පුළුවන් විදියට එහෙම කියල කිව්වා.මටත් දොස් කිව්ව ඉතින්. ඔබතුමියත් අත ඉස්සුව නේද ඇහුවා මේකට. මම ඔක්කෝටම පියවර ගන්නවා කිව්වා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ මුදල පැනෙව්වේ සියලු දෙනා ඒකමතිකව.රු.15000/- මම තමයි රු.10000/- ට අඩු කළේ. මං අහන්නෙ මෙහෙමයි ඇපීල් එකක් තියෙනවා මොකක්ද කියන්නේ.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා මම විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙමනම් වෙනස් කිරීමක් නැතිව ඔහොමම තියනවා.

**තිරණය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලිපියක් තියෙනවා. අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ ස්ථාපිත කොට ඇති ලොතරැයි අලෙවි කුටිවලින් අයකරන බදු මුදල රු.10000/= ක මුදල වෙනස් කිරිමක් සිදු නොකරන බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05 ගර්භණී මවක් රෝහල් ගතවිමේදි නොමිලේ භාණ්ඩ ලබාදිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මීලඟට ගර්භණී මවක් රෝහල් ගතවීමේදී නොමිලයේ භාණ්ඩ ලබාදීම. උක්ත කටයුතු සඳහා වැයවන මුදල සභා අරමුදලින් දැරීමට 2019.11.05 පැවති මාසික සභාවේ 10.19 යටතේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එම භාණ්ඩ මාස 07 ඉක්මවූ මව්වරුන් සඳහා ලබාදීම සුදුසු බව යෝජනා කරන අතර 2020 වසරේ සිට මෙම වැඩසටහන ආරම්භ කිරීමට සුදුසු දිනයක් හා වේලාවක් තීරණය කර ඒ අනුව යෝජනා කළ පරිදි සෑම මසකම 10 වන දිනට අදාළ නාම ලේඛනය ගෙන්වා ගැනීමට සුදුසුයි කියල තියෙනවා. ඒවගේම 25 වෙනිදා භාණ්ඩ ලබාදීමට තීන්දු කරනවා. ඒක මහතික කරන්න ඕන

ග්‍රාම සේවා නිලධාරීයි , පවුල් සෞඛ්‍ය සේවිකාවයි , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීයි සහතික කරල තමයි ගන්නෙ.

**තීරණය**

ගර්භණී මවක් රෝහල් ගතවිමේදි නොමිලේ භාණ්ඩ ලබාදිම සඳහා සැම මසකම නාම ලේඛණය 10 දිනට ගෙන්වා ගැනිම සුදුසු බවටත් 25 වෙනි දින භාණ්ඩ ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.06 ගා/බුද්ධදත්ත ආදර්ශ විද්‍යාලයේ වාර්ෂික නිවාස ක්‍රීඩා උත්සවය සඳහා පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනය ගාස්තු රහිතව ලබාගැනීම. දින පැවැත්විම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**තීරණය**

ගා/බුද්ධදත්ත ආදර්ශ විද්‍යාලයේ වාර්ෂික නිවාස ක්‍රීඩා උත්සවය සඳහා පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනය ගාස්තු රහිතව 2020.02.20 වැනි බ්‍රහස්පතින්දා ලබාදිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.07 පලාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඊලඟට පළාත් පාලන කොමසාරිස් වත්කම් බැරකම් ප්‍රකාශය දීල නැති අය එවන්න කියල දන්වල තියෙනවා.

**තීරණය**

පළාත් පාලන කොමසාරිස් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදිම පිළිබඳව ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදි.

**12.08 2020 ත්‍රීරෝද රථ ස්ටිකර් ලබාගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඊලඟට 2020 ත්‍රීරෝද රථ ස්ටිකර් ලබාගැනීම . ඒ අනුව ස්ටිකර් 250 ක් ලබාදීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේකෙ දැන් අපි ක්‍රියාත්මක වෙන්නෙ නැහැ.සමහර අය ඒ ගමන ස්ටිකර් නොගෙන ඉන්නවා. ගරු උප සභාපතිතුමා මේකට මොකක්ද දැන් කරන්නෙ. නීතිය ක්‍රියාත්මක වෙන්න එපැයි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අමාත්‍ය මණ්ඩල අනුමැතියට දාල තියෙනවා නේද ආදායම් පරීක්ෂක මහත්මයා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

තවම සහකාර එකේ තියෙන්නෙ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ නෑ.ඒක යන්න ඕන ගරු ආණ්ඩුකාරතුමා මගින්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී   රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්</u>**

ඒක තමයි ගරු සභාපතිතුමා දැන් මාස කීයක්ද මේකට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම තමයි ඔය පළාත් සභාවල හැටි ඔහොම තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා  කතා කරමින්</u>**

පළාත් සභා නෙමේ ගරු සභාපතිතුමා ඔබතුමා කවුරුහරි යවල ඒක කාර්යක්ෂම කරවන්න.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ  මහතා  කතා කරමින්</u>**

නෑ නෑ මෙහෙම එකකුත් තියෙනවා අපේ ගරු මන්ත්‍රීතුමා. අපි දැන් කොච්චර මහන්සි වුණත් අපට ගිහිල්ල ඒ මිනිස්සුත් එක්ක ගහගන්න බැහැ. පොලීසියෙන් කිසිම සහයෝගයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා  කතා කරමින්</u>**

සහයෝගය දෙන්න ඉස්සරවෙලා ගැසට් කරන්න එපැයි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ  මහතා  කතා කරමින්</u>**

ඔබතුමාට හොඳම උදාහරණයක් මං කියන්නම් මං ඊයෙත් මනුස්සයෙක් එක්ක ඇරගත්තා. වෑන් පාර්ක් එක ඉස්සරහා ගහනව ත්‍රීවිල්. මං ගිහිල්ල ඇහුවා තමුසෙ මෙතන ගහන්නෙ මොකද කියලා. මේ අපි වෑන් පාර්ක් එකේ දුවන කට්ටිය කිව්වා.වෑන් එකත් එතන ගහලා ත්‍රීවිල් එකත් ගහනව එතන. මාත් එක්ක අපේ ගරු ධම්මි කොඩිකාර මන්ත්‍රීතුමයි, ලසන්ත මන්ත්‍රීතුමයි දෙන්නම ගියා. මේ දෙන්නා මට බනිනවා ඔයා යන්න එපා ගහගන්න. මිනිස්සුන්ට ඕව කියන්න කියලා. ඇඟේ ලේ වතුර වෙනවා ගරු සභාපතිතුමනි දැක්කම. වෑන් පේලිය ඉස්සරහින් ත්‍රීවිල් පේලියක් ගහලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ආදායම් පරීක්ෂක මහත්තයා බලපත්‍ර නැති ඒවා ලියන්න. නඩු දිනන පරදින එක ප්‍රශ්නයක් නැහැ. 100 ක් හරි කමක් නැහැ දාන්න. ගියා බලපත්‍රෙ තියෙනවද ඇහුව නැහැ. ලයිෂන් ඉන්ෂුරන්ස් එක බැලුවා. එහෙමම නම් ටික ලියාගත්තා. නඩු දැම්මා. පළවෙනි දවස අහුවුනා නම් දාන්න.ඉවරයි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ  මහතා  කතා කරමින්</u>**

දැන් ඔයගොල්ලො ගිහිල්ල කියල වැඩක් නැහැ. ඒ මිනිස්සුන්ට මොනවහරි දඬුවමක් දෙන්න ඕන. නැත්නම් ආයෙ ගහනවා ගෙනැල්ලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දවසක් දෙකක් උසාවියෙ රස්තියාදු වෙනකොට ඒක ගෙවයි.

**<u>ගරු නගර සභා උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඊයෙ ගියාම මං ඒ මිනිහා දීපු උත්තරේ අපේ ගරු මන්ත්‍රීවරු දෙන්නා අහන් හිටියා.මොකක්ද කිව්වේ මං මගේ වෑන් එක මෙතන ගහල තියෙනවා මං ත්‍රීවිල් එකත් දුවනවා කිව්වා. ඉතින් ගරු සභාපතිතුමා වෑන් එකත් ගහනවා.ත්‍රීවිල් එකත් ගහනවා. අම්බලන්ගොඩ නගරෙ මිනිහෙකුත් නෙමේ. කන පැලෙන්න දෙන්න හිතෙනවා ඒ වෙලාවට. ඒ හින්දා මාව එක්කගෙන ගියා හොඳ වෙලාවට. මං තනියම ආවනම් මට හරි ප්‍රශ්නයක් ඉතින්.ඇත්තටම ගරු සභාපතිතුමා.එක්කො නිලධාරීන් ක්‍රියාත්මක වෙන්න ඕන. අපි සිවිල් ආරක්ෂක බලකායෙ දෙන්නෙක් ගත්තෙ ඔයගොල්ලොන්ට අරන් යන්න. ඔයගොල්ලොන්ගෙ ආරක්ෂාව වෙනුවෙන් අරගෙන යන්න. නිතරම වැඩිපුර දෙදෙනෙක් ඉන්නේ ගරු සභාපතිතුමා. එහෙම අරන් ගිහිල්ල හරි මේක ක්‍රියාත්මක කරන්න ගරු සභාපතිතුමා.නැත්නම් මේ නගරෙ හදන්න හම්බෙන්නෙ නැහැ.හැමදාම කොච්චර කිව්වත් වැඩක් නැහැ.අපි කට කැඩෙනකන් කියනවා. අන්තිමට අපි මන්ත්‍රීවරුන්ගෙන් බැනුම් අහනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයගොල්ලො නීතිය ක්‍රියාත්මක කරලා වැඩේ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

යුනිෆෝම් එකක් තියෙනවද? යුනිෆෝම් එක ඇඳගෙන ගියාම ඉවරනෙ. සිවිල් ආරක්ෂකයිනුත් අරගෙන ගිහිල්ල මෙහෙමයි මේ ප්‍රශ්නෙ වෙන්නෙ මෙහෙමයි.කොටසකගෙන් සල්ලි අරගෙන ස්ටිකර් එක දෙනවා. ඉතින් අර මිනිස්සු නිකන් ගහනකොට අර මනුස්සය ගන්නෙ නැහැ.

**තීරණය**

2020 ත්‍රීරෝද රථ ස්ටිකර් ලබාගැනීම අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.09 අම්බලන්ගොඩ නගර සභා නිලධාරීන්ගේ සුභසාධක සංගමය. ලන්ද උත්සව ශාලාවට පැමිණීම සම්බන්ධව ස්තුතිය පුද කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා නිලධාරීන්ගේ සුභසාධක සංගමය. ලන්ද උත්සව ශාලාවට පැමිණීම සම්බන්ධව ඔයගොල්ලන්ට ස්තූති කරල තියෙනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා නිලධාරීන්ගේ සුභසාධක සංගමය. ලන්ද උත්සව ශාලාවට පැමිණීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12.10 ලියාපදිංචි කර්මාන්ත සේවකයන් සඳහා අත්තාරම් ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලියාපදිංචි සේවක මහත්ම මහත්මින්ට 2020 වර්ෂය සඳහා විශේෂ උත්සව අත්තිකාරම් වශයෙන් රු4000/= ක මුදලක් ස්ථිර සේවකයින් දෙදෙනෙකු අත්සන් කර පසු ගෙවීමට අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.